දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් අව තුදුස්වක ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 74 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 12 සිකුරාදා

කොවිඩ් ව්‍යාප්තිය



දේශයේ පාලන මාවත අද පනුය සමග

වසර හයකදී ප්ලාස්ටික් කිලෝ කෝටි 335ක් ගෙනල්ලා

වියදම කෝටි 18,430යි

ස්වර්ණා විජේකෝන්

2012 වසරේ සිට 2018 වසර දක්වා කාල සීමාව තුළ ප්ලාස්ටික් කිලෝග්‍රෑම් මිලියන 3353.8ක් මෙරටට ආනයනය කර ඇති බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා-වේදී පසුගියදා (09) අනාවරණය විය. පිට 06

ඡායාරූප - ලොරන්ස්වර්ණ ලම්සන්

දෙල්කඳ ව්‍යාපාරිකයාගේ පිලිස්සුණු සිරුර

කොහුවල මෝටර් රථයක

ගින්නට හේතුව දුම්වැටියක්දැයි සැකයක්

බුද්ධි කරුණාරත්න සහ බොරලැස්ගමුව සමූහ සෙනවිරත්න කහටපිටිය

කොහුවල, ආසිරි මාවතේ වැගන් ආර් වර්ගයේ මෝටර් රථයක් තුළ තිබී පොලිසිය විසින් පෙරේදා (10) රාත්‍රියේ සොයා ගැනුණු මළ සිරුර දෙල්කඳ ප්‍රදේශයේ මෝටර් රථ අමතර කොටස් වෙළෙඳාමේ නිරත වන 34 හැවිරිදි ව්‍යාපාරිකයකුගේ බවට හඳුනා ගෙන තිබේ. පිට 06

සීනි බදු සිද්ධියට ජවිපෙ අද උසාවි යයි

නදී මාණික්කගේ

ආනයනික සීනි සඳහා පැනවූ බදු වංචාවක් මගින් රජයට රුපියල් බිලියන 15.9ක මුදලක් අහිමි කිරීම සහ ඒ මගින් ජනතාවට ලැබිය යුතු සහනය නොලැබීම නිසා ජනතා-වගේ මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් සහනයක් ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ගොනු කිරීමට ජනතා විමුක්ති පෙර-මුණ තීරණය කර තිබේ. පිට 06

කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවට කොවිඩ් මර්දන එන්නත දීමේ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක වන අතර නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානයේදී ද 1,200ක පිරිසකට එන්නත්කරණය ඊයේ (11) සිදු කෙරිණි. එම අවස්ථාවට පැමිණි අගමැති මහින්ද රාජපක්ෂ මහතා එන්නත්කරණ වැඩසටහන නිරීක්ෂණ-යට ලක් කළ අයුරු. නාරාහේන්පිට අභයාරාමාධිපති, බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි ඇතුළු පිරිසක් මෙහි වෙති.

දෙමළ දේශපාලන සිරකරුවන්ට පොදු සමාව දෙන්න

සංගරී අගමැතිට ලියයි

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

දැනට බන්ධනාගාරගත කොට සිටින දෙමළ දේශපාලන සිරකරුවන් පිරිස පොදු සමා-වක් යටතේ නිදහස් කිරීමට පියවර ගන්නා ලෙස ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක ආනන්ද සංගරී පෙරේදා (10) අග්‍රාමාත්‍යවරයාට ලිපියක් යවමින් ඉල්ලා තිබේ. පිට 06

අසාද් සාලි අත්අඩංගුවට ගන්න

බුද්ධි කරුණාරත්න

ජාතික සමගි පෙරමුණේ නායක අසාද් සාලි මහතා කළ ප්‍රකා-ශය සම්බන්ධයෙන් ඔහු වහාම අත්අඩංගුවට ගන්නා ලෙස තමන් පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කරන බව ජාතික නිදහස් පෙරමුණේ මාධ්‍ය ප්‍රකාශක පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් මුසම්මිල් මහතා පවසයි.

ඊයේ (11) කොළඹ පැවති මාධ්‍ය හමු-වකට එක් වෙමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

ප්‍රසිද්ධ හමුවක් පවත්වමින් මෙරට නීතියට අභියෝග කරන තැනට ඉස්ලාම් අන්තවාදීන් පත්ව ඇතැයි මුසම්මිල් මහතා මෙහිදී කියා සිටි-යේය. පිට 06

ප්‍රහාරකයන්ට දඬුවම් නොදී අශෝක් පසුපස යෑම විහිළුවක්

විපක්ෂ නායක

බුද්ධි කරුණාරත්න

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු අයට දඬුවම් කළ යුතුව තිබී-යදී ආණ්ඩුව එසේ ක්‍රියා නොකර විවිධ ප්‍රකාශ කළ අශෝක් අබේසිංහ මන්ත්‍රීවරයා වැනි අය පසු පස ගමන් කිරීම හාස්‍යයට කරුණක් බව සමගි ජන බලවේගයේ නායක විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඊයේ (11) මාධ්‍යයට කීවේය. පිට 06

යල-මහ කන්නවලින් වී ටොන් ලක්ෂ 50ක ඉලක්කයක්

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

මෙවර මහ කන්නයේදී වී මෙට්‍රික් ටොන් මිලියන 3.2ක අස්වැන්නක් අපේක්ෂා කරන බව කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පවසයි.

මහ කන්නයේ කුඹුරු හෙක්ටයාර් 7,42,000ක් අස්වද්දා ඇති අතර එමගින් වී මෙට්‍රික් ටොන් මිලියන 3. 2ක අස්වැන්නක් අපේක්ෂා කරන අතර, යල කන්නයේදී වී මෙට්‍රික් ටොන් මිලි-යන 1. 8ක අස්වැන්නක් අපේක්ෂා කරන බවත් ඇමැතිවරයා පැවසීය. ඒ අනුව මහ කන්න-යේදී හා යල කන්න-යේදී වී මෙට්‍රික් ටොන් මිලියන 5ක අස්වැ-න්නක් අපේක්ෂා කරන බවද ඇමැතිව-රයා පැවසීය. පිට 06

පිට 6

රන්ජන්ට සති 2ක් අමුත්තන් හමු වීම තහනම්

පිට 6

උපවාස කළ ගොවීහු තිදෙනෙක් සූරියවැව රෝහලට

කොවිඩ් -19 ලෝක වසංගතයට වසරයි

පළාත් ඡන්දයට ශ්‍රීලනිපය ඉල්ලුම් පත් කැඳවයි

එජාපය හැර ගිය පුංචි මන්ත්‍රීන් යළි ගන්න කෘත්‍යාධිකාරියෙන් තීරණයක්

මියන්මාරයට ඇරියුම් කළේ සාමාජික රටක් නිසයි

විදේශ අමාත්‍යාංශය

පාරිසරික පනත කඩිනමින් සංශෝධනය කරන්න

කෝප් සභාපති පරිසර අමාත්‍යාංශ ලේකම්ට කියයි

අශෝක්ගෙන් CIDයට ප්‍රකාශයක්

ආණ්ඩුව මාව දඩයම් කළේ නෑ

පිට 6

මාධ්‍යවේදීන් හමුවේ කියයි

ඡායාරූපය - සමන්ත වීරසිරි

අශෝක් අබේසිංහට CIDය එන්න කියද්දී දැන් ඇඳ යට හැංගිලා

පා.ම. සහන් ප්‍රදීප්

අනුර ප්‍රේමලාල්

අශෝක් අබේසිංහ මන්ත්‍රීවරයා පාස්කු ප්‍රහාරය ගැන ජනපති, අගමැති අල්ලමින් ප්‍රකාශ නිකුත් කර තිබුණත් ඒ ගැන සොයන්න සී.අයි.ඩී. එකෙන් එන්න කියද්දි ඇඳ යට හැංගෙනවා යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් මහතා ඊයේ (11) ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව සඳහන් කෙළේ බත්තරමුල්ල නෙළුම් මාවතේ පිහිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද පැවසීය.

තරුණ තරුණියන්ගේ විශාල නැඹුරුවක් යෞවන සමාජවලට තිබෙනවා. ඒ සඳහා සෑම යෞවන සමාජයකටම , මුළු ලංකාවේම ග්‍රාම නිලධාරි වසම් 14,000 කම නාමල් රාජපක්ෂ ඇමැතිතුමා ගිහින් ඒ යෞවන සමාජ ශක්තිමත් කරන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. යෞවන සමාජවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න, ක්‍රීඩා භාණ්ඩ ලබා දෙන්න මේ වෙන කොට කටයුතු කරන්න සියලු සැලසුම් කරන්න කටයුතු කර තිබෙනවා.ඒ වගේම තරුණයන් ආර්ථික වශයෙන් ගොඩනගන්න ස්වයං රැකියාවලට ආධාර ලබා දෙන වැඩසටහන්, ව්‍යාපාර සඳහා 4% අඩු පොළියකට ලක්ෂ 10 දක්වා මුදල් ලබා දෙන වැඩ පිළිවෙළ එක පැත්තකින් ආරම්භ කර තිබෙනවා. අපි දැක්කා ගමකට ක්‍රීඩා පිට්ටනියක් යන සංකල්පය යටතේ සෑම ග්‍රාම නිලධාරී වසමකටම ක්‍රීඩා පිට්ටනියක් සකස් කරලා තරුණයන් විනය ගරුක කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර තිබෙනවා. ඒ වගේම ආසනයකට ඒ වගේ කාය වර්ධන මධ්‍යස්ථාන 5ක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ශ්‍රී ලංකා තරුණ පෙරමුණේ ශාඛා සංවිධාන සඳහා අලුතින් සමාජිකයන් එකතු කර ගන්නවා වගේම ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශාඛා සංවිධාන පිහිටවලා වෙනත් රටවල්වල ඉන්න තරුණයන්ටත් අපිත් එක්ක එකතු වෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරෙත්තු වෙනවා. ඒ නිසා මිලියන 5000 ක් වඩා වැඩි මුදලක් 2021 අය වැයින් වෙන් කරලා තිබෙනවා තරුණයන්ගේ අභිවෘද්ධිය සඳහා. අපි ඉතාමත් සතුටු වෙනවා ශ්‍රී ලංකා පොදුජන තරුණ පෙරමුණ හැටියට වැඩක් කරන්න පුළුවන් ඇමැතිවරයෙක් හැටියට නාමල් ඇමැතිවරයා කරන කාර්ය. අපේ විශ්‍රාම ගිය ක්‍රිකට් ක්‍රීඩකයෝ ආදර්ශයක් ලබා දිලා තිබෙනවා තරුණ ක්‍රිකට් ක්‍රීඩකයන්ට. ඒ නිසා අද ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න,ඒ වගේ ආසියානු ක්‍රීඩා උළෙළ, පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල ඔලිම්පික් දක්වා ගමකින් ක්‍රීඩකයන් බිහිකිරීමේ වැඩ පිළිවෙළ මේ වෙන කොට රට තුළ ක්‍රියාත්මක කරනවා.

අපි දැක්කා අශෝක අබේසිංහ මන්ත්‍රිවරයා ප්‍රකාශයක් කරනවා වීරයෙක් වගේ ගමකට ගිහිල්ලා. පාස්කු ප්‍රහාරයට අතිගරු ජනාධිපතිතුමත්, බැසිල් රාජපක්ෂ මැතිතුමත් සම්බන්ධයි කියලා. එහෙම කතා කරලා වීරයෙක් වගේ පාර්ලිමේන්තුවට ඇවිත් යන්නේ නැතිව. එනිසා එතුමාට ඉල්ලීමක් කරනවා ගම්වලට ගිහින් එක දෙයක් කියන්නත් නීතියට හයේ හැංගෙන්නත් කටයුතු කරන්න අවශ්‍ය වෙන්නේ නෑ. එතුමාට පුළුවන් ඇවිල්ලා නීතියේ ඉදිරියේ තමන්ගේ නිරදෝෂිභාවය ඔප්පු කරන්න. අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපේ මන්ත්‍රිවරු නම් අපි කිව්වොත් ඒ කිව්ව දේ කරනවා.

අසාද් සාලි හිටපු ආණ්ඩුකාරතුමා ප්‍රකාශයක් කරනවා එක රටක එක නීතියක් කියන එක කරන්න බෑ කියලා. එදා ඉඳන්ම යහපාලන ආණ්ඩුව එගොල්ලොන්ට ඕනෑ විදිහට රුකඩයක් විදිහට නටවලා ඒ අයට අවශ්‍ය දේ කර ගත්ත අන්තවාදි පක්ෂ. නමුත් අද මේ ආණ්ඩුව එහෙම නටවන්න පුළුවන් කමක් නෑ. අපි පැහැදිලිව කියනවා එක රටක් එක නීතියක් කියන වැඩපිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. අසාද් සාලිට ඕනෑ නම් තමන්ට කැමති විදිහට වෙනත් ආකාරයකට ඒ කටයුත්ත කර ගන්න පුළුවන්. හැබැයි රටේ නීතියට ගරු කරන්න එතුමාට සිද්ධ වෙනවා.

අපේ විමල් වීරවංශ මැතිතුමා ප්‍රකාශයක් කරනවා දේශපාලනයේ තක්කඩියෝ ඉන්නවා කියලා. ඇත්තටම අපි කියන්න ඕනෑ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉන්න නායකයෝ මේ රටේ ජනතාවට ආදරය කරන, පරිසරයට ආදරය කරන සංවේදි නායකයෝ කියලා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ තක්කඩියෝ නෑ. හැබැයි සමර වේලාවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ වුණු ආණ්ඩුවේ හවුල්කාර පක්ෂවල දේශපාලන තක්කඩියෝ ඉන්න පුළුවන්. එහෙට මෙහෙට රිලව් වගේ පැනලා අවසානයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කරපු වැඩපිළිවෙළ හයියෙන් ගිරියවින් කෑ ගහලා ප්‍රකාශ කරන්න පුළුවන්. එදා මේ රටේ වැඩ කොටස් බොහෝමයක් කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමත්, ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් වෙලා ඉන්න කාලේ. ඒ නිසා පැහැදිලිව කියනවා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය තුළ දේශපාලන තක්කඩියෝ නෑ. හවුල්කාර පක්ෂය තුළ සමහර විට ඔය කියන දේශපාලන තක්කඩියෙක් ඉන්න පුළුවන්.

මුස්ලිම් අන්තවාදයේ පදනම ගැන හොඳ විවරණයක් පාස්කු කොමිෂන් වාර්තාවේ පෙන්වා දී තිබෙනවා

පා.ම. අතුරලියේ රතන හිමි

අසේල කුරුළුවංශ

පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමසන් වාර්තාවේ මුස්ලිම් අන්තවාදයේ පදනම පිළිබඳ ඉතා හොඳ විවරණයක් කර තිබෙන බවත් එය ඇතැම් පිරිස් විවේචනය කරනු ලබන්නේ නිසි ලෙස අධ්‍යයනයක් කිරීමෙන් තොරව බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමියෝ පවසති.

අස්ගිරි මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතන මහනාහිමියන් බැහැදැක ඊයේ (11) ආශිර්වාද ලබා ගැනීමෙන් පසු මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් රතන හිමියෝ මේ බව ප්‍රකාශ කළහ.

ශ්‍රී දළදා මාලිගාවට ගිය උන්වහන්සේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා සමඟ සුහඳ පිළිසඳරක යෙදීමෙන් පසු මල්වතු පාර්ශ්වයේ අනුනායක පූජ්‍ය නියංගොඩ ශ්‍රී විජිතසිරි නාහිමියන්ද බැහැදැක ආශිර්වාද ලබා ගත්හ. වැඩිදුරටත් අදහස් දැක්වූ රතන හිමියෝ මෙසේද පැවසුහ.

බොදු බල සේනා සංවිධානයට නඩු පැවරිය යුතු බවට මෙම වාර්තාව මඟින් කර තිබෙන යෝජනාව පිළිගත නොහැකි. එය එම වාර්තාව හැල්ලු කිරීම සඳහා කිසිවකුගේ වුවමනාවට සැලසුම් සහගතව ඇතුළත් කළ දෙයක් බවට සැකය මතු වෙනවා. කොමිසන් සභාව මඟින් රටේ දිගු කාලීන යහපත පිණිස කර තිබෙන යෝජනා නිවැරදිව හඳුනාගෙන අප ඒවා ක්‍රියාත්මක කළ යුතුයි.

හිටපු ජනපති මෛත්‍රිපාල සිරිසේන මහතාට වගකීම් පැහැර හැරීම පිළිබඳ චෝදනා එල්ල වී ඇතත් එතුමා මෙම ප්‍රහාරය දියත් කිරීම පිණිස මුස්ලිම් අන්තවාදීන්ට උදව් කළ බවක් කිසිවකු හෝ පිළි ගන්නේ නෑ.

මෙම පාස්කු කොමිසන් වාර්තාවෙන් අප බලාපොරොත්තු විය යුත්තේ කාටද සිර දඬුවම් ලබා දෙන්නේ කියන කාරණය නොව මෙවැනි ක්‍රියා යළිත් ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග ලෙස නිර්දේශ කර තිබෙන්නේ මොනවද යන්න බවයි. එහිදී වඩා වැදගත් වන්නේ මුස්ලිම් අන්තවාදයේ උල්පත් වසා දැමීමයි.

මදුසා පාසල්,අන්තවාදී පොත්පත් හා මතවාද,ඒ සඳහා මඟ පෙන්වන විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කොමිසමේ නිර්දේශ වැදගත් වෙනවා. ඒවා පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව වාර්තාව විවේචනය කිරීම එහි අන්තර්ගතයට කරන හානියක්.

පාස්කු ප්‍රහාරය මෙහෙය වූ සහරාන් සමඟ සම්බන්ධතා පැවැත් වූ මුස්ලිම් මැති ඇමැතිවරුන්ට හා හිටපු ආණ්ඩුකාරවරුන් පිළිබඳ වාර්තාවේ යම් යම් ස්ථානවල වගන්ති තිබෙන බවත් ඒ පිළිබඳ වැඩිදුර විමර්ශන සිදුකළ යුතුව තිබුණා. සහරාන් සහ ත්‍රස්තවාදී කල්ලිවල අයට දඬුවම් දීම එක් පැත්තකින් සිදු වෙත්දී අනෙක් පසින් ඊට සම්බන්ධ සෙසු පාර්ශ්වයන් හඳුනාගෙන අවශ්‍යය ක්‍රියාමාර්ග ගැනීම අනෙක් පසින් සිදුවිය යුතුයි.

ජමෙයිතුල්ලා උලමා සංවිධානය වහබ් වාදය පිළිගන්නා බව කොමිසන් වාර්තාව මඟින් පැහැදිලිව දක්වා තිබෙනවා. එය බරපතල කාරනයක්. තනි මුස්ලිම් ඒකක වෙනුවට ග්‍රාම සේවා වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සියලු ජාතීන් මිශ්‍ර ගහනකින් පදිංචි කරවීම අන්තවාදය පිටු දැකීම සඳහා වන හොඳ පියවරක් ලෙස කොමිසම නිර්දේශ කර තිබෙනවා. ඒවා පිළිබඳ සමාජයේ අවධානය යොමුවිය යුතුයි.

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අන්තර්ජාතික පරීක්ෂණයක් සිදු කර මහ මොළකරු අල්ලා ගත යුතුයි

එජාප සභාපති වජිර අබේවර්ධන

මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

ලෝකයේ බලවත් රහස් ඔත්තු සේවාවන්ගේ සහාය ලබාගෙන පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අන්තර්ජාතික මට්ටමේ පරීක්ෂණයක් සිදු කර මෙහි මහ මොළකරු සිටී නම් අල්ලාගෙන අන්තර්ජාතික අධිකරණයෙන් එල්ලුම් ගහට නියම කළ යුතු බව එක්සත් ජාතික පක්ෂයේ සභාපති, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවසුවේ සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි. වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා මෙසේ ද පැවසීය.

අපේ ආණ්ඩුවේ අය පමණක් නොවේ. අපේ ආණ්ඩුවට කලින් දින 60ක් පමණ රට පාලනය කළේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලයයි. ඒ අතරවාරයේ රටේ ඇති වූ ප්‍රජාතන්ත්‍ර විරෝධී දේශපාලන අරගලය නිසා රටේ යම් යම් අංශ දුර්වලව පැවතුණා. එහෙනම් එම දින 60 කැබිනට් මණ්ඩලයයි, මේ කැබිනට් මණ්ඩලයයි දෙගොල්ලන්ම එල්ලුම් ගස් යවන්න ඕනෑ.

එහෙම නීතියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැහැ. දේශපාලනඥයන්ගේ නඩු අහන විදිය වෙනස්. සමහර නඩු අහන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව. දේශපාලනඥයන්ගේ විතරයි අවුරුදු පහකට නඩු අහන්නේ. රජයේ සේවක සේවිකාවන්ගේ නඩු අහන විට ආයතන සංග්‍රහය යටතේ ඔවුනට වෙන ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි දේශපාලනඥයා අවුරුදු පහකට සැරයක් ජනතා අධිකරණයට ඉදිරිපත් කරනවා. ජනතාව සමහර වේලාවට පාස් කරනවා. සමහර වේලාවට ෆේල් කරනවා. ඉතින් ජනතාව දැන් අපට දඬුවම් කරලා ඉවරයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනතාව සුප්‍රිම් නිසා ජනතා අධිකරණයෙන් නඩු අහන්නේ පස් වසරකට සැරයක්.

මේ සිදු වුණු අපරාධය සොයා බැලීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ සහයෝගයක් ලබා ගන්න ඕනෑ. එම තොරතුරු කලින් සැපයූ ඉන්දියාවේ රහස් ඔත්තු සංවිධානය ප්‍රමුඛ ලෝකයේ අන්තර්ජාතික සංවිධානවල සහාය ඇතිව එදා දිවංගත රණසිංහ ප්‍රේමදාස, ආරක්ෂක නියෝජ්‍ය ඇමැති රන්ජන් විජේරත්න දෙදෙනා පිළිබඳ ජර්මනියත් තවත් රටකුත් පරීක්ෂණ පැවැත්වූ ආකාරයට සහයෝගය ලබාගෙන මෙම සිද්ධියේ මහ මොළකරු කවුද කියලා සොයා ගන්න ඕනෑ. අනතුරුව ඔවුන්ව එල්ලුම් ගහට නියම කරන එක ශ්‍රී ලංකාවට කරන්න පුළුවන්කමක් නැහැ. එය අන්තර්ජාතික අධිකරණය ඉදිරියේ කළ යුතු ක්‍රියාවලියක්.

අධික ණය - ආදායම් බෙදී යෑමේ විෂමතාව රටේ අර්බුද ඇති වීමට හේතු වී තිබෙනවා

ජවිපෙ නායක පා.ම. අනුර කුමාර දිසානායක

නදී මාණික්කගේ

අධික ණය සහ ආදායම් බෙදී යෑමේ විෂමතාව හේතුවෙන් රටෙහි අර්බුදයක් ඇති වී තිබෙන බව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා කොළඹ නව නගර ශාලාවේදී පැවති ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයේ දී පෙරේදා (10) කියා සිටියේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද පැවසීය.

රටේ කොතරම් ධනස්කන්ධයක් නිෂ්පාදනය කළත් ආදායම් බෙදීයෑමේ විෂමතාවය නිසා අර්බුද මතු වෙනවා. ජාතික ධනය සාධාරණ ලෙස බෙදෙන්න ඕනෑ. සමාන ලෙස බෙදෙන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. අද වෙන කොට ජාතික ධනයෙන් 1.6%ක් පහළම ආදායම් ලබන ජනතාවගෙන් 10%ක් වෙත බෙදී යනවා. ඉහළම ආදායම් ලබන 10% වෙනුවෙන් ජාතික ධනයෙන් 35.8%ක් බෙදිලා යනවා. 2020දී ආර්ථික අර්බුදය කොවිඩ් වසංගතය නිසා තවත් තීව්‍ර කළා. ඒ අතර මනෝ සෙල්වනාදන් සහ හරින් සෙල්වනාදන්ට අයත් 'මුදිත්තා' කියන සමාගමේ 2019 ලාභය මිලියන 1019 වෙද්දී 2020 දී මිලියන 11,322 ක් දක්වා ලාභය අවුරුද්දක් තුළ දසගුණයකින් වැඩිවෙලා තිබෙනවා. පාරේ කොළකැඳ විකුණපු කෙනාගේ ආදායම, තැඹිලි විකුණපු කෙනාගේ ආදායම පහත වැටුණා. කම්කරු රැකියා කරපු කෙනාගේ ආදායමත් අඩු වුණා. හැබැයි මනෝ සෙල්වනාදන් සහ හරින් සෙල්වනාදන්ට අයිති සමාගමේ ලාභය දසගුණයකින් වැඩිවුණා. හනිෆ් යූසුෆ් මහත්තයාගේ 'එක්ෆෝ ලංකා' සමාගමේ 2019 මිලියන 1909ක් වූ ලාභය 2020 දී මිලියන 14,480ක් වෙනවා. එයාගේ ලාභය හත්ගුණයකින් වැඩි වෙලා. ධම්මික පෙරේරාගේ 'හේලීස්' සමාගමේ 2019දී මිලියන 2,750ක් වූ ලාභය 2020දි 10,338ක් වෙනවා.

රටේ සියලු දෙනාගේ ආදායම් අඩු වෙන කොට මේ අයගේ ලාභය විශාල වශයෙන් වැඩිවෙලා. රටේ මහා ධනයක් නිෂ්පාදනය වුණාට ඉතා කුඩා කණ්ඩායමක් අතේ සංකේන්ද්‍රණය වෙලා තිබෙනවා. අපේ ආර්ථිකයේ ප්‍රධානම අර්බුදය ජාතික ධනය සාධාරණ බෙදී නොයෑමයි.

ජනගහනයෙන් පහළම ආදායම් ලබන 70%ක් දෙනා ජාතික ආදායමෙන් ලබාගන්නා පංගුවට සමාන ප්‍රමාණයක් ඊළඟ 10%ක් දෙනා ලබා ගන්නවා. ඒතරම් විශාල ආදායම් බෙදීයෑමේ විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා ග්‍රාමීය ජනතාව විශාල දුප්පත් භාවයකට ඇදවැටිලා මිලදී ගැනීමේ හැකියාව ඉතාම අවම වෙලා තිබෙනවා. එහෙම වුණාම බිස්කට් විකිණන එක අඩු වෙනවා, පපඩම් විකිණෙන එක අඩුවෙනවා, ආදායම් බෙදීයෑමේ විෂමතාවයෙන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය කඩා වැනෙවා විතරක් නොවෙයි ආර්ථිකය අර්බුදයකට ලක් කරනවා. අපේ රටේ ආර්ථිකය මුහුණ දී තිබෙන දෙවැනි අර්බුදයි මේ.

මීට කලින් ආර්ථිකයේ ඇති වී තිබෙන අර්බුදයට හේතුව යුද්ධය කිව්වා. පාලකයෝ වේදිකාවලදී මල්ටි බැරල්වලින් ප්‍රහාර එල්ල කරන කොට යන වියදම් ගණන් හදල පෙන්නුවා. අනෙක් උණ්ඩවලට යන වියදම් හදල පෙන්නුවා. යුද්ධය අවසන් වුණාම ආර්ථිකය හදන බව කිව්වා. එහෙම නම් ජනතාව තේරුම් ගන්න ඕනෑ ආර්ථික අර්බුදයට හේතුව යුද්ධය නොවන බව. ඇත්ත ගත්තොත් යුද්ධය ජනිත කළෙත් ආර්ථික අර්බුදය විසින්මයි. තව ටික දවසකින් ආර්ථික අර්බුදයට හේතුව කෝවිඩ් බව කියන්න පටන් ගන්නවා. හැබැයි කෝවිඩ් එන්න කලිනුත් 2020 පළමු වැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය -1.7යි. දෙවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය -16.3යි. ඒ නිසා කොවිඩ් වසංගතය අපේ ආර්ථික අර්බුදය තීව්‍ර කරලා තිබෙන එක ඇත්ත, යුද්ධයෙන් ආර්ථික අර්බුදය තියුණු වූ බව ඇත්ත. හැබැයි කෝවිඩ් හෝ යුද්ධය අපේ ආර්ථික අර්බුදයේ පතුළ නොවෙයි. පතුළේ තිබෙන්නේ විශාල ණය කන්ද, ජාතික සම්පත් අත්හැරීම වගේ සාධකයි.

ආණ්ඩුවට විරුද්ධව කතා කරන අය මර්දනය කරමින් සිටිනවා

පා.ම. තුෂාර ඉඳුනිල්

පහන් විජේසේකර

ආණ්ඩුවට විරුද්ධව කතා කරන අය මර්දනය කරමින් සිටින බවත් දේශපාලන පළිගැනීම් විමර්ශන කොමිසම, විමර්ශන කොමිසමක් නොව කැකිල්ලේ රජ්ජුරුවන්ගේ කොමිසමක් යැයි සමගි බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී තුෂාර ඉඳුනිල් මහතා විපක්ෂ නායක කාර්යාලයේ දී පැවැති මාධ්‍ය හමුවේදී ඊයේ (11) පැවැසීය.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් ඒ මහතා මෙසේ ද පැවසීය.

මේ ආණ්ඩුවට කොමිසම්, ගැසට් නැතුව බැහැ. කොමිසම් පිට කොමිසම් වගේම ගැසට් පිට ගැසට්. අත්‍යවශ්‍ය භාණ්ඩ උපරිම මිලට ගැසට් එක්ක ගහුවහම එයට උඩින් තව ගැසට් එකක් ගහනවා. කොමිසමක් පත් කිරීම යනු කල්මැරීමක්. පාස්කු ප්‍රහාරයට සති දෙකෙන් ක්‍රියා මාර්ග ගන්නව කියලා මුලාකරලා කොමිසමකින් දුන්න වාර්තාව අධ්‍යයනයට තවත් කොමිසමක් පත් කරලා. එය කල්මැරීමක්.

සීනි ගෙන්වීමේදී කෝටි 1600ක වංචාවක් සිදු කිරීම ගැන මාධ්‍ය වාර්තා පළ වුණා. එය පොඩි මුදලක් නොවෙයි. බිලියන 16ක් වංචාවක්. පසුගිය කාලයේ සිදු වූ බැදුම්කර වංචාව බිලියන 12යි. එය මිලියන 12000ක්. ආණ්ඩුව පත්වෙලා මාස තුනයි ගියේ. එක ආනයනයකින් විතරක් අපේ රටට ආදායම අහිමි කළා.

අද කෝවිඩ් නිසා මිනිස්සු පීඩා විඳිනවා. ඔවුන්ට එන්නත ගන්න මුදල් නැහැ. ඉන්දියාව නොමිලේ ලබා දුන්න එන්නත තමයි තවම පාවිච්චි කරන්නේ. අපේ රටට එන්නත් ගෙන්වන්න වියදම බිලියන 10ක් අවශ්‍යයි කිව්වා. මේ සීනි වංචාවේ මුදල් ටික තිබුණා නම් අහිංසක මිනිස්සුන්ට එන්නත ලබා දෙන්න තිබුණා. අද ජනතාවට නිවෙසක් වැසිකිළියක් හදා ගන්න බැහැ. ඒ අවශ්‍ය භණ්ඩ මිල ඉහළ ගිහින් අද රෝහල්වල බෙහෙත් නැහැ. පිළිකා රෝගීන්ට අවශ්‍ය බෙහෙත් නැතුව ඔවුන් අසරණ වෙලා. අපි නොමිලේ දුන්න ඇස් කාච, ස්ටෙන්ට්, අද නැහැ. මේවා ගැන කතා කළාම තමයි අපිට කොමිසම් දාලා පළිගැනීම් කරන්නේ. සීනි විතරක් නොවෙයි පොල් තෙල් වංචා, ගල් අඟුරු වංචා, ටයිල් වංචා සිදු වුණා.

පිටරට සිටින අය ගෙන්වන්න ක්‍රමවේදයක් නැහැ. ඒ අයගේ ගුවන් ටිකට්පත් ගන්න මුදල් නැහැ. මේ ගැන කතා කරන්න වේදිකා නැහැ. පාර්ලිමේන්තුවේ කාලය අඩු කරලා.

ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රශ්නයට මානව හිමිකම් පෙරදැරි කරගත් විසඳුමක් ඕනෑ

සී.වී. විග්නේශ්වරන්

උතුරු පළාත් විශේෂ

ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රශ්නයට දිය යුත්තේ දේශපාලනමය විසඳුමකට වඩා මානව හිමිකම් පෙරදැරි කරගත් විසඳුමක් බව දෙමළ ජාතික පෙරමුණේ නායක සී.වී. විග්නේශ්වරන් මහතා නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කරයි.

විග්නේශ්වරන් මන්ත්‍රීවරයා සඳහන් කරන්නේ ජිනීවා මානව හිමිකම් මණ්ඩලය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරණු ලබන යෝජනා හා නිර්දේශ සිංහල හා දෙමළ භාෂාවෙන් ජනතාව අතර බෙදා දෙන ක්‍රමයක්ද ආරම්භ විය යුතු බවයි.

එක්සත් ජාතින්ගේ මානව හිමිකම් මණ්ඩලය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඇති යෝජනා සලකා බැලීමේදී දෙමළ ජනයාට ඔවුන්ගේ ඉඩම් ආගමික ස්ථාන සාම්ප්‍රදායික ජීවන රටාවන් උපන් ස්ථාන කෙතෙක් දුරට අහිමි වී ගොස් ඇත්දැයි නිරීක්ෂණය කිරීම වඩා වැදගත් බව පවසන විග්නේශ්වරන් මන්ත්‍රීවරයා තමන් ඒ පිළිබඳ මානව හිමිකම් මණ්ඩලයට ඉල්ලීමක් කොට තිබෙනවා.

දෙමළ ජනයා සම්බන්ධයෙන් සලකා බලන විට ඔවුන්ගේ මානව හිමිකම් උල්ලංඝණය වීම් දිනෙන් දින ඉහළ යද්දී ජාත්‍යන්තරය උත්සහ කරන්නේ ශ්‍රී ලංකාවට දේශපාලන විසඳුමක් ලබා දීමට වුවත් එය ප්‍රායෝගික වන්නේ නෑ.

මේ නිසා මුළු ලෝකයම මේ අවස්ථාවේදී උත්සහ කළ යුත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මානව හිමිකම් දෙස ඉතා වුවමනාවෙන් සොයා බලා ඊට ගැළපෙන විසඳුම් ලබා දීම බව ද ඔහු වැඩිදුරටත් සඳහන් කොට තිබේ.

සමහර දේශපාලන පක්ෂ දමිළ ජනතාව අවුස්සන ආකාරයට කටයුතු කරනවා

ඊපීඩීපී නායක, ඇමැති ඩග්ලස් දේවානන්දා

සමහර දේශපාලන පක්ෂ දමිළ ජනතාව අවුස්සන ආකාරයට කටයුතු කරන්නේ දමිළ ජනතාවගේ ඡන්දය ලබා ගැනීමට බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා පවසයි.

වවුනියාවේ පැවැති ඊ.පී.ඩී.පී. පක්ෂ සාමාජිකයන්ගේ හමුවකින් අනතුරුව මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙමින් ඇමැතිවරයා මෙම අදහස් පළ කෙළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවසීය. පළාත් සභා ක්‍රමය පිළිබඳ මේ අය විවිධ මත පතුරුවනවා. ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරුන් තුළ යම් යම් පෞද්ගලික මත මේ ගැන ඉදිරිපත් වෙනවා නමුත් ආණ්ඩුව පළාත් සභා ක්‍රමය පිළිබඳ කිසිදු තීන්දුවක් මේ දක්වා ගෙන නෑ. වර්තමානයේ සමහර දේශපාලන පක්ෂ දමිළ ජනතාව අවුස්සන ආකාරයට කටයුතු කරනවා. දමිළ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් නොලැබෙන තාක් ජනතාව මුලා කරමින් බලයට පැමිණිය හැකි. අතීතයෙත් මා දෙමළ ජනතාවගේ ආවේග ශීලි හැඟීම්වලට අනුව ක්‍රියා නොකර නිවැරදි මාර්ග පෙන්වා දුන්නත් එය බහුතර දමිළ ජනයා පිළිගත්තේ නැහැ. වර්තමානය වන විට අපි යන මාර්ගය නිවැරදි යැයි ජනතාවට අවබෝධ වෙමින් තිබෙනවා.

මෑතකදී ඉන්දීය ධීවරයන් පිරිසක් ශ්‍රී ලංකා මුහුදු තීරයේ දී මිය යෑමේ සිද්ධියේ ගැන නාවික හමුදාවට චෝදනා කළා.

රටට විදේශ ආයෝජන අවශ්‍යයි. දුපත් ප්‍රදේශවල ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාරයෙන් දියත් කරන සෝලා විදුලිබල ව්‍යාපෘතියක් චීන සමාගමට පවරා තිබීම අහම්බෙන් සිදු වූ දෙයක්. ඉන්දියාවත් එයට ඉදිරිපත් වී සිටියා. එම ටෙන්ඩරය තීන්දු කළේ අපගේ ආණ්ඩුව නොවෙයි. ආසියානු සංවර්ධන බැංකුවයි. නමුත් භූගෝලීය දේශපාලනය නිසා මේ වන විට එම ව්‍යාපෘතිය නවතා තිබෙනවා.

පාස්කු දින ප්‍රහාරයට වගකිව යුතු සියලු දෙනාට එරෙහිව නීතිය කඩිනමින්

නීතිපති අගරදගුරු හිමි හමුවේ කියයි

නීතිඥවරුන් 12කට කණ්ඩායමකුත් පත් කරලා:

රෝෂන් තුෂාර

පාස්කු ඉරිදා ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකළ පාර්ශ්වවලට පමණක් නොව ප්‍රහාරය පසුපස සිටින මහ මොළකරුවන්ට, කුමන්ත්‍රණකරුවන්ට හා ආධාර අනුබල දුන් පුද්ගලයන් ඇතුළු සියලු පාර්ශ්වයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව නීතිපති දප්පුල ද ලිවේරා මහතා කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් හිමිපාණන් හමුවේ පැවසීය.

පසුගිය 08 වැනිදින නීතිපතිවරයා හා අගරදගුරුතුමා අතර පැවති හමුවේදී මේ සඵත කිරීම සිදු වූ බව නීතිපති සම්බන්ධීකාරක අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය දිනමිණට පැවසුවාය.

2019 අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් අධි චෝදනා ගොනු කිරීමට පෙර පාස්කුදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජනාධිපති කොමිසම නිකුත් කළ අවසන් වාර්තාව හා සාක්ෂි සටහන් ඇතුළු සියලුම වාර්තා සලකා බැලීමේ වැදගත්කම පෙන්වා දී ඇති නීතිපතිවරයා අධිචෝදනා ගොනු කිරීමට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන අවසන් වී තිබීම යන කරුණු සම්පූර්ණ විය යුතු යැයිද පවසා ඇත.

ජනාධිපති කාර්යාලයෙන් දුන් පාස්කු කොමිසමේ අවසන් වාර්තාව මගින් පාස්කුදා ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකළ පාර්ශ්ව කෙරෙහි අවධානය යොමුව ඇති බැවින් ඊට අදාළ සෙසු කුමන්ත්‍රණකරුවන්, ආධාර අනුබල දුන් පුද්ගලයන් හා මහමොළකරුවන් හඳුනාගැනීමට කොමිසමේ සියලු වාර්තා හා සාක්ෂි සටහන් ලබාගැනීම ඇතුළු නඩුවල වත්මන් වාතාවරණය රදගුරු හිමියන් සමඟ දීර්ඝව සාකච්ඡා කර ඇති නීතිපතිවරයා විමර්ශනවල වත්මන් තත්ත්වය පිළිබඳවද සාකච්ඡා කර ඇත.

පාස්කු ඉරිදා ප්‍රහාරයේ වගකිවයුත්තන්ට දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන් 12කගෙන් යුත් කණ්ඩායමක් පත්කර ඇති බවට රදගුරු හිමියන්ට කරුණු පැහැදිලි කළ නීතිපතිවරයා සියලුම සාක්ෂි අධ්‍යයනය කිරීමේ වැදගත්කමද සාකච්ඡා කළ බව ජයරත්න මෙණෙවිය පැවසුවාය.

කේරළ ගංජා කිලෝ 141ක් සැකකරුවන් සමඟ යාපනයේදී දැලේ

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

යාපනයේ එලුවතීව් දූපතේදී කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 141ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු නාවික හමුදාව විසින් පෙරේදා (10) අත්අඩංගුවට ගෙන තිබේ.

මේ කේරළ ගංජා තොගය ඉන්දියාවේ සිට රැගෙන විත් ගොඩබිම කරා ගෙන එමින් තිබියදී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඇත. අදාළ කේරළ ගංජා තොගය හා සැකකරුවන් වැඩිදුර පරීක්ෂණයට යාපනය කයිට්ස් පොලීසිය වෙත බාර දී තිබේ.

මිලියන 26ක වියළි මුහුදු කුඩැල්ලන් කිලෝ 1189ක් සැකකරුවන් 4ක් සමඟ අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

නීති විරෝධීව මුහුදු මාර්ගයෙන් මෙරටට ගෙන ඒමට උත්සාහ කළ රුපියල් මිලියන 26කට අධික වටිනාකමින් යුත් වියළි මුහුදු කුඩැල්ලන් කිලෝග්‍රෑම් 1189කට අධික ප්‍රමාණයක් සමඟ සැකකරුවන් සිව් දෙනෙකු ශ්‍රී ලංකා නාවික හමුදාව තලෛයිමන්නාරමට ආසන්න මුහුදු තීරයේ පසුගියදා (09) සිදුකළ විශේෂ සෝදිසි මෙහෙයුමක් නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කර තිබේ.

මුහුදු මාර්ග ඔස්සේ සිදු කරන නීති විරෝධී ජාවාරම් මැඩපැවැත්වීමට ශ්‍රී ලංකා නාවික හමුදාව නිරන්තර මෙහෙයුම් සිදු කරනු ලබයි. ඒ අනුව, උතුරු මැද නාවික විධානය මගින් මාර්තු 09 වැනි දින තලෛයිමන්නාරමට ආසන්න මුහුදු තීරයේ සිදුකළ මේ විශේෂ සෝදිසි මෙහෙයුමේදී සැකකටයුතු ඩිංගි යාත්‍රා දෙකක් පරීක්ෂාවට ලක් කර එම ඩිංගි යාත්‍රාවල තිබූ උර 24 ක අසුරන ලද වියළි මුහුදු කුඩැල්ලන් කිලෝ 1189 ග්‍රෑම් 83 ක පමණ ප්‍රමාණයක්, සැකකරුවන් සිව් දෙනෙක් සහ ඩිංගි යාත්‍රා නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කර තිබේ.

මෙහිදී නාවික හමුදා භාරයට ගත් වියළි මුහුදු කුඩැල්ලන් තොගයේ වෙළෙඳපොළ වටිනාකම රුපියල් මිලියන 26කට අධික වෙතැයි විශ්වාස කෙරේ.

කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමට ලබාදී ඇති සෞඛ්‍ය උපදෙස් හා ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කරන ලද මේ මෙහෙයුමෙන් නාවික හමුදා භාරයට ගත් සැකකරුවන් වයස අවුරුදු 38ත් 58ත් අතර වයසේ පසුවන කල්පිටිය, සිලාවතුර සහ නානට්ටාන් ප්‍රදේශයන්හි පදිංචිකරුවන් බවට හඳුනාගෙන ඇති අතර, එම සැකකරුවන් දින 14ක කාලයක් නිරෝධායන කිරීමට මන්නාරම මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත භාරදීමට කටයුතු කරන ලදී. නාවික හමුදා භාරයට ගන්නා ලද වියළි මුහුදු කුඩැල්ලන් තොගය සහ ඩිංගි යාත්‍රා ඉදිරි නීතිමය කටයුතුවලට මන්නාරම සහකාර ධීවර පරීක්ෂක කාර්යාලය වෙත භාර දී ඇති අතර, නිරෝධායනයෙන් පසු සැකකරුවන්ද නීතිමය කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

ගාල්ලේ පාසල් සිසුන් 16කට ගුරුවරුන් දෙදෙනකුට කොවිඩ්

ගාල්ල ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ

ගාල්ල දිසා සමූහ

ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් 16කට හා ගුරුවරුන් දෙදෙනකුට කොවිඩ් වයිරසය ආසාදනය වී ඇතැයි ගාල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය වෙනුර.කේ.සිංගාරච්චි මහතා පවසයි. මෙකී කාලයේ ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 11කට අයත් සිසු දරු දැරියන් 16කට හා ගුරුවරුන් 02කට කොරෝනා වයිරසය ආසාදනය වී ඇත. කොරෝනා වයිරසය ආසාදනය වූ පාසල් දරු දැරියන් ගෝනාපිනුවල, හික්කඩුව, ඉඳුරුව, ගාල්ල නගර සභාව, උඩුගම හා යක්කලමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවල පදිංචිකරුවෝ වෙති.

කොරෝනා වයිරසය ආසාදනය වූ පාසල් දරුවන් තිදෙනකුට ආරච්චිකන්ද හා කරන්දෙණිය නිරෝධායන මධ්‍යස්ථානවල සිට සා:පෙළ: විභාගයට පෙනී සිටීමට අවස්ථාව සලසා දුන් බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා පවසයි. මේ අතර ජනවාරි මස 21 වැනි දින සිට මාර්තු මස 09 වැනි දින දක්වා අතර කාලයේදී ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 77ක දරුවන් 163ක් හා ගුරුවරුන් 08කට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා පවසයි. මෙකී අයගේ පළමු පෙළ ආශ්‍රිතයන් 293ක් සිටින බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

උපදේශක බලපත් නැති රියැදුරු පුහුණු පාසල් දැන් මේ රටේ ඕනෑ තරම්

සමස්ත ලංකා රියැදුරු පාසල් හිමියන්ගේ ජාතික සංගමයේ සභාපති

අසේල කුරුළුවංශ

රියැදුරු පුහුණු උපදේශක බලපත්‍රය නොමැතිව රියැදුරුන් පුහුණු කරන රියැදුරු පාසල් රැසක් මෙරට තිබෙන බව සමස්ත ලංකා රියැදුරු පාසල් හිමියන්ගේ ජාතික සංගමයේ සභාපති එම්.ඩී සෝමසිරි මහතා පවසයි.

නීත්‍යනුකූල රියැදුරු පාසලක බලපත්‍රය වසර දෙකින් දෙකට අලුත් කළයුතු බවත් වසර 70 ඉක්මවූ පසු රියැදුරු පුහුණු උපදේශක බලපත්‍රය අවලංගු වන නිසා බොහෝ රියැදුරු පාසල්වලට නීත්‍යානුකූල පුහුණු උපදේශකයන් නැතිව පාසල් පවත්වාගෙන යෑමට සිදුව තිබෙන බවත් ඒ මහතා කීය.

එම සංගමයේ පළමු විධායක සභා රැස්වීම ඊයේ (11) මහනුවර සේනානි හෝටලයේදී පැවැති අවස්ථාවේ සෝමසිරි මහතා මේ බව ප්‍රකාශ කළේය.

රියැදුරු පුහුණු උපදේශකයන් බඳවා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් විභාගයක් පැවැත්විය යුතු බවත් එම විභාගය වසර ගණනාවකින් පවත්වා නැති බැවින් රියැදුරු පාසල් බොහොමයක් උපදේශකයන් නැතිකමින් වැසී ගොස් තිබෙන බවත් හෙතෙම අවධාරණය කළේය.

රියැදුරු පුහුණුව අවසන් කර රියැදුරු බලපත්‍රය ලබා ගැනීමට පවත්වන පරීක්ෂණයට සම්බන්ධ වන ඇතැම් මෝටර් රථ පරීක්ෂකවරුන්ට මුදල් ලබාදීමට රියැදුරු පාසල් හිමියන්ට සිදුවන බවත් එය තමන් නොව ජනපතිතුමාද වරක් ප්‍රකාශ කළ බවත් ඒ මහතා කීය.

මේ අයට ලබාදීමට සිදුවන මුදල රියැදුරු පාසල් හිමියන්ට දැරීමට නොහැකි බැවින් එම මුදලද අය කිරීමට සිදුව තිබෙන්නේ පුහුණුව ලබන අයගෙන්යැයිද සභාපතිවරයා පැවසීය.

මෙරට රියැදුරු පුහුණු පාසල් 1200 ක් පමණ තිබූ බවත් උපදේශක හිඟය නිසා මේ වන විට නීත්‍යනුකූල රියැදුරු පාසල් තිබෙන්නේ 600ක් පමණ බවත් සෝමසිරි මහතා පැවසීය.

මේ අවස්ථාවට සංගමයේ ලේකම් කේ.එස් ජයසේකර මහතාද සහභාගි විය.

ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත

• *එක රටකට එක නීතියක් පිළිගන්නෙ නෑ කියල අසාද් සාලි කියනව සර් !*

• *මෑන් දන්නෙ නැතුව ඇති බං, ප්‍රහාකරන්ටත් බය ලෙඩේම තිබිල හොඳ කළා කියල !*

'මාවා' නමැති මත්ද්‍රව්‍ය කිලෝ 09ක් සමඟ සැකකරුවෙක් අසු වෙයි

රක්ෂණ ශ්‍රියන්ත

මාවා නැමැති මත්ද්‍රව්‍ය කිලෝ 09 ග්‍රෑම් 350ක් සමඟ සැකකරුවකු වැල්ලම්පිටිය පොලිස් වසමේ මීතොටමුල්ල ප්‍රදේශයේදී පෙරේදා (10) පොලිස් විශේෂ කාර්ය බළකායේ මෙහෙයුම් අංශ 01හි නිලධාරීන් පිරිසක් විසින් සිදුකළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරු නඩු භාණ්ඩ සමඟ වැඩිදුර විමර්ශන කටයුතුවලට වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට භාරදී තිබේ. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු සිදුකරයි.

අද නැත්ත

අකුරණ කෙනකු කී කරුණක් කනට ඇහී
සිත් වෙයි යළිත් ඒ ගැන කරනුවට සිහී
කවුරුද? හැදුවෙ! පල්ලියෙ වල් කපන පිහී
විමසමු! ත්‍රස්ත කල්ලිය කළ අයුරු බිහී!

අතිගරු කාදිනල් උතුමන් කියන ලෙස
තවමත් නොමැත! යොමු වී නිසි තැනට ඇස
ලොවටම ඇහෙන විලසට ගැසූ නමුදු කස
හැංගී බැන්ද වෙස් නැටුමේ නොමැත රස!

රටේමුල්ලේ මුදන්නායක

කාලගුණයෙන් ප්‍රබල අකුණු ගැන අවවාදාත්මක නිවේදනයක්

ප්‍රබල අකුණු පිළිබඳ අවවාදාත්මක නිවේදනයක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේ.

ඒ අනුව මධ්‍යම,සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් තැනින් තැන ගිඟුරුම් සහිත වැසි සමඟ ප්‍රබල අකුණු ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී. එම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී 75 ඉක්ම වූ තදවැසි ඇති වේ.

බියගම කම්හල් සේවකයන් 29කට කොවිඩ් ආසාදිතයි

බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක

බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ පිහිටි කර්මාන්ත ශාලාවල සේවකයන් 29ක් කොවිඩ්-19 වයිරසය ආසාදිතයන් ලෙස ඉකුත් දින තුනේ වාර්තා වී ඇති බව බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් පෙරේරා මහතා පැවසීය.බියගම නිදහස් වෙළෙඳ කලාපය හා බියගම පට්ටිවිල සහ සපුගස්කන්ද ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවල සේවකයන් 29ක් මෙසේ ආසාදිත වූ බවට තහවුරු වී තිබේ.සපුගස්කන්ද ප්‍රදේශයේ ප්‍රධානම ආයතනයක නඩත්තු කටයුතු කරන සේවක කණ්ඩායමක සේවකයන් 15ක් ඊයේ (11) කොවිඩ්-19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වී ඇත.

ගීතාධාන්‍ය

අමාරු කාලයක්ය අප දැන් කරන්නෙ පාස්
පාඩුයි මේ කාලෙදි කාටත් ගණනින් දාස්
අමුවෙන් කත හැකි දේවල් හොයමු යොමා දෑස්
නොඛලා ඉන්නයැ ගෑසුත් පෙන්නුවොතින් ගෑස්

යාපනය විශ්ව විද්‍යාලයේ සියලු අංශ විෂබීජහරණයට

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

යාපනය විශ්වවිද්‍යාලයේ විනය නිලධාරියකු කොරෝනා ආසාදිතයකු බවට නිගමනය වීමත් සමඟම විශ්ව විද්‍යාලයේ සියලුම අංශ පෙරේදා (10) විෂබීජහරණයට ලක් කොට ඇති අතර එම නිලධාරියා සමඟ රැස්වීම් කීපයකට සහභාගි වූ 32ක් නිරෝධායනයට යොමු කළ බව යාපනයේ නල්ලූර් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා පැවසීය.

විභාගවලට සහභාගි වන සිසුන් විශාල පිරිසක් මේ දිනවල විශ්ව විද්‍යාගයට පැමිණීම නිසා විශ්ව විද්‍යාලයේ සියලුම අංශ සෞඛ්‍යාරක්ෂිත කලාපයක් බවට පත් කිරීමට පියවර ගෙන ඇති බවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා පැවසීය.

මේ අතර පෙරේදා(10) කොරෝනා රෝගය වැළඳුණු පුද්ගලයන් 11ක් යාපනයෙන් හමු වූ බව උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කරයි.

ඔවුන් අතර යාපනයේ බැංකුවක නිලධාරියකු හා ගුරුවරුන් දෙදෙනකු වෙයි.

යාපනය උඩුවිල් ප්‍රදේශයේ සිටි කාන්තාවක් කොළඹදී කොරෝනා රෝගයෙන් මියයෑමත් සමඟම එම කාන්තාවගේ පවුලේ ඥාතීන් ඇතුළු විශාල පිරිසක් නිරෝධායනයට ලක් කොට ඇති බවත් උඩුවිල් ගම්මානයේ වැසියන් 213ක් පී.සී.ආර්.පරීක්ෂණවලට යොමු කොට ඇති බවත් උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කළේය.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මාර්තු 12 සිකුරාදා

අන්තවාදී පිළිකාවට බෙහෙත් ඕනෑ!

හිටපු ජනාධිපතිවරයා කුමන මතයක් පළ කළ ද හිටපු අගමැතිවරයා කුමන මතයක් පළ කළ ද පාස්කු ඉරිදා ප්‍රහාරයට යහපාලන ආණ්ඩුව වගකිව යුතුය යන්න අහෝසි වන්නේ නැත. අමාත්‍ය සරත් වීරසේකර මහතා පෙරේදා පාර්ලිමේන්තුවේදී කළ කථාවෙන් ද ඒ බව තවදුරටත් සනාථ වෙයි. සරත් වීරසේකර මහතා පාස්කු ප්‍රහාරයට පෙර වූ සංසිද්ධි කිහිපයක් ගෙනහැර දක්වමින් පෙන්වා දුන්නේ එම සිදුවීම් විශ්ලේෂණය කොට ජාතික ආරක්ෂාව තහවුරු කළේ නම්, ප්‍රහාරය වළක්වා ගැනීමට ඉඩ තිබූ බවය. ඉහත සිදුවීම් පෙන්වා දී තිබුණේ අන්තවාදී සංවිධානයක් ප්‍රහාරයකට සූදානම් වන බවය. එහෙත් රාජ්‍ය නායකයන් හෝ ආරක්ෂක ප්‍රධානීන් හෝ ඒවා සැලකිල්ලට ගෙන ක්‍රියා කර නැත.

2018 පෙබරවාරියේ දී ප්‍රහාර කිහිපයක් සිදු වී ඇත. ජාතික පෙරමුණේ සාමාජිකයකුගේ නිවෙසකට බෝම්බ ගැසීම, කාත්තන්කුඩියේ කාර්යාලයකට පහරදීම ඒ අතර පවතී. තවත් මාස කිහිපයකදී මඩකලපුවේ දී පුපුරන ද්‍රව්‍ය තොගයක් සොයා ගනී. ඉන් පසු වවනතිවිහි පොලිස් නිලධාරීන් දෙදෙනකු ඝාතනය කැරේ. ඊටත් පසු මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීම සිදු වේ. ඊටත් පසු වනාතවිල්ලුවෙන් පුපුරන ද්‍රව්‍ය තොගයක් සොයා ගනී. 2019 මාර්තුවේ දී රජයේ ඔත්තුකරුවකු වෙඩි තබා ඝාතනය කැරේ. 2019 අප්‍රේල් 16 දා නාලංකුඩා ප්‍රදේශයේ දී ප්‍රහාරයට අදාළ පූර්ව අත්හදා බැලීම් සිදු කර ඇත. මේවා විශ්ලේෂණය කොට ඉදිරි පියවර ගැනීමට යහපාලන ආණ්ඩුව උත්සුක වී නැත.

යහපාලන ආණ්ඩු සමය තුළ ජාතික ආරක්ෂාව පිරිහුණු බව ද බුද්ධි අංශ දුර්වල වූ බව ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලනීකරණයට ලක් වූ බව ද පිළිගත් කාරණයකි. තත්ත්වය කුමක් වුව රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය නායකයා වගකිව යුතුය. ආරක්ෂක අංශවල ප්‍රධානියා ලෙස ද සේනාධිනායකයා ලෙස ද ක්‍රියා කරන්නේ ජනාධිපතිවරයාය. ඒ අනුව ජාතික ආරක්ෂාවේ යම් ඇද වැටීමක් වුව හොත් ජනාධිපතිවරයා ඊට වගකිව යුතුය. ආරක්ෂක මණ්ඩලයට පත්ව සිටින අය ද එම වගකීමෙහි කොටස්කරුවෝ වෙති. එදා පැවැති තත්ත්වය නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ ආරක්ෂක මණ්ඩලය නිසි අයුරින් පවත්වාගෙන ගොස් නැති බවකි. ආණ්ඩුවේ නායකයන් සංහිඳියාව කෙරෙහි වැඩි නැඹුරුවකින් ක්‍රියා කර ඇති බව ද පෙනෙයි.

ආගමික අන්තවාදය රට තුළ පැළපදියම් වී ඇත්තේ සැලකිය යුතු කාලයක සිට බව පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පෙන්වා දෙයි. මේ සංවිධානවල ව්‍යුහය ගත් කල කොටස් කිහිපයකින් සමන්විත බව හෙළිදරවු වී ඇත. දේශීය ව්‍යාපාරිකයන්ගේ සහයෝගය මෙන්ම විදේශීය ධනවතුන්ගේ සහයෝගය ද ඊට ලැබී ඇත. සංවිධානයේ න්‍යායාත්මක පදනම හා පුහුණු වීම් සම්බන්ධ වන්නේ අයි. එස්.අයි.එස්. අන්තර්ජාතික ත්‍රස්ත ජාලයටය. මේවා පිළිබඳ සොයා ගනී. ඉන් පසු වවනතිවිහි පොලිස් නිලධාරීන් දෙදෙනකු ඝාතනය කැරේ. ඊටත් පසු මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීම සිදු වේ. ඊටත් පසු වනාතවිල්ලුවෙන් පුපුරන ද්‍රව්‍ය තොගයක් සොයා ගනී. 2019 මාර්තුවේ දී රජයේ ඔත්තුකරුවකු වෙඩි තබා ඝාතනය කැරේ. 2019 අප්‍රේල් 16 දා නාලංකුඩා ප්‍රදේශයේ දී ප්‍රහාරයට අදාළ පූර්ව අත්හදා බැලීම් සිදු කර ඇත. මේවා විශ්ලේෂණය කොට ඉදිරි පියවර ගැනීමට යහපාලන ආණ්ඩුව උත්සුක වී නැත.

යහපාලන ආණ්ඩු සමය තුළ ජාතික ආරක්ෂාව පිරිහුණු බව ද බුද්ධි අංශ දුර්වල වූ බව ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලනීකරණයට ලක් වූ බව ද පිළිගත් කාරණයකි. තත්ත්වය කුමක් වුව රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය නායකයා වගකිව යුතුය. ආරක්ෂක අංශවල ප්‍රධානියා ලෙස ද සේනාධිනායකයා ලෙස ද ක්‍රියා කරන්නේ ජනාධිපතිවරයාය. ඒ අනුව ජාතික ආරක්ෂාවේ යම් ඇද වැටීමක් වුව හොත් ජනාධිපතිවරයා ඊට වගකිව යුතුය. ආරක්ෂක මණ්ඩලයට පත්ව සිටින අය ද එම වගකීමෙහි කොටස්කරුවෝ වෙති. එදා පැවැති තත්ත්වය නිරීක්ෂණය කරන විට පෙනී යන්නේ ආරක්ෂක මණ්ඩලය නිසි අයුරින් පවත්වාගෙන ගොස් නැති බවකි. ආණ්ඩුවේ නායකයන් සංහිඳියාව කෙරෙහි වැඩි නැඹුරුවකින් ක්‍රියා කර ඇති බව ද පෙනෙයි.

ආගමික අන්තවාදය රට තුළ පැළපදියම් වී ඇත්තේ සැලකිය යුතු කාලයක සිට බව පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පෙන්වා දෙයි. මේ සංවිධානවල ව්‍යුහය ගත් කල කොටස් කිහිපයකින් සමන්විත බව හෙළිදරවු වී ඇත. දේශීය ව්‍යාපාරිකයන්ගේ සහයෝගය මෙන්ම විදේශීය ධනවතුන්ගේ සහයෝගය ද ඊට ලැබී ඇත. සංවිධානයේ න්‍යායාත්මක පදනම හා පුහුණු වීම් සම්බන්ධ වන්නේ අයි. එස්.අයි.එස්. අන්තර්ජාතික ත්‍රස්ත ජාලයටය. මේවා පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමට නම්, බුද්ධි අංශ ශක්තිමත් විය යුතුය. යහපාලන ආණ්ඩුව බුද්ධි නිලධාරීන් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමක නිරතව සිටියේය. ඒ අනුව බුද්ධි සේවා දුර්වල වීම පුදුමයක් නොවේ.

වවනතිවිහි පොලිස් නිලධාරීන් දෙදෙනකු අමානුෂික ලෙස ඝාතනය කිරීම රටේ ආන්දෝලනාත්මක සිදුවීමක් වුව ද එය ගැඹුරින් විශ්ලේෂණයකොට සැබෑ තොරතුරු සොයා ගැනීමට රජය උනන්දුවක් දක්වා නැත. එය සාමාන්‍ය සිදුවීමක් හැටියට යට ගියේය. මේ වන විට මැදවච්චිය, මල්වාන, ලේවැල්ල, හම්බන්තොට, නුවරඑළිය, හිඟුල ආදි ප්‍රදේශවල අන්තවාදීන්ගේ පුහුණු කඳවුරු පවත්වා ඇත. එම කඳවුරු ඔස්සේ මරාගෙන මැරෙන කාන්තා සෙබළියන් දාහත්දෙනකු පුහුණුව ලබා ඇති බව ද හෙළිදරවු වී ඇත. ඒ මරාගෙන මැරෙන පිරිමි අන්තවාදීන්ට අමතරවය. එදා ආණ්ඩුව යටතේ බුද්ධි අංශ ශක්තිමත්ව පැවතියේ නම් සියලු තොරතුරු අනාවරණය කරගෙන පාස්කු ප්‍රහාරය ද වළක්වා ගැනීමට ඉඩ තිබිණි.

පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ කරුණු සොයා බැලූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් ඉතා වැදගත් තොරතුරු රැසක් හෙළිදරවු කර තිබේ. එම වාර්තාව සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් වූයේ ඒ පිළිබඳ නිසි විචාරයකින් තොරව බව පෙනී යයි. එය ගැඹුරින් අධ්‍යයනය කළ යුතු වාර්තාවකි. උඩින් - මත්තෙන් එහි අදහස උපුටා දක්වමින් සමස්ත වාර්තාව විවේචනය කිරීම වැරැද්දකි. කතෝලික රදගුරු සමුළුව වාර්තාව ගැඹුරින් අධ්‍යයනය කොට එහි දක්වා ඇති කරුණු හා නිර්දේශ පිළිගන්නා බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කර ඇත. එය මේ මොහොතේ සිදු වී ඇති වැදගත් සංසිද්ධියක් ලෙස සැලකිය හැකිය. රදගුරු සමුළුවේ ඉල්ලීම වන්නේ වාර්තාවේ නිර්දේශ වහාම ක්‍රියාත්මක කිරීම සිදු විය යුතු බවය.

වත්මන් ආණ්ඩුව පාස්කු ප්‍රහාරය හොඳින් විශ්ලේෂණය කොට ඉදිරි පියවර ගෙන ඇති බව පැහැදිලිය. බුද්ධි අංශ ශක්තිමත් කිරීම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලන බලපෑම්වලින් නිදහස් කිරීම හා ත්‍රස්ත මර්දන හා විමර්ශන ඒකකය යථාවත් කිරීම මේ වන විටත් සිදු වී ඇත. ප්‍රහාරයට සෘජුව හා වක්‍රව සම්බන්ධ වූ චූදිතයන් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කර තිබේ. පිරිසක් අත්අඩංගුවේ පසු වන අතර, තව පිරිසක් ඇප පිට නිදහස් වී ඇත. ඇප පිට නිදහස් වී ඇති පිරිස ගැන ද නිරන්තර අවධානයකින් පසු වන බව අමාත්‍ය සරත් වීරසේකර මහතා පෙන්වා දී ඇත. අන්තවාදයට සම්බන්ධ සංවිධාන හා අන්තවාදය උගන්වන පාසල් තහනම් කිරීමට පියවර ගන්නා බව ද අමාත්‍යවරයා කියයි.

ආණ්ඩුවකට ජාතික ආරක්ෂාව පිළිබඳ බරපතළ හැඟීමක් තිබිය යුතුය. බටහිර රටවල් පෙන්වා දෙන අන්දමට සංහිඳියාවෙන් පමණක් ජාතික සමගිය ගොඩනැගිය නොහැකිය. ඉස්ලාම් අන්තවාදය යනු පිළිකාවක් යැයි කියයි. ඊට බෙහෙත් කළ යුතුය. පිළිකාව ඉබේ සුව වන්නේ නැත.

දිල්රුගෙ සීරීද

දැන් රට පුරා ඉන්නා බව මාල හොරු
පවසයි පොලීසිය තොරතුර නොවෙයි බොරු
දහඩිය ගලාගෙන හැලුණත් දවස් වරු
වෙහෙසී මුදල් ඉපැයුම කටයුතුයි ගරු

අධිකරණයේ ඩිජිටල් හැරවුම

මෙරට අධිකරණ පද්ධතියේ ක්‍රියාවලිය ප්‍රමාදය හේතුවෙන් බොහෝ විත්තිකරුවන් වරදකරුවන් ද නොවී, නිවැරදිකරුවන් ද නොවී, රක්ෂිත බන්ධනාගාර තුළ ම වියපත් වීම ඛේදනීය තත්ත්වයකි. උසාවියෙන් වැඩියෙන්ම ලැබෙන්නේ වෙන කිසිවක් නොව නඩු දිනයි. දිනෙන් දින කල් යන ඇතැම් නඩු පෙරකදෝරුවාගේ මඩිය තර වන, සේවාදායකයා හිඟන්නකු කරවන පලහිලව්වකි. නඩුව ගොනු කළ තැනැත්තා මියගිය පසුත් ඔහුගේ දූ පුතුන් ද මහලු වන තුරු පවත්වාගෙන යන ඉඩම් නඩු හා වෙනත් නඩු කොතෙකුත් ඇත.

අධිකරණ පද්ධතියට සැබෑ වෙනසක, නව ක්‍රමවේදයක අවශ්‍යතාව ඇති වී තිබුණේ දීර්ඝ කාලයක සිටය. එය රටක් ලෙස අප වසර ගණනාවක සිට පෙළෙමින් පැවැති අවශ්‍යතාවකි. ඒ අනුව නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් නඩු විසඳීම සම්බන්ධයෙන් මින් පෙර කිහිප වරක් ම සාකච්ඡා සිදුකොට ඇත. තංගල්ලේ දී විදේශීය කතක් දූෂණය කොට ඇගේ පෙම්වතා ඝාතනය කිරීමේ නඩුවේ දී ස්කයිප් තාක්ෂණය යොදා ගැනුණත් ඉන් පසු එවැන්නක් මෙරට අධිකරණ පද්ධතිය තුළ දකින්නට ලැබුණේ, කොවිඩ් පළමු ව්‍යාප්තිය හේතුවෙන් අධිකරණ වසා දැමීමත් සමගයි. සාමාන්‍යයෙන් රිමාන්ඩ් සිරකරුවකු දින 14කින් පසුව ඇප මත මුදා හරින්නේ නැති නම් ඔහුගේ රිමාන්ඩ් කාලය නැවත දීර්ඝ කළ යුතුය. නීතිය ප්‍රකාරව එය සිදු කරන්නේ මහේස්ත්‍රාත්වරයා සිරකරුවාව සිය දැසින් දුටු පසුවයි. එබැවින් කොවිඩ් -19 වසංගත තත්ත්වය යටතේ අධිකරණ වසා තැබුණු වකවානුව තුළ රිමාන්ඩ් සිරකරුවන් අධිකරණය වෙත රැගෙන නොයමින් ඔවුන්ගේ බන්ධනාගාර කාලය දිගු කිරීම සඳහා අධිකරණ යන්ත්‍රණයට නව ක්‍රමයක් අවශ්‍ය විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යෝජනාවක් අනුව අධිකරණවලට ලැප්ටොප් ලබා දී ස්කයිප් තාක්ෂණය යොදාගනිමින් මහේස්ත්‍රාත්වරයාට සිරකරුවා සියැසින් දැකබලා ගෙන, රිමාන්ඩ් කාලය දීර්ඝ කිරීමේ අවස්ථාව ලබාදුන්නේ ඒ අනුවයි.

■ 'ස්කයිප්' තාක්ෂණය

මේ වන විට UNDP ආයතනය අවශ්‍ය උපකරණ බන්ධනාගාර සහ අධිකරණවලට සැපයීමට කටයුතු යොදා ඇති අතර ඉදිරියේ දී ස්කයිප් තාක්ෂණය ඔස්සේ පමණක් රිමාන්ඩ් බන්ධනාගාර රැඳවූවන්ගේ රිමාන්ඩ් කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් දින 14කට වරක් විනිසුරු වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි. එතුළින් සිරකරුවන් රැගෙන යෑම සඳහා වැය වන මුදල් ඉතිරි කර ගැනීමටත් එසේ බන්ධනාගර සහ අධිකරණ අතර ගෙන යෑමේ දී ඔවුන්ගේ ආරක්ෂාවට එල්ල වන තර්ජන මැඩ පැවැත්වීමටත් හැකියාව උදා වනු ඇති. කෙසේ වෙතත් මේ බන්ධනාගාර රැඳවියන් වෙනුවෙන්, ඔවුන්ගේ නීතිඥයන්ට අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට ඇති හැකියාව එලෙස ම පවතී.

මීට අමතර ව අධිකරණවල ඇප ඉල්ලුම් පත්‍ර, පෙත්සම් ගොනු කිරීම සම්බන්ධයෙන් ද නවීන තාක්ෂණය ඇඳා ගැනීමට කටයුතු යෙදෙමින් පවතී. එහි දී කොළඹ මහාධිකරණය ආදර්ශ උසාවිය ලෙස ගෙන එම උසාවියේ ඇප ඉල්ලුම්පත් සියල්ලක්ම ඊ -තාක්ෂණය හරහා යොමු කිරීමේ හැකියාව ලබා දී ඇත. ඒවා ගොනු කළ වහාම, ඒ වෙනුවෙන් අධිකරණ පද්ධතියේ ඇති තාක්ෂණය උපයෝගි කරගනිමින් පොලිස්පතිතුමාට සහ නීතිපතිතුමාට ඒ පිළිබඳ දැනුම්දීම සිදු කෙරෙන්නේ ඊ-තැපැල මඟිනි. ඒ වෙනුවෙන් වෙන වෙන ම ඊ-තැපැල් ලිපිනයන් ද සකසා දී තිබේ. එලෙස යොමු කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් වන විරෝධතා වෙතොත් ඒවා ද ඊ-තැපැල මඟින් ම අධිකරණයට යොමු කළ හැකියි. ඉන් අනතුරුව ඒ පිළිබඳ විමසීම් සිදු කිරීමට පමණක් අධිකරණයේ ඇප ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. එහි දී යම් ආකාරයකින් නීතිඥවරයකුට හෝ නීතිඥවරියකට පැමිණ කරුණු දැක්වීමේ අපහසුතාවක් ඇත්නම් ඔහුට හෝ ඇයට තමන් සිටින ස්ථානයේ සිට ස්කයිප් තාක්ෂණය උපයෝගී කරගනිමින් කරුණු දැක්වීමට අවස්ථාව ලැබේ. එම තාක්ෂණය ඔස්සේ කෙරෙන කරුණු දැක්වීම විනිසුරු අසා සිටිනු ඇත. ඊට අමතරව නීතිපතිතුමා වෙනුවෙන් සිදු කෙරෙන කරුණු දැක්වීම ද මේ තාක්ෂණය උපයෝගී කරගනිමින් නීතිපති දෙපාර්තමේන්තුවේ සිට ම සිදු කළ හැකියි. මේ ක්‍රියා පිළිවෙත ඉදිරියට ගෙනයන්නේ නඩු කටයුතු සඳහා පෙර නොවූ තරමින් තාක්ෂණය ඇඳා ගැනීම සම්බන්ධයෙන් කළ අත්හදා බැලීම් ලැබූ සාර්ථකත්වය මත ය.

■ අවබෝධතා ගිවිසුමක්

කෙසේ වෙතත් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයට තාක්ෂණය මෙලෙස ඇඳා ගැනීමේ දී ඇතිවන යම් යම් දුෂ්කරතා ද හඳුනාගත හැකියි. විශේෂයෙන්ම මේ තාක්ෂණය ඔස්සේ හුවමාරු වන තොරතුරු සහ පණිවිඩ, අන්තර්ජාල සබඳතාවල ඇති දුර්වලතා හේතුවෙන් අතරමඟ ඇනහිටීමටත්, අපහැදිලි වීමටත් ඉඩ තිබේ. එබැවින් වඩාත් සූක්ෂ්ම උපකරණ යොදා ගනිමින්, මෙවැනි කටයුතුවල දී ලෝකයේ භාවිත වන නවීනතම තාක්ෂණය පිළිබඳ සොයාබලා ඊට අනුගතවීමේ අවශ්‍යතාව පැනනැඟිනි.

ඇතැම් නීතිඥවරුන් ද සාම්ප්‍රදායික නඩු විසඳීමේ ක්‍රමවේදයෙන් බැහැර ව මෙවැනි නව ක්‍රමවේදයන්ට අනුගත වීමේ දී දක්වන්නේ මැළිබවකි. එහෙත් දැනුම්වත් කිරීම් හා කරුණු පහදාදීම් මත බොහෝ දෙනකු නව ක්‍රමවේදය පිළිබඳ එකඟත්වය පළ කොට තිබේ. ඉදිරියේ දී අධිකරණ අමාත්‍යාංශය මඟින් පුහුණු වැඩමුළු පවත්වා මේ පිළිබඳ දැනුවත්භාවය තව දුරටත් නංවාලීමට කටයුතු කෙරෙනු ඇත.

මෙරට සමස්ත අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමකට ඉකුත් පෙබරවාරි 11 වැනි දා අත්සන් තැබුණේ අධිකරණ අමාත්‍ය අලි සබ්රිගේ ප්‍රධානත්වයෙනි. මෙවැනි ගිවිසුමකට එළැඹුණේ අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, තාක්ෂණ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඒකාබද්ධවයි.

ඒ අනුව අධිකරණ පද්ධතියේ ලිපි ගොනු කිරීම, මාර්ගගත ක්‍රමවේදය (On line) ඔස්සේ දඩ මුදල් ගෙවීම ඇතුළු සමස්ත අධිකරණ ක්‍රියාවලියම ඩිජිටල්කරණය කිරීමට මේ ව්‍යාපෘතිය ඔස්සේ සැලැසුම්කොට ඇත. ඩිජිටල්කරණ ක්‍රියාවලිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම ඇතුළු තාක්ෂණික මෙහෙයුම් සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මඟිනි. එම ආයතනයේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ශ්‍රියානන්ද රත්නායක අදහස් දැක්විය.

"අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කළ යුතුයි යන්න මෑතක දී ඇති වූ මතයක් නම් නොවෙයි. මින් පෙරත් මේ සම්බන්ධයෙන් ප්‍රයත්න රැසක් ගෙන තිබෙනවා. කෙසේ වෙතත් අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම වනාහි මෙරට සමාජ, ආර්ථික, දේශපාලන යන සෑම අංශයකට ම නව ජවයක් ලබා දෙන්නා වූ කර්තව්‍යයක් ලෙස සැලකිය හැකියි. අධිකරණයට පරිගණකය හා නව තාක්ෂණය ඇඳා ගැනීමේ උත්සාහය විවිධ අධිකරණවල විවිධ විනිශ්චයකාරවරුන් යටතේ මතු වුවත් ඒ සම්බන්ධයෙන් මින් පෙර විධිමත් වැඩපිළිවෙළක් ඉදිරිපත් වී තිබුණේ නැහැ. වත්මන් රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ පැහැදිලි ව සඳහන් වනවා අධිකරණ පද්ධතිය නවීකරණය කිරීම පිළිබඳව. ඒ යටතේ ඉතා ඉක්මනින් නීතිය සාධාරණය ඉටු කිරීම අරමුණු කරගනිමින් අධිකරණ අමාත්‍යවරයා තීරණයක් ගෙන තිබෙනවා මෙරට අධිකරණ පද්ධතිය ඩිජිටල් කරණය කිරීමට."

■ නීතිඥ සංගමයේ ප්‍රසාදය

අධිකරණ පද්ධතියට නව තාක්ෂණය ඇඳා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපති, අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක, ජනාධිපති නීතිඥ යූ. ආර්. ඩී. සිල්වා ද අදහස් දක්වමින් කියා සිටියේ. "මෙරට අධිකරණ පද්ධතිය තුළ මාර්ගගත තාක්ෂණය භාවිත කරමින් යුක්තිය පසිඳලීමේ ක්‍රියා පිළිවෙතකට අවතීර්ණ වීමෙහිලා, සුවිශේෂ අමාත්‍යාංශය මඟින් පුහුණු වැඩමුළු පවත්වා මේ පිළිබඳ දැනුවත්භාවය තව දුරටත් නංවාලීමට කටයුතු කෙරෙනු ඇත.

මෙරට සමස්ත අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමකට ඉකුත් පෙබරවාරි 11 වැනි දා අත්සන් තැබුණේ අධිකරණ අමාත්‍ය අලි සබ්රිගේ ප්‍රධානත්වයෙනි. මෙවැනි ගිවිසුමකට එළැඹුණේ අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, තාක්ෂණ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඒකාබද්ධවයි.

ඒ අනුව අධිකරණ පද්ධතියේ ලිපි ගොනු කිරීම, මාර්ගගත ක්‍රමවේදය (On line) ඔස්සේ දඩ මුදල් ගෙවීම ඇතුළු සමස්ත අධිකරණ ක්‍රියාවලියම ඩිජිටල්කරණය කිරීමට මේ ව්‍යාපෘතිය ඔස්සේ සැලැසුම්කොට ඇත. ඩිජිටල්කරණ ක්‍රියාවලිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම ඇතුළු තාක්ෂණික මෙහෙයුම් සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මඟිනි. එම ආයතනයේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ශ්‍රියානන්ද රත්නායක අදහස් දැක්විය.

"අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කළ යුතුයි යන්න මෑතක දී ඇති වූ මතයක් නම් නොවෙයි. මින් පෙරත් මේ සම්බන්ධයෙන් ප්‍රයත්න රැසක් ගෙන තිබෙනවා. කෙසේ වෙතත් අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම වනාහි මෙරට සමාජ, ආර්ථික, දේශපාලන යන සෑම අංශයකට ම නව ජවයක් ලබා දෙන්නා වූ කර්තව්‍යයක් ලෙස සැලකිය හැකියි. අධිකරණයට පරිගණකය හා නව තාක්ෂණය ඇඳා ගැනීමේ උත්සාහය විවිධ අධිකරණවල විවිධ විනිශ්චයකාරවරුන් යටතේ මතු වුවත් ඒ සම්බන්ධයෙන් මින් පෙර විධිමත් වැඩපිළිවෙළක් ඉදිරිපත් වී තිබුණේ නැහැ. වත්මන් රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ පැහැදිලි ව සඳහන් වනවා අධිකරණ පද්ධතිය නවීකරණය කිරීම පිළිබඳව. ඒ යටතේ ඉතා ඉක්මනින් නීතිය සාධාරණය ඉටු කිරීම අරමුණු කරගනිමින් අධිකරණ අමාත්‍යවරයා තීරණයක් ගෙන තිබෙනවා මෙරට අධිකරණ පද්ධතිය ඩිජිටල් කරණය කිරීමට."

■ 2017 සිට කළ අධ්‍යයනයක්

මේ ව්‍යාපෘතියේ අරමුණ වී ඇත්තේ අධිකරණ ක්‍රමය තුළ සියලු දේ ජනතාවට පහසුවෙන් සහ ඉක්මනින් ඉටු කර ගත හැකි පද්ධතියක් දියුණු කිරීමයි. ඒ අනුව මේ හා සම්බන්ධ ක්‍රමවේදයක් ලබාදිය හැකි පිරිස් අතරින් සුදුසු ම සමාගම සහ මෘදුකාංග පද්ධතිය තෝරා ගැනීම තවත් දෙමසක් ඇතුළත අවසන් කිරීමට අපේක්ෂිත බවත් මේ සම්බන්ධයෙන් විශේෂඥ තාක්ෂණික පහසුකම් සපයන කණ්ඩායමක සහයෝගය ලබා ගනිමින් සිටින බවත් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ශ්‍රියානන්ද රත්නායක පවසා සිටින්නේ ය. "අධිකරණ අමාත්‍යාංශය ද නවීන් මාරපන ජනාධිපති නීතිඥතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ව මේ සඳහා වෙන ම අනුකමිටුවක් පත්කොට තිබෙනවා. ඔවුන් සමඟ පළමු වැඩමුළුව අප මේ වන විටත් පවත්වා අවසන්.

එහි දී සාකච්ඡා කෙරුණේ ව්‍යාපෘතියේ ඉදිරි පියවර පිළිබඳවයි. මේ වන විට ව්‍යාපෘතියට අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ වැඩමුළු කිහිපයක් පැවැත්වෙනවා. ව්‍යාපෘතිය සාර්ථක වනු දැකීමට නම් ඒ සියලු දෙනාගේ සෘජු සහභාගීත්වය අවශ්‍යයි."

අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන් 2017 වර්ෂයේ පටන් සිදු කළ අධ්‍යයනයක් පවතින අතර ඒ අනුව අවශ්‍ය පද්ධතිය සකසා ගෙන යෑම මේ වන විට සිදුකෙරෙමින් පවතී. මෙලෙස විවිධ පාර්ශ්ව සමඟින් වැඩමුළු ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරන්නේ ඊට සමගාමී ව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් ලබාගැනීමයි.

■ පළමුවන අදියරට අධිකරණ 12ක්

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ අධිකරණ අමාත්‍යංශයේ අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ) ඩී.එම්. එම්. දිසානායක මහතා පවසනුයේ පද්ධති අධ්‍යයනය සහ වැඩමුළු මාලාව අවසන් වූ පසු අධිකරණය පද්ධතිය ඩිජිටල්කරණය කිරීම වෙනුවෙන් යොදාගත හැකි සුදුසුම ක්‍රමවේදයක් සැපයිය හැකි ආයතනයක් තෝරා ගත යුතු බවය. ඉන් පසුව පළමු වන අදියර වශයෙන් විවිධ මට්ටම් නියෝජනය වන පරිදි අධිකරණ 12ක් ඩිජිටල්කරණය කිරීමට සැලසුම් කොට තිබේ. එම අරමුණ මේ වසරේ අගෝස්තු මාසය වන විට සපුරා ගැනීමට අපේක්ෂිතය. එසේ ම දෙවැනි අදියර වශයෙන් ඉදිරියේ දී සියලු මට්ටම්වල අධිකරණ නියෝජනය වන පරිදි තවත් අධිකරණ 50ක් ඩිජිටල්කරණය කෙරේ. මෙහි දී මානව සම්පත සම්බන්ධයෙන් යම් යම් ගැටලු මතු විය හැකි අතර අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීමට නම් තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් දැනුමක් ඇති නිලධරයකු සෑම අධිකරණයකටම අනුයුක්තව සිටිය යුතුය. නොඑසේ නම් පද්ධතිය පවත්වාගෙන යෑමේ දී සහ නඩත්තු කිරීමේ දී අපහසුතා මතුවිය හැකිය. ඒ හැරුණුවිට ආකල්ප අතින් මීට අදාළ සියලු පාර්ශ්ව වෙතින් ලැබෙන්නේ උපරිම සහයෝගයකි. අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහනට සුදුසු මානව සම්පතින් සන්නද්ධ කිරීමට මේ වන විට විකල්ප කිහිපයක් සාකච්ඡා මට්ටමේ තිබේ.

අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම විවිධ පාර්ශ්වවලට විවිධ වූ අන්දමින් හිතකර වන අතර විශේෂයෙන් ම මේ ව්‍යාපෘතිය මඟින් අධිකරණ කටයුතු විධිමත් වීම, කඩිනම් වීම, විනිවිද භාවයෙන් යුතු වීම සහ වියදම් අවම වීම වැනි වාසි රැසක් ද අත්වනු ඇති. එමඟින් ව්‍යාපාර පවත්වාගෙන යෑමේ සත්‍යතා දර්ශකයේ (Doing Business Index) අන්තර්ජාතික ව ඉදිරියට යෑමට හැකි වේ. එය ආයෝජන ආකර්ෂණය වැඩිවීමට ද හේතුවකි. කෙසේ වෙතත් මේ වැඩසටහනට සමගාමී ව මෙරට සියලු බන්ධනාගාර සහ අධිකරණ විඩියෝ තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතියක් මේ වන විට තාක්ෂණික ඇගයීම් මට්ටමේ පවතින බවත් අධ්‍යක්ෂවරයා පවසන්නේ ය.

කෙසේ වෙතත් අධිකරණ පද්ධතිය තුළ ක්‍රමයෙන් ඇති කරන්නට උත්සාහ ගන්නා මේ වෙනස තුළ අපේක්ෂිත ප්‍රතිඵල අත් කර ගැනීමට නම් අදාළ පාර්ශ්වයන් තව දුරටත් වෙහෙසිය යුතු ය; කැප විය යුතු ය. මෙය නව හැරවුම

ප්‍රතිශක්තිකරණයෙන් අපේ රට පොහොසත්

විශේෂඥ වෛද්‍ය සුනිල් ද අල්විස් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අතිරේක ලේකම්

ලොව පුරා පැතිර ගිය කොවිඩ් 19 වසංගතයත් සමඟ එය ලෝකයෙන් තුරන් කිරීම සඳහා රටවල් කිහිපයක් එන්නත් වර්ග නිපදවා තිබේ. මේ එන්නත් අතුරින් වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ ඉන්දියාවේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයත් ඇස්ට්‍රා සෙනිකා ආයතනයත් එක්ව නිෂ්පාදනය කළ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනිකා කොවිෂීල්ඩ් එන්නතයි. සියයට අසූ දෙකක ආවරණයක් සහිත එන්නත මිල අඩුවීමත් හේතුවෙන් මිල දී ගැනීමට බොහෝ රටවල් පෙලැඹී තිබේ. ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අතිරේක ලේකම් විශේෂඥ වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

● ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනිකා කොවිෂීල්ඩ් එන්නත පිළිබඳ සමාජය තුළ ඇති වී තිබෙන බියත්, එන්නත් කර ගැනීමෙන් පසු අතුරු ආබාධ ඇති වේ යැයි පැතිර යන කතාවන්හි සත්‍ය අසත්‍යතාවය කුමක් ද?

මේ එන්නත පිළිබඳ ගැටලුවක් නැහැ කියලා අපට විශ්වාසයෙන් කියන්න පුළුවන්. සිංහල හෝ ඉංග්‍රීසි ඖෂධයක් ඕනෑම මාත්‍රාවකින් දුන්නාම යම් තරමකින් අතුරු ආබාධ ඇති වෙන්න පුළුවන්. ඖෂධයක් ලබා ගැනීමේදී යම් මාත්‍රාවක් නිර්දේශ කරන්නේ ඒ නිසයි. එන්නත ලබා දුන් අවස්ථාවේ සිට ඇති වන වේදනාව දවසක් දෙකක් තිබෙන්නටත් පුළුවන්. වමනය, හිසරදය වැනි සංකූලතා ඇති වෙන්නත් පුළුවන්. උණ තත්ත්වයක් ඇති වීමක් දකින්නත් පුළුවන්. ඊට අමතරව දිගු කාලීන අතුරු ආබාධ ඇති වෙනවා යැයි කියලා තොරතුරු වාර්තා වෙලා නැහැ. විද්‍යාත්මක පැහැදිලි කිරීමවලදීත් එවැනි සනාථ කිරීමක් කරලා නැහැ.

● මේ එන්නත පාසල් දරුවන්ට දෙන්නේ නැහැ. ගැටලුවක් නැති නම් පාසල් දරුවන්ට නොදෙන්නේ ඇයි?

ඕනෑම ඖෂධයක හෝ එන්නතක ප්‍රතිචාර (Reaction) දක්වන එක එකිනෙකාට වෙනස්. එනිසා මේ එන්නත සම්බන්ධ පරීක්ෂණ සිදු කරලා තියෙන්නේ වැඩිහිටියන් යොදාගෙන. එම වයස් කාණ්ඩ අනුව සිදු කළ පරීක්ෂණ අනුව මෙය ආරක්ෂාකාරී එන්නතක් ලෙස හඳුනාගෙන තිබෙනවා. එහෙත්, වයසින් අඩු කාණ්ඩ සම්බන්ධයෙන් තවමත් පර්යේෂණ සිදු කෙරමින් තිබෙනවා. වඩා ආරක්ෂාකාරී පියවර වන්නේ, එම නිශ්චිත තොරතුරු ලැබෙනතුරු පරීක්ෂණවලින් සනාථ වූ කණ්ඩායම්වලට පමණක් මේ එන්නත ලබාදීමයි. ඒ ආකාරයට තමයි, එන්නත් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාවලිය සකස් වෙලා තියෙන්නේ.

● ඔබ එසේ පැවසුවත්, පාසල් දරුවන්ටත් කොවිඩ් 19 රෝගය වැලඳුණ අවස්ථා වාර්තා වුණා නේද?

රෝගය කාට වුවත් වැලඳෙන්න පුළුවන්. එහෙත්, මේ රෝගයෙන් ආරක්ෂා වීමට තිබෙන එකම දේ එන්නත නෙවෙයි, තවත් ක්‍රමවේද රැසක් තියෙනවා. එන්නත් කර නොමැති රෝගය වැලඳුණේ නැති බොහෝ පිරිසක් ඉන්නවා. එන්නතකින් ආවරණය වන්නේ කිසියම් ප්‍රතිශතයක් පමණයි. සියයට සියයක්ම ආවරණය වන්නේ නැහැ. කිසිම ඖෂධයක් සියයට සියයක ආවරණයක් ලබා දෙන්නේ නැහැ. එන්නතකින් කෙරෙන්නේ රෝගය ඇති වීමේ සංකූලතාව අසාත්මික තත්ත්වයකට යෑම වැළැක්වීමයි. මෙය ශරීර අභ්‍යන්තරයේ ප්‍රතිදේහය සහ ප්‍රතිදේහජනකය අතර තිබෙන ගැටුමක් වැනියි. ප්‍රතිදේහය ගුණාත්මක නම් ශරීරයට ඇතුළුවන විෂබීජ සමඟ සටන් කර දිනන්න පුළුවන්. ප්‍රතිදේහ සහ ප්‍රතිශක්තිකරණය එකම දෙයක් මත රඳා පවතින්නේ නැහැ. පුද්ගලයාගේ ශරීර සෞඛ්‍ය, වයස් මට්ටම සහ වෙනත් ආබාධ මෙන්ම බෝ නොවන රෝග සමඟ ඇතිවන සංකීර්ණ ක්‍රියාවලියක්. වයිරස් එකක් ජීවී සෛල තුළ වැඩෙනවා. මිනිසාත් ජීවියෙක්. මේ දෙන්නාම ජීවීන්. එනිසා දෙන්නා අතර කිසියම් ආකාරයක තරගයක් ඇති වෙනවා. ශරීරය සමඟ සහයෝගයෙන් සිටින බැක්ටීරියාත් තිබෙනවා. ඒ අයට විරුද්ධව ප්‍රතිදේහ නිපදවීමක් සිදු වන්නේ නැහැ.

● ගර්භිණී මාතාවන්ට එන්නත නොදෙන්නේ කුස තුළ සිටින දරුවාට යම් සංකූලතාවක් ඇති වේ යැයි සැක පළ කරන නිසා ද?

ඕනෑම ඖෂධයක්, එන්නතක් ලබාදෙන විට ගර්භිණී මවුවරුන් සම්බන්ධයෙන් සැලකිලිමත් වෙනවා. එහෙම කරන්නේ කුසේ සිටින දරුවාට හානියක් වෙයි කියන අවදානම නිසයි. දරුවා ඊට දක්වන ප්‍රතිචාරය කුමක් වේ දැයි සැකයක් තිබෙනවා. වැදෑමහ හරහා දරුවාගේ ශරීරයට මෙය ඇතුළු වූ විට ප්‍රතිදේහ මඟින් එය ක්‍රියාත්මක වන්නේ කවර ආකාරයට ද යන්න පිළිබඳ ගැටලුවක් තියෙනවා. මේ කාරණා පිළිබඳ වසර කිහිපයක අත්දැකීම් නොමැතිව, පරීක්ෂණ පිළිබඳ තොරතුරු නැතිව ක්‍රියා කිරීම අවදානමක් මෙන්ම එය සදාචාරාත්මකත් නැහැ. එන්නතක් පමණක් නොවෙයි, ඕනෑම ඖෂධයක් සම්බන්ධයෙන් කුස තුළ සිටින දරුවා ගැන සැලකිලිමත් වීම අපේ වගකීමක්. ගර්භිණී සමයේදී ඖෂධ ලබාදීම පුළුවන් තරම් අවම කරන්නත් වෛද්‍යවරු උත්සාහ ගන්නවා. ඊට හේතුව වැඩෙන දරුවාගේ අවයවවලට වගේම සෞඛ්‍යසම්පන්න භාවයට බලපෑම් ඇතිවිය හැකි අවදානමක් තිබෙන නිසයි. ගර්භිණී කාලයේ දී පිටගැස්මට එන්නත් කිරීමේදී දරුවාටත් මවටත් දෙදෙනාටම හානියක් වෙන්නේ නැහැ. වෛද්‍ය ආචාර ධර්මවලට අනුව සියයට සියයක විශ්වාසයක් නැතිව කිසිදු ඖෂධයක් හෝ එන්නතක් ගර්භිණී මාතාවන්ට ලබා දෙන්නේ නැහැ.

● මවකිරි දෙන මවුවරුන්ටත් මේ එන්නත ලබා දෙන්නේ නැහැ. මවකිරි ලබාදීමෙනුත් බලපෑමක් ඇති වෙනවා ද?

මවකිරිවල තිබෙන ගුණ ගැන අපි බොහෝවිට කතා කරනවා. පුළුවන් තරම් දරුවාට මවකිරි ලබා දෙන්න කියලයි අපි කියන්නේ. එයින් අපි බලාපොරොත්තු වන්නේ දරුවාගේ ප්‍රතිශක්තිකරණය උපරිමයෙන් තබා ගැනීමයි. දරුවාට ප්‍රතිශක්තිකරණය ලැබෙන ප්‍රෝටීන් මවකිරිවලින් දරුවාට ලැබෙනවා. මුල් අවධියේදී දරුවාගේ ප්‍රතිශක්තිකරණය උපරිමයට ඇති වන්නේ නැහැ. බාහිර බලපෑම්වලට මුහුණ දෙන්න ශක්තියක් දරුවාට කුඩා අවධියේදී ලැබිලා නැහැ. පරිසරයේ ඇති බැක්ටීරියා, වයිරස් ආදියට දරුවාගේ ප්‍රතිශක්තිකරණය හොඳින් ප්‍රතිචාර දක්වන්නේ තරුණ වයසට පැමිණියාට පසුවයි. එනිසා කුඩා දරුවන්ගේ ශරීරයට බාහිරින් යම් යම් දේවල් ඇතුළු කිරීමට අප එකඟවන්නේ නැහැ. කුස තුළ සිටිනවා සේම මවකිරි බොන දරුවාටත් මවකිරි මඟින් යම් යම් දේවල් සම්ප්‍රේෂණය විය හැකියි. විද්‍යාත්මකව තහවුරු කළ හැකි වුවත්, නොදන්න සහ පරීක්ෂණ නොකළ දේවල් දරුවන් සහ මව්වරුන්ට ලබාදෙන්න උත්සාහ කරන්නේ නැහැ. එන්නත් කමිටු මඟින් මේ සියල්ලක්ම නිරීක්ෂණයට ලක් කරනවා. එන්නත් නිෂ්පාදකයාගේත්, අපගේත් වගකීම වන්නේ තොරතුරු විශ්ලේෂණය කොට සෑහීමකට පත්වුවොත් පමණක් එන්නත් හඳුන්වාදීමයි. එන්නතක් දිය යුතු වයස් කාණ්ඩ සහ සුදුසුකම් ඇති පුද්ගල කාණ්ඩ නිගමනය කරන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයත්, නිෂ්පාදකයාත් කියන දෙපාර්ශ්වයයි. එනිසා ඒ නිගමනවලට පිටින් ගිහින් වෙනත් කාණ්ඩවලට එන්නත් දෙන්න අපට බැහැ. එවැනි පිරිසකට එන්නත ලබාදීමෙන් පසු සංකූලතාවයක් ඇති වුවහොත් එහි වගකීම සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයටම පැවරෙනවා. එනිසා එය සදාචාරාත්මක නොවනවා සේම නීති විරෝධියි.

ශරීරයට ආගන්තුක දෙයක් ඇතුළු වූ විට ප්‍රතික්‍රියා දක්වනවා

ඉන්දියාවෙන් ගෙන්වූවාම බොහෝ දෙනකු 'ලාබ බඩුයි' සිතනවා

මොන ප්‍රතිශක්තිකරණය ගත්තත් පරිස්සම් වන්නත් ඕනෑ

● ඇස්ට්‍රා සෙනිකා එන්නතේ පළමු මාත්‍රාව දී සති දහයක් තුළ දෙවැනි මාත්‍රාව දිය යුතුයි කියලා නිර්දේශ වෙලා තියෙනවා. එම කාල සීමාව තුළ දෙවැනි මාත්‍රාව ගැනීමට නොහැකි වුවහොත් සිදු වන්නේ කුමක් ද?

සති දොළහක් ඇතුළත දෙවැනි මාත්‍රාව ලබාදිය යුතුයි. එන්නතේ යාන්ත්‍රණය වන්නේ කිසියම් දෙයකට විරුද්ධව ප්‍රතිදේහ නිපදවීමයි. විෂබීජයකට විරුද්ධව ක්‍රියා කිරීමේ හැකියාවක් ලබාදීමක් සිදු වෙනවා. ඒ නිර්ණායකයන් වන්නේ ප්‍රතිදේහ කොපමණ ප්‍රමාණයක් ශරීරය තුළ නිපදවනවා ද යන්නය. එසේම එය කොපමණ කාලයක් ශරීරයේ රඳා පවතිනවා ද යන්නත් බැලෙනවා. පළමු මාත්‍රාව දුන් විට ශරීරය තුළ ප්‍රතිදේහ යම් ප්‍රමාණයක් නිපදවෙනවා. දෙවැනි මාත්‍රාවේදී ඇතුළු වූයේ කවරක් ද යන්න ශරීරය හඳුනා ගන්නවා. ඊට පස්සේ වඩා වේගවත්ව තමන්ගේ සගයන් නිර්මාණය කර ගන්නවා. තවදුරටත් ප්‍රතිදේහජනකය හඳුනාගෙන ඊට විරුද්ධව ක්‍රියා කිරීමේ හැකියාවක් වර්ධනය කර ගැනීමක් දෙවැනි මාත්‍රාවේදී සිදු වෙනවා. එවිට මුලින් ඇති වූ ප්‍රතිදේහ සාන්ද්‍රණය අඩුවීම ආරම්භ වෙනවා. එක් එක් ප්‍රතිදේහයන් ක්‍රියා කරන කාල සීමාවන් වෙනස් ස්වභාවයකුත් ගන්නවා.

උදාහරණයක් ලෙස පැපොල සහ සරම්ප ගත් විට පැපොල හැදුණ කෙනෙකුට නැවත එය හැදෙන්නේ නැහැ කියලා කියනවා. එහෙම වෙන්නේ කලින් එම විෂබීජය ශරීරයට ඇතුළු වන අවස්ථාවේ ශරීරය තුළ වර්ධනය වුණු ප්‍රතිදේහ ශරීරය තුළ ජීවිත කාලය පුරාම පවත්වාගෙන යෑම නිසයි. ශරීරය තුළ ප්‍රතිශක්තිකරණයට පෙර සූදානමකුත් ඇති වී තිබෙනවා. මෙහිදී එන්නතේ දෙවැනි මාත්‍රාව දිය නොහැකි වුවහොත් යම් අවස්ථාවකදී ශරීරයේ ප්‍රතිශක්තිය දුර්වල වෙන්න පුළුවන්. ශරීරය නිශ්චිත කාලසීමාවක් පවත්වාගෙන යන්නට ප්‍රතිදේහ ප්‍රමාණවත් වන්නේ නැහැ. එම නිසා දෙවැනි මාත්‍රාව අදාළ කාල සීමාවේදී දිය යුතුමයි.

● එන්නත දීලත් මුඛ ආවරණ සහ අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන්නේ එන්නත පිළිබඳ විශ්වාසයක් නැති නිසා ද?

එන්නත ලබාදුන්නත් සාමාන්‍ය ක්‍රියාදාමයන්ගෙන් බැහැර නොවිය යුතුයි. ඕනෑම එන්නතක්, ඖෂධයක් ආරක්ෂා වීමේ හැකියාව තියෙන්නේ යම් ප්‍රතිශතයකින් විතරයි. එවිට කිසියම් ආකාරයකට දුර්වල ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇති කෙනකුට එන්නත ලබා දුන්නත් යම් අවස්ථාවක වයිරසය ආසාදනය වෙන්න පුළුවන්. එය කොතරම් දුරට තීව්‍ර වෙනවා ද යන කාරණය වෙනස් විය හැකියි. එහෙත් වඩාත්ම ආරක්ෂාකාරී පියවර වන්නේ වයිරසයෙන් ආරක්ෂාවීමට ක්‍රියා කිරීමයි.

එන්නත ලබා ගත් අයකුට රෝගය නොවැලඳුණත් ඔහුට කොවිඩ් වයිරසය ශරීරයට ඇතුළු වී ඇත්නම් කිවිසුම් යෑමේදී හෝ හුස්ම ගන්නා විට වයිරසය පිට වේ නම් එය අනෙක් අයට හානිදායක වෙනවා. එනිසා තමන් සහ අනෙක් අයත් යන පාර්ශ්ව දෙකම ආරක්ෂාවීම සඳහා අත් සේදීම, මුඛ ආවරණ පැලඳීම කළ යුතුය. එසේම සමීප ඇසුරක් තබා ගැනීමත් නොකළ යුතුයි. පසුගිය කාලයේ කොවිඩ් පොකුරු වාර්තා වුණේ උත්සව අවස්ථාවලට සහභාගී වූ පිරිසගෙන්.

● එන්නත් කරගැනීමෙන් පසු බොහෝ අයට උණ තත්ත්වයන් ඇති වුණා. උදරාබාධ ඇති වුණා. එහෙම වුණේ ඇයි?

ශ්‍රී ලංකාව ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ අතින් පොහොසත් රටක්. කුඩා අවධියේ සිටම රෝග කිහිපයකටම එන්නත් දෙනවා. එදා සිටම එන්නතක් ලබාදීමේදී අතුරු ආබාධ තිබුණා. ශරීරයට යම් ආගන්තුක දෙයක් ඇතුළු වුණාම ශරීරය එයට ප්‍රතික්‍රියා දක්වනවා. හිපොක්‍රටිස් මෙය මැනවින් විග්‍රහ කර තිබුණා. වෛද්‍ය විද්‍යාවේ මේ පිළිබඳ කරුණු පහකින් විග්‍රහ කර තිබෙනවා. උණ ගැන්ම, ශරීරය රතුවීම, වේදනාව, ශරීරය දුර්වලවීම ආදි ප්‍රතික්‍රියා දැක්වීම ස්වාභාවිකයි. එන්නත ලබා ගත්තා කියලා ඔප්පු කළ හැකි සාධක එම ප්‍රතික්‍රියායි.

● චීනය, රුසියාව, ඉන්දියාව ආදි රටවල් කිහිපයකින්ම එන්නත් නිපදවූවා. මේ අතුරින් අපේ රටට ගෙන ආ ඇස්ට්‍රා සෙනිකා එන්නත හොඳම එන්න ද? එහෙමත් නැති නම් වඩාත් ලාභ එන්නත ද?

ලාභ කියා කියන්න බැහැ. ඉන්දියාවෙන් ගෙන්වූවාම බොහෝදෙනෙක් මේක ලාභයට ගෙනාපු දෙයක් කියලා හිතනවා. ඒ වගේම ප්‍රමිතියෙන් අඩුයි කියලත් හිතනවා. ඒත් මේ ඇස්ට්‍රා සෙනිකා එන්නත ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයත්, ඇස්ට්‍රා සෙනිකා ආයතනයත් සමඟ එකතු වී නිපදවන එන්නතක්. සීරම් ඉන්ස්ටිට්යුට් කියන්නේ ලෝකයේ හොඳම ආයතනයක්. ඒ ආයතනයෙත් මේ එන්නත නිපදවා තිබෙනවා. එහි ප්‍රමිතිය පිළිබඳ කිසිම ගැටලුවක් නැහැ. මෙහි වටිනාකම තියෙන්නේ එක පැත්තක් පමණයි. පළමුවෙන්ම අපි බලන්න ඕනෑ මෙය පහසුවෙන් ලබාගත හැකි ද යන්නයි. ප්‍රවාහනයේදී සීත දාමය (Cool Chain) ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාදාමය කෙතරම් පහසු ද යන්න වැනි බොහෝ කරුණු සහ නිර්ණායකයන් උපයෝගි කර ගැනීම පිළිබඳව අපි බැලිය යුතුයි. යුරෝපයෙ වැනි වෙනත් රටකින් එන්නත් එනතුරු බලා සිටියා නම් අපි තවමත් බලා සිටිනවා. ඇතැම් එන්නත් ලංකාවේ ලියාපදිංචි වී නැහැ. ස්පුටනික් එන්නත ශ්‍රී ලංකාවේ නිර්දේශ වුණේ ගිය සතියේයි. ස්පුටනික් එන්නතත් ලෝකයේ බොහෝ රටවල් මේ වන කොට භාවිත කර තියෙනවා. එහි විශේෂ සංකූලතා පිළිබඳ වාර්තා වුණේ නැහැ.

එක් එක් එන්නත්වල වෙනස් ගුණාංග තියෙනවා. සාර්ථකභාවය පිළිබඳ දත්ත සහ සීත දාමය පවත්වා ගැනීම වැනි වෙනස්කම් තියෙනවා. ඕනෑම දෙයක යහපත් සහ අඩුපාඩු සහිත වීම් යන දෙකම තියෙනවා. අප ඒවා පිළිබඳ සැලකිය යුතුයි.

චතුමි පිටිපන



වසංගතයක් අභිමුව ආර්ථිකයට කෙළින් සිටිය හැකි ද?

වරලත් ගණකාධිකාරී ප්‍රගීත් පෙරේරා

ගෝලීය ආර්ථිකය දෙවැනි ලෝක යුද්ධයට පසු මුහුණ දෙන දරුණුතම ආර්ථික පසුබෑමට මුහුණ දෙමින් සිටියි. කොවිඩ් 19 නිසා ඇතිවී තිබෙන ආර්ථික අවපාතය වත්මන් ලෝකය මුහුණ දෙන විශාලම ආර්ථික අභියෝගය වී ඇත. මෙවර මතුවී ඇති අභියෝගය වන්නේ ගෝලීය සේවා නිෂ්පාදනය අභිභවා ගෝලීය භාණ්ඩ නිෂ්පාදනය විශාල ලෙස පසුබෑමට ලක්ව තිබීමයි.

එළැඹෙන කාර්තුවේදී සහ එළැඹෙන වර්ෂයේදී සියලු රටවල් ඉතා ප්‍රබල අභියෝගයන්ට මුහුණ දෙනු ඇත. බොහෝ ආර්ථිකයන් මුහුණ දෙන සත්‍ය තත්ත්වය වන්නේ ආර්ථික පසුබෑමට ලක් වන වාර්තා පෙනෙන්න තිබීමයි. ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ තම රටවල්වල ආර්ථික අර්බුදයට ලක් නොවීම සඳහා සෑම රටකම මහ බැංකු විසින් පියවර ගනිමින් සිටියි. ගෘහස්ථ ආර්ථිකය නිසා ව්‍යාපාරවලට මේ අර්බුදකාරී අවස්ථාවට මුහුණදීම සඳහා රජයෙන් විවිධ සහනාධාර පියවර ක්‍රියාවට නංවා තිබේ.

ගෝලීය වශයෙන් කොවිඩ් 19 සඳහා තවමත් සාර්ථක ප්‍රතිකාරයක් සොයා ගෙන නැත. එසේම මේ වසංගතය භෞමික වශයෙන් ලෝකයේ අස්සක් මුල්ලක් නැර පැතිරී යමින් තිබේ. මේ තත්ත්වය වෙළෙඳපොළ සඳහා දැඩි බලපෑමක් සිදු කරමින් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී කිරීමට හේතු සාධක වේ. මෙහි මුල්ලක අමෙරිකානු මහමැතිවරණය තිබෙන අතර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට අපගේ සමත්කම අභියෝගයක් ලෙස ඉදිරියේ පවතියි. ගෝලීය තත්ත්වය කලින් පැවැතියාට වඩා තරමක් පැහැදිලි මට්ටමක පැවැතිය ද ගෝලීය වෙළෙඳපොළ තවමත් අවිනිශ්චිතභාවයෙන් පිරී පවතියි.

මෙවැනි අවස්ථාවක තනි අකුරක හැඩයේ ගමන් මාර්ගයක් අනුගමනය කළ යුතු යැයි අනුමාන කිරීමට කාලය පැමිණ ඇත. උදාහරණ ලෙස V හැඩය හෝ U හැඩය හෝ L හැඩය දැක්විය හැකිය. ආර්ථික විශේෂඥයන් විශ්වාස කරන්නේ ත්‍රි - පාර්ශ්වීය විසැඳුම් ඉදිරියෙන් පවතින බවයි. පළමුවන අදියර - වේගවත් ආපසු ගමනක් සතිපතා හා මාස්පතා දත්තවලින් අප්‍රේල් මැද භාගය වන විට යම් තරමක වර්ධනයක් ඇති වී තිබෙන බව පෙන්නුම් කළේය. ඉල්ලුම පිළිබඳ නිකුත් කර ඇති වාර්තාවලට අනුව අන්තර්ජාලය ඔස්සේ ඇති වූ ඉල්ලුමේ සියයට 60ක 70ක පසුබැසීමක් පෙන්නුම් කර තිබේ. පොලී අනුපාතවලට සංවේදී නිවාස සහ කුඩා පරිමාණ ව්‍යාපාරවලට සහන ලැබීම නිසා ද්‍රවශීලතාව ගලා ඒම දක්නට ලැබිණි.

ආදායමට සහාය ලබාදී ආර්ථිකය වර්ධනය කිරීම එක් අතකට මූල්‍යය එකතැන පල්වීමකට හෝ මෙහෙයුම් පරාසය පටුත්වයට පත් කරන අතර සමාජ දුරස්ථභාවයට අනුව ව්‍යාපාරයේ ආදායමට තවදුරටත් හානි සිදු කරයි. බංකොලොත් භාවයේ දෙවැනි රැල්ලක් ඇති වීමට මේ තත්ත්වය හේතු වේ.

වසංගතය නිසා නැවත බඳවා ගැනීම් සිදු කිරීමට සමාගම් අසමත් වීම නිසා ආර්ථිකයේ ඇතැම් අංශවල විරැකියාව ඉතා ඉහළ මට්ටමකට පැමිණෙමින් පවතියි. විරැකියා කාල සීමාව දීර්ඝ වේ. පිළියම් ලෙස ඉතුරු කිරීම් වැඩි වීම ඉහළ නඟී. අමෙරිකානු මැතිවරණයේ ප්‍රතිඵලය කුමක් වුවත් චීන - අමෙරිකානු වෙළෙඳ යුද්ධයේ ආර්ථික අවදානම අපට දැනෙන්න පටන්ගෙන ඇත.

කෙසේ වෙතත් අමෙරිකානු මැතිවරණයේ ප්‍රචාරක වැඩසටහනේ උණුසුම නිසා යම් ලෙසකින් කොවිඩ් 19 සඳහා පරීක්ෂණ සිදු කරන එන්නත කලින් ලබා ගැනීමට අපට මඟ පෑදෙනු ඇත. කොවිඩ් 19 කඩා වැදීම නිසා ඇති වී තිබෙන නව යථාර්ථය වසර කිහිපයක් තිස්සේ ඉදිරිපත් කිරීමට උත්සාහ දැරූ කාරණාවන් වේ.

සැපයුම්දාම විතැන් වීම මඟින් නිර්ගෝලීයකරණය දෙසට ගමන් කිරීමක් නිරීක්ෂණය වේ. තවද කලාපීකරණය වීම, වෙළෙඳ කලාප ජනනය වීම සහ උද්ධමනය මඟින් මේ තත්ත්වය තීව්‍ර වේ.

ආණ්ඩුවල බැඳුම්කර නිකුතු ඉහළ යෑම නිසා ගෝලීය ණය මට්ටම් ඉහළ යෑම නිසා රාජ්‍ය වියදම් පහත දැමීමට බල කෙරේ. පොලී අනුපාත ඉතා පහළ මට්ටමට බසියි. තව තවත් විකල්ප වත්කම් වෙත නැඹුරු වෙමින් ආදායම් ඉපැයීමට යොමු වීමෙන් අවදානම වර්ධනය වේ. විවිධාකාර සමාජ ආර්ථික ප්‍රශ්න වර්ධනය වේ. පවුල් අසමානතාවයෙන් ආර්ථිකයන් ගොඩගැනීම කෙරෙහි ගත හැකි පියවර මොනවාද? විශ්වීය මූලික ආදායම් තත්ත්වය සඳහා ඉඩක් පවතීද? නවීන මූල්‍ය සිද්ධාන්තය එය ද? ආර්ථික විවෘත කරන විට, ගෝලීය මිලදී ගැනීම පුළුල් වීම දෙසට ආපසු එයි.

ආර්ථිකය යහපත්වීමේ පළමු අදියර වේගවත් ලෙස සීමා පුළුල් වීමයි. ගෝලීය මිලදී ගැනුම් කළමනාකරණ දර්ශකයන්හි (PMIs) මෙන් මූලික වශයෙන් විද්‍යමාන වේ. විද්වතුන් මෙය එළැඹෙන මාසයේදී සංවේදී 50 වැනි මට්ටමට පැමිණේවි යැයි බලාපොරොත්තු වේ.

අප්‍රේල් මැද භාගය වන විට ගෝලීය ආර්ථිකය පතුලට ගමන් කරන බව ඉහළ මට්ටමේ දත්ත පෙන්නුම් කරයි. කොවිඩ් 19 වසංගතය නිසා වත්මන් ඉතිහාසය තුළ ගෝලීය ආර්ථිකය පහළට ගමන් කළේය. ගෝලීය ආර්ථික ක්‍රියාවලිය හොඳින් අවබෝධ කර ගැනීමට විද්වත්හු විකල්ප මූලාශ්‍රය වෙත නැඹුරු වී සිටිති. දෛනික සහ සතිපතා දත්ත අමෙරිකාවේ ඉදිරි නඩු තීන්දුවලින් එළියට එයි. ආර්ථිකය දරුණුතම පසුබෑම වාර්තා වූයේ අප්‍රේල් මැද භාගයේ යැයි විද්වත්හු පවසති. කොවිඩ් 19 වසංගතයට වෙළෙඳපොළ මුහුණ දෙන ආකාරය සමීපව නිරීක්ෂණය කළ යුතු වේ.

මාර්තු මාසය දක්වා ගෝලීය මහ බැංකු ගෝලීය ආර්ථිකයට විශාල සහායක් ලබා දුන්නේය. ගෝලීය මහ බැංකු නැවතී බලා සිට අදහස් ප්‍රකාශ කිරීමකට තම ක්‍රමෝපායන් වෙනස් කරනු ඇතැයි විද්වතුහු අපේක්ෂා නොකළහ. කෙසේ වෙතත් විශ්වාසය වූයේ අවශ්‍යතාව මතුවන විට ඊට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ට හැකි බවයි. විද්වත්හු විශ්වාස කරන පරිදි මහ බැංකුවලට පොලී අනුපාතවලට බලපෑම් කිරීමේ සංවේදීතාවක් ඇත. පුළුල් ආර්ථිකයෙන් කතා කරන විට මූල්‍ය අර්බුද ඇතිවීමට ප්‍රථම ඒවා වැළැක්වීමට පුළුවන් යැයි විශ්වාසයක් පවතියි.

දේශපාලනික අවදානම ප්‍රවර්ධනය කිරීම ගෝලීය ආර්ථිකයේ පෙනුම විය හැකිද?

සිව්වන කාර්තුවේදී ආර්ථිකය සම්බන්ධයෙන් හූ දේශපාලනික කාරණා කිහිපයක් මතු වූ අතර නොඑසේ නම් ප්‍රබල බලපෑමක් ඇති කළේය. මෙයට චීන - අමෙරිකානු වෙළෙඳ සම්බන්ධතාවය ද ඇතුළත් වේ. චීන - හොංකොං සම්බන්ධය ද ඇතුළත් වේ. ඉන්දු - චීන ආතතිය, බ්‍රික්සිට් සම්බන්ධ අවදානම් කාරණා ද ඇතුළත් වේ. යුරෝපා සංගමයේ සමගියට ද අදාළ වේ. නොවැම්බරයේ පැවැත්වෙන අමෙරිකානු මැතිවරණය ද මේ සම්බන්ධ ප්‍රධාන කාරණාවකි. අමෙරිකානු ඩොලරයේ අනාගත මූල්‍ය වැය කිරීමේ ශක්‍යතාව, අමෙරිකානු ඩොලරයේ ශක්තිය, ඉහත කාරණා එකිනෙක කෙරෙහි දක්වන බලපෑම ඇති කරන සාධක වේ.

අමෙරිකානු කොංග්‍රසයේ ඩිමොක්‍රැටිවරු කෙතරම් ප්‍රබල බලයක් අත්පත් කර ගනීද යන කාරණා ද මේ සඳහා දැඩි බලපෑමක් සිදු කරයි. එසේම ජනාධිපතිධුරය හිමි කරගන්නේ කවුද යන්න ද මෙවැනි බලපෑමක් සිදු කරන කාරණාවකි.

ගෝලීය වසංගතය හමුවේ බලපෑමට ලක්වන ඇතැම් ගෝලීය මූල්‍ය සාධක පවතින ඉතුරුම් පොලී අනුපාතය සහ පවතින ණය පොලී අනුපාතය පිළිවෙළින් සියයට 4.50ක හා 5.50ක මට්ටමේ පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුව 2020 ඔක්තෝබර් 22 වැනිදා තීරණය කළේය. ඉන් පසු මේ මූල්‍ය ප්‍රතිපත්තිය දිගටම පත්වාගෙන යෑමට ස්ථාවරයක් ඇති කර ගත්තේය.

2020 ඔක්තෝබර් 16 වැනිදා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාධ්‍ය නිවේදනයකට අනුව කොවිඩ් 19 වසංගතයට ගොදුරු වූ ව්‍යාපාර සඳහා 61,907ක් වූ ණය අයදුම්පත් අනුමත වී තිබේ. මේ අයදුම්පත්වලින් රුපියල් මිලියන177,954ක් සෞභාග්‍ය කොවිඩ්19 පුනරුත්ථාපන ණය සඳහා අදියර තුනකින් ලබාදීමට නියමිතය. මේ වනවිට ලියාපදිංචි බැංකු විසින් රුපියල් මිලියන 133,192ක ණය ප්‍රමාණයක් මුදා හැර ඇත. මෙයින් දිවයින පුරා බලපෑමට ලක්වූ ව්‍යාපාර 45,582ක් පිහිට ලබයි. නිවේදනය කළ අවසාන දිනයට පෙර ළඟා වූ සියලුම ණය අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ අතර රුපියල් බිලියන 150ක් මේ සඳහා වෙන් කෙරිණි.

ඉදිරි පියාපත් සහ පිටුපස පියාපත්වලට ගෝලීය ආර්ථිකය ඉදිරියට ගෙන යාමට හැකිවී ඇති විටෙක එය පහසුවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වන දැඩි උට්ඨාන වීර්යයෙන් යුක්ත සාම්ප්‍රදායික නොවන ප්‍රවේශයකින් ගෝලීය ආර්ථික යෝධයන්ට පමණක් යථාවත් කළ හැකි යථාර්ථයන් පවතියි. කොවිඩ් 19 සඳහා ඉදිරියේදී පැමිණෙන එන්නත් සුලබත්වය ලෝකයේ ගැලවීමට බලපාන ප්‍රධාන කාරණය වේ. කුඩා අපනයන ආර්ථිකයක් හිමි ශ්‍රී ලංකාව වැනි රටක් ප්‍රධාන වශයෙන් ගෝලීය සුවය ලැබීම් කෙරෙහි රඳා පවතියි.

මෙවැනි අවස්ථාවක ආණ්ඩුව කෙටි කාලීනව රටේ ව්‍යාපාරික ප්‍රජාව දේශීය වෙළෙඳපොළ අවශ්‍යතා සැපරීම සඳහා උනන්දු කරන අතර මධ්‍යකාලීනව ව්‍යාපාරවලට අර්බුද

එජාපය හැර ගිය පුංචි මන්ත්‍රීන් නැවත ගන්න කෘත්‍යාධිකාරියෙන් තීරණයක්

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂය හැර ගොස් සමඟි ජන බලවේගයට ඒක් වූ ප්‍රාදේශීය සභා නියෝජිතයන් නැවත පක්ෂයට එක් කර ගැනීමට ඒජාප කෘත්‍යාධිකාරි මණ්ඩලය තීරණය කර තිබේ.

ඒ අනුව සමඟි ජන බලවේගයට එක් වූ පළාත් පාලන මන්ත්‍රීවරු 44 දෙනකු සමාව ඉල්ලා නැවත පක්ෂයට එක් වීමට කළ ඉල්ලීමට ඒකඟතාව හිමිව ඇති අතර විනය පරීක්ෂණවලින් පසුව තවත් පළාත් පාලන නියෝජිතයන් 18 දෙනකු පක්ෂයෙන් නෙරපීමට විනය කමිටුව ගත් තීරණයටද කෘත්‍යාධිකාරි මණ්ඩලයේ අනුමැතිය හිමි විය.

පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 9දා සිරිකොත පක්ෂ මූලස්ථානයේදී රැස් වූ කෘත්‍යාධිකාරි මණ්ඩලය විසින් මේ තීරණයට එළඹ තිබේ.

පක්ෂයේ ක්‍රියාකාරී කටයුතුවලින් ඈත් වී සිටි රවි කරුණානායක, අර්ජුන රණතුංග, ලක්ෂ්මන් විජේමාන්න, නවීන් දිසානායක යන මහත්වරුද මෙවර කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම සඳහා සහභාගි වී තිබීම විශේෂත්වයක් විය.

පක්ෂය හැර ගිය සියලු පාක්ෂිකයන්ට නැවත එක් වීම සඳහා අවස්ථාව දීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට පක්ෂයේ සභාපති වජිර අබේවර්ධන සහ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහත්වරුන්ට පවරන ලද අතර විනය කඩ කරන පක්ෂ සාමාජිකයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් තීරණ ගැනීමේ බලය පළාත් මට්ටමින් පත් කරන ලද විනය කමිටුවලට පැවරීමටත් තීරණය විය.

පක්ෂයේ අරමුදල් තර කිරීම සඳහා ආනන්ද කුලරත්න මහතා ඉදිරිපත් කළ ඇති යෝජනාවද කෘත්‍යාධිකාරි මණ්ඩලය ඒකමතිකව අනුමත කළේය. සංවිධායකවරුන් පත් කිරීමේ නිර්දේශ නායකත්වයට දීම සඳහා කමිටුවක්ද පත් කෙරිණි.

පක්ෂයේ ප්‍රතිසංවිධාන වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන්ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා වී තිබේ.

පළාත් සභා මැතිවරණයේදී කාන්තාවන්ට ඒජාප අපේක්ෂක ලැයිස්තුවෙන් 25%ක් වෙන් කරන ලෙස ශාන්තිනි කෝන්ගහගේ මහත්මිය ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහතා ඒකඟතාව පළ කර ඇති අතර ඒ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමටද කමිටුවක් පත් කෙරිණි.

කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම අවසන් වීමෙන් පසු රවි කරුණානායක රනිල් වික්‍රමසිංහ මහතා දීර්ඝ වශයෙන් සාකච්ඡාවක් පවත්වා ඇත.

කොවිඩ් -19 ලෝක වසංගතයට වසරයි

ලෝක සෞඛ්‍ය සංවිධානය කොවිඩ් -19 වයිරස ව්‍යාප්තිය ලෝක වසංගත තත්ත්වයක් ලෙසට ප්‍රකාශයට පත් කර ඊයේ දිනට (11) වසරක් සපිරිණි.

2019 වසරේ දෙසැම්බර් මාසයේදී චීනයේ වුහාන් නගරයෙන් ආරම්භ වූ කොවිඩ් වයිරසය පසුව ලෝකයේ දුබල රාජ්‍ය මෙන්ම බලවත් රාජ්‍ය රැසකටම දැඩි බලපෑම් එල්ල කළේය.

අමෙරිකාව, ඉතාලිය, මහා බ්‍රිතාන්‍ය මෙන්ම ඉන්දියාව, බ්‍රසීලය වැනි රටවලට කොවිඩ් -19 වයිරසයෙන් දැඩි බලපෑම් එල්ල වූ අතර මේ වන විටත් එම රටවලින් දෛනිකව දහසකට අධික වෛරස ආසාදිතයින් ප්‍රමාණයක් වාර්තා වේ.

රාජ්‍ය නායකයින් රැසක් මෙන්ම සෞඛ්‍ය අමාත්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය බලධාරීහු රැසක් ද කොවිඩ් වයිරසයට ගොදුරු විය.

එමෙන්ම ලෝකයේ ජනප්‍රිය පුද්ගලයින් ද කොවිඩ් -19 වෛරසය හේතුවෙන් මියගියේය.

කෙසේවෙතත් මේ වන විට වයිරස ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා විවිධ රටවල් අත්හදාබැලීම් සිදුකරමින් එන්නත් නිෂ්පාදනය කර ඇති අතර එන්නත් කිහිපයක් ජනතාව වෙත ලබාදීම මේ වන විටත් සිදුකෙරෙයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඇතැම් රටවල් කොරෝනා ව්‍යාප්තියේ සිව්වන අදියරට පැමිණ ඇති බවට මේ වන විටත් ප්‍රකාශයට පත් කර තිබේ.

උපවාස කළ ගොවීහු තිදෙනෙක් සූරියවැව රෝහලට

හම්බන්තොට යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීම ඇතුළු ඉල්ලීම් 6ක් මුල් කර ගනිමින් ආරම්භ කළ මාරාන්තික උපවාසයට එක්වූ ගොවීන් තිදෙනා පෙරේදා (10) රාත්‍රී 7ට පමණ සූරියවැව ප්‍රාදේශීය රෝහල වෙත රැගෙන ගොස් ඇත. පෙරේදා (10) සවස උපවාසය අවසන් කෙරුණි.

වළව වම් ඉවුර ඒකාබද්ධ ගොවි සංවිධානය ඇතුළු ගොවි සංවිධාන 86ක නිලධාරීන් විසින් ආරම්භ කළ සත්‍යග්‍රහය තව දුරටත් ක්‍රියාත්මක වේ.

කෙසේ වෙතත් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා හරහා විරෝධතාකරුවන්ට සිය ඉල්ලීම වූ අදාළ ගැසට් පත්‍රය මසක් ඇතුළත නිකුත් කරන බවට ඊයේ දැනුවත් කිරීමත් සමඟ ආරම්භ කළ මරාන්තික උපවාසය අවසන් කෙරුණි.

මාරාන්තික උපවාසය අවසන් වුවද ගැසට් පත්‍රය නිකුත් කරන තෙක් සත්‍යග්‍රහය තව දුරටත් ක්‍රියාත්මක වේ.

මියන්මාරයට ඇරියුම් කළේ සාමාජික රටක් නිසයි

විදේශ අමාත්‍යාංශය

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේදී ලබන 1 වැනිදා සිට 17 දා දක්වා පැවැත්වෙන බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීමට සහභාගි වන ලෙස ශ්‍රී ලංකාව සියලු සාමාජික රටවලට නිල වශයෙන් ආරාධනා කර තිබේ.

විදේශ සබඳතා අමාත්‍යාංශය මඟින් මේ ආරාධනාව කර තිබෙන අතර මේ වන විට එම සංවිධානයේ වර්තමාන සභාපතිත්වය දරන්නේ ශ්‍රී ලංකාව වන අතර බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (BIMSTEC) සභාපතිත්වය දරන රට සහ මේ අමාත්‍ය රැස්වීමේ සත්කාරක රට ලෙස, මේ වසර අග භාගයේ ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට අපේක්ෂිත 5 වැනි බිම්ස්ටෙක් සමුළුව පිළිබඳ ලේඛනවල කටයුතු අවසන් කිරීමේ අරමුණින් යුතුව, සාකච්ඡාවලට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකාව විසින් සියලු සාමාජික රටවලට (බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය සහ තායිලන්තය) ආරාධනා කර තිබේ.

එත් මේ වන විට මියන්මාරයේ හමුදා පාලනයක් පවතින බැවින් එරටට එම අවස්ථාවට ආරාධනා කිරීම එරට හමුදා පාලනය ශ්‍රී ලංකාව පිළිගැනීමක් වැනි බව සමාජ මාධ්‍ය පරිශීලකයන් පවසා තිබෙන නමුත් මියන්මාරයද සාමාජික රටක් වන බැවින් ආරාධනා කළ බව විදේශ සබඳතා අමාත්‍යාංශය පෙන්වා දෙයි.

ජගත් කාන්තා දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයෙන් වතු සේවක නිවෙස් පිළිසකරයට ආධාර

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය මෙවර අන්තර්ජාතික කාන්තා දිනය සැමරීම සඳහා සිය සංගමයේ වතුකම්කරු කාන්තා සාමාජිකාවන් සඳහා තමන්ගේ නිවාස පිළිසකර කර ගැනීම සඳහා මූල්‍යාධාරයක් දීමට තීරණය කර ඇත.

එම මූල්‍ය ප්‍රදානය ලබන 13වැනිදා ශ්‍රී ලංකා නිදහස් කාන්තා සංගමයේ අනුග්‍රහයෙන් පොල්ගහවෙල, ඊදැල්ලවත්ත ඔරේන්ජ් ගෝවි කොටසේ ග්‍රාම සංවර්ධන සමිති ශාලාවේදී පැවැත්වේ.

පාරිසරික පනත කඩිනමින් සංශෝධනය කරන්න

කෝප් සභාපති පරිසර අමාත්‍යාංශ ලේකම්ට කියයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

ජාතික පාරිසරික පනත කඩිනමින් සංශෝධනය කළ යුතු බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී චරිත හේරත් මහතා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දී ඇත.

ජාතික පාරිසරික පනත වසර විස්සකට අධික කාලයක සිට යාවත්කාලීන කිරීමට උත්සාහ කළද එය මෙතෙක් සංශෝධනය වී නොමැති හෙයින් මේ පනත කාලානුරූපීව සංශෝධනය කිරීමට පියවර ගන්නා ලෙස පරිසර අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා වෙත දැනුම් දී තිබේ.

මේ පනතේ සංශෝධන පිළිබඳ දීර්ඝව සාකච්ඡා කළද එය ප්‍රායෝගිකව මෙතෙක් ක්‍රියාත්මක නොවීම ගැටලුවක් බවත් හෙතෙම පැවසීය. එමෙන්ම ඇතැම් ආයතන මේ පනත සංශෝධනය කිරීමේ කාර්යයට බාධා එල්ල කරන බවත්, පවතින එම ගැටලු විසඳා ගැනීමට ක්‍රියා කරන ලෙසත් සභාපතිවරයා මධ්‍යම පරිසර අධිකාරියට දැනුම් දුන්නේය.

ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ආනයනය, භාවිතය සහ පසුභාවිත කළමනාකරණයට අදාළ පරිසර විගණන වාර්තාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පැවති කෝප් කාරක සභා රැස්වීමේදී චරිත හේරත් මහතා මේ දැනුම් දීම කළේය. එමෙන්ම පොලිතින් නිෂ්පාදන අමුද්‍රව්‍ය ආනයනය අධෛර්යය කිරීම පරිසර හිතකාමී ආදේශන නිෂ්පාදනයන් පාරිභෝගිකයන්ට දීම හා ප්‍රචලිත කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව මධ්‍යම පරිසර අධිකාරියට දැනුම් දුන්නේය.

වැටලීම් සඳහා කරන නීතිමය කාර්යභාරයන් කඩිනමින් කිරීමට අවශ්‍ය ක්‍රමවේද සැකසීමට පියවර ගන්නා ලෙසද කාරක සභාවේ සභාපතිවරයා එම අධිකාරියට පැවසීය.

පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය සම්බන්ධ ප්‍රගතිය මාසයක් ඇතුළත කෝප් කාරක සභාවට දන්වන ලෙස සභාපතිවරයා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දුන්නේය.

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තොම්බර් මස 10 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වුවද මෙතෙක් එය ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.

ඒ සම්බන්ධයෙන් කඩිනමින් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කෝප් කාරක සභාවේ සභාපතිවරයා අනිල් ජාසිංහ මහතාට දැනුම් දුන්නේය.

මේ රැස්වීම සඳහා ඇමැති මහින්ද අමරවීර, ආචාර්ය සරත් වීරසේකර, රාජ්‍ය ඇමැතිවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල්, නාලක ගොඩහේවා, ජයන්ත සමරවීර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අනුර දිසානායක, ජගත් පුෂ්පකුමාර, ඉරාන් වික්‍රමරත්න, ප්‍රේමනාත් සී.දොලවත්ත, එස්. රාසමාණික්කම් යන මහත්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීහු සහභාගි වූහ.

රන්ජන්ට සති 2ක් අමුත්තන් හමු වීම තහනම්

බුද්ධිකා ඉඹුලාන

බරපතළ වැඩ සහිතව අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ සිර දඬුවම් විඳින පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායකට දෙසතියක කාලයක් අමුත්තන් හමුවීම තහනම් කර තිබේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා සමඟ සෙල්ෆි ඡායාරූප ගැනීමේ වරද බන්ධනාගාර අධිකාරිය ඉදිරියේ පිළිගැනීම නිසා මේ දඬුවම ඔහුට දී ඇත.

එමෙන්ම රැඳවියන්ට තම නිවෙස්වලට කතා කිරීම සඳහා බන්ධනාගාරයෙන් දී ඇති දුරකතන පහසුකම ද මේ සති දෙකේදී රන්ජන් රාමනායක මහතාට අහිමි වේ.

බන්ධනාගාර ආඥා පනතේ 78 වැනි වගන්තිය යටතේ විනය නීති කඩ කිරීම සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් සහිතව ඔහුව අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරිවරයා විසින් ඊයේ (11) විනය ශාලාවට ඉදිරිපත් කර තිබිණි. එහිදී රන්ජන් රාමනායක, තමන් පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා සමඟ සෙල්ෆි ඡායාරූපයක් ගත් බවට බන්ධනාගාර අධිකාරිවරයා ඉදිරිපිටදී වරද පිළිගැනීම නිසා ඔහුට අමුත්තන් හමුවීම දෙසතියක කාලයකට තහනම් කළ බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

පළාත් ඡන්දයට ශ්‍රීලනිපය ඉල්ලුම් පත් කැඳවයි

ස්වර්ණා විජේකෝන්

ඉදිරි පළාත් සභා මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත්වීමට අපේක්ෂා කරන්නන්ට මාර්තු 31 වැනිදාට පෙර ඉල්ලුම් පත් යොමු කිරීමට හැකියාව පවතින බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහ ලේකම් රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහතා දිනමිණට පැවසීය.

ඉදිරියේදී පැවැත්වෙන පළාත් සභා මැතිවරණය වෙනුවෙන් ශක්තිමත් කණ්ඩායමක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සූදානම් බවද ජයසේකර මහතා පැවසීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධානාත්මක කටයුතු නිසි පරිදි කෙරෙන අතර බල මණ්ඩල ඇතුළු ශාඛා සමිති ශක්තිමත් කිරීම මේ වන විට කරන බවද ලේකම්වරයා පැවසීය.

එමෙන්ම පක්ෂයේ ඉදිරි වැඩපිළිවෙළ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පක්ෂයේ සභාපති, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා පක්ෂ මූලස්ථානයේදී විශේෂ සාකච්ඡාවක්ද පැවැත්විණ.

වැඩි දුරටත් අදහස් දැක්වූ මහ ලේකම් දයාසිරි ජයසේකර මහතා, "පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් අපේක්ෂකත්වය ඉල්ලලා සෑහෙන පිරිසක් අයදුම් පත් එවා තිබෙනවා. ඒ වගේම අප දැනුම් දෙනවා මෙයට කැමති අයට අයදුම් එවන්න කියලා. ඒ නිසා පළාත් සභා මැතිවරණය සඳහා සූදානම් වීම තියෙනවා. අයදුම් පත් ගන්න මාසයක කාලයක් තිබුණත් විශාල ප්‍රමාණයක් අපිට ලැබිලත් තිබෙනවා. ඒ අනුව පක්ෂයේ ඉදිරි වැඩපිළිවෙළ ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා."

අශෝක්ගෙන් CIDයට ප්‍රකාශයක් ආණ්ඩුව මාව දඬයම් කළේ නෑ

මාධ්‍යවේදීන් හමුවේ කියයි

රක්ෂණ ශ්‍රියන්ත

පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ මහතා ඊයේ (11) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිට ප්‍රකාශකයක් දී තිබේ.

අශෝක් අබේසිංහ මහතා විසින් පාස්කු ප්‍රහාරයට වත්මන් ජනපති හා අගමැති වගකිව යුතු බවට පසුගියදා කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබිණි.

එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කළ පැමිණිල්ලේ සඳහන්ව ඇත්තේ අදාළ ප්‍රකාශය සම්පූර්ණයෙන් අසත්‍යයක් බවත් එමගින් යම් ආකාරයක විසංවාදයක් ඇති වන බවත් ඒ අනුව මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන ලෙසයි.

ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුට දැනුම්දී ඇති ආකාරයට කරන ලද විමර්ශන ප්‍රකාශයක් දීම සඳහා අශෝක් අබේසිංහ මහතා අපාරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ තිබුණු අතර තමන් කළ ප්‍රකාශය ගැන එහිදී කනගාටුව පළ කර තිබේ. ඔහු මේ අවස්ථාවට පැමිණියේ දෙවරක් ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීම පැහැර හැරීමෙන් පසුවය. ප්‍රකාශ ලබා දීමෙන් අනතුරුව මාධ්‍යයට අදහස් පළ කරමින් අබේසිංහ මහතා පැවැසුවේ දැන් සිද්ධිය නීතිමය කරුණක් බවට පත් ව ඇති බවයි. තමන් කළ ප්‍රකාශය තහවුරු කර ගැනීමට කිසිදු කරුණක් ඉදිරිපත් කර ගැනීමට නොහැකි වූ බවත් තමන්ගෙන් කිසිදු දේශපාලන දඬයමක් රජය සිදු නොකළ බවත් කී ඒ මහතා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමන්ට කෑම බීම පවා ලබා දෙන්නට විමසීම් කළ බවත් කිවේය.

01 පිටුවෙන් ...

දෙල්කඳ ව්‍යාපාරිකයාගේ ...

පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසා සිටියේ පෙරේදා (10) රාත්‍රී 11.30ට පමණ එම මළසිරුර සොයා ගත් බවය.

අදාළ මෝටර් රථය සම්පූර්ණයෙන් පිලිස්සී ඇති බවත් මෝටර් රථය තුළ තිබූ පුද්ගලයාගේ සිරුරද පිලිස්සී තිබූ බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩි දුරටත් පැවසීය.

මේ මෝටර් රථයේ ඉදිරිපස අසුන අසළ පෙට්‍රල් පිරවූ කෑනයක් තිබී ඇති අතර එම පුද්ගලයා අතින් දැල්වූ දුම්වැටියක් ඊට විසි වීමෙන් ගිනි ගැනීම වී ඇති බවට පොලිසිය සැක පළ කරයි.

එම ව්‍යාපාරිකයා රාත්‍රී ආහාර ගැනීමට යම් ස්ථානයකට ගොස් ඉන් අනතුරුව එම මෝටර් රථයෙන් ගමන් කර ඇති බවටත් තොරතුරු ලැබී ඇතැයිද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

මේ සම්බන්ධයෙන් කොහුවල පොලිසිය විසින් වැඩි දුර පරීක්ෂණ පවත්වයි.

මේ පුද්ගලයා අතුරු මාර්ගයේ කාර් රථය නවතා තබා ගෙන සිටි අතර, හදිසියේම මෙලෙස කාර් රථය ගිනි ගෙන දැවීගොස් ඇතැයිද, ඒ මොහොතේ කොහුවල පොලිසිය හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ගිනි නිවීම් රථ දෙකක් යොදා ගින්න නිවීමට කටයුතු කළේය.

මේ ගින්න කෙසේ ඇති වූයේද යන්න හා සිදුවී ඇති අලාභයද ගණනය කර නොමැති අතර වැඩි දුර පරීක්ෂණ කටයුතු කොහුවල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හැරිසන් හෙට්ටිආරච්චි මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් කර ගෙන යයි.

සිද්ධිය වූ ස්ථානය ගල්කිස්ස වැඩ බලන මහේස්ත්‍රාත්වරිය විසින් නිරීක්ෂණය කර ඇති අතර රජයේ රස පරීක්ෂක සහ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාද එම ස්ථානය පරීක්ෂා කර තිබේ.

එමෙන්ම අසල තිබෙන සීසීටීවී කැමරා පරීක්ෂා කිරීමෙන් මෙය ඝාතනයක් බවට හෙළි නොවන නමුත් පරීක්ෂණ කටයුතු සිදු කෙරෙන බවත් පොලිසිය පවසයි.

01 පිටුවෙන් ...

ප්‍රහාරකයන්ට දඬුවම් නොදී ...

සමඟි ජන බලවේගය පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ පාස්කු ප්‍රහාරය ගැන කළ ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රකාශයක් දීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඊයේ (11) උදෑසන පැමිණි අවස්ථාවේදී විපක්ෂ නායකවරයාද ඊට එක් වෙමින් මේ බව පැවසීය. ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රී පිරිසක් ඉදිරිපත් කළ පෙත්සමක් නිසා මන්ත්‍රීවරයාව කැඳවා තිබිණි. මේ අවස්ථාවට විපක්ෂ නායකවරයා ඇතුළු මන්ත්‍රීවරු කිහිපදෙනකුම පැමිණියහ.

විපක්ෂයේ මන්ත්‍රීවරු ආරක්ෂා කිරීම තමන්ගේ වගකීම නිසා මේ අවස්ථාවට සහභාගි වූ බව විපක්ෂ නායකවරයා වැඩි දුරටත් කියා සිටියේය.

ප්‍රකාශය දීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් පළ කළ අශෝක් අබේසිංහ මන්ත්‍රීවරයා මෙසේ කීවේය, "ප්‍රකාශයක් ගන්න මාව කැඳවා තිබෙනවා. මේ අවස්ථාවේ අල්ලන්න ඕනෙ පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ අයයි. ඒත් පුදුමයට කරුණ වන්නේ මහ මොළකරු, මුදල් දුන්න අය අල්ලන්නේ නැතිව අප පසුපස එන එකයි" යැයි ඔහු කීවේය.

මේ අවස්ථාවේ අදහස් ප්‍රකාශ කළ සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ෆීල්ඩ්මාර්ෂල් සරත් ෆොන්සේකා පැවසුවේ සිරගෙවල්වල ගත කිරීමත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ දීමත් තමන්ට අමුතු දෙයක් නොවන බවත් එයින් තමන්ව බියට පත් කළ නොහැකි බවත්ය.

දෙමළ දේශපාලන සිරකරුවන්ට ...

මේ පිරිසට වඩා විනාශකාරී ක්‍රියා කළ දෙමළ කොටි සංවිධානයේ සාමාජිකයන් වසරක කාලයක් පුනරුත්ථාපනය වී නිවෙස්වල සිටීමත් බන්ධනාගාරවල සිටින පිරිස වසර දහයකට වඩා වැඩි කාලයක් බන්ධනාගාරගතව සිටින නිසාත් ඔවුන්ව පොදු සමාවක් යටතේ නිදහස් කිරීම සාධාරණ බව සංගරි මහතා විසින් යවන ලද ලිපියේ සඳහන් කොට තිබේ.

පොදු සමාවන් දීම ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවන බව පෙන්වා දෙන හිටපු මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍යවරයා ඇතුළු පිරිස බෞද්ධාගම පෙරදැරි කර ගත් පාලන ක්‍රමයක් මේ රටේ ගෙන යන නිසා දෙමළ දේශපාලන සිරකරුවන්ගේ පවුල්වල ඥාතීන් මේ වන විට වැටී සිටින අසරණ තත්ත්වය ගැන සලකා ඔවුන්ට පොදු සමාවක් දීම කෙරෙහි අවධානය යොමු කරවන මෙන් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයා අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ.

යුද්ධය හමාර කිරීමෙන් පසුව යළිත් වරක් රටේ ජනාධිපතිවරයා වූ අවස්ථාවේදී මහින්ද රාජපක්ෂ මහතා ජාතික නිදහස් දින උලෙළේදී කළ කතාව යළි සිහිගන්වමින් ආනන්ද සංගරි හිටපු මන්ත්‍රීවරයා සඳහන් කොට ඇත්තේ ඔබ ඒ කතාවේ සඳහන් සියලු දේ ඉටු කරනු දැකීම තම කැමැත්ත බවයි.

වසර හයකදී ...

එමෙන්ම එම කාල සීමාවේදී ආනයනය කරන ලද ප්ලාස්ටික් සඳහා රුපියල් මිලියන 184,300.9ක් වැය කර ඇති බවටද එහිදී අනාවරණය විය.

ආනයනික දත්ත විශ්ලේෂණය කිරීමේදී 2012 වසරේ සිට 2017 වසර දක්වා කාල සීමාවේදී ආනයනික ප්ලාස්ටික් ප්‍රමාණය වර්ධනය වී ඇති අතර 2017 වසරේදී පෙර වර්ෂයන්ට සාපේක්ෂව ආනයනය කර ඇති ප්ලාස්ටික් ප්‍රමාණය ඉහළ ගොස් ඇති බවද මෙහිදී අනාවරණය විය.

එමෙන්ම ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වර්තමාන ආනයන ප්‍රමාණයන් රටට නොදැරිය හැකි මට්ටමක පවතින බවත් කාරක සභාව මෙහිදී පෙන්වා දුන්නේය.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කර බැහැර කිරීමේදී සහ කළමනාකරණයේදී පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතනවල දායකත්වය ගැනීම සහ ආහාර දවටන හා ආහාර අසුරන පිළිබඳ නීති හා එක්වරක් පමණක් භාවිත කර ඉවත දමන ප්ලාස්ටික් භාණ්ඩ පාලන නීති ශක්තිමත් කිරීම කඩිනමින් කළ යුතු බවද කාරක සභාවේ මතය විය.

දැනට වෙළෙඳපොළෙහි පවතින ජෛව හායනයට ලක්වන ආහාර දවටන සඳහා ප්‍රමිතියක් සකසා නොමැති අතර, විකුණුම් මිලක්ද පනවා නොමැත. එහෙයින් ජෛව හායනයට ලක්වන ආහාර දවටන සඳහා ප්‍රමිතියක් හා පාලන මිලක් නියම කිරීම අත්‍යවශ්‍ය බව කාරක සභාව අවධාරණය කළේය.

ජෛව හායනයට ලක්වන අමුද්‍රව්‍ය මඟින් නිෂ්පාදිත ආහාර දවටන පරිසරයට නිදහස් වීමෙන් අනතුරුව එම බහු අවයවික ජලය, පස, සමුද්‍ර පරිසරය හා කසල කළමනාකරණ අංගණ වෙත ළඟා වූ පසු කවර රසායනික හා ජෛව විපර්යාපසයකට ලක් වන්නේද යන්න පර්යේෂණ අධ්‍යයනයක් මෙතෙක් කර නොමැති බැවින් පර්යේෂණ අධ්‍යයනයක් කිරීමේ අවශ්‍යතාවද කාරක සභාව පෙන්වා දුන්නේය.

අසාද් සාලි ...

එහිදී වැඩි දුරටත් අදහස් දැක් වූ ඒ මහතා,

"මෙහෙම කියනවා කියන්නේ ඉතා පැහැදිලිව දැඩි තර්ජනයක් එල්ල කරනවා මේ රටේ අනෙකුත් ජන කොටස්වලට හා ඔවුන්ගේ අන්තවාදී මතයන්වලට එරෙහිව නොයන අයට අප මුස්ලිම් නීතිය වෙනස් කළොත් තව සහරාන් කෙනෙක් එවනවා කියන පණිවිඩය තමයි වෙනත් ආකාරයකින් අසාද් සාලි කියන්නේ. වයස අවුරුදු 12ක දැරියක් විවාහ කර ගෙන තමන්ගේ දුවගේ දුවවත් විවාහ කර ගන්න පුළුවන් මානසිකත්වය තමයි අසාද් සාලි ඉන්නේ. මොන තරම් පහත් මානසිකත්වයකින්ද මේ කටයුතු කරන්නේ. ඒ නිසා පුද්ගලයා හෝ ජාති ආගම් මත නීති වෙනස්වීම ශිෂ්ඨ සම්පන්න ලෝකෙ පිළිගන්න දෙයක් නෙමෙයි. චාරිත්‍ර වාරිත්‍ර උප සංස්කෘතිවලට පවතින්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නෑ.

හැබැයි මේ නීති වෙනස් කළා කියලා අසාද් සාලිට ඌරු මස් කන්න කියලා කවුරුත් කියන්නේ නෑ. සිංහල, මුස්ලිම්, දෙමළ මිනිස්සුන්ව ඇඳුම්න් වෙන් කළා. ඊට පස්සේ ආහාරවලින් වෙන් කළා හලාල් කියලා ගෙනල්ලා. අධ්‍යාපනයෙන්, උසාවියෙන් වෙන් කළා. ඒ කරලා අසාද් සාලිලාට තමන්ගේ පටු දේශපාලන වුවමනා ඉටු කර ගන්න සහරාන්ලාට තවත් මරාගෙන මැරෙන බෝම්බකරුවන් නිර්මාණය කර ගැනීමට තමයි මේ වෙනම නීති ඉල්ලන්නේ. රටේ නීතියට අභියෝග කරන අසාද් සාලිලාට විරුද්ධව අපි විශ්වාස කරනවා නීතිපතිතුමාත් පොලිස් දෙපාර්තමේන්තුවත් ක්‍රියාත්මක වෙයි කියලා.'' යැයිද කීය.

යල-මහ කන්නවලින් ...

එමෙන්ම වී මිල දී ගැනීමේ ක්‍රමවේදය වෙනස් කොට ගොවීන්ට ඒ මොහොතේම මුදල් දී වී මිලදී ගැනීම ආරම්භ කර ඇති අතර එමගින් අතරමැදියන්ගේ මැදිහත්වීම අවම කර ගැනීමට අපේක්ෂා කරන බවද ඇමැතිවරයා සඳහන් කළේය. ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා මේ බව සඳහන

පල්ලෙවෙල ශ්‍රී සුමනජෝති නාහිමි අපවත් වීම සම්බුදු සසුනට දැරිය නොහැකි පාඩුවක්

ඇමැති කෙහෙලිය ශෝක පණිවිඩයකින් කියයි

උතුම් සම්බුදු සසුනේ චිරස්ථිතය උදෙසා අනුපමේය මෙහෙවරක නිරත වූ බදුලු මුතියංගණ රජමහා විහාරයේ හිටපු භාරකාර ඌව වෙල්ලස්ස දෙදිසාවේ ප්‍රධාන සංඝනායක මිණිපේ පහේ කනුව ශ්‍රී සඳගල් විහාරාධිපති පල්ලෙවෙල ශ්‍රී සුමනජෝති නාහිමිපාණන් වහන්සේගේ අපවත්වීම සම්බුදු සසුනට දැරිය නොහැකි වූ ඉමහත් පාඩුවක් බව ජනමාධ්‍ය ඇමැති කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි. උතුම් ධර්මධර, විනයධර සුපේශල ශික්ෂාකාමී හිමිනමක වන උන්වහන්සේ වචනයේ පරිසමාප්ත අරථයෙන්ම මහා සංඝ පීතෘවරයාණන් වහන්සේ නමක් බව ඇමැතිවරයා පෙන්වා දෙයි. පල්ලේවෙල ශ්‍රී සුමනජෝති නාහිමිගේ අපවත්වීම පිළිබඳ ශෝක පණිවිඩයක් නිකුත් කරමින් ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා මේ බව පවසයි.

අතිදුෂ්කර මිනිපේ පුරවරයටත්, ඌව වෙල්ලස්සටත් සසුනඹර එකළු කළ මහා මිණි පහනක් වූ නාහිමියන් උතුම් සංඝ ශෝභන ගුණයෙන් පිරිපුන් මහ තෙර නමක යැයිද ඇමැති රඹුක්වැල්ල මහතා ශෝක පණිවිඩයෙන් පෙන්වා දෙයි.

කරුණා දයාවෙන් පිරිපුන් සුමනජෝති නාහිමියන් 'අනතිමානි' ගුණැති උතුම් හිමිනමක බවත් එවැනි උතුම් යතිවරුන් සසුනේ චිරස්ථිතිය උදෙසා අවැසි මොහොතක නාහිමියන්ගේ අපවත්වීම සැබැවින්ම දැරිය නොහැකි පාඩුවක් බවත් රඹුක්වැල්ල මහතා පෙන්වා දෙයි.

සුමනජෝති හිමියන් වැනි ආදර්ශවත් සංඝ පීතෘවරුන් නිසාවෙන් සම්බුදු සසුන සුරක්ෂිත වී ඇතැයිද ඒ නිසා උතුම් සම්බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා උන්වහන්සේගෙන් ගත හැකි ආදර්ශ ඉමහත් බව ඇමැති රඹුක්වැල්ල මහතා වැඩිදුරටත් පෙන්වා දෙයි.

ඉන්දික පොල්කොටුව
ඇමැතිගේ මාධ්‍ය ලේකම්

පොදු ප්‍රවාහන සේවයට E ticket පතක්

සුභාෂිණී සේනානායක

පොදු ප්‍රවාහන සේවාවලට E ticket පතක් හඳුන්වාදීමට ප්‍රවාහන අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

මේ අනුව එහි නියමු ව්‍යාපෘතියක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා පැවැසීය. මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට ගණනාවක් අදාළ අංශ සහ ප්‍රවාහන අමාත්‍යංශය අතර පැවැති බවත් ඒවායේ සුබවාදී තීන්දු තීරණ රැසක් ගත් බවත් කියා සිටි ඇමැති ලොකුගේ මහතා කඩිනමින් මේ ටිකට්පත මගීන්ට හඳුන්වාදෙන බවත් කියා සිටියේය.

පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමෙන් පසුව මතුවන ගැටලු පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා වූ අතර මේ වන විට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩ කටයුතු රාශියක් සිදු කොට අවසන් වී ඇති අතර නුදුරේදීම නියමු ව්‍යාපෘතියක් ලෙස අදියර කීපයකින් මේ පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ගෘහ සේවිකාවන් වෙනුවෙන් ලක්ෂ දහයක් ඒජන්සිකරුවන්ට ලැබෙනවා කියන කතාව බොරු

බලපත් හිමි විදේශ සේවා නියුක්ති නියෝජිතායතන සංගමය

අනුර ප්‍රේමලාල් සහ මහින්ද අලුත්ගෙදර

ගෘහ සේවිකාවන් වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක් ඒජන්සිකරුවන්ට ලැබෙනවා කියන කතාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන අතර ඒ පිළිබඳ සිදුකරන ඕනෑම විගණනයකට සම්පූර්ණ සහයෝගය දෙන බව බලපත්‍ර ලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතන සංගමය කියා සිටියි.

මේ සම්බන්ධයෙන් එම සංගමයේ ලේකම් එම්.එෆ්.එම්. අර්ෂාඩ් මහතා මෙසේද කීය. ගෘහ සේවිකාවන් වෙනුවෙන් රුපියල් ලක්ෂය දහයක් ලැබෙන බව සඳහන් කිරීම පදනම් විරහිත ප්‍රකාශයකි. මෙය රටෙන් රටට හා සේවකයාගේ වයසෙන් වයසට ලැබෙන ගණන වෙනස් වේ. අප වෙත ප්‍රේෂණය වන සියලුම පෙර විගමිණික වියදම් වෙනුවෙන් වාර්තාවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඉදිරිපත් කරන අතර ඒ වෙනුවෙන් සෙස් මුදල් පවා ගෙවීමට කටයුතු කර තිබෙනවා. එසේම සියලුම ප්‍රේෂණ මහා බැංකුවේ ලියාපදිංචි වී ඇති බැංකු හරහා ගෙන්වා තිබෙනවා.

අපගේ සියලුම බලපත්‍රලාභීන් නියාමනය වන්නේ කාර්යාංශයේ පනත හා ගැසට් නිවේදනය අනුවයි. වසංගත තත්ත්වය හමුවේ රජය කිසිම සහනයක් නොමැතිව බලපත්‍ර ලාභීන් මාර්ගයෙන් ලියාපදිංචිවූ නීත්‍යානුකූලව රැඳී සිටින ශ්‍රමිකයන්ගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඔවුන්ගේ සුබසාධනයට අපගේ දායකත්වය තිබුණු නිසා මේ දක්වා තත්ත්වය පාලනය කර ගත හැකිවිය. නැතිනම් තත්ත්වය මීට වඩා දරුණු විය හැකියි.

ණය නොවී විදේශ විනිමය ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම පිළිබඳ හිටපු ඇමැති බැසිල් රාජපක්ෂ මහතාගේ සංකල්පයට අනුව ඒ සඳහා වන එකම විකල්පය වන විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඉදිරිපත් කරන්න අපි සැලසුම් කළ අවස්ථාවේදි එය කඩාකප්පල් කිරීමක්දැයි හැඟෙනවා.

වකුගඩුවක් ලබාදී වටිනා ජීවිතයක් බේරා ගනිමු

ඉමහත් කැපවීමෙන් දිගුකලක් තිස්සේ සමාජ සේවයේ නිරත සමාජ සේවකයකු සඳහා O+ ("ඕ" පොසිටිව්) වර්ගයේ වකුගඩුවක් අවශ්‍යව ඇත. ලබාදීමට කැමති අයෙක් වෙතොත් කරුණාකර **දුරකථන අංක 0762522538 ට** අමතන ලෙස ඉල්ලා සිටිමු.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 D වන වගන්තිය යටතේ විකිණීම

මහජන බැංකුව
ආයතනික ශාඛාව

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාත් කළුතර දිස්ත්‍රික්කයේ අලුත්ගම බැද්ද කළුතර තොටමුණෙහි බේරුවල ප්‍රාදේශීය සභා සීමා තුළ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 760 දරන මොරගල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කළුවාමෝදර කලවිල හි පිහිටි **කළුවිලවත්ත** නැමැති ඉඩමට බලයලත් මිනින්දේරු එන්. කුලරත්න විසින් සකස් කළ 2008 නොවැම්බර් 3 දිනැති අංක 2587 දරන පිඹුරේ තිරූපිත ලොට් D වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 2 රූඩ් : 1 පර්.28.50

එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව
මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි D/130/125 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ

2021 අප්‍රේල් මස 20 වන අඟහරුවාදා දින
පෙ.ව. 11.00 ට මහජන බැංකුවේ කළුතර ශාඛාවේ ශ්‍රවණාගාරයේහිදී
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙළට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

අදාළ දේපළ ඩබ්.එම්. මෙන්ඩිස් ඇන්ඩ් කම්පණි ලිමිටඩ් විසින් මහජන බැංකුව වෙත උකස්කරන ලදුවකි.

රජයේ ගැසට් පත්‍රයේ 2021.02.12 දිනද, ඩේලිනිවුස්, දිනමිණ සහ තිතකරන් පුවත් පත්වල 2021.02.05 දින ද පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළ වෙත පිවිසීම - අලුත්ගම නගරයේ සිට ගාලු පාර දිගේ ගාල්ල දෙසට මීටර් 100 ක් ගියවිට වම් පසින් පිහිටා ඇති අදාළ දේපළ ලොට් D සහ වරිපනම් අංක 50, ගාලු පාර, මොරගල්ල ලෙස පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාර)
04. ලිපිකරු හා සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 1,500.00
05. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ප්‍රධාන කළමනාකාර - අයකරගැනීම්, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ. දුරකථන අංක 011-2481443, 011-2481546

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම
එකම රටක්. එකම වෙන්දේසිකරුවෙක්.
වසර 129 ක සේවා විශිෂ්ටත්වය සමගින්

ප්‍රධාන කාර්යාලය
24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන - 081-2227593
දුරකථන / ෆැක්ස් - 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය
6A, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 8.
දුරකථන - 011-2671467, 011-2671468
දුරකථන / ෆැක්ස් - 011-2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

වාහන විකිණීමක්

ත්‍රීරෝද රථ		වර්ෂය	අංගනය
AAV-1553	බජාජ්	2014	රාගම
YY- 6186	බජාජ්	2012	නුවරඑළිය
YS-2228	බජාජ්	2011	නුවරඑළිය

මෙම වාහන අපගේ වාහන අංගනයන්හිදී පරීක්ෂා කළ හැකි අතර වෙන්දේසි ක්‍රමයට විකිණේ.

රාගම 0113 288 893
නුවරඑළිය 0114 346 723

දිනුම් වාරය - 4422 නිල ප්‍රතිඵල

මහජන සම්පත

දිනය: 2021-03-10

ජයග්‍රාහී අක්ෂරය: B ජයග්‍රාහී අංක: 7 9 3 8 6 8

ත්‍යාග රටාව - අග සිට මුලට

			ජයග්‍රාහකයන් ගණන
1 වැනි ත්‍යාගය	7 9 3 8 6 8	රු. 2,000,000/-	01
2 වැනි ත්‍යාගය	9 3 8 6 8	රු. 100,000/-	14
3 වැනි ත්‍යාගය	3 8 6 8	රු. 10,000/-	125
4 වැනි ත්‍යාගය	8 6 8	රු. 1,000/-	1,250
5 වැනි ත්‍යාගය	6 8	රු. 100/-	12,594
6 වැනි ත්‍යාගය	8	රු. 20/-	124,498

ත්‍යාග රටාව - මුල සිට අගට

			ජයග්‍රාහකයන් ගණන
7 වැනි ත්‍යාගය	7 9 3 8 6	රු. 10,000/-	10
8 වැනි ත්‍යාගය	7 9 3 8	රු. 1,000/-	127
9 වැනි ත්‍යාගය	7 9 3	රු. 100/-	1,275
10 වැනි ත්‍යාගය	7 9	රු. 50/-	12,465
11 වැනි ත්‍යාගය	B	රු. 20/-	49,655

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 11,620,210.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 11,037,498.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

2021-03-10 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 706,649

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 63,427,867.60

www.nlb.lk

ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 32,869,777.60 | 01 | රු. 2,000,000.00 ත්‍යාග | 01 | රු. 1,000,000.00 ත්‍යාග | 03 | රු. 100,000.00 ත්‍යාග | 25

ජාතික ලබ සම්පත

නිල ප්‍රතිඵල දිනුම් වාරය 1103 | දිනය 2021.03.10

ජයග්‍රාහී ලග්නය: ධනු

ජයග්‍රාහී අංක: 0 6 5 3 4 8

අග සිට මුලට ත්‍යාග රටාව

01 ත්‍යාගය	0 6 5 3 4 8	රු: 1,000,000.00	ත්‍යාගය	01
02 ත්‍යාගය	6 5 3 4 8	රු: 100,000.00	ත්‍යාග	03
03 ත්‍යාගය	5 3 4 8	රු: 10,000.00	ත්‍යාග	26
04 ත්‍යාගය	3 4 8	රු: 1,000.00	ත්‍යාග	313
05 ත්‍යාගය	4 8	රු: 100.00	ත්‍යාග	3,047
06 ත්‍යාගය	8	රු: 20.00	ත්‍යාග	30,546

මුල සිට අගට ත්‍යාග රටාව

07 ත්‍යාගය	0 6 5 3 4	රු: 10,000.00	ත්‍යාග	0
08 ත්‍යාගය	0 6 5 3	රු: 1,000.00	ත්‍යාග	29
09 ත්‍යාගය	0 6 5	රු: 200.00	ත්‍යාග	288
10 ත්‍යාගය	0 6	රු: 100.00	ත්‍යාග	3,072
11 ත්‍යාගය	ධනු	රු: 20.00	ත්‍යාග	25,427
12 ත්‍යාගය	ජයග්‍රාහී අංක 6ම ඕනෑම පිළිවෙලට ගැලපීමෙන්	රු: 200.00	ත්‍යාග	264

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 3,743,760.00

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස හයක කාලසීමාවකට පමණි. රුපියල් ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ලබන සෙනසුරාදා සුපිරි ත්‍යාගය රු. 14,987,563.70

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 4607000, 011 2324324
ෆැක්ස්: 011 4669416
Web : www.nlb.lk

ධන නිධානය නිල ප්‍රතිඵල

දිනය - 2021/03/10
දිනුම් වාරය - 459

ඉංග්‍රීසි අක්ෂරය: T
ජයග්‍රාහී අංක: 04 15 24 64
දහස් වරම: 0249

	සංයෝග	තෑගි	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 04 ගැලපේ නම්	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 100,000.00	02
3 ත්‍යාගය	අංක 3 ක් ගැලපේ නම්	රු. 3,000.00	91
4 ත්‍යාගය	අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 1,000.00	226
5 ත්‍යාගය	අංක 2 ක් ගැලපේ නම්	රු. 100.00	5,176
6 ත්‍යාගය	අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම්	රු. 60.00	3,513
7 ත්‍යාගය	අංක 1 ක් ගැලපේ නම්	රු. 20.00	89,248
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම්	රු. 20.00	16,466

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 4,676,660.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 114,858

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය රු.87,028,424.80

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
ඇස 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2717 | දිනුම් අදින ලද දිනය 2021 /03 /10

ඉංග්‍රීසි අක්ෂරය: S
ජයග්‍රාහී අංක: 29 63 73 80

	සංයෝගය		තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 4 ම නිවැරදි	රු.	1,000,000.00	01
2 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි	රු.	100,000.00	04
3 ත්‍යාගය	අංක 3 ක් පමණක් නිවැරදි	රු.	2,000.00	177
4 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි	රු.	1,000.00	396
5 ත්‍යාගය	අංක 2 ක් පමණක් නිවැරදි	රු.	100.00	9,991
6 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි	රු.	40.00	6,532
7 ත්‍යාගය	අංක 1 ක් පමණක් නිවැරදි	රු.	20.00	164,171
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු.	20.00	29,912

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 211,184

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,292,040.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 72,520,017.20

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යයේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

ඉරිදා ගෝල්ඩන් මෙගා පවර් දිනුම් වාරය 786 නිල ප්‍රතිඵල

දිනය: 2021.03.10

ඉංග්‍රීසි අකුර: G
සුපිරි අංකය: 10
ජයග්‍රාහී අංක: 05 41 55 74

	ත්‍යාග රටාව	ත්‍යාග මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය	සුපිරි අංකය සමග අංක 04 ම ගැලපේනම්	32,869,777.60	01
1 වන ත්‍යාගය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන ත්‍යාගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	02
3 වන ත්‍යාගය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	96
4 වන ත්‍යාගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	225
5 වන ත්‍යාගය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	5,502
6 වන ත්‍යාගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	3,585
7 වන ත්‍යාගය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	89,724
8 වන ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	16,442

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 121,855,704.40

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 20,938,204.80
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

දිනා ඇති මුළු මුදල රු. 36,095,197.60

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

පාස්කු දින ප්‍රහාරයේ සැකකරුවන් 291කට එරෙහිව නඩු පැවරීමට පියවර ගන්නවා

බනිජ සම්පත් ඇමැති, උදය ගම්මන්පිල පාර්ලිමේන්තුවේදී කියයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

යහපාලන ආණ්ඩුවේ අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඉස්ලාම් අන්තවාදය කෙරෙහි දැක්වූ ලිහිල් ප්‍රතිපත්තිය නිසා පාස්කු ප්‍රහාරය එල්ල වූ අතර පාස්කු දින ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන් 291කට එරෙහිව නඩු පැවරීමට රජය පියවර ගන්නා බව බනිජ සම්පත් ඇමැති උදය ගම්මන්පිල මහතා පාර්ලිමේන්තුවේ දී පෙරේදා (10) ප්‍රකාශ කළේය.

සහරාන් වැනි අන්තවාදී කල්ලියකගෙන් නැවත වරක් දෙවැනි ප්‍රහාරයක් එල්ල වීමට පෙර මෙරටින් අන්තවාදී කල්ලි මුලිනුපුටා දැමීමට රජය කටයුතු කරන බවත් පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් ජනාධිපති කොමිසම් වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙන ඇතැම් නිර්දේශ සම්බන්ධයෙන් එක්වීමට හැකියාවක් නැති බවත් ඇමැතිවරයා පැවසීය.

පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් ජනාධිපති කොමිසම් සභා වාර්තාව විවාදයට ගැනීමේ අවස්ථාවට එක් වෙමින් ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කර සිටියේය.

වේත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව පෙරේදා (10) රැස්විය. නිවේදන, ලිපි ලේඛන, පෙත්සම් වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව වාචික පිළිතුරු අපේක්ෂාවෙන් මන්ත්‍රීවරුන් ඇසූ ප්‍රශ්නවලට ඇමැතිවරු පිළිතුරු දුන්හ.

බනිජ සම්පත් ඇමැති උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා-

ජනාධිපති කොමිසම් සභා වාර්තාව ගැන මටත් විවේචනයක් කරන්න තිබෙනවා. නමුත් ඊට පෙර ඒ සඳහා තිබෙන පහසුකම් ගැන සොයා බැලිය යුතුයි. මේ කොමිසමට තිබූ පහසුකම් අප සිතිය යුතුයි. පොලිස් පරීක්ෂණ සිදු වෙනවා. සැකකාරයා ලුහුබැඳ හෝ වෙස්වළාගෙන ගොස් සොයන්න පුළුවන්. නමුත් මේ කොමිසම් සභාවේ නිලධාරීන්ට එසේ කළ නොහැකියි. කොමිසම් සභාවේ නිර්දේශ ගැන අධ්‍යයනය කළ යුතුයි. ඒ සඳහා අනුකම්ටුවක් පත් කළා. ඒ ගැනත් අපට විවේචන ආවා. නීතිපතිවරයාට තිබෙන දේ සම්බන්ධයෙන් ආණ්ඩුව ඇඟිලි ගහන්නේ නැහැ. මේ වාර්තාවෙන් වැඩිපුරම ආණ්ඩුව සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. රජය පත් කළ අනුකම්ටුවෙන් අධිකරණ කටයුතුවලට ඇඟිලි ගහන්නේ නැහැ. මේ වාර්තාවේ 308 වැනි පිටුවේ කියනවා. සාක්ෂි සලකා බැලීමේදී රනිල් මහතා ඉස්ලාම් අන්තවාදය කෙරෙහි දැක්වූ ලිහිල් ප්‍රතිපත්තිය නිසා මේ ප්‍රහාරය ඇති වූ බව කොමිසම් සභා වාර්තාව කරුණු ගෙනහැර දක්වනවා. පාස්කු ප්‍රහාරයට යුක්තිය ඉටු කරන්න කියලා කියන්න සදාචාරාත්මක අයිතියක් විපක්ෂයට නැති බව අපි මතක් කරනවා. ගලබොඩඅත්තේ ඥානසාර හිමියන්ට නඩු පැවරිය යුතු බවට මේ වාර්තාවෙන් ප්‍රකාශ කර තිබෙනවා. 2016 වසරේ සිට ඉස්ලාම් අන්තවාදය ගැන මත පළ කළ උන්වහන්සේට එරෙහිව නඩු පවරන්නේ නම් ඉන් කියවෙන්නේ මෙවැනි මත පළ නොකළ යුතු බවයි. එම නිර්දේශය අපට පිළිගත නොහැකියි. බුද්ධි අංශය මේ ගැන තවදුරටත් සිතා බැලිය යුතුයි. බුද්ධි අංශයේ උපදේශකවරයෙක් ලෙස උන්වහන්සේ පත් කර ගත යුතු බව මම යෝජනා කරනවා. සුරේෂ් අලෙයි මහතා රැක ගත යුතුයි. ඒ මහතා මුස්ලිම් අන්තවාදය නැති කරන්න කටයුතු කළ පුද්ගලයෙක්. එවැනි පුද්ගලයන් රැක ගත යුතුයි. සහරාන්ගේ දෙවැනි ප්‍රහාරයක් එල්ල වීමට පෙර මේ අන්තවාදය නතර කිරීමට පියවර ගත යුතුයි. මේ ප්‍රහාරයේ 291කට නඩු දාන්න කටයුතු කරනවා.

පත් කළ මන්ත්‍රී ජයන්ත වීරසිංහ මහතා (පො.ජ.පෙ.)-

පාස්කුදා ප්‍රහාරය නිසා පුද්ගලයන් 300කට වැඩි දෙනකුට ජීවිතය අහිමි වුණා. 500කට වැඩිදෙනෙක් තුවාල වුණා. පසුගිය ආණ්ඩුව මේ සඳහා වගකිව යුතුයි. රටේ ආරක්ෂාව බල්ලට යන්න ඇරියා. එවකට ජනාධිපතිවරයාව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කළා. එහි වාර්තාව මේ වන විට ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ මෑතකදී සිදු වූ විශාලම බේදවාචකය තමයි පාස්කු දින ප්‍රහාරය. 2019 අප්‍රේල් 21 වැනිදා මේ ප්‍රහාරය සිද්ධ වුණා. මේ ප්‍රහාරයට වග කිව යුත්තේ මේ සිද්ධිය සිදු වූ කාලයේ බලයේ සිටි යහපාලන ආණ්ඩුවයි. අද වෙන බෝඩ් එකක් ගහගෙන සමඟි ජන බලවේගය නමින් මෙතැන වාඩි වී සිටියාට ඒ අය තමයි මේ සිද්ධියට වගකිව යුත්තේ. විපක්ෂය අමුතුම කතාවක් මෑතකදී කියන්න පටන් ගෙන තිබෙනවා. අපේ රජය බලයට පත්වුණේ පාස්කු දින ප්‍රහාරය මතින් කියලා. පාස්කු දින ප්‍රහාරය සිදු වුණේ 2019 අප්‍රේල් 21 වැනිදා. නමුත් අපේ ආණ්ඩුව බලයට පත්වීමට මූලාරම්භය තැබුවේ 2018 පෙබරවාරි 10 වැනිදා පැවැති ප්‍රාදේශීය මැතිවරණයෙන්. බැසිල් රාජපක්ෂ මහතාගේ සංවිධානය යටතේ එදා ඡන්දයෙන් මන්ත්‍රීවරුන් 3361 ක් පත් වුණා. කොට්ඨාස 261 ක් ජයග්‍රහණය කරන්න අපට පුළුවන් වුණා. පාස්කු දින ප්‍රහාරය නිසා අපි බලයට පත් වුණා කියා මේ අය කියනවා නම් ඒවා ඉල්ලා අස් කරගත යුතුයි. මේ වාර්තාව අනුව තරාතිරම නොබලා දඬුවම් දිය යුතුයි. යහපාලන ආණ්ඩුව යටතේ සර්ව බලධාරියා වුණේ හිටපු අගමැතිවරයා. නාමික ජනාධිපතිවරයා ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා කටයුතු කළා. ඒ ආණ්ඩුව යටතේ සිටි තුන්වැනි බලය ලත් පුද්ගලයා වුණේ වත්මන් විපක්ෂ නායකවරයා. මේ අය තමයි පාස්කු දින ප්‍රහාරයට වගකිව යුත්තේ. සාරා නමැති කාන්තාව ලංකාවට ගෙන්නන්න කියා විපක්ෂය අද කියනවා. ඔවුන් බලයේ සිටි කාලයේ සාරා නමැති කාන්තාව 2019 සැප්තැම්බර් මාසය දක්වා ලංකාවේ සිටියා. 2015 සිට ජාතික ආරක්ෂාවට ප්‍රමුඛතාව දීම සිදු කර නැහැ. අයි එස් සහ ඉස්ලාමීය අන්තවාදය සහ වෙනත් අන්තවාද හඳුනා ගැනීමට එකල ආණ්ඩුවට නොහැකි වුණා. මේ වාර්තාව ලබාදී තිබෙන්නේ ඔවුන්ගේම ආණ්ඩුව විසින්.

පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී නිරෝෂන් පෙරේරා මහතා (ස.ජ.බ.)-

එදා සිට අපි මේ වෙනුවෙන් සාධාරණ පරීක්ෂණයක් ඉල්ලුවා. ඒ අනුව නීතිය ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලුවා. රිෂාඩ් බදියුදීන්ට එරෙහිව විශ්වාසභංගයක් ගෙන ඒමට මේ අය කටයුතු කළා. ඒ සඳහා මගේ සහාය දෙන බව මම පැවසුවා. පසුගිය ආණ්ඩුව තිබෙන කාලයේ මේ අය කෑගැසුවත් දැන් ඒ අයට මොකද වෙලා තිබෙන්නේ. පාස්කු දින වාර්තාවේ පළමුවෙන්ම ප්‍රහාරය වැළැක්වීමට තිබූ කෙනා අද වාඩිවෙලා සිටින්නේ ආණ්ඩු පක්ෂයේමයි. මේ සම්බන්ධයෙන් ජනතාව බලා සිටිනවා. මේ පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිම දවසක සාධාරණයක් ඉටු නොවන බවට මගේ හිතේ තිබෙනවා. තමන්ගේ දේශපාලන බලය රැක ගැනීමට පාස්කු දින ප්‍රහාරය පාවාදීලා ඉවරයි. මේ වාර්තාවේ කොටස් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් අපි ප්‍රශ්න කරනවා. සහරාන් සමඟ මේ සිද්ධිය වළ දැමීමට උත්සාහ කරන්න එපා.

මහජන ආරක්ෂක ඇමැති සරත් වීරසේකර මහතා-

සුරේෂ් අලෙයි තමයි රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියා ලෙස සිටින්නේ. සිද්ධීන් නවයක් සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුව කිසිම දෙයක් කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් කිසිදු අයිතියක් නැහැ ඔහුට.

නිරෝෂන් පෙරේරා මහතා-

මෙතැන කතා කරන්න අයිතියක් නැත්නම් කොහේට ගිහිං ද කතා කරන්නේ. සුරේෂ් අලේ ගැන චෝදනා තිබෙනවා.

කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා-

පසුගිය ආණ්ඩුවේ සමඟි ජන බලවේගයේ බහුතරයක් පිරිස මේ පාස්කු දින ප්‍රහාරයට වගකිව යුතුයි. මේ විවාදයේදී පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් එක් එක්කෙනාට ඇඟිල්ල දික් කර වැඩක් නැහැ. ඒ ආණ්ඩුව ජාතික ආරක්ෂාවට මුල් තැන දුන්නේ නැහැ. මුල් තැන දුන්නේ සංහිඳියාවට. බටහිරට කොන්ත්‍රාත්තුව දුන්නා. අපේ කාලයේ ප්‍රමුඛස්ථානය දුන්නේ ජාතික ආරක්ෂාවට. මංගල සමරවීර මහතා පිටරටට ගොස් අපේ රණවිරුවන්ට විරුද්ධව කටයුතු කළා. රාජ්‍ය නොවන සංවිධානවල මුදල් බලයට යහපාලනය යටත් වුණා. මේ සිද්ධිය සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කළා. මෛත්‍රීපාල සිරිසේන මහතා තමයි පත්කළේ. පාර්ලිමේන්තුවේ කාරක සභාවකුත් පත් කර ගත්තා. මාස අටක් ගල් ඉබ්බෝ වගේ කට වහගෙන සිටියා. දැන් තමයි මේ කතා කරන්නේ. විපක්ෂ නායකවරයාට මේ ගැන කියන කොට ඇඩෙනවා. ඒ තරම්ම එතුමාට දුකයි. අපි මැරිලා ඉපදිලා නැහැ. තේරීම් කාරක සභාවක් දාලා මේ සිද්ධිය වහන්න යහපාලනය කටයුතු කළා. මේ කොමිසම සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන බව කාදිනල්තුමා ප්‍රකාශ කළා. ඔබවහන්සේගේ නියෝජිතයෙක් මේ කොමිසම් සභාවට පත් කරන ලෙස ගෝඨාභය ජනාධිපතිතුමා ඉල්ලීමක් කළා. නමුත් එය කාදිනල්තුමා ප්‍රතික්ෂේප කළා. මේ සිද්ධියේ මහ මොළකරුවා සහරාන්. ඔහු මරාගෙන මැරිලා තිබෙනවා. ඔහු සමඟ සිටි අයත් මරාගෙන මැරිලා තිබෙනවා. පළමු පෙළේ ප්‍රධාන අපරාධකරුවන් ගණනාවක් මිය ගිහින් තිබෙනවා. ඊළඟ පෙළේ සැකකරුවන් මේ වන විට අත්අඩංගුවට ගෙන තිබෙනවා. සමඟි ජනබලවේගයේ පක්ෂ නායකයන් තුන්දෙනෙක් මේ සිද්ධියට සම්බන්ධයි කියා කාරණා තිබෙනවා. විපක්ෂ නායකවරයාගේ බඩිය තමයි හරින් ප්‍රනාන්දු. ඔහු කළු කොඩි දාන්න, කළු ඇඳගෙන එන්න කියා කීවා. ඔහු එදාට පල්ලිය ඉස්සරහා පිටිටනියට ගොස් ක්‍රිකට් ගහනවා. පාස්කු දින ප්‍රහාර සිද්ධියට සම්බන්ධ වන්නේ එක්සත් ජාතික පක්ෂයේ සිටි පිරිස සහ අද සමඟි ජන බලවේගයේ සිටින බහුතරයක් මන්ත්‍රීවරුන් කියා මම කියනවා.

දිවා ආහාරයෙන් පසුව නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය-

පාස්කු දින ප්‍රහාරය සිදු වුණේ ගිය ආණ්ඩුව කාලේ බව පොඩි දරුවෙක් පවා දන්නවා. මෙරට ජාතික ආරක්ෂාව ගැන නොතකා කටයුතු කළ නිසා මේ ප්‍රහාරය සිදු වුණා. මේ ප්‍රහාරය සම්බන්ධයෙන් 97 වතාවක් දැනුම්වත් දී තිබුණා. කාදිනල්තුමා ඉල්ලා සිටින්නේ මේ ප්‍රහාරයේ සැකකරුවන් හඳුනාගෙන දඬුවම් දෙන්න කියලා. මුස්ලිම් අන්තවාදය හරහා ත්‍රස්තවාදී කල්ලි බිහිවෙලා සිටිනවා. පුත්තලම ගමක මම පොඩි කාලයේ හැදුණේ. ඒ කාලයේ සංහිඳියාව රටේ තිබුණා. විවිධ පුද්ගලයන් හරහා එන සංවිධාන යනාදිය නියාමනය කරන්න අවශ්‍යයයි. මේ රටේ ජනතාව වෙනුවෙන් යුක්තිය සාධාරණය ඉටු කරන්න ජනාධිපතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා. අපි එතුමා විශ්වාස කරනවා. කටුවාපිටිය ජනතාවට වගේම මේ සිද්ධියෙන් මරණයට පත් වූ සියලුදෙනාගේ පවුල්වලට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ආබාධ වූ අයට ශක්තිය දෙන්න කටයුතු කරනවා.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී සරත් ෆොන්සේකා මහතා (ස.ජ.බ.)-

පාස්කු දින ප්‍රහාර වාර්තාව පෝස්මෝටම් වාර්තාව දක්වා පටු වී තිබෙනවා. ඒ නිසා රජයේ පාර්ශ්වවලින් පවා මේ වාර්තාව සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන බව ප්‍රකාශ කරනවා. ජනාධිපති කොමිසම හාරසිය පනස් ගණනකින් සාක්ෂි ගෙන තිබෙනවා. නමුත් අපි ගත් වාර්තාවම තමයි මේ කොමිසමෙන් ඉදිරිපත් කර තිබෙන්නේ. ජනතාවට පොරොන්දු වූ පරිදි ත්‍රස්තවාදී ප්‍රහාරයේ මහ මොළකරුවා හඳුනාගෙන නැහැ. ත්‍රස්තවාදී කටයුතුවල සුලමුල සෙවීමට හැකිවන්නේ හමුදාවලට, බුද්ධි අංශවලට, පොලිසියට පමණයි. විනිසුරුවරුන්ගේ කොමිසමක් මගින් මේවා සොයා ගත නොහැකියි. ජනාධිපති කොමිසම සහරාන්ගේ ක්‍රියාකලාපය ගැන සම්පූර්ණයෙන් වාර්තා කර නැහැ. 2009 වසර වන විටත් සහරාන් ළඟ ටී 56ක් තිබී තිබෙනවා. නමුත් මේවා වාර්තා කිරීමට කොමිසම කටයුතු කර නැහැ. වග කියන්න ඕන පුද්ගලයා මෙතැන ඉස්සරහා වාඩි වෙලා සිටිනවා. මෛත්‍රීපාල සිරිසේන මහතා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ.

පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු මහතා-

ජනතාවගේ සිතැඟි පරිදි අපි මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යනවා. ෆොන්සේකා මහතාගේ සිතුවිලි පරිදි ඔවුන්ගේ ආණ්ඩුවක් ගෙන ඒමට අපේ ආණ්ඩුව පරාජය වීමක් වෙන්නේ නැහැ. පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් හරියටම වැරැදිකරුවන් හඳුනාගත යුතුයි. මේ සිද්ධියට අදාළව බන්ධනාගාර 12 ක සැක පිට 190කට වඩා වැඩි පිරිසක් සිරගත කර තිබෙනවා. මේ වාර්තාව පිළිබඳ හොඳ සහ නරක දෙකම තිබෙනවා. මේ වාර්තාවේ සාධනීය පැත්තකුත් තිබෙනවා. ඒ පැත්ත සම්බන්ධයෙන් අපි සිතිය යුතුයි. මේ සිද්ධිය සම්බන්ධයෙන් සාධාරණ විමර්ශනයක් සිදු කරනවා. යහපාලන ආණ්ඩුව කාලයේ දී අගමැතිවරයා ප්‍රමුඛ කණ්ඩායම අරලිය ගහ මන්දිරයට රැස්ව ඊළඟට අත්අඩංගුවට ගන්න කෙනා ගැන සාකච්ඡා කරනවා. අපේ ආණ්ඩුවෙන් එහෙම දෙයක් සිදු වන්නේ නැහැ. විපේදාස රාජපක්ෂ මහතා වනාතවිල්ලුව ගැන කතා කරන විට රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ඔහුට සහාය දුන්නේ නැහැ. ඒවාත් සමඟ තමයි මේ ප්‍රහාර සිද්ධ වන්නේ. මේ රටේම තරුණ මුස්ලිම් පිරිසක් තමයි මේ සිද්ධියට සම්බන්ධ වුණේ. ඊබ්‍රාහිම් මහතා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධයි. ඔහුගේ පුතාලා දෙන්නා තමයි මේ ප්‍රහාරයට සම්බන්ධ. අවුරුදු තිහක යුද්ධයක් අවසන් කරන්න අපට හැකි වුණා. නිදහස් කර දුන් රටේ නැවත ත්‍රස්තවාදයක් ඇති නොවීම සඳහා පියවර ගත යුතුයි. මගේ අමාත්‍යාංශයේ දෙවැනි පොල් ත්‍රිකෝණය යාපනයෙන් හදන්න ආරම්භ කළා. මෙවැනි කටයුතුවලින් තමයි සංහිඳියාව ඇති කළ යුත්තේ. අපේ රජය ගැන විශ්වාසය තබා ගන්න. මේ සිද්ධියට සම්බන්ධ සියලුදෙනාට දඬුවම් දීම සිදු කරනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රී රාසමාණ්‍යකම් මහතා මුලසුනට පැමිණියේය.

පත් කළ මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර මහතා (ස.ජ.බ.)

පාස්කු ප්‍රහාර කොමිසම් වාර්තාවේ කොටසක් පමණයි අපට ලැබී තිබෙන්නේ. මේ ප්‍රහාරය සම්බන්ධ තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට එවකට රජය කටයුතු නොකළ ආකාරය සම්බන්ධයෙන් තමයි මේ අය කතා කරන්නේ. මේ වාර්තාවේ වෙලුම් 22 ක් හංගලා තිබෙනවා.

ඉඩම් ඇමැති එස්.එම්. චන්ද්‍රසේන මහතා-

කොමිසම් සභා වාර්තාව ගැන විවිධ කතා කියනවා. පාස්කු දින ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණ අය තමයි මේ කතා කරන්නේ. ගෝඨාභය ජනාධිපතිවරයා මේකට වග කියන්න ඕනෑ කියා විපක්ෂයේ අය රෙදි ඇඳගෙන ද කියන්නේ. සාමය උදා කර දුන් රටක් තමයි යහපාලනය බාර ගත්තේ. නමුත් අපට බාර ගන්න වුණේ නැවත ත්‍රස්තවාදී කටයුතු සිදු වූ රටක්. මාර්ගෝපදේශ ඔස්සේ ගොස් මේ වාර්තාව හදා තිබෙනවා. මේ වාර්තාව ඇඳගෙන කාදිනල්තුමා පවා නොමඟ යවන්න උත්සාහ කරනවා. දේශපාලන වාසි උදෙසා තමයි ඒ අය එහෙම කරන්නේ. මේ ප්‍රහාරය යට ගසන්න අපට කිසිම වුවමනාවක් නැහැ.

කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා (ස.ජ.බ.)

පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් කටයුතු කළ අයගේ කරමුලින් අල්ලා ගත යුතුයි. මේ සිද්ධියේ මහ මොළකරු අනාවරණය කර ගත යුතුයි. මේ ප්‍රහාරයට වගකිව යුත්තන්ට තරාතිරම නොබලා දඬුවම් කරන බව ප්‍රකාශ කරලා තමයි මේ ආණ්ඩුව බලයට පැමිණියේ. මේ වාර්තාවේ කොටස් හංගා ඇති බව නීතිපතිවරයා පවසනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අධිකරණ කටයුතු නිසි විදියට ගන්න වෙන්නේ නැහැ. පාස්කු ප්‍රහාරයේ වාසිය ගියේ වත්මන් ආණ්ඩුවට.

කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා (පො.ජ.පෙ.)-

එරාන් වික්‍රමරත්න මහතාගේ කතාවෙන් තහවුරු කරන්න උත්සාහ කළේ පාස්කු දින ප්‍රහාරය නිසා තමයි යහපාලන ආණ්ඩුව පරාජය වුණේ කියා. අපේ රටේ 4917 පළාත් පාලන කොට්ඨාස තිබෙනවා. පළාත් පාලන මැතිවරණය 2018 පෙබරවාරි 10 වැනිදා පැවතුණා. ඉන් 3297ක් කොට්ඨාස අපි දිනුවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දිනුවා. ඒ පාස්කු දින ප්‍රහාරයට අවුරුද්දකට කලින්. යහපාලන ආණ්ඩුව කොට්ඨාස 768 යි දිනුවේ. ඉතින් මේ අය කොහොමද කියන්නේ පාස්කු දින ප්‍රහාරය මතින් අපි ආණ්ඩුව ජයග්‍රහණය කළා කියා. වැරැදි දේශපාලන අදහසක් සමාජගත කරන්න ඔවුන් උත්සාහ කරන බව අපට මෙයින් පෙනී යනවා. අවුරුදු හතර හමාරක් යහපාලන ආණ්ඩුව බලයට පත් වී සිටියා. ඒ කාලයේදී ආරක්ෂක ඇමැතිවරුන් පස්දෙනෙක් පත් කළා. පාස්කු ප්‍රහාරය දිනයේ පිපිරුම් 8ක් සිදු වුණා. මේ සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් පත් කර සාධාරණයක් ඉටු කළ යුතු බව මගේ අදහසයි.

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලන්සා මහතා-

ශ්‍රී ලංකා රදගුරු සමුළුව වාර්තාවක් නිකුත් කර තිබෙනවා. යහපාලනය ගේන්න වැඩ කළේ සහරාන්ලා. ඒ නිසා අපට ඇඟිලි දික් කරන්න එන්න එපා. සහරාන්ට පෝෂණය වෙන්න ඉඩ හැරියේ යහපාලන ආණ්ඩුව. මහ මොළකාරයන්ව අල්ලන්න තිබූ සාක්ෂි සියලු දේ යහපාලනය විනාශ කළා. සහරාන්ලාගේ ලැප්ටොප්වල තිබූ සියලු තොරතුරු ඔවුන් විනාශ කළා. කතෝලික සභාව කඩිනම් පියවර ගන්න කියා ඉල්ලා සිටියා. කතෝලික ජනතාව කිසිම අවස්ථාවක ලෑස්ති නැරෑ වැටුණු වලේ දවල් වැටෙන්න. ඒ අය දන්නවා මේ සිද්ධිය සම්බන්ධයෙන් වග කිව යුත්තේ යහපාලන ආණ්ඩු කාලය කියා. ත්‍රස්තවාදී කටයුත්ත සිදු කළ අය ගැන හොයන්න තමයි මේ කොමිසම පත් කළේ. ත්‍රස්තවාදී ප්‍රහාරයට සිංහල බෞද්ධ කිසිදු සංවිධානයක් සම්බන්ධ නැති බව පැහැදිලිව කිව යුතුයි. අන්තවාදී දේවල් ගැන මේ වාර්තාවේ සඳහන් වෙනවා. ඒ ගැන අපේ විරෝධතාව පළ කරනවා. අපි මේ කොමිසම පත් කළේ ත්‍රස්තවාදය ගැන හොයන්න මිස අන්තවාදී සිංහල බෞද්ධ සංවිධාන හෝ වෙනත් සංවිධාන ගැන සොයන්න නොවන බවත් පැහැදිලි කළ යුතුයි.

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී කාවින්ද ජයවර්ධන මහතා (ස.ජ.බ.)-

පාස්කු දින ප්‍රහාරය වන විට ආරක්ෂක ඇමැති විදියට සිටියේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා. ඔහු සිටින්නේ දැන් ආණ්ඩුවත් එක්ක. ඔහු ආරක්ෂා කරන්න දැන් ආණ්ඩුව කටයුතු කරනවා. අපේ කතෝලික ජනතාවට සාධාරණයක් ඉටු වන තෙක් අපි සටන් කරනවා. මේ ලෝකයේ කතෝලික සභාව කළු ඉරිදාවක් නම් කර නැහැ. මේ කළු ඉරිදාව අවසන් නැහැ. සාධාරණය ඉටු නොවුණොත් කතෝලික සභාව පාරට බහිනවා.

පත් කළ මන්ත්‍රී අතුරලියේ රතන හිමි-

මේ වාර්තාවේ අඩුපාඩු ඇති. නමුත් ඉදිරියට යාම සඳහා මේ වාර්තාව වැදගත් වෙනවා. දේශපාලන ගැටුම් ඉවත දමා මේ ප්‍රහාරය සම්බන්ධයෙන් පවතින බරපතළකම ගැන අවධානය යොමු කළ යුතුයි. ඒ ගැන මේ සභාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම සිතා බැලිය යුතුයි. ඉස්ලාම් ආගම මත පදනම් වූ රාජ්‍යයක් බිහි කිරීමට තමයි මේ ප්‍රහාරය සිදු කර තිබෙන්නේ.

මාතර දිස්ත්‍රික් මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා මුලසුනට පැමිණියේය.

අතුරලියේ රතන හිමි-

මේ මතවාදයේ ප්‍රධාන පදනම වන්නේ ඉස්ලාම් අධිරාජ්‍යයක් ගොඩනැඟීමයි. වහබ්වාදයේ අන්තර්ගතය සියලු මුස්ලිම් පාසල්වල, විශ්ව විද්‍යාලවල උගන්වන බව මේ වාර්තාවේ සඳහන්. ඒ අන්තර්ගතය ගැන මේ සභාවේ කතා කළේ නැහැ. ඒවා ගැන තමයි අපි කතා කරන්න ඕනෑ. හින්දු සහ සිංහල අයට කාති උසාවිවලින් සිදු වන අසාධාරණය ගැන සඳහන් වන්නේ නැහැ. මේ කොමිසම් සභාවෙන් ඉදිරිපත් කර තිබෙන කරුණු ගැන සභාව කතා කළ යුතුයි. වහබ්වාදය තහනම් කළ යුතුයි. එයයි අපේ ස්ථාවරය. මෙරට තිබෙන සියලු මදුසා පාසල් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළ යුතුයි. මුස්ලිම් කොලනි ඇති වෙන්න ඉඩ නොතැබිය යුතුයි. ජාතියක් විදියට එක්ව කොමිසම් සභාවේ නිර්දේශ ක්‍රියාවට නංවන්න කටයුතු කළ යුතුයි. කාදිනල්තුමාගේ හඬට අපි කන් දිය යුතුයි.

බනිජ සම්පත් ඇමැති උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා-

ජනාධිපති කොමිසම් සභා වාර්තාව ගැන මටත් විවේචනයක් කරන්න තිබෙනවා. නමුත් ඊට පෙර ඒ සඳහා තිබෙන පහසුකම් ගැන සොයා බැලිය යුතුයි. මේ කොමිසමට තිබූ පහසුකම් අපි සිතිය යුතුයි. පොලිස් පරීක්ෂණ සිදු වෙනවා. සැකකාරයා ලුහුබැඳ හෝ වෙස්වළාගෙන ගොස් සොයන්න පුළුවන්. නමුත් මේ කොමිසම් සභාවේ නිලධාරීන්ට එසේ නොහැකියි. කොමිසම් සභාවේ නිර්දේශ ගැන අධ්‍යයනය කළ යුතුයි. ඒ සඳහා අනුකම්ටුවක් පත් කළා. ඒ ගැනත් අපට විවේචන ආවා. මේ වාර්තාවේ 308 වැනි පිටුවේ කියනවා සාක්ෂි සලකා බැලීමේදී රනිල් මහතා ඉස්ලාම් අන්තවාදය කෙරෙහි දැක්වූ ලිහිල් ප්‍රතිපත්තිය නිසා මේ ප්‍රහාරය ඇති වූ බව කොමිසම් සභා වාර්තාව කරුණු ගෙනහැර දක්වනවා. පාස්කු දින ප්‍රහාරයට යුක්තිය ඉටු කරන්න කියා කියන්න සදාචාරාත්මක අයිතියක් විපක්ෂයට නැති බව අපි මතක් කරනවා. ගලබොඩඅත්තේ ඥානසාර හිමියන්ට නඩු පැවරිය යුතු බවට මේ වාර්තාවෙන් ප්‍රකාශ කර තිබෙනවා. 2016 වසරේ සිට ඉස්ලාම් අන්තවාදය ගැන මත පළ කළ උන්වහන්සේට එරෙහිව නඩු පවරන්නේ නම් ඉන් කියවෙන්නේ මෙවැනි මත පළ නොකළ යුතු බවයි. එම නිර්දේශය අපට පිළිගත නොහැකියි. බුද්ධි අංශය මේ ගැන තවදුරටත් සිතා බැලිය යුතුයි. බුද්ධි අංශයේ උපදේශකවරයෙක් ලෙස උන්වහන්සේ පත් කර ගත යුතු බව මම යෝජනා කරනවා. සුරේෂ් අලෙයි මහතා රැක ගත යුතුයි. ඒ මහතා මුස්ලිම් අන්තවාදය නැති කරන්න කටයුතු කළ පුද්ගලයෙක්. එවැනි පුද්ගලයන් රැක ගත යුතුයි. සහරාන්ගේ දෙවැනි ප්‍රහාරයක් එල්ල වීමට පෙර මේ අන්තවාදය නතර කිරීමට පියවර ගත යුතුයි. මේ ප්‍රහාරයේ 291 කට නඩු දාන්න කටයුතු කරනවා.

කෑගල්ල දිස්ත්‍රික් මහතා කබීර් හෂීම් මහතා (ස.ජ.බ.)-

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් වාසි ගත්තේ කවුද කියා අපි දැන ගත යුතුයි. මේ සිද්ධිය නිසා වැඩිම අවාසිය මුස්ලිම් ප්‍රජාවට සිදු වුණා. මාවනැල්ල බුදු පිළිමවලට හානි කරන විට මම කාටත් ප්‍රථමව ඉදිරිපත්ව ඒ ගැන සොයන්න ගත්තා. ඒ සඳහා ස්වාමීන් වහන්සේත් මට උදව් කළා. මා සමඟ කටයුතු කළ තස්ලීම් නමැති පුද්ගලයාට මුස්ලිම් අන්තවාදීන් වෙඩි තැබුවා. ඔහු මේ වන විට ආබාධිතව සිටිනවා. ඔහු වෙනුවෙන් නිවෙසක් තනාදීමට සිංහල තරුණ පිරිසක් කටයුතු කළා. ඒ වගේ එකමුතුවක් සිංහල මුස්ලිම් අය අතර සහයෝගයක් තිබුණා. වත්මන් ජනාධිපතිවරයාට

විවෘත ආර්ථිකයත් සමඟ ශක්තිවන්තයා ඉතිරි වී දුර්වල තැනැත්තා හැලී ගියා

එයින් ඇති වූ තරගයෙන් අපට බොහෝ දේවල් අහිමි වුණා

ශ්‍රී ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ 22 වැනි සංවත්සරයේදී අගමැති කියයි

නුවන් කොඩිකාර

විවෘත ආර්ථිකය පැමිණීමත් සමඟ ශක්තිවන්තයා ඉතිරි වී දුර්වල තැනැත්තා හැලී ගිය බවත් ඉන් ඇති වූ තරගය නිසා අපට විශාල දේවල් ප්‍රමාණයක් අහිමිවුණු බවත් අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

මේ තත්ත්වය අවබෝධ කරගත් ව්‍යාපාරිකයන් පිරිසක් එක්ව මීට වසර 22කට පෙර සාරධර්ම පිරි ව්‍යාපාරික එකමුතුවක් ගොඩනැගූ බව කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ පෙරේදා (10) පැවති ශ්‍රී ලාංකික තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ 22 වැනි සංවත්සර සැමරුමට එක්වෙමින් අගමැතිවරයා පැවසීය.

රට ජාතිය ගැන හැඟීම තිබෙන තරුණ ව්‍යවසායකයන් පිරිසක් ජාතික ඇඳුමෙන් සැරසී සිටිනු දැකීම විශාල ආඩම්බරයක් බව ද හෙතෙම කියා සිටියේය.

හිටපු සභාපති චමත් කෝට්ටගේ මහතා එම තනතුරේ කාලය අවසන් කිරීමත් ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ නව සභාපතිවරයා ලෙස සාරංග ගුණවර්ධන මහතා පත්වීමත් මෙහිදී සිදුවිය.

අගමැතිවරයා වැඩිදුරටත් එහිදී මෙසේද පැවසීය.

ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයට දැන් වසර 22 ක් සම්පූර්ණ වෙනවා. මට මතකයි මේ ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලය ආරම්භ කළ කාලය. ඒ 1999 වසරෙදී. ඒ වගේම මම මේ සංගමය ආරම්භයට සම්බන්ධ වුණා. මම ඒ කාලයේ ධීවර ඇමැතිවරයා. 17 දෙනෙකුගෙන් තමයි එදා මේ සංවිධානය ආරම්භ කළේ.

එදා ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයට සම්බන්ධ වුණ අයට රටේ ඉන්න අනෙකුත් ව්‍යාපාරිකයන් එකට එකතු කරගෙන සංසදයක් හැටියට ඉදිරියට යන්න ලොකු වුවමනාවක් තිබුණා. ඒ 17 දෙනා ඉතාමත් ධෛර්යවන්තව, අරමුණක් ඇතිව වැඩ කරන පිරිසක් වීම නිසා තමයි අවුරුදු 22ක් තුළ මෙච්චර දුර ගමනක් එන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. එදා සම්බන්ධ වුණ අයගෙන් ජගත් සුමතිපාල වගේ අය තවමත් මේ සංවිධානයේ ඉන්නවා දකින්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මේ වෙනකොට මේ සංවිධානයේ විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරවල යෙදෙන 120 දෙනෙකු සාමාජිකත්වය දරන බව මට දැනගන්න ලැබුණා. ඒ වගේම මේ රටේ දළ දේශීය නිෂ්පාදනයට බිලියන 600ක පමණ දායකත්වයකුත් ලබාදෙනවා. ඒ විතරක් නොවෙයි, ලක්ෂ 4කටත් වඩා වැඩි පිරිසකට රැකියා සපයනවා.

මම දේශපාලනයට ආවේ 70 දශකයේ. 1970 දී දේශපාලනයට ආපු මට ඒ කාලයේ රටේ අගනගරය වන කොළඹ හිටපු අපේ ලාංකික ව්‍යාපාරිකයෝ මුණ ගැහිලා තිබෙනවා. ඒ අයගේ ආකල්ප, හැසිරීම් මම දැක තිබෙනවා. ඒ අයට රට ගැන හැඟීමක් තිබුණා. ඒ අය රටේ දේශීය නිෂ්පාදනය ගොඩගැනීම ගැන හිතපු අය. බොහෝ දෙනෙක් පිට පළාත්වලින් කොළඹ ඇවිල්ලා ව්‍යාපාරිකව හැදුණු වැඩුණු අය. ඒ නිසාම ඒ අය අතරේ ලොකු සම්බන්ධයක් තිබුණා.

1977දී විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දුන්නා. විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වාදීමත් එක්කම එදා හිටපු ව්‍යාපාරික පැලැන්තියට විශාල වශයෙන් බලපෑම් ඇතිවුණා. ඒ අයට වෙනස් වෙන්න සිද්ධ වුණා. විවෘත ආර්ථිකය යටතේ ප්‍රධාන කාරණයක් තමයි තරගය. තරගකාරීව ව්‍යාපාරයේ යෙදෙන තැනැත්තා ජයග්‍රහණය කිරීම තමයි විවෘත ආර්ථිකයේ ක්‍රමය. තරගය මත තමයි සේරම තීරණය වුණේ. දැන් තරගය වෙනුවට සහයෝගයෙන් කටයුතු කිරීම නිසා ගොඩනැගෙන්න පුළුවන් කියන හැඟීම,දැක්ම අපේ ව්‍යාපාරික සමාජයට ඇවිල්ලා තියෙනවා. ඒක ඇති කරන්න මූලික වුණ ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලය (COYLE-කොයිල්) ගැන අපේ ගෞරවයක් තියෙනවා.

එදා අපේ ව්‍යාපාරිකයන්ට තිබුණු පුණ්‍යවන්ත සිතින් යමක් දීම අද දකින්න ලැබෙන්නේ නෑ

එදා හිටපු ව්‍යාපාරික පැලැන්තියට රට ගැන ලොකු හැඟීමක් තිබුණා. බොහෝ ව්‍යාපාරිකයන් තමන් උපයපු බොහෝ දේවල් රජයට හා සමාජයට දුන්නා. එහෙම නැතිනම් සමාජ සේවා කටයුතුවලට දායක වුණා. අධිරාජ්‍යවාදීන්ගේ යුගයේ රටේ රෝහල්, පාසල් පරිත්‍යාග කළේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් නොවෙයි. අපේ ව්‍යාපාරිකයන්ගේ දේපළ තමයි සොයිසා වටරවුමේ තියෙන්නේ. කොළඹ මහ රෝහල, විශාඛා විද්‍යාලයේ ඉඳන් බොහෝ දේවල් මේ රටේ ව්‍යාපාරිකයන් පරිත්‍යාග කළ දේවල්.

එදා ඒ ව්‍යාපාරිකයන් ඒවා පරිත්‍යාග කළේ ව්‍යාපාරික අරමුණින් නොවෙයි. රට ගැන තිබුණ කරුණාවෙන්. අපේ මිනිස්සු වෙනුවෙන් යමක් කරන්න ඕනෑ කියන හැඟීමෙන්. වර්තමාන ව්‍යාපාරවල මහජන සුභසාධන වැඩ තියෙනවා. ඒවා කරන්නේ එදා ව්‍යාපාරිකයන් කරපු ආකාරයට පුණ්‍ය චේතනාවෙන්ම නොවෙයි.

ඒවා කරන්නේ ව්‍යාපාරයේ කීර්තිනාමය ඉහළට ඔසවලා තමන්ගේ භාණ්ඩ හා සේවා විකුණගන්න. නමුත් එදා අපේ ව්‍යාපාරිකයන් තුළ තිබුණු පුණ්‍යවන්ත අදහසින් යමක් දීම දැන් දකින්න ලැබෙන්නේ නැහැ. මේ ව්‍යවසායකයන්ගේ සංගමය ඒකට විසඳුමක් දී තියෙනවා. ලාංකේය තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයට අනුබද්ධව කාන්තා සංසදයක් ගොඩනඟා වසර 12ක පමණ කාලයක් තිස්සේ කටයුතු කරගෙන යන බව මම දන්නවා. ඒ අය එකතු වෙලා අතීතයේ ව්‍යාපාරිකයන් තුළ තිබුණු පුණ්‍ය චේතනාව ක්‍රියාවට නංවන්න වැඩකටයුතු කරන බව මට දැනගන්න ලැබෙනවා.

ඈත ගම්මානවලට ගෙවල් හදාදීමේ සිට ශාසනයට උදව් කිරීමේ ඉඳන් බොහෝ දේවල් ප්‍රචාරය කරන්නේ නැතිව කරගෙන යන බව මට දැනගන්න ලැබී තියෙනවා. අතීත ව්‍යාපාරික සමාජයේ තිබුණ සාරධර්මත් අරගෙන ව්‍යාපාරික සංසදය ගොඩනැගීම පිළිබඳ මම ඉතාම සතුටු වෙනවා.

තරුණ ව්‍යවසායකයන් පළමු වතාවට තමයි ටයි-කෝට් නැතිව ජාතික ඇඳුමින් සැරසිලා එදා ඒකරාශී වුණේ. මට මතකයි ජීවිතේ පළමුවෙනි වතාවට ජාතික ඇඳුමින් සැරසුණු අය මීට වසර 22කට කලින් එකතුවෙලා හිටපු හැටි. අදත් ඒ ජාතික ඇඳුම ඇඳගෙන මෙතැනට ඇවිත් ඉන්න බව දකින කොට වසර 22කට කලින් තිබුණු සුහද හැඟීම, ජාතිය පිළිබඳ හැඟීම, රට පිළිබඳ හැඟීම ඇති පිරිසක් දැන් එකතු වෙලා ඉන්නවයි කියන එක ගැන මට විශාල ආඩම්බරයක් දැනෙනවා. ඔබගේ කටයුතු දිනෙන් දින දියුණුවට පත් වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

රාජ්‍ය ඇමැතිවරුන් වන කංචන විජේසේකර, ෂෙහාන් සේමසිංහ, දයාසිරි ජයසේකර, ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න, යුද හමුදාපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා, තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සභාපති දිමුත් චන්දන සිල්වා, උප සභාපති රසිත් වික්‍රමසිංහ මහත්වරුන් ඇතුළු ව්‍යවසායකයන්ගේ සංගමයේ සාමාජිකයෝ රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

රජයේ ආයතන සතු වගා කිරීමට සුදුසු ඉඩම් ගැන බැංකු සංචිතයක් ගොඩනැඟිය යුතුයි

ඇමැති චමල් රාජපක්ෂ

නුවන් කොඩිකාර

රජයේ ආයතන සතු වගා කිරීමට සුදුසු ඉඩම් පිළිබඳ බැංකු සංචිතයක් ගොඩනැඟිය යුතු බව වාරිමාර්ග ඇමැති හා රාජ්‍ය ආරක්ෂක, ආපදා කළමනාකරණ, ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා පවසයි.

වගා කිරීමට සුදුසු එහෙත් මේ වන විට වගා නොකර ඇති ඉඩම් විශාල ප්‍රමාණයක් රජයේ ආයතන සතුව තිබෙන හෙයින් එම ඉඩම් පාරම්පරික ගොවීන්ට හෝ ගොවිපොළ ඇති කිරීමට දීමට සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙස ඇමැතිවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ ජාතික සම්බන්ධීකරණ කෘෂිකාර්මික අනුකමිටුව එහි සභාපති, ඇමැති චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පෙරේදා (10) රැස්වූ අවස්ථාවේ දී එම තීරණයට එළැඹ තිබේ.

රට හදන සෞභාග්‍යයේ දැක්මට අනුව ශ්‍රී ලංකාව ආහාරවලින් පෝෂණය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ශක්තියක් වීමට මේ වැඩසටහන රුකුලක් වන බව පැවැසූ රාජපක්ෂ මහතා ඒ සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ නිර්මාණය කිරීම, කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම, යල කන්නය සඳහා පොහොර බෙදාහැරීමේදී නිසි කලට ගොවීන්ට ලබාදීමේ ක්‍රමවේද සකසන ලෙස ඉල්ලා සිටියේය.

මහවැලි ගොවිපොළ ඉදිරි වසරවලදී ලාභදායකත්වයට පත් කිරීමට විශේෂ ක්‍රමවේදයක් ඇති කිරීම සහ වන සතුන්ගෙන් බෝගවලට සිදුවන හානිය වළක්වා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මේ කෘෂිකර්ම ජාතික සම්බන්ධීකරණ අනු කමිටුවේ දී සාකච්ඡා කෙරිණි.

රිලවුන්ගෙන් ගොවීන්ට වගා හානි සිදුවීම වළක්වා ගැනීමට විශේෂ ක්‍රමවේදයක් ඇති කළ යුතු බව මෙහිදී සාකච්ඡා කළ අතර මේ අනුකමිටුවට වාරිමාර්ග, වනජීවී, කෘෂිකර්ම , ඉඩම්, පරිසර හා වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ 6ක් ඇතුළත් වේ.

පරිසර ඇමැති මහින්ද අමරවීර, කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ, රාජ්‍ය ඇමැතිවරුන් වන ශෂීන්ද්‍ර රාජපක්ෂ , සිරිපාල ගම්ලත්, අනුරාධ ජයරත්න , විමලවීර දිසානායක, කනක හේරත්, අරුන්දික ප්‍රනාන්දු, ජානක වක්කුඹුර මහත්වරුන් සහ අමාත්‍යාංශවල ලේකම්වරුන්, රාජ්‍ය නිලධාරීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.

'ත්‍රිශික්ෂා' අන්තර්ජාතික බෞද්ධ සම්මේලනය සූම් තාක්ෂණයෙන්

දලයි ලාමා නාහිමියන් වහන්සේ හා ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මකුලෑවේ විමල නා හිමියන් වහන්සේ ප්‍රමුඛ කොටගත් "ත්‍රිශික්ෂා" අන්තර්ජාතික බෞද්ධ සම්මේලනය පසුගියදා 5, 6 දෙදිනහිදී පැවැත්විණි.

සිංගප්පූරුවේ විබෙට් බෞද්ධ මධ්‍යස්ථානය විසින් සංවිධාන කරන ලද මේ ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මූලස්ථානයේ ශ්‍රවණාගාරයේ දී භික්ෂූන් වහන්සේ රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය, ජපානය, චීනය, භූතානය, මැලේසියාව, බංග්ලාදේශය, ඇතුළු රටවල් බොහෝ ගණනක මහ සංඝරත්නය ඇතුළු විද්වතුන්ගේ සහභාගිත්වයෙන් භාෂා 16 ක පරිවර්තනයන්ගෙන් යුතුව සූම් තාක්ෂණය ඔස්සේ ඉතා සාර්ථකව පවත්වන්නට යෙදුණි. දස දහස් ගණනක් නැරඹූ සහ online තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ සමුළුවේදී දලයි ලාමා නාහිමියන් සහ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහනායක මකුලෑවේ විමල නාහිමියන් වහන්සේ online තාක්ෂණය ඔස්සේ මේ අවස්ථාවට සම්බන්ධ වූ අයුරු.

ඡායාරූප - කමල් ජයමාන්න

කමතටම ගොස් පැයකින් වී මෙට්‍රික් ටොන් 05ක් සහල් කළ හැකි ජංගම සහල් නිෂ්පාදන යන්ත්‍රයක්

නදී මාණික්කගේ

කමතටම ගොස් පැයක කාලයකින් වී මෙට්‍රික් ටොන් 05ක් සහල් කළ හැකි ජංගම සහල් නිෂ්පාදන යන්ත්‍රයක් පේටන්ට් බලපත්‍රය සහිතව කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබී ඇත.

නව නිපැයුම්කරුවකු වන විකුම් සම්පත් දිඹුල්ගස්තැන්න මහතා විසින් ඊයේ (10) කෘෂිකර්ම අමාත්‍යාංශයේදී කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතාට එම යන්ත්‍රය හඳුන්වා දී තිබේ.

මේ නව යන්ත්‍රය තෙත වී වියළා ගැනීමටත්, වී තම්බා ගැනීමටත් හැකි වන පරිදි නිර්මාණය කර ඇති අතර අඩි 40ක බහාලුමක නව යන්ත්‍රය සවිකොට කමතටම ගොස් වී සහල් කිරීමේ හැකියාව සහිතය.

යන්ත්‍රයට ස්වයංක්‍රීයව වී ඇතුළත් කර ගන්නා අතර වී තැම්බීමත්, වියළා ගැනීමත් අනතුරුව ගල් වැලි ඉවත් කළ පිරිසුදු සහල් ස්වයංක්‍රීයව නිෂ්පාදනය කිරීමත් මේ නව යන්ත්‍රය මගින් සිදු කෙරේ. සමස්ත කාර්යයට සේවකයන් දෙදෙනකු ප්‍රමාණවත් වන අතර ඉතිරි සියල්ල ස්වයංක්‍රීයව සිදුවීම විශේෂත්වයකි.

මහා පරිමාණ හාල් මෝල් හිමියන් කීපදෙනෙකුගෙ සහල් මාෆියාවෙන් ගොවියාත්, පාරිභෝගිකයාත් රැක ගැනීමට මේ නව යන්ත්‍රය නිර්මාණය කර ඇත. මේ නව යන්ත්‍රය අවශ්‍ය ප්‍රමාණයට විශාලත්වයකින් සකස් කොට පළමු යන්ත්‍රය නිර්මාණය කිරීමට වී අලෙවි මණ්ඩලය හරහා පියවර ගැනීමට ඇමැතිවරයා උපදෙස් දී ඇති අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් එක් යන්ත්‍රය බැගින් ලබාදීමට ඉදිරියේදී කටයුතු යොදනු ඇත.

යාපනය - චෙන්නායි සෘජු ගුවන් ගමන් කඩිනමින් යළි අරඹනවා

ඇමැති ප්‍රසන්න රණතුංග

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් වසංගතය හේතුවෙන් අත්හිටුවා ඇති යාපනය - චෙන්නායි සෘජු ගුවන් ගමන් කඩිනමින් යළි ආරම්භ කිරීමට තීරණය කළ බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා ඊයේ (11) ප්‍රකාශ කෙළේය.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංචාරක බුබුළු සංකල්පය යටතේම මෙය ද ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව රණතුංග මහතා පැවැසීය.

ඉන්දියානු රජයේ ආධාර යටතේ රුපියල් මිලියන 300 ක් වැය කරමින් ඉදිකෙරෙන මඩු වන්දනාවේ යන බැතිමතුන් සඳහා වූ අතරමැදි නිවාස ඒකක 144 ක ඉදිකිරීම් ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වෙමින් ඇමැතිවරයා මේ බව සඳහන් කෙළේය. මඩු දේවස්ථාන භූමියේ දී ඊයේ (11) මෙම උත්සවය පැවැත්විණි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙසේද පැවසීය.

රත්මලාන, යාපනය සහ මඩකළපුව අතර අභ්‍යන්තර ගුවන් සේවයක් කඩිනමින් ආරම්භ කිරීමට ද සැලසුම් කර තිබෙනවා. යාපනය හා මඩකලපුව ගුවන් තොටුපළ අන්තර්ජාතික ගුවන් තොටුපළ ලෙස සංවර්ධනය කිරීමට ද අපේක්ෂා කරනවා.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවතින දීර්ඝ කාලීන මිත්‍රත්වය තවදුරටත් තහවුරු කරමින් ඉන්දියානු රජය අනුග්‍රහයෙන් මන්නාරම මඩු දේවස්ථාන භූමියේ ඉදි කෙරෙන අතරමැදි නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීමේ අවස්ථාවට සහභාගී වීමට ලැබීම පිළිබඳ ව මා ඉතා සතුටු වෙනවා. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින දීර්ඝ කාලීන දැඩි මිත්‍රත්වය ශක්තිමත් කිරීම සඳහා මේ ව්‍යාපෘතිය ඉවහල් වනවා. නිවාස ඒකක 144 ක් තැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 300 ක් මේ සඳහා ලබාදීම සම්බන්ධයෙන් ඉන්දියානු රජයට, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් ප්‍රමුඛ අපේ රජයේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ශ්‍රී ලංකාවට වැඩි වශයෙන්ම සංචාරකයන් පැමිණෙන එක් රටක් ඉන්දියාව. මේ වනවිට කොවිඩ් වසංගතය නිසා ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීම නතර වී තිබෙනවා. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මේ සඳහා විකල්පයක් ලෙස ගුවන් සංචාරක බුබුළක් යෝජනා කළා. ඒ සඳහා අපේ එකගත්වයත් පළ කළා. ඉතා ඉක්මණින් මෙම ගුවන් සංචාරක බුබුළ හරහා දෙරට අතර සංචාරක කටයුතු ආරම්භ කිරීමට අපි අපේක්ෂා කරනවා.

ඒ වගේම රත්මලාන, යාපනය හා මඩකලපුව අභ්‍යන්තර ගුවන් සේවයක් කඩිනමින් ආරම්භ කිරීමට මේ වනවිට අප කටයුතු කරමින් යනවා. යාපනය හා මඩකලපුව ගුවන් තොටුපළ අන්තර්ජාතික ගුවන් තොටුපොළක ලෙස සංවර්ධනය කිරීම අපේ ඉලක්කයක්. යාපනය ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමට ඉන්දියාව දක්වන සහයෝගය අපි අගය කරනවා. දැනට කොවිඩ් වසංගතය හේතුවෙන් අත්හිටුවා ඇති යාපනය හා චෙන්නායි අතර සෘජු ගුවන් ගමන් ද ඉතා ඉක්මණින් ආරම්භ කිරීමට අපේ අවධානය යොමුව තිබෙනවා.

මෙහිදී අදහස් දැක්වූ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා සඳහන් කෙළේ ඉන්දියාව හැම විටම ශ්‍රී ලංකාව සමඟ එක්ව කටයුතු කරන බවයි. ශ්‍රී ලංකාවේ සංවර්ධනය මෙන්ම රට මුහුණ දෙන ඔනෑම අභියෝගාත්මක අවස්ථාවකදී ඉන්දියාව ශ්‍රී ලංකාවට සිය සහය පලකරන බව සඳහන් කෙළේය. සංවර්ධන ක්‍රියාදාමයේ දී ප්‍රජාවට වැඩි වාසි අත්වන ව්‍යාපෘති සඳහා ඉන්දියාව සිය සහය පළ කරන බව පැවසූ මහා කොමසාරිස්වරයා සියවස් ගණනාවක් පුරා දිවෙන ශ්‍රී ලංකා සහා ඉන්දියාව අතර මිත්‍රත්වය ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු පියවර ගන්නා බවට සහතික විය.

මන්නාරම් රදගුරු ආචාර්ය එමානුවල් ප්‍රනාන්දු පියතුමා, සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

බොදුබල සේනා සංවිධානය තහනම් කිරීමට නිර්දේශ කිරීම ඉතා අසාධාරණයි

ගලගොඩඅත්තේ ඥානසාර හිමි

මුස්ලිම් අන්තවාදය රටට හෙළිදරව් කළ බොදුබල සේනා සංවිධානය තහනම් කිරීමට පාස්කු ප්‍රහාරය පිළිබඳ සෙවීමේ ජනාධිපති කොමිෂන් සභාව නිර්දේශ කිරීම ඉතාම අසාරධාරණ බව එහි මහා ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ ඊයේ (11) පැවසුහ.

උන්වහන්සේ මේබව පැවසුවේ කොළඹ 7 නිදහස් චත්‍රරශ්‍රයේ පැවැති සත්‍යග්‍රහ අවස්ථාවට එක් වෙමිනි. එය බොදුබල සේනා සංවිධානය සහ භික්ෂු සංවිධාන එකමුතුව හා සිවිල් සංවිධාන එක්ව මෙම විරෝධතා සත්‍යග්‍රහය සංවිධානය කර තිබිණි.

එහිදි වැඩදුරටත් අදහස් දැක්වූ ඥානසාර හිමියෝ මෙසේද පැවසුහ.

මෙවැනි සත්‍යග්‍රහ රට පුරාම පැවැත්වීමට කටයුතු කරනවා. ඊළඟ සත්‍යග්‍රහය පොළොන්නරුවේ පවත්වනවා.

මෙහිදි සහභාගිවි සිටි භික්ෂූන් වහන්සේලා මුස්ලිම් අන්තවාදයට උඩගෙඩිදුන් නායකයෝ නිදැල්ලේ සිටිද්දි බොදුබල සේනාව වැනි සංවිධානයක් තහනම් කිරීමට එරෙහිව විරෝධය දැක්වුහ. මෙම සිදුවීම තම ආණ්ඩුකාලයේ සිදු නොවුවක් පවසමින් වත්මන් ආණ්ඩුවට ඉන් පළා යෑමට නොහැකි. ඒ අනුව නොවිසඳුනු ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය පියවර දහයක්ද මෙහිදි ඉදිරිපත් කෙරිණි. එහිදි කොමිසම් වාර්තාව අනුව නිර්දේශ කර ඇති දිගුකාලීන කෙටිකාලීන ප්‍රතිකර්ම අතරින් රාජ්‍ය බුද්ධි අංශ ප්‍රතිසංවිධානය, පොලිස් දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කොට ත්‍රස්තවාදය වැළැක්වීම පිණිස වෙනම අංශයක් සංවිධිත ලෙස පවත්වාගෙ යෑම ත්‍රස්තවාදී ක්‍රියා අධික්ෂණය කළ හැකි පරිදි නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම වැනි කරුණු විස්තර කොට තිබේ.

ජායාරූප - හිරන්ත ගුණතිලක

රතු ලූනු - අල - රතු කැකුළු අඩු මිලට සතොසෙන් අද සිට

අනුර ප්‍රේමලාල්

අද (12) සිට වහාම ක්‍රියාත්මක වන පරිදි රතු ලූනු, දේශීය අල, රතු කැකුළු සහල් යන පාරිභෝගික භාණ්ඩ අඩු මිලට සතොස මඟින් දීමට වෙළෙඳ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ. පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වූ අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය 27ක මිල අඩු කිරීමේ ව්‍යාපෘතිය ඒ අයුරින්ම ක්‍රියාත්මක වන අතර ඊට අමතරව මේ භාණ්ඩ මිලද අඩු කර තිබේ.

ඒ අනුව දැනට වෙළෙඳපොළේ රු.300ක් වැනි මිලකට අලෙවි වන රතු ලූනු, උසස්ම තත්ත්වයේ ගුණාත්මක බවින් යුක්තව සතොස හරහා රු.195ක් වැනි මිලකට අලෙවි කිරීමටත්, දේශීය අල රු.150ක් වැනි මිලකට අලෙවි කිරීමටත්, දැනට රු.93කට අලෙවි වන රතු කැකුළු සහල් කිලෝ ග්‍රෑමයක් රු.89ක් වැනි මිලකට අලෙවි කිරීමටත් පියවර ගෙන තිබේ.

ඒ අනුව ඉදිරියේදී ද පාරිභෝගික ජනතාවට සහන සැලසීම සඳහා කටයුතු කිරීමට පියවර ගන්නා මෙන් වෙළෙඳ ඇමැතිවරයා සතොස ආයතනය වෙත උපදෙස් දී තිබේ.

නවීකරණය කළ පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය යළි අද විවෘත වෙයි

පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය නවීකරණයෙන් පසු යළි විවෘත කිරීම අද (12) උදේ 9.30ට ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ සහ ධීවර රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ.

උත්සව සමයේ හිඟයක් නැතිව අත්‍යවශ්‍ය භාණ්ඩ

සිංහල හා දෙමළ අලුත් අවුරුදු සමයේදී කිසිදු හිඟයකින් තොරව ආහාර ද්‍රව්‍ය දිය හැකි බව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනකරුවන්ගේ සහ වෙළෙඳුන්ගේ සංගමයේ සභාපති නිහාල් සෙනෙවිරත්න මහතා දිනමිණට ඊයේ (11) පැවසීය.

රුපියලේ අගය තව දුරටත් අවප්‍රමාණ වීම සහ රජය විසින් බදු පැනවීමක් කළහොත් පමණක් භාණ්ඩ මිල ඉහළ යා හැකි බවද හෙතෙම පැවසීය.

යහපාලන ආණ්ඩුව හකුළාගත් ඉරිදා ටියුෂන් තහනම් කිරීමේ නීති සම්පාදනය කඩිනම් කළ යුතුයි

ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ගෝනදූවේ ගුණානන්ද හිමි

රෝෂන් තුෂාර

යහපාලන ආණ්ඩුව ජනාධිපතිවරණයට ඡන්ද අහිමි වේයැයි බියෙන් හකුළාගත් ඉරිදා ටියුෂන් තහනම් කිරීමේ නීති සම්පාදනය කඩිනම් කළයුතු බව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ගෝනදූවේ ගුණානන්ද හිමියෝ පැවසුහ.

කොරෝනා වසංගතයට වඩා භයානක ටියුෂන් වසංගතය තහනම් නොකොළහොත් සමාජය පරිහානියට ලක්වන බවත්, පැවති රජයන් හෝ කිසිදු ජන නායකයකු නොකළ මේ නීති සම්පාදනය අද අත්‍යවශ්‍ය වී ඇති බවත් ගුණානන්ද හිමියෝ අවධාරණය කළහ.

කළුතර උතුර ශාසනාරක්ෂක මණ්ඩලය දහම් පාසල් අවසාන විභාග අපෙක්ෂකයන් වෙනුවෙන් සංවිධාන කළ දෙදින සම්මන්ත්‍රණයේ සමාරම්භයේදී ගුණානන්ද හිමියෝ එසේ පැවසූහ.

1971 නිවාඩු දින ආඥා පනතේ 13 වන වගන්තිය සංශෝධනය කරමින් ඉරිදා ටියුෂන් තහනම් කිරීමට හිටපු ජනපති මෛත්‍රිපාල සිරිසේන මහතා ප්‍රමුඛ එවකට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද ජනාධිපතිවරණය හේතුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ බවද ඒ හිමියෝ දින වකවානු සහිතව සඳහන් කළහ.

ගෝනදූවේ ගුණානන්ද හිමියෝ එහිදී මෙසේද පැවසුහ.

අද සමාජයේ සාරධර්ම කඩා වැටිලා.දහම් අධ්‍යාපනය පිළිබඳ නිවැරදි දැනුමක් නැහැ. අධ්‍යාපනයේ පරමාර්ථ ළමයි දන්නේ නැහැ. මේකට ප්‍රධාන හේතුව අවුරුදු ගානක් මේ රටේ තිබෙන ටියුෂන් වසංගතයයි.කොරෝනා වසංගතයටත් වඩා භයානක වසංගතයක් තමයි ටියුෂන් වසංගතය.කොරෝනා හේතුවෙන් වසරක් පමණ දහම් පාසල් වසා තිබුණා.දැන් ඉරිදා දිනත් ඔන්ලයින් ටියුෂන්. මේක තමයි මේ රටේ විශාලම විනාශය. මේකෙන් තමයි පාසල්වල කුඩුකාරයෝ බිහිවෙලා තිබෙන්නේ.කාම අපරාධ කරන මිනිසුන් බිහිවෙලා තිබෙන්නේ.අද පාසල් දරුවන් අතර විනය අත්තයටම වැටිලා.මේ විනය යම්තම් හරි රැකගන්න තිබෙන තැන තමයි දහම් පාසල.අපි ගුණදහමින් පිරි සමාජයක් හදන්න මහත් පරිශ්‍රමයක් දරනවා. පහ වසර ශිෂ්‍යත්ව ටියුෂන් නිසා ළමයි දහම් පාසල් එන්නේ නැහැ.නමය දහය පන්තිවල සා:පෙළ: උ:පෙළ: සිසුන් ඉරිදාට ටියුෂන්.කළුතර කොට්ඨාසයේ ළමයින් හාරසීයක් පන්සීයක් දහම් පාසල් අවසන් විභාගයට පෙනී සිටීමට ලියාපදිංචි වෙනවා. නමුත් ටියුෂන් නිසා දෙසිය පනහක්වත් විභාගයට පෙනී සිටින්නේ නැහැ. රජය මුදල් වියදම් කරනවා.ඇඩ්මිසන් දෙනවා.විභාගයට පෙනී නොසිටින ළමයි ලියාපදිංචියෙන් රජයට ලක්ෂ ගානක් මුදල් අහිමි වෙනවා.

ගොස් නොමැති බවට එම සාකච්ඡිවේදි අනාවරණය කෙරෙනවා.1971 අංක 29 දරණ නිවාඩු දින ආඥා පනතේ දහතුන්වන වගන්තිය සංශෝධනය කිරීම ප්‍රමාණවත් බවත් ,ප්‍රකාශවෙනවා.උපකාරක පන්ති විශාල සමාජ ගැටළුවක් බවට ප්‍රකාශ කරමින් මේ තීන්දු ගන්නවා. ජාත්‍යනතර පාසල් දරුවන් උපකාරක පන්ති වලට නොයැමෙන් පෙනීයන්නේ රජයේ පාසල් ගුරුවරුන් මෙය ව්‍යාපාරයක් කරගෙන තිබෙන බවට එම කමිටුව නිගමනය කරනවා.නිදහස් අධයාපනය වෙනුවෙන් රජය විශාල ප්‍රතිපාදන ලබා දුන්නද සාමාන්‍ය පවුලක ආදායම ටියුෂන් පන්ති සඳහා වැය වන බව මෙහිදි පෙන්වා දෙනවා.

කළුතර උතුර ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති කරන්නාගොඩ අමරවංශ හිමි,උප සභාපති උනන්තැන්නේ බුද්ධප්‍රිය හිමි, ලේඛකාධිකාරි පැල්ලන්තුඩාවේ සරණ හිමි,උප ලේඛකාධිකාරි දියකඩුවේ සොමාලංකාර හිමි ඇතුළු හිමිවරු ද, කළුතර බෝධි භාරකාර මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි ජනක් ගුණරත්න, සැමිසන් සමාගමේ පනාපිටිය ශාඛා කළමනාකාර මහේන්ද්‍ර සේනාරත්න මහත්වරු ද, ගුරු භවතුන් ඇතුළු පිරිසක් ද මේ උත්සවයට සහභාගි වුහ.

අසරණ පවුලකට නිවෙසක් හදන්න මුල් ගල තබයි

අසරණ පවුලකට නිවෙසක් සාදාගැනීම සඳහා ඉඩම් කොටසක් පරිත්‍යාග කිරීමට අවිස්සාවේල්ලේ පදිංචි ප්‍රකට ව්‍යාපාරිකයකු වන දේශමාන්‍ය එච්.පී.ආර්.ප්‍රියන්ත සහ සමාජ සේවකයකු වන ඉන්දුල රූපසිංහ මහත්වරුන් කටයුතු කර තිබේ.

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සේවය කරන ආබාධිත කම්කරු සේවකයකු වෙත මෙම ඉඩම පිරිනමා ඇති අතර ඡායාරූපයෙන් දැක්වෙන්නේ එම නිවෙසේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරමින් ප්‍රියන්ත මහතා මුල් ගල තබන අවස්ථාවයි.

එම සත්කාර්යය සම්බන්ධීකරණය කළ එම සංස්ථාවේ සභාපති මේජර් ජනරාල් (විශ්‍රාමික) ඩබ්ලිව්. ආර්.ඩී. සොයිසා මහතා සහ එම මහත්මිය ද සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ පිරිසක් ද නිවෙස සාදා ගැනීම සඳහා ශ්‍රම දායකත්වය දුන් අතර නාවික හමුදාවේ භට පිරිසක් ද ඊට එක් වූහ. නිවෙස ඉදිකිරීමට ද්‍රව්‍යමය ආධාර එම සංස්ථාව සපයා දීමට නියමිතය.

ඇල්ටෙයාර් බහුමහල් ව්‍යාපෘතියේ පළමු අදියර අද විවෘත වෙයි

මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අලුත් අත්දැකීමක් සහිත නව නිර්මාණයක් සේ ඉදිකෙරුණු කොම්පැස්සැවීදියේ පිහිටි ඇල්ටෙයාර් බහුමහල් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර අද (12) සවස 5.00ට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් සහ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට නියමිතය.

නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹ ගංගාරාම සීමාමාලකයට නුදුරින් අක්කර 02ක භූමි ප්‍රමාණයක මේ ඇල්ටෙයාර් ගොඩනැඟිල්ල ඉදි කර තිබේ.

ඇල්ටෙයාර් ගොඩනැඟිල්ල සඳහා වන ආයෝජන මුදල අමෙරිකානු ඩොලර් මිලියන 250කි. මෙහි ආයෝජකයා ලෙස ඉන්ඩෝඩිස් ඩිවලොප්මන්ට් සමාගම කටයුතු කරයි.බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඌන සංවර්ධන ඉඩම් සංවර්ධනය කිරීමේ අරමුණින් 2011 වසරේදී 99 අවුරුද්දකට යටත්ව රුපියල් මිලියන 2,560කට බදු දුන් මේ ඉඩමේ සංවර්ධන ව්‍යාපෘතිය 2012 වසරේදී ආරම්භ කළ අතර 2021 වසරේදී එහි වැඩ අවසන් කෙරිණි.මේ ඇල්ටෙයාර් ගොඩනැඟිල්ලේ උස මීටර් 230 ක් වන අතර මෙය මහල් 68කින් සමන්විතය.ඒ අනුව වර්ග 4 කින් සමන්විත අති සුඛෝපභෝගී නිවාස 407 කින් ඇල්ටෙයාර් ගොඩනැඟිල්ල සමන්විත වේ. මෙහි පිහිටි වාණිජ ප්‍රදේශය වර්ග අඩි 30,000 කි. සියලු නිවාස නවීන පහසුකම්වලින් සමන්විත වේ. ඉතා උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය භාවිතා කර ඉදිකර ඇති මේ නිවාස වර්ග අඩි 1400 සිට වර්ග අඩි 5000 ක් දක්වා ප්‍රමාණයක පවතී. ඇල්ටෙයාර් ගොඩනැඟිල්ලේ වාහන 600 ක් නතර කර තැබිය හැකි වාහන රථගාලක්, කායවර්ධන මධ්‍යස්ථානයක්, පිහිනුම් තටාක 02 ක්, උත්සව ශාලා සහ ප්‍රමිතියෙන් යුතු සනීපාරක්ෂක පහසුකම්වලින් සමන්විතයි. අක්කරයක භූමි භාගයක ඉදිකර ඇති උද්‍යානයක් මෙහි ඇති විශේෂත්වයක් ලෙස දැක්වෙයි.

ලංකාවේ ව්‍යාපෘතියක් සඳහා ආයෝජකයකු විසින් සම්පූර්ණ ආයෝජන මුදල එකවර ගෙවන ලද ව්‍යාපෘතියක් මෙන්ම නේවාසික හා වාණිජ වෙළෙඳ සංකීර්ණයක් වන ඇල්ටෙයාර් ගොඩනැඟිල්ල වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්ව සිටි කාලයේ වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා ප්‍රකාශ කරයි.

විදේශ ආයෝජන දිරි ගැන්වීමේ අරමුණ උදෙසා ක්‍රියාත්මක කෙරෙන මේ ව්‍යාපෘතිය වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණේ 2017 වසරේදීය. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේ දී මෙහි වැඩ අතරමඟ නැවතුණු අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මැදිහත්වීම නිසා යළි මෙහි වැඩ කඩිනමින් ආරම්භ කර එහි පළමු අදියර මෙසේ විවෘත කිරීමට කටයුතු කරන බව ද අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා විසින් පෙන්වා දුන්නේය.

අතරමඟ ඉදිකිරීම් නැවතී තිබූ මේ ව්‍යාපෘතිය 2020 මැයි මාසයේ දී ජනාධිපතිවරයාගේ අවධානයට ලක් විය.

ඒ සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා ප්‍රමුඛ කමිටුවක් පත් කළ අතර වසර 05ක කාලයක් ප්‍රමාද වූ මේ ව්‍යාපෘතියේ අඩුපාඩු සහ ආයෝජකයන්ගේ ගැටලු නිරාකරණය කර අවසන් කිරීමෙන් පසු වසරක් ඇතුළත මේ ව්‍යාපෘතිය නිමවා අවසන් කෙරිණි.

නාගරික සංවර්ධන හා නිවාස ඇමැතිවරයා වශයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දුන්නේ මෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකර මුදල් වියදම් කර තිබෙන නිවාස හිමියන්ට එම නිවාස ලබාදීමට කටයුතු කරන ලෙසයි.

'අපේ ගමේ අපේ කඩේ' ව්‍යාපෘති ඇරැඹේ

ක්‍රිසන්ති විතාරණ

අන්තර්ජාතික කාන්තා දිනයට සමගාමීව කොළඹ, කළුතර සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ආරම්භ කරන ලද මාර්ග හා නිවාස ව්‍යාපෘති එළඹෙන සිංහල හා හින්දු අලුත් අවුරුද්දට පෙර නිම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

'අපේ ගමේ අපේ කඩේ' තේමාව යටතේ දිවයිනේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 14022හි තෝරා ගත් මාර්ගයක සංවර්ධනයට සමගාමීව නිවෙසක් සහ එයට යාබද ව්‍යාපාරික ස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ පසුගිය (8) මෙම ව්‍යාපෘති ආරම්භ කරන ලදී.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ රට හදන 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය නංවාලීම මූලික කොටගෙන ආර්ථික පුනර්ජනනීය හා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකා ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් මත මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

'සෞභාග්‍යයේ දැක්ම' වැඩපිළිවෙළ අනුව යමින් ගමේ යටිතල පහසුකම් සංවර්ධනය හා අඩු ආදායම් ලාභීන්ගේ ආර්ථිකය නගා සිටුවීම මෙහි අරමුණ වන අතර මෙය ක්‍රියාත්මක කිරීමෙන් පවුල් 14,022 ක ආර්ථිකයද ඉහළ නැංවීමට හැකියාව ලැබෙනු ඇත.

පැලියගොඩ

පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල	
	කිලෝ ග්‍රෑම් එකක මිල
තෝරා (බිලි)	1000
කබර පරව්	450
ඇටනඟුල් පරව්	550
අංජිලා B	880
බලයා ලොකු	350-360
බලයා කුඩා	380
කෙළවල්ලා කුඩා	580
කෙන්දා බොකු සහිත	460-480
තලපත් ලොකු	750
කොප්පරා	850
මෝරු ගුද්ද	650
ඇටිල්සා ලොකු	650
ඇටිස්සා කුඩා	500
පීලා ලොකු	550
අලගොඩුවා ලොකු	300
පියාමැස්සා	230
හුරුල්ලා	400-450
ගල් හුරුල්ලා	450
සාලයා මට්ට	140-150
දැල්ලා බිලි	650
ඉස්සා ලොකු (සුදු)	900
ඉස්සා මධ්‍යම	800
ඉස්සා කුඩා	450
සවරා	800
ලින්නා ලොකු	250
ලින්නා කුඩා	200
සුද්දා	400
මුහුදු කකුළුවා ලොකු	650
ලේනපරව්	380
ලෝමැස්සා	420
ගින්නට් පරව්	450
සූඩයා	60
කාරල්ලා	100
පොතුබරි	140
ගුද්ද කොයි	400
කුම්බලා බෝල්ලා	350
හැඩැල්ලා	850
සුරාපරව්	320

පැලියගොඩ එළවළු මිල	
	(කිලෝවක තොග මිල)
ගෝවා	80
බෝංචි	140
තක්කාලි	130
ලීක්ස්	70
කැරට්	150
වම්බටු	40
පිපිඤ්ඤා	30
අමු මිරිස්	160
මාළු මිරිස්	200
බණ්ඩක්කා	50
තළන බටු	40
දෙහි	70 අතර
වට්ටක්කා	80
පතෝල	80
බීට්	80
දේශීය අර්තාපල්	100
ලොකු ලූනු	70

පැලියගොඩ පලතුරු මිල	
	(කිලෝවක තොග මිල)
අඹ අල්පොන්සෝ	380-400-420 අතර
අඹ කර්තකොළම්බන් (ගෙඩි එකක්)	90-100-110-120 අතර
ගස් ලබු (ගෙඩි එකක්)	80-90 අතර
කෝලිකුට්ටු	160
ඇඹුල් කෙසෙල්	30-40-50 අතර
දොඩම්	140
කොමඩු	80-90-100 අතර
අන්නාසි	80-90-100 අතර
කිලෝ පේර	140-150 අතර
දොඩම්	140

සූරියවැව වල්සපුගල මාරාන්තික ගොවි උපවාසය අත් හරී

සූරියවැව විශේෂ-නුවන් ජයසේකර

වනජීවී අධ්‍යක්ෂගේ ලිඛිත පොරොන්දුවට හිස නමා මාරාන්තික උපවාසය අත්හැරිය ද සත්‍යග්‍රහය දිගටම කරගෙන යන බවත් යම් හෙයකින් ගොවීන් රවට්ටන්න කටයුතු කළොත් ඉතිහාසයේ දැවැන්තම ගොවි අරගලය ආරම්භ කරන බවත් වලව වම් ඉවුර ඒකාබද්ධ ගොවි සංවිධානයේ ලේකම් අයි.කේ.සමන් සුදර්ශන මහතා පැවසීය.

හම්බන්තොට යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කරන ලෙස ඉල්ලා සූරියවැව වල්සපුගල වැවි තාවුල්ලේදී ආරම්භ කරන්න යෙදුණු මාරාන්තික උපවාසය පසුගියදා (10) සවස 6.45 සිට තාවකාලිකව අත්හැරීමට තීරණය කිරීමෙන් අනතුරුව ඒ මහතා මාධ්‍යයට මේ බව පැවැසීය.

වැඩිදුරටත් ඒ මහතා මෙසේද පැවසීය.

හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් එච්.ඩබ්ලිව්.කරුණාරත්න මහතා සමඟ පසුගියදා (10) සවස සාකච්ඡාවක් පැවත්වුණු අතර එහිදී දිස්ත්‍රික් ලේකම්වරයා විසින් වනජීවී අධ්‍යක්ෂවරයාගේ අත්සනින් යුතු ලිපියක් ගොවීන් වෙත බාරදීම සිදු කළ බවත් මසක කාලයකදී මේ අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීමට අදාළ ගැසට්ටුව ගොවීන් අතට දෙන බව එහි සඳහන් වී ඇති බවත් හෙතෙම කීය. තවත් එක් දේශපානඥයකු නොව රාජ්‍ය නිලධාරියකු විසින් දුන් ලිඛිත පොරොන්දුවක් නිසා තවදුරටත් රජයට අවස්ථාවක් ලබාදීමේ අරමුණෙන් මාරාන්තික උපවාසය පමණක් තාවකාලිකව නැවැත්වීමට තීරණය කළා. නමුත් තවදුරටත් අඛණ්ඩව සත්‍යග්‍රහය පවත්වාගෙන යාම සිදුකරනවායැයි ද කීය.

මානව හිමිකම් සංවිධානයට අප යළි මතක් කරනවා:

දෙමළ ජනයා ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගැනීමට ජීවිත පූජා කරමින් සටන් කළේ අපේ රණවිරුවන්

යුද හමුදාපති

රත්නසිරි පතිරණ

ජිනීවා මානව හිමිකම් සංවිධානය එහෙ ඉඳලා ශ්‍රී ලංකාවට එරෙහිව මොන විදියේ චෝදනා බොරු අවලාද එල්ල කළත් කොටි සංවිධානයේ විවිධ පීඩාවන්ට ලක්වෙලා වසර ගණනාවක් දුක් විඳපු දෙමළ ජනතාව බේරා ගැනීම සඳහා ජීවිත පූජා කරමින් සටන් කළේ අපේ වීරෝදාර රණවිරුවන් බව නැවත වතාවක් මානව හිමිකම් සංවිධානයට මතක් කර දෙන බව යුද හමුදාපති ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා සඳහන් කළේය.

එදා කොටි සංවිධානයේ ප්‍රාණ ඇපයට තියාගත්තේ ඔවුන්ගේම සහෝදර ජනතාව. ඒ මිනිස්සු විඳපු දුක දැක්කේ අපි. අද අපට විවිධ චෝදනා එල්ල කරමින් ශ්‍රී ලංකාවට යුද අපරාධ චෝදනා කරන ජිනීවා මානව හිමිකම් සංවිධානය එදා අහිංසක දෙමළ මිනිසුන්ගේ දුක දැක්කේ නැත්තේ ඇයිදැයි තමන් ඔවුන්ගෙන් අසන බවත් යුද හමුදාපතිවරයා සඳහන් කළේ පසඟගියදා (08) උදේ විශේෂ උත්සවයකට එක්වෙමිනි. ශ්‍රී ලංකා යුද හමුදාවේ කොමන්ඩෝ රෙජිමේන්තුවේ කෝප්‍රල් ඩබ්ලිව්. ජී.ටී. දර්ශන සම්පත් රණවිරුවාගේ විවාහ මංගල්‍යයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා උත්සවයෙන් අනතුරුව මාධ්‍ය වෙත එසේ අදහස් දැක්වීය.

වැඩිදුරටත් එහිදී යුද හමුදාපතිවරයා මෙසේද කීය.

රටට වගකියන රජයක් හැටියට ජිනීවා මානව හිමිකම් සංවිධානය එල්ල කරන චෝදනාවලට නොබියව මුහුණ දෙනවා. අපේ නිර්දෝෂීභව මුළු ලෝකයම දන්නවා. අවසන් මානුෂීය මෙහෙයුමට මුහුණදෙන්න බැරි කොටි සංවිධානය ලක්ෂ ගණනක් දමළ ජනතාව ප්‍රාණ ඇපයට තියාගෙන අපේ වීරෝදාර හමුදාවන්ට ප්‍රහාර එල්ල කළා. ඒත් අපි ඒ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගනිමින් කොටි ප්‍රහාරවලට මුහුණ දුන්නා. ශ්‍රී ලංකා යුද හමුදාව කියන්නේ විනය ගරුක අතිදක්ෂ හමුදාවක්. ඒ නිසා අපට මේ රටේ ජීවත්වන සෑම ජනකොටසකගේම ජීවිත වටිනවා. ඒකයි මානුෂීය මෙහෙයුමේදී ජීවිත හානි අවම කරමින් අපේ හමුදාව ඉදිරියට ගිහින් දමළ ජනතාව කොටි ග්‍රහණයෙන් මුදා ගත්තේ. අපි එදා ජීවිත පරිත්‍යාගයෙන් කරපු ඒ කැප කිරීම් නිසයි අද මේ රටේ සියලු ජනකොටස් සාමකාමීව නිදහසේ ජීවත්වෙන්නේ.

වැඩිදුරටත් යුද හමුදාපතිවරයා මෙසේද කීය. කොටි හිතවාදීන් කවදාවත් අපේ වීරෝදාර රණවිරුවන් කරපු හොඳ දකින්න කැමති නෑ. දැන් මානව හිමිකම් සමුළුව පැවැත්වෙන කාලයයි. ඒ නිසා වැඩිපුර ශ්‍රී ලංකාව ගැන ඔවුන් විවිධ අපවාද චෝදනා එල්ල කරාවි.හැබැයි අනාගතයේ දවසක අපේ රටට අපේ හමුදාවන්ට බොරු චෝදනා එල්ල කරපු අයට කවුද හරි කියා සත්‍ය අවබෝධ කරගන්න හැකිවේවි. කවුරු මොනවා කීවත් සත්‍ය ජය ගන්නවා. ඒ නිසා මම මානව හිමිකම් සමුළුව ඇතුළු කොටි හිතවාදී සෑම කෙනෙකුටම සත්‍ය අවබෝධ කරගන්න නුවණ පහළවේවායි ප්‍රාර්ථනා කරන බවද යුද හමුදාපතිවරයා සඳහන් කළේය.

යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජනරාල් සෙනරත් බණ්ඩාර, මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති සහ කොමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් උපාලි රාජපක්ෂ මහත්වරුන් ඇතුළු හමුදා නිලධාරීහු රැසක්ද මේ අවස්ථාවට එක්වූහ. 'සියනෑවේ අපි' සංවිධානය මේ විවාහ මංගලෝත්සවය සංවිධාන කර තිබුණි.

ඡායාරූප - රුක්මාල් ගමගේ

අපනයන කෘෂිකෝග මිල ගණන්

2021.03.09 දිනෙන් අවසන්වූ සතිය තුල පැවති සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑමයට රුපියල්)

බෙදාහැරීම / ප්‍රභේදය		[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]	[illegible]
සුරාසඳු	Alba					3,033	-	-	-	-	3,800	3,200	2,962	-	-
	C-5 Sp					2,683	-	-	2,400	-	2,590	2,610	2,567	-	-
	C-5					2,433	-	-	2,500	2,110	2,480	2,455	2,450	2,450	-
	C-4					2,316	-	-	2,350	1,800	2,365	2,340	2,342	2,375	-
	M-5					2,016	-	-	-	-	2,850	-	2,283	-	-
	M-4					2,016	-	-	-	-	1,980	-	2,217	-	-
	H-1					1,983	-	-	2,100	-	1,885	2,155	2,138	2,125	-
කමිසිරන්	1 කිලෝග්‍රෑම්	594	600	667	600	579	588	600	613	580	500	580	588	550	588
	2 කිලෝග්‍රෑම්	500	-	-	-	-	560	-	-	-	-	-	-	-	-
පටාලි 1 කිලෝග්‍රෑම්		1,002	1,031	980	850	931	788	963	738	920	800	750	994	860	925
කොටි 1 කිලෝග්‍රෑම්		911	925	983	950	735	781	883	767	890	785	800	738	750	800
කොකෝවා 1 කිලෝග්‍රෑම්		355	387	-	300	-	360	325	-	-	-	-	-	-	380
පටදැත්තෙකු ප්‍රාණා ගිනි		-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
පාදික්කා 1 කිලෝග්‍රෑම්		783	776	825	800	-	-	700	-	-	-	900	-	-	-
එලතරුණි 1 කිලෝග්‍රෑම්		3,850	3,842	3,750	4,000	-	-	3,500	-	-	-	3,800	-	-	-
ගිනුරු කොළ 1000යි		-	-	-	-	-	-	6,000	-	5,000	-	-	-	-	-
පුවක් පටවන්නා සි.ගු.1යි		602	606	567	625	607	550	617	553	610	597	600	606	620	550

නිෂ්පාදනය	කි'කොට්ටා' පුර		සාමාන්‍ය	මිනිසා
සුරාසඳු කොළ කෙරේ (සි.ගු./රු.)	-	-	3,500	3,300
පාසෙරි කෙල්ලේ (සි.ගු./රු.)	2,000	0	-	2,000

දැනට සැකසුම් - අපනයන කෘෂිකර්මික ආර්ථික පර්යේෂණ අංශය
අපනයන කෘෂිකර්මික බෝග විකාශනයේ හා සංවර්ධනයේ පිළිබඳ නිලධාරී
පාලිඅණිත පොරතුරු සහ උපදෙස් කොමිෂන් සභාවෙහි සහයෙන්
අපනයන කෘෂිකර්මික වාරාන්තර හිතුධාරී හඳුවන්න.
ස්ථානය - කොළඹ කේන්ද්‍රය දිනය - සඳුදා
වේලාව -පෙ.ව. 8.30 සිට ප.ව. 4.15

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.dea.gov.lk

සන්නිවේදන අංශය, අපනයන කෘෂිකර්මික දෙපාර්තමේන්තුව, 1095, නුවර පාර, පේරාදෙණිය
අපනයන කෘෂිකර්මික දෙපාර්තමේන්තුව - අත්තීව කරු කෙව දීනසව ☎ 081 2388651

46 වන ජාතික මහා ක්‍රීඩා උළෙල - 2020

මැරතන් / තරග ඇවිදීම සහ පාපැදි රේසිං (පිරිමි/ කාන්තා)

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සංවිධානය කරනු ලබන 46 වන ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව පවත්වනු ලබන ක්‍රීඩා ඉසව් පහත සඳහන් පරිදි කතරගම ප්‍රධාන බස් නැතුම්පොල ඉදිරියේ දී පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර ඇත.

තරගය සඳහා වන පොදු කොන්දේසි මාලාව

1. ජාතික මැරතන් කාන්තා හා පිරිමි තරගය විවෘත තරගයක් වශයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.
2. වයස් සීමාව – තරගය සඳහා සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2021.03.12 දිනට වයස අවුරුදු 15 සම්පූර්ණ කර තිබිය යුතුය.
3. තරගය සඳහා ලියාපදිංචි විය යුතු දිනය සහ වේලාව – 2021.03.25 දින පෙ.ව.09.00 සිට ප.ව. 04.00 දක්වා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරයේදී

අංක	තරගය	දිනය	ආරම්භක වේලාව
1	විවෘත මැරතන් තරගය	2021.03.26	පෙ.ව. 05.30
2	තරග ඇවිදීම	2021.03.27	පෙව.06.00
3	පාපැදි තරගය	2021.03.29	පෙව. 06.30 – පිරිමි
			ප.ව. 03.00 – කාන්තා

4. අනත්‍යතාවය තහවුරු කිරීම
   4.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබූ ජාතික හැඳුනුම්පත (නැවත ඉල්ලුම් කර ඇත්නම් ග්‍රාම නිලධාරී විසින් ලබාදෙන ඡායාරූපය ඇළ වූ අයදුම්පතෙහි කොටස)
   4.2 තැපැල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබූ වලංගු හැඳුනුම්පත
5. අයදුම්පත් භාරගන්නා අවසන් දින – 2021.03.19 දින
6. තරගය සඳහා සහභාගි වන සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ආහාර පාන සහ නේවාසික පහසුකම් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නොමිලේ ලබාදෙනු ඇත.
7. සහභාගි වන සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් දින 14 ක් ඇතුළත ලබාගත් වෛද්‍ය වාර්තාවක් සහ ECG එක්ක රැගෙන ආ යුතුය.
8. සහතික කරගත් කෝවිඩ් – 19 නිෂ්කාශන අයදුම්පත්‍රය මේ සමග රැගෙන ඒම අනිවාර්ය වේ.

   පහත සඳහන්ව ඇති ආකෘතියට අනුව සකස් කරගත් තරග අයදුම්පත් අධ්‍යක්ෂ (ක්‍රීඩා), ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **"ජාතික විවෘත මැරතන් තරගය - 2020"** ලෙස සඳහන් කළ යුතුය.

අමල් එදිරිසූරිය
අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

46 වන ජාතික මහා ක්‍රීඩා උළෙල – 2020
මැරතන් / තරග ඇවිදීම සහ පාපැදි රේසිං (පිරිමි/ කාන්තා) ආදර්ශ තරග අයදුම්පත

තරගය _____

1. ක්‍රීඩකයා / ක්‍රීඩිකාවගේ සම්පූර්ණ නම (මුලකුරු සමග) : .....
2. පෞද්ගලික ලිපිනය : .....
3. උපන් දිනය : දිනය ..... මාසය ..... අවුරුද්ද .....
4. හැඳුනුම්පත් අංකය : .....
5. දුරකථන අංකය (ජංගම) : .....
6. රැකියාව / ආයතනය : .....
7. විද්‍යුත් තැපැල් ලිපිනය : .....
8. රාජකාරි ස්ථානයේ ලිපිනය : .....
9. පළාත : ..... දිස්ත්‍රික්කය : .....
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .... ග්‍රාම නිලධාරී වසම : .....
11. පුහුණුකරුගේ නම සහ ලිපිනය : .....
12. දුරකථන අංකය (ජංගම) : .....
13. ක්‍රීඩා සමාජයේ නම සහ ලිපිනය : .....
14. නේවාසික පහසුකම් අවශ්‍යතාව (කොටුව තුළ හරි ලකුණ යොදන්න) : ඔව් ☐ නැහැ ☐

ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බවත්, ජාතික මහා ක්‍රීඩා උළෙලෙහි සියලු තරග තීතිරීතිවලට එකඟව කටයුතු කරන බවත්, තරගය අතරතුර දී මා හට හෝ දේපළවලට සිදුවන අතතුරු හා ආලාභ හානි සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වගකීම භාර නොගත්තා බව මා දැනුවත් බවත් මෙයින් ප්‍රකාශ කරමි.

....
අයදුම්කරුගේ අත්සන දිනය

46 වන ජාතික මහා ක්‍රීඩා උළෙල – 2020
මැරතන්/ තරග ඇවිදීම සහ පාපැදි රේසිං (පිරිමි/ කාන්තා) තරග
2021 - කොවිඩ් - 19 නිශ්කාශන අයදුම්පත්‍රය

තරගය _____

1. ක්‍රීඩකයා/ ක්‍රීඩිකාවගේ මුලකුරු සමග නම : .....
2. ක්‍රීඩකයා/ ක්‍රීඩිකාවගේ සම්පූර්ණ නම : .....
3. පෞද්ගලික ලිපිනය : .....
   (පසුගිය මාස 03 ක කාලයක් තුළදී පදිංචිව සිටි ලිපිනය) : .....
4. උපන් දිනය : දිනය ..... මාසය ..... අවුරුද්ද .....
5. හැඳුනුම්පත් අංකය : .....
   (හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඇමිණිය යුතුය)
6. පළාත : ..... දිස්ත්‍රික්කය : .....
7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..... ග්‍රාම නිලධාරී වසම : .....
8. ඉහත ග්‍රාම නිලධාරී වසම අයත්වන : සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පොලිසිය : .....
9. ඉහත ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් ලබාදිය යුතු සහතිකය : ඉහත විස්තරයට අදාළ පුද්ගලයා පදිංචි ප්‍රදේශය කොවිඩ් 19 රෝගය පැතිරීම හේතුවෙන් මේ වන විට හුදකලා කර ඇති ප්‍රදේශයක් නොවන බවත්, එම පුද්ගලයා හෝ ඔහුගේ / ඇයගේ / ළඟම ඥාතීන් කොවිඩ් 19 රෝගය වැළඳුනු අයගේ ආශ්‍රිතයින් වීම හේතුවෙන් මේ වන විට නිරෝධායනයට ලක්කර නොමැති බව මෙයින් සහතික කරනු ලැබේ/ නොලැබේ. (අදාළ වචන කපා හරින්න)
10. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ නම : .....
11. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන් සම්බන්ධකරගත හැකි දුරකථන අංක : .....

.....
මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ අත්සන හා නිල මුද්‍රාව

ශ්‍රී ලංකා මැදපෙළ කඩාවැටෙද්දී පළමු එක්දින ජය කොදෙව්වන්ට

දෙවැනි තරගය අද රාත්‍රී 7.00ට

ෂායි හෝප්

නායක දිමුත් කරුණාරත්න සහ ධනුෂ්ක ගුණතිලක ඉනිමට සාර්ථක ආරම්භයක් දුන්න ද මැද පෙළ පිතිකරුවන්ගේ දුර්වල ක්‍රීඩා විලාශය හේතුවෙන් සත්කාරක බටහිර ඉන්දීය කොදෙව් පිල හමුවේ කඩුලු 8ක පරාජයක් විඳ ගැනීමට පෙරේදා (10) ඇන්ඩිගුවාහිදී පැවැති පළමු එක්දින තරගයේදී සංචාරක ශ්‍රී ලංකා කණ්ඩායමට සිදු විය.

එහිදී පළමුව පන්දුවට පහර දුන් ශ්‍රී ලංකා පිල ලකුණු 232කට සීමා කළ කොදෙව් ක්‍රීඩකයන් ඕවර 47ක ඉලක්කය සපුරා ගත්තේ කඩුලු 2ක් පමණක් අහිමි කර ගනිමිනි.

මේ සමඟින් තරග 3කින් සමන්විත එක්දින තරගාවලිය 1-0ක් ලෙස පෙරමුණ ගැනීමට ද සත්කාරකයෝ සමත් වූහ.

ජයග්‍රාහී ඉලක්කය හඹා යෑම සඳහා කොදෙව් ඉනිමට සාර්ථක අඩිතාලමක් දැමූ ෂායි හෝප් සහ එවින් ලුවිස් පළමු කඩුල්ලට ඕවර 28.2කදී ලකුණු 143ක සබඳතාවක් ගොඩනැගූහ. ලකුණු 65ක් රැස් කර සිටි ලුවිස් දුෂ්මන්ත චමීරගේ පන්දුවක් කෙළින්ම කඩුල්ලේ වැදීමෙන් දැවී යෑමත් සමඟ එම සබඳතාව නිමා විය. මේ තරගයේදී සිය 10 වැනි එක්දින ශතකය රැස් කිරීමට සමත් වූ හෝප් ද චමීරගේ පන්දුවක් කඩුල්ලේ වැදීමෙන් දැවී ගිය අතර, ඒ වන විට ඔහු ලකුණු 110ක් රැස් කර තිබිණි. පන්දු 133කට මුහුණ දුන් ඔහු හතරේ පහර 12කින් සහ හයේ පහරකින් ඉනිම වර්ණවත් කර ගත්තේය.

මේ පිතිකරුවන් දෙදෙනා පළමු කඩුල්ලට එක් කළ ලකුණු 143ක දෙරට අතර එක්දින තරගයකදී පළමු කඩුල්ලට වාර්තා වූ ඉහළම සබඳතාව ලෙස ද වාර්තා අතරට එක් විය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් ශ්‍රී ලංකා ඉනිමට කලකට පසු සාර්ථක ආරම්භයක් දුන් නායක දිමුත් කරුණාරත්න සහ ධනුෂ්ක ගුණතිලක පළමු කඩුල්ලට පන්දු 116කින් ලකුණු 105ක් එක් කිරීමට සමත් වූහ.

ධනුෂ්ක ගුණතිලක සහ දිමුත් කරුණාරත්න

පන්දු 61කදී හතරේ පහර 4ක් සමඟ 6 වැනි එක්දින අර්ධ ශතකය ලෙස ලකුණු 52ක් රැස් කර සිටි දිමුත් දැවී යෑමත් සමඟ මුළු ලකුණු 105දී එම සබඳතාව නිමා විය.

ගුණතිලක ද පන්දු 61කට මුහුණ දී තිබූ අතර, හතරේ පහර 7ක් සමඟින් ඔහු ලකුණු 55ක් රැස් කළේ 9 වැනි එක්දින අර්ධ ශතකය ලෙසිනි. මුළු 112දී ගුණතිලක අවාසනාවන්ත දැවී යෑමකට හසු වීමත් සමඟ ශ්‍රී ලංකා ඉනිමේ කඩා වැටීම ආරම්භ විය.

මංගල එක්දින තරගයට ක්‍රීඩා කළ පැතුම් නිස්සංක අනවශ්‍ය ලකුණු කරා දිව යෑමට ගත් උත්සාහයන් හේතුවෙන් ශ්‍රී ලංකා පිලට ලකුණු 14ක් තුළ කඩුලු 3ක් අහිමි විය. ගුණතිලක සමඟන් ඇන්ජෙලෝ මැතිව්ස් (5) සහ නිස්සංක (8) ද දුවද්දි දැවී ගිය පිතිකරුවන් බවට පත් වූහ.

පළපුරුදු පිතිකරුවන් ද සමඟ මැද පෙළ එක පෙළට කඩා වැටෙද්දී මේ තරගයෙන් ජගත් එක්දින වරම් ලැබූ 22 හැවිරිදි අශේන් බණ්ඩාර හුදෙකලා සටනක නිරත වෙමින් මංගල අර්ධ ශතකයක් රැස් කිරීමට සමත් විය. අනෙක් අන්තයේ පිතිකරුවන්ගෙන් සහායක් නොලැබුණු ඔහු මුහුණ දුන් 60 වැනි පන්දුවෙන් දැවී යන විට හතරේ පහර 4ක් එල්ල කර තිබිණි.

කඩුල්ල බේරා ගැනීමට ප්‍රබල සටනක නිරත වූ දිනේෂ් චන්දිමාල් පන්දු 24කින් ලකුණු 12ක් රැස් කර සිටියදී 5 වැනි කඩුල්ල ලෙස දැවී ගියේ මුළු ලකුණු 151දීය. කමිඳු මෙන්ඩිස් (9) සහ වනිඳු හසරංග (6) ලකුණු 6ක් තුළ පිටියෙන් ඉවත් කිරීමට ජේසන් මොහොමඩ් සමත් වූ අතර, දුෂ්මන්ත චමීර ලකුණු 8කටත්, නුවන් ප්‍රදීප් එක් ලකුණකටත් දැවී යෑමත් සමඟ ශ්‍රී ලංකා ඉනිම ඕවර 49කින් නිමා විය. නොදැවී සිටි ලක්ෂාන් සඳකැන් පන්දු 20කින් ලකුණු 16ක් රැස් කර තිබිණි.

අශේන් බණ්ඩාර

පන්දු යැවීමේදී ජේසන් මොහොමඩ් සහ ජේසන් හෝල්ඩර් කඩුලු 2 බැගින් දවා ගත්හ.

අයිසීසී ලෝක කුසලාන සුපර් ලීග් එක්දින තරගමාලාවට ඇතුළත් දෙරට අතර එක්දින තරගාවලියේ දෙවැනි තරගය අද (12) රාත්‍රී 7.00ට ඇන්ටිගුවාහි ශ්‍රීමත් විවියන් රිචර්ඩ්ස් ක්‍රීඩාංගණයේදීම පැවැත්වේ.

කඹ ඇදීමේ පුහුණුකරුවන්ට පළමුවරට පාඨමාලාවක්

ෆවුස් මොහොමඩ්

කඹ ඇදීමේ පුහුණුකරුවන්ට පාඨමාලාවක් මෙරට කඹ ඇදීමේ පුහුණුකරුවන්ගේ වෘත්තීය මට්ටම ඉහළ දැමීමේ සහ ඔවුන්ගේ සේවයේ ගුණාත්මකභාවය දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය සහ ක්‍රීඩා විද්‍යායතනය එක්ව පළමුවරට කඹ ඇදීමේ පුහුණුකරුවන්ගේ පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේ.

ජාතික තරගාවලියකට සහභාගි වී තිබීම මූලික සුදුසුකම ලෙස සැලකිල්ලට ගනිමින් දිවයින පුරා විසිරි සිටින කඹ ඇදීමේ පුහුණුකරුවන්ගෙන් ඒ සඳහා අයැදුම්පත් කැඳවා ලියාපදිංචි කිරීම පසුගියදා නිමාවට පත් වූ බවත්, පළමු පාඨමාලාවට පුහුණුකරුවන් 49 දෙනකු ඇතුළත් වූ බවත් කඹ ඇදීමේ සම්මේලනයේ සභාපති බ්‍රිගේඩියර් ජානක රණසිංහ මහතා 'දිනමිණ'ට කීවේය.

කඹ ඇදීමේ පුහුණුකරුවන් ශ්‍රේණිගත කරමින් ඔවුන්ට විශේෂ බලපත්‍රයක් නිකුත් කිරීමට සැලසුම් කර ඇති බවත්, ඉදිරියේදී පැවත්වෙන ජාතික මට්ටමේ තරග සඳහා සම්බන්ධ වීමේ අවස්ථාව ලැබෙන්නේ එම බලපත්‍ර සහිත පුහුණුකරුවන්ට පමණක් බවත් ජානක රණසිංහ මහතා පැවසීය.

වසරකට පාඨමාලා දෙකක් පැවත්වීමට කටයුතු යොදා ඇති අතර, ක්‍රීඩා විද්‍යායතනයේ උපදේශකයන් එම පාඨමාලාවේදී දේශන පවත්වනු ලබන අතර, අවශ්‍ය තාක්ෂණ දැනුම කඹ ඇදීමේ සම්මේලනයේ තාක්ෂණික කමිටුවෙන් ලබා දෙනු ඇත.

වසර 4ක තරග තහනමකට ලක්ව සිටි කබඩි ක්‍රීඩිකාව නිදොස් කොට නිදහස්

ප්‍රින්ස් ගුණසේකර

වසර 4ක පූර්ණ තරග තහනමකට ලක් කර සිටි සබරගමු පළාතේ මනෝරී ජයසිංහ ක්‍රීඩිකාවගේ දෙස් විදෙස් තරග තහනම ඉවත් කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිත ආයතනය පියවර ගනියි.

පොළොන්නරුව ජාතික මහා ක්‍රීඩා උලෙළේ දක්ෂතම කබඩි ක්‍රීඩිකා සම්මානය දිනාගත් සබරගමු පළාතේ මනෝරී ජයසිංහ තහනම් උත්තේජක භාවිතා කොට තරග වැදුනේ යැයි පවසා වසර 4ක පූර්ණ තරග තහනම ජාතික විනය පරීක්ෂණ කමිටුව මගින් නිර්දේශ කර තිබූ අතර, ඊයේ පැවැති පරීක්ෂණයකදී තහනම ඉවත් කෙරිණි.

ජනාධිපති නීතිඥ නවින් මාරපන මහතාගේ උපදෙස් අනුව උදිත වික්‍රමසිංහ හා රශ්මි ඉන්ද්‍රතිස්ස යන නීතිඥවරු පිරිස ක්‍රීඩිකාව වෙනුවෙන් පසුගිය වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ තර්ක ඉදිරිපත් කළ අතර, මේ හේතුවෙන් තහනම ඉවත් කිරීමට සිදු විය. නීතිඥවරුන් පෙන්වාදී ඇත්තේ ක්‍රීඩිකාවගේ මුත්‍ර සාම්පල් එකතු කිරීම හා ප්‍රවාහණය නිසි පරිදි සිදු නොවී ඇති බැවින් සාම්පල පරීක්ෂණ ප්‍රතිඵල පිළිගත නොහැකි බවයි. එමෙන්ම මුත්‍ර සාම්පල නියැදි පරීක්ෂා කළ ඉන්දීය පරීක්ෂණාගාරය තහනම් උත්තේජක පරීක්ෂා සඳහා සුදුසු ප්‍රමිතියක නැති බවට ලෝක තහනම් උත්තේජක මර්දනායතනය (WADA) ප්‍රකාශ කොට තිබීම ද විශේෂත්වයක් විය.

ශ්‍රී ලංකා කබඩි සම්මේලනයේ සභාපති අනුර පතිරණ මහතා විසින් ක්‍රීඩිකාවට අවශ්‍ය සහයෝගය දුන්න ද ඇය සේවය කළ ස්ථානයෙන් කිසිදු සහයෝගයක් නොදීම කනගාටුවට කරුණක් බව කබඩි සම්මේලන ප්‍රකාශකයෙකු 'දිනමිණ'ට පැවසීය.

ක්‍රීඩිකාවට 2022 ඔක්තෝබර් 11 දින දක්වා දෙස් විදෙස් තරග තහනමක් පනවා තිබූ අතර, එම කාලය තුළ සියලු ආකාරයේ ක්‍රීඩා කටයුතු හා පුහුණුවීම් සිදු කිරීමෙන් වැළකී සිටිය යුතු බවට ලිඛිත දැනුම්දීමක් කර තිබිණි. මේ තහනම පිළිබඳ තෘප්තිමත් නොවන්නේ නම් එකී තීරණයට එරෙහිව 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 26 (1) (අ) උප වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව තීරණය දැනුම්දී සති දෙකක් තුළ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිත ආයතනයේ අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනාවක් ඉදිරිපත් කිරීමේ අයිතිය ක්‍රීඩිකාවට ලැබී තිබූ හෙයින් එම අභියාචනාව මත පරීක්ෂණ ඇරඹිණි.

පොළොන්නරුව ජාතික මහා ක්‍රීඩා උලෙළේ තරග පැවැති අතරතුරදී ජාතික තහනම් උත්තේජක මර්දන නියෝජිතායතනය අහඹු ලෙස මුත්‍ර සාම්පල ගෙන ඉන්දියාවේ පරීක්ෂණාගාරයකදී කළ පරීක්ෂණයකදී 'ඩියුරටික්' (diuretic) නම් තහනම් උත්තේජක සංඝටක අඩංගු බවට වාර්තා වී තිබූ අතර, පසුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිත ආයතනය විසින් පවත්වනු ලැබූ විනය කමිටු පරීක්ෂණයේදී චෝදනාවට මනෝරී ජයසිංහ ක්‍රීඩිකාව වැරදිකාරිය වූවාය.

ඇය සමඟ දකුණු පළාතේ ක්‍රීඩක චාමර නුවන් ක්‍රීඩකයාට තහනම් උත්තේජක භාවිතා කළ බවට චෝදනා එල්ල වූ අතර, ක්‍රීඩකයා 'බී' සාම්පල මුත්‍ර නියැදි පරීක්ෂාව සිදු කිරීම අනවශ්‍ය බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිත ආයතනය වෙත පැමිණ ලිඛිතව දැනුම් දී කබඩි ක්‍රීඩාව අත්හැර කොරියාව බලා පිටත් වූ හෙයින් ඉදිරි පරීක්ෂණ සිදු නොවිණි.

පන්දු රකින්නන්ට බාධා කළේ යැයි ගුණතිලකට ඉතිහාසගත දැවී යෑමක්

බටහිර ඉන්දීය කොදෙව් පිල සමඟ පළමු තරගයේදී ශ්‍රී ලංකා ආරම්භ පිතිකරු ධනුෂ්ක ගුණතිලක දැවී ගියේ ක්‍රිකට් පිටියේ විරල අවස්ථාවකිනි.

ඔහු පන්දු රකින්නන්ට බාධා කළ බවට තීරණය කරමින් දැවී ගිය පිතිකරුවකු ලෙසට නම් කළ අතර, මෙලෙස පන්දු රකින්නන්ට බාධා කිරීම හේතුවෙන් දැවී ගිය පළමු ශ්‍රී ලාංකික පිතිකරු ලෙස ගුණතිලක ඉතිහාසයට එක් විය. එලෙස දැවී ගිය ලොව 8 වැනි පිතිකරු වන්නේ ද ගුණතිලකයි.

කොදෙව් නායක කිරන් පොලාර්ඩ් ඉනිමේ 22 වැනි ඕවරයේ පළමු පන්දුවට පහර දුන් ගුණතිලක වෙතින් පන්දු රැකීමට බාධා වීම හේතුවෙන් ඔහු දැවී ගිය පිතිකරුවකු ලෙසට නම් කරන ලෙස පොලාර්ඩ් පිටියෙන් විනිසුරුවන්ගෙන් ඉල්ලා සිටියේය. එය තෙවැනි විනිසුරු ලෙස කටයුතු කළ නයිජල් ඩුගුයිඩ්ට යොමු කිරීමෙන් අනතුරුව ඔහු දැවී ගිය පිතිකරුවකු ලෙස නම් කළ ද පුනරුපණවලින් දක්නට ලැබුණේ ඔහු විසින් හිතාමතා පන්දු රකින්නන්ට බාධා නොකළ බවකි. කෙසේ වෙතත් තෙවැනි විනිසුරුගේ මේ තීරණය මතභේදයට තුඩු දුන් එකක් විය.

සමාජ මාධ්‍ය ඔස්සේ ද මේ තීරණය පිළිබඳ විවිධ මත පළ වෙමින් තිබෙන අතර, හිටපු කොදෙව් නායක ඩැරන් සැමි සහ ටොම් මූඩි සිය ට්විටර් ගිණුම්වල සටහන් කර තිබුණේ මේ තීන්දුව නිසා කම්පනයට පත් වූ බවයි. කෙසේ වෙතත් තරගයෙන් අනතුරුව පොලාර්ඩ් සහ ගුණතිලක හමු වී සුහද කතාබහක නිරතව සිටින අයුරු ද කොදෙව් ක්‍රිකට් ආයතන නිල ට්විටර් ගිණුමේ ඡායාරූපවලින් දක්නට ලැබිණි.

ජගත් ක්‍රිකට් පිටියේදී මේ අයුරින් පන්දු රකින්නන්ට බාධා කිරීම හේතුවෙන් දැවී ගිය පළමු ක්‍රීඩකයා ලෙස ඉතිහාසයට එක්ව ඇත්තේ පාකිස්තානයේ රමීස් රාජාය. ඔහු 1987 වසරේ නොවැම්බර් 20 වැනිදා එංගලන්තය සමඟ පැවැති තරගයේදී මෙලෙස දැවී ගොස් තිබිණි. ගුණතිලකට පෙර රමීස් රාජා සමඟින් තවත් පාකිස්තාන ක්‍රීඩකයන් තිදෙනකු, එංගලන්ත සහ එක්සත් අරාබි එමිර් ක්‍රීඩකයකු ද එලෙස දැවී ගොස් තිබේ.

- ප්‍රියංකර

'ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස්' අවසන් පූර්ව වටයේ

උපුල් තරංගගේ විශිෂ්ට පිතිහරඹය හේතුවෙන් රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස් ක්‍රිකට් තරගාවලියේ බංග්ලාදේශ ලෙජන්ඩ්ස් පිල සමඟ පැවැති තරගයෙන් ලකුණු 42ක ජයක් අත් කර ගැනීමට ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල සමත් විය.

මේ සමඟින් තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගත් ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් ක්‍රීඩකයෝ අවසන් පූර්ව වටයේ ස්ථානයක් වෙන් කර ගැනීමට ද සමත් වූහ. කණ්ඩායම් 7ක් එක් වන තරගාවලියේදී අවසන් පූර්ව වටයට පිවිසි පළමු කණ්ඩායම වන්නේ ද ශ්‍රී ලංකාවය.

රායිපූර්හිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම කඩුලු 6ක් දැවී ලකුණු 180ක් රැස් කළ අතර, එම ඉලක්කය හමුවේ බංග්ලාදේශ ලෙජන්ඩ්ස් පිලට ඕවර 20 අවසානයේ කඩුලු 6ක් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 138ක් පමණි.

නසිමුදින් පන්දු 41කදී හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් සමඟ ලකුණු 54ක් රැස් කරමින් බංග්ලාදේශයට බලාපොරොත්තුවක් ගෙන දුන්න ද මැද පෙළ පිතිකරුවන් අඩු ලකුණු ගණනකට දවා ගැනීමට ශ්‍රී ලංකා පන්දු යවන්නෝ සමත් වූහ. කලීඩ් මෂූඩ් ලකුණු 28ක් සහ මෙහෙරාබ් හුසේන් ලකුණු 27ක් ඉනිමට එක් කළ අතර, සෙසු පිතිකරුවන්ට ලකුණු 10 සීමාව පසු කිරීමට නොහැකි විය. පන්දු යැවීමේදී තිලකරත්න ඩිල්ෂාන් කඩුලු 3ක් බිඳ දැමූ අතර, ධම්මික ප්‍රසාද් කඩුලු 2ක් දවා ගත්තේය.

නායක තිලකරත්න ඩිල්ෂාන් පන්දු 23කින් වේගවත් ලකුණු 33ක් රැස් කරමින් ශ්‍රී ලංකා ඉනිමට වේගවත් ආරම්භයක් දුන් අතර, ඔහු සමඟ ඉනිම ඇරඹූ සනත් ජයසූරිය ආබාධයක් හේතුවෙන් ලකුණු 4කට පිටියෙන් ඉවත් විය.

අනතුරුව පිටියට පිවිසි උපුල් තරංග ඉනිම නිමා වන තෙක් පිටියේ රැඳෙමින් නොදැවී රැස් කළ ලකුණු සංඛ්‍යාව 99කි. හතරේ පහර 11කින් සහ හයේ පහර 5කින් ඉනිම වර්ණවත් කර ගත් ඔහු ඒ සඳහා වැය කළේ පන්දු 47ක් පමණි. තරංග මේ තරගාවලියේ රැස් කළ දෙවැනි අර්ධ ශතකය මෙයයි. චාමර සිල්වා ලකුණු 24ක් ඉනිමට එක් කළේය. ශ්‍රී ලංකා පිල සහභාගි වන මූලික වටයේ අවසන් තරගය හෙට (14) එංගලන්ත ලෙජන්ඩ්ස් පිල සමඟින් පැවැත්වීමට නියමිතය.

බීආර්සී - ටැමිල් යුනියන් ජය ගනී

අන්තර් සමාජ විස්සයි20

නිරෝෂාන් ප්‍රියංකර

අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ 7 වැනි දිනය යටතේ ඊයේ පෙරවරුවේ පැවැති තරගවලින් ජයග්‍රහණ අත් කර ගැනීමට බීආර්සී සහ ටැමිල් යුනියන් කණ්ඩායම් සමත් වූ අතර, ඊයේ පස්වරුවේ පැවැති තරග දෙකට වර්ෂාවෙන් බාධා ඇති වීම හේතුවෙන් එම තරග අත්හැර දැමීමට කටයුතු කෙරිණි.

පී සරා ඕවල් පිටියේදී බීආර්සී පිල විසින් බදුරලිය ක්‍රීඩා සමාජය ලකුණු 21කින් පරාජයට පත් කළ අතර, ටැමිල් යුනියන් ක්‍රීඩකයෝ කඩුලු 7ක ජයක් අත් කර ගත්තේ පාණදුර ක්‍රීඩා සමාජය සමඟ එන්සීසී පිටියේ පැවැති තරගයේදීය.

පස්වරුවේ ගාල්ල සහ මීගමුව අතර සරා පිටියේ පැවැති තරගයේදී ගාල්ල කණ්ඩායම ඕවර 20 අවසානයේ කඩුලු 7කට ලකුණු 144ක් රැස් කර තිබූ අතර, මීගමුව කණ්ඩායම පිළිතුරු ඉනිම ක්‍රීඩා කිරීමට නොහැකි විය. එන්සීසී පිටියේදී නාවික හමුදාව ඕවර 2කදී කිසිවකු නොදැවී ලකුණු 10ක් රැස් කර තිබුණේ සෙබස්තියනයිට්ස් කණ්ඩායම පළමුව පන්දුවට පහර දෙමින් රැස් කළ ලකුණු 131කට පිළිතුරු ලෙසිනි.

මේ තරගවලදී දුෂාන්ත හේමන්ත සහ ළහිරු සමරකෝන් (බීආර්සී), එරංග රත්නායක (ගාල්ල), අර්ධ ශතක රැස් කිරීමට සමත් වූ අතර,නිමන්ද මධුෂංබ (බදුරලිය), චාමර දිසානායක (බීආර්සී), සචිඳු කොළඹගේ (ටැමිල් යුනියන්) සහ නිශාන් පීරිස් (මීගමුව) කඩුලු 3 බැගින් බිඳ දමමින් දස්කම් දැක්වූහ.

තරගාවලියේ 8 වැනි දිනය වන අද (12) කැන්ඩි කස්ටම් - නුගේගොඩ (පෙ.ව) සහ සීසීසී - බදුරලිය (ප.ව) එස්එස්සී පිටියේදී තරග වදින අතර, ලන්කන් - වරාය අධිකාරිය (පෙ.ව) සහ එන්සීසී - කෝල්ට්ස් (ප.ව) සීසීසී පිටියේදීත් තරග වැදීමට නියමිතය.

පොලීසිය - කළුතර (පෙ.ව) සහ හලාවත - එස්එස්සී (ප.ව) කෝල්ට්ස් පිටියේදීත්, රාගම - යුද හමුදාව (පෙ.ව) සහ පාණදුර - නාවික හමුදාව (ප.ව) පී සරා ඕවල් පිටියේදීත් තරග බිමට පිවිසෙති.

අහස්ගවිය

විඳ්දනීය සිනමාවේ වර්තමාන කියවීම

සිනමාවේ සම්මානය ලෙස්ටර්

1919 අප්‍රේල් මස පස් වැනිදා දෙහිවලට හිරු උදා වූයේ ජේම්ස් ප්‍රැන්සිස් පීරිස් නම් වූ වෛද්‍යවරයාට මෙන්ම විනිප්‍රිඩා ජයසූරිය නමින් හැඳින්වූ මාතාවටත් අගනා වූ පුත්‍ර රත්නයකගේ රූපකායක් දැක බලා ගන්නට ඉඩ හසර සලස්වමිනි. මෙසේ උපන් ඔහුට ඔවුන් තැබූ නම වූයේ ලෙස්ටර් ජේම්ස් පීරිස්ය. පියාගේ පරම්පරාව කුරුකුලසූරිය පරම්පරාවෙන් පැවත එන්නේ වූ නමුදු කිසිම විටක ඔවුන් කුරුකුලසූරිය යන නාමය භාවිත කරන්නට පෙලඹුණේ නැත. බම්බලපිටිය ශාන්ත පීතර විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ ලෙස්ටර්, පාසලේ දී මෙන්ම නිවසේ දී ද හැ දී වැඩුණේ සියලු වරප්‍රසාදයන් ගෙන් අනූන නාගරික පන්තියේ සමාජ ආශ්‍රයේ ය. ඔවුන් කිසිදු විටෙක තම පවුල් සමාගම තුළ සිංහල භාෂාව උච්චාරණයට නොපෙළඹුණු අතර සියලු අදහස් උදහස් හා කතාබහ කිරීම් සියල්ල සිදුවූයේ ඉංග්‍රීසි භාෂාවෙනි. යම් තරමකින් හෝ එකී නිවස තුළින් සිංහල වචන කිහිපයක් ඇසුනේ නම් එය ලෙස්ටර්ගේ මවට කේන්ති ගිය විට පමණි.

ඉංග්‍රීසි භාෂාව කතා කරමින් නාගරික පන්තියේ සියලු වරප්‍රසාද භුක්ති විඳිමින් හුන් ලෙස්ටර් ලෝකයටම කතා කළ හැකි මට්ටමේ සිනමා නිර්මාණ, සිංහල භාෂාවෙන් කවරාකාරයෙන් නිර්මාණය කිරීමට ඔහු සමත් වී ද කියා. මේ මතු කියවීම ට ඔබ සූදානම් වන්නේ ලෙස්ටර්ගේ සිනමා සක්මනයි.

ලාංකේය සිනමාවේ අසාහය සිනමාවේදියා ලෙස්ටර් ජේම්ස් පිරිස් අධ්‍යක්ෂණය කළ වෘතාන්ත චිත්‍රපට සංඛ්‍යාව 20කි. හේ වෘත්තාන්ත සිනමාවට පිවිසෙන්නේ 1956 දී රේඛාව චිත්‍රපටය අධ්‍යක්ෂණය කිරීමෙනි. මෙකී රේඛාව චිත්‍රපටය එතෙක් මෙතෙක් සිංහල සිනමාවේ රාමුව බිඳ දමන්නට සමත් වූ චිත්‍රපටයකැයි අවිවාදයෙන්ම නම් කරන්නට පිළිවන. රේඛාව වූ කලී දේශීය සිනමාවේ සැබෑ උපත යැයි විචාරකයන් අදහස් දක්වන තැනටම ඔහුගේ මුල්ම වෘත්තාන්ත චිත්‍රපටය මහත් වූ පෙළහර දක්වා තිබිණි. චිත්‍රාගාරයේ තිබූ කැමරාව එළියට ගෙන ආ ලෙස්ටර් ඔහුගේ නිර්මාණය නිමවූ පසු 1957 දී අදහස් දක්වමින් පවසා ඇත්තේ "අපේ චිත්‍රපට සත්‍ය ලෙසින්ම ජාතික චිත්‍රපටයක් වන්නට නම් එය ගම්මානයටත් ගැමි දිවි දිවිපෙවෙට ත් දිවෙන මුල් සහිත විය යුතු බවයි. නිසැකවම ඔහු තම මුල්ම වෘත්තාන්ත චිත්‍රපටයෙන්ම එය මනාව පසක් කළේ 1956 දී බණ්ඩාරනායක මහතා දේශපාලන විප්ලවයක් කළා මෙන්ම ලෙස්ටර් ද එම වසරේදීම එතෙක් කලක් පුරාවට පැවැති ලාංකේය සිනමාව ද උඩු යටිකුරු කරමිනි. රේඛාවෙන් වෘතාන්ත චිත්‍රපට කලාවට ලෙස්ටර් පිවිසියද ඊට කලකට පෙර එනම් 1949 වසරේ දී කෙටි චිත්‍රපට නිර්මාණකරණයට අත ගැසීය. ඒ soliloquy චිත්‍රපටය නිපදවීමට සමත් වීමත් සමගිනි .විනාඩි තුනක ධාවන කාලයක් සහිත වූ මෙම චිත්‍රපටය නිර්මාණය කළායින් පසුව හේ පිළිවෙලින් farewell childhood (1950) sinhalese dance වෘත්තාන්ත කෙටි චිත්‍රපට තුන ද නිර්මාණය කරන්නට සමත් විය. මෙහි විශේෂත්වය වන්නේ මෙකී චිත්‍රපට තුනම ලෙස්ටර් නිර්මාණය කළේ විදේශගතව එංගලන්තයේ සිටිය දී වීමය..

1954 වසරේදී ලංකාවට පැමිණි ඔහු මුලින්ම රාජ්‍ය චිත්‍රපට අංශයේ රාජකාරී කටයුතු කළ අතර එහි දී වාර්තා චිත්‍රපට දෙකක් ද නිර්මාණය කිරීමට සමත් විය. එයින් වියළි කලාපය ජයගනී (conquest in the dry) චිත්‍රපටය වෙනීසියේ පැවැති සිනමා උලෙළක දී ඩිප්ලෝමා සහතිකයක් ලබන්නට ද සමත් විය . ලංකාවට පැමිණ වසරක පමණ කාලයක් රාජ්‍ය චිත්‍රපට අංශයේ සේවය කළ ලෙස්ටර් 1955 සැප්තැම්බර් පළමුවනදා එයින් ඉවත් වූයේ සැබැවින්ම දේශීය ඌරුවට දිවෙන චිත්‍රපටයක් නිර්මාණය කිරීමේ අරමුණෙනි. ඒ අනුව ඔහුට එය සාක්ෂාත් කරගැනීමට හැකි වූයේ 1956 දෙසැම්බර් 28 දා ප්‍රදර්ශනය ඇරඹී රේඛාව චිත්‍රපටය සමඟිනි.

චිත්‍රාගාරයේ කැමරාව එළියට

චිත්‍රාගාරයේ පැළපදියම්ව තිබූ කැමරාව චිත්‍රාගාරයේ එළියට ගෙන්වා ලෙස්ටර්ට තම දෙවැනි නිර්මාණය එළිදැක්වීම වෙනුවෙන් වසර හතරක කාලයක් බලා සිටීමට සිදුවිය. රේඛාව චිත්‍රපටය ප්‍රේක්ෂකයාට නැවුම් අත්දැකීම් ගෙන දෙන්නට සමත් වුවද වාණිජමය අතින් එය එතරම් සාර්ථක වූයේ නැත. මේ කාරණාව ම යම් හෙයකින් ලෙස්ටර්ගේ දෙවැනි නිර්මාණය එළි දක්වන්නට පමා වූවා වන්නට පිළිවන. කෙසේ වෙතත් පසුකාලීනව කාලයක් යනතුරුම ලෙස්ටර් පවසා ඇත්තේ රේඛාව සහ සංදේශය අතර කාලය ඔහුගේ අපතේ ගිය කාලවකවානුවක් ලෙසිනි. සංදේශය චිත්‍රපටයේ දළ සේයා පට අඩි එක්ලක්ෂ විසි දාහක් පුරාවටම දිවෙන අතර චිත්‍රපටයේ ඇති බලකොටුව පුපුරවා හැරීම ලාංකේය සිනමා පටයක තිබුණු විශේෂිතම සිදුවීම් බවට බොහෝ දෙනෙකුගේ මතකයේ නිදන්ගත ව තිබිණි. සන්දේශයේ නිර්මාණාත්මක අදහස සම්බන්ධයෙන් ලෙස්ටර් මෙසේ කරුණු දක්වා තිබුණේ 1960 පෙබරවාරි මස පළමුවන දා පළකළ චිත්‍රවාහිනී සඟරාව ටයි

"සංදේශය චිත්‍රපටයේ උපත රසවත් එකකි. එම අදහස මගේ සිතට ඇතුල් වුණේ මගේ මිත්‍රයකු වන විලියම් බ්ලේක් සමඟ කතා කරමින් සිටින මොහොතක ය. එය සිදු වූයේ 1968 ජනවාරි මුල් සතියක දී බව අද මෙන් මට මතකය. එදා මා ඔහු සමඟ කතා කළේ පෘතුගීසීන් ලංකාව අල්ලාගෙන රාජ්‍ය කළ කාල සීමාව තුළ සිදු වූ කතාවක් සම්බන්ධයෙනි. පෘතුගීසීන් රාජ්‍ය කළ කාලය පසුබිම් කරගෙන රසවත් කතාවක් චිත්‍රපටයක් බවට පත් වීමට පුළුවන් යැයි මම බ්ලෙක් ට කීවෙමි . ඔහුද මගේ මතය අනුමත කළේය. සන්දේශයේ උපත සිදුවූයේ අප දෙදෙනාගේ මේ සාකච්ඡාවෙන් පසුව ය".

සංදේශයෙන් ගම්පෙරළියට

1960 මාර්තු 30 ප්‍රදර්ශනය ඇරඹී සන්දේශයෙන් පසුව ලෙස්ටර් ගේ මීළඟ සිනමා ප්‍රයත්නය වූයේ ගම් පෙරළියයි. (1963) ලෙස්ටර්ගේ විශිෂ්ටතම නිර්මාණ දෙකෙන් එකක් වූ ගම්පෙරලිය මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ නව කතාවක් මුල්වරට සිනමාවට නැඟුණු අවස්ථාවක්ද විය. 1965 දී ඉන්දියාවේ පැවැති අන්තර්ජාතික චිත්‍රපට උලෙළේ හොඳම චිත්‍රපටයට හිමි රණමයුර සම්මානය දිනා ගන්නට ද ගම්පෙරළිය සමත් විය. ඉන් පසුව 1966 දී දෙලොවක් අතර චිත්‍රපටය අධ්‍යක්ෂණය කළ ලෙස්ටර් කතෝලිකයකු වුවත් 1967 දී අධ්‍යක්ෂණය කළ රන් සළු චිත්‍රපටය බෞද්ධ මුහුණුවරකින් යුක්ත විය. අක්කර පහ හරහා සිනමාව වෙනස් ම වූ කලාත්මක ධාරාවකට යොමු කළ ලෙස්ටර් ඔහුගේ අනෙක් විශිෂ්ටතම නිර්මාණය වූ නිධානය 1970 දී බිහි කරන්නට සමත් විය.

ගාමිණී ෆොන්සේකා නම් වූ රංගවේදියාගෙන් උපරිම හැකියාවන් උකහා ගන්නට සමත් වූ ලෙස්ටර් නිධානය අද්විතීය සිනමා නිර්මාණයක් කරන්නට සමත් විය.

ඉන් අනතුරුව ගුණසේන ගලප්පත්ති නිෂ්පාදනය කළ දැස නිසා වේදිකා නාට්‍ය ඇසුරෙන් දැස නිසා (1975) චිත්‍රපටය නිර්මාණය කළ අතර එය ඔහු වේදිකා නාට්‍යයක් ඇසුරින් කළ එකම චිත්‍රපටයයි. ඉන් අනතුරුව God king (1975) මඩොල්දූව (1976) වීර පුරන් අප්පු (1978) අහසින් පොළවට] (1978] බැද්දේගම (1981)කළියුගය (1983) පිංහාමි (1983)යුගාන්තය (1985) වෑ කන්ද වලව්ව (2003) හා අම්මාවරුනේ චිත්‍රපට අධ්‍යක්ෂණය කරන්නට සමත් විය.

මෙතෙක් අපි කතා කළේ ලෙස්ටර්ගේ සිනමා සක්මන පිළිබඳය. ඒ බහුතරයක් දෙනා දන්නා කතා සාරාංශයයි. මෙතෙක් ඔබ කියවා අවසන් කළේ ලෙස්ටර්ගේ සිනමා ආරම්භයත් සමඟ මේ දක්වා විහිදුණු ඔහුගේ නිර්මාණ වෑයමයි. එමනිසා අපි යළිත් ලිපියේ මුලටම යමු.

ජේම්ස් ප්‍රැන්සිස් පීරිස් නම් වූ වෛද්‍යවරයාට අවැසිව තිබුනේ ලෙස්ටර් කෙදිනක හෝ වෛද්‍යවරයකු එසේත් නැතිනම් ඉහළ සමාජයේ පිළිගැනීමට ලක්ව ඇති නීතිඥ වෘත්තියේ යෙදවීමයි. එහෙත් ලෙස්ටර්ගේ එකම අභිලාෂය වී තිබුණේ පොතපතේ ඇලීගැලී ජීවත් වන සාහිත්‍යධරයකු වීමයි. මේ නිසාම ලෙස්ටර් තරුණ වියේදීම කෙටිකතා, නාට්‍ය, කවි, රචනා කිරීමට කාලය යොදවන්නට විය එහි මුල්ම කාලයේ සාර්ථක වූ එක් පියවරක් ලෙස දැක්විය හැක්කේ cathedral and a star නමින් කාව්‍ය සංග්‍රහයක් ලියා පළ කිරීමයි. කලක් ගතවන විට ඔහුගේ අවශ්‍යතාවය වී තිබුණේ පුවත්පත් වාර්තාකරුවකු වීමයි. ලෙස්ටර් මුලින්ම මුහුණ දුන්නේ ඩේලි නිවිස් පුවත්පතේ සම්මුඛ පරීක්ෂණයකට ය. පරීක්ෂණයෙන් අවසන් දෙදෙනා දක්වා පැමිණීමට අවස්ථාව ලැබුණ ද අවසන් මොහොතේ දී වාසනාව ඔහුගෙන් ගිලිහිණි. ලෙස්ටර්ට daily news පුවත්පතේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලැබුනේ එවක එම පුවත්පතේ blue page යනුවෙන් හඳුන්වන තරුණ පරපුරේ සිනමා අතිරේකයට ය ඔහු නිර්මාණ සපයමින් සිටි අවධියක දී ය. කෙසේවෙතත් මේ මොහොත වන විට ටයිම්ස් පුවත්පතට ද ලෙස්ටර් ලිපි සපයමින් සිටියේය. මේ කාල වකවානුව වන විට ලෙස්ටර්ගේ සහෝදරයකු චිත්‍ර ශිල්පය හැදෑරීමට එංගලන්තයට ගොස් සිටි අතර ඔහු එහි දී අසනීප වීම හේතුවෙන් ලෙස්ටර් ගේ මව විසින් ඔහුගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා ලෙස්ටර් එංගලන්තයට යැවීමට තීරණය කළාය. මේ බැව් ටයිම්ස් පත්‍රයේ කර්තෘවරයා වෙත පැවසූ විට ඔහ පවසා සිටියේ එංගලන්තයට ගොස් එහි ටයිම්ස් පත්‍රයේ කතුවරයා හමුවන ලෙසයි.

ලෙස්ටර් එංගලන්තයට

ඉන් පසු එංගලන්තයට ගිය ලෙස්ටර්ගේ මුල්ම රාජකාරිය වූයේ london times පුවත්පතේ වාර්තාකරුවකු ලෙස සේවයට එක් වීම ය. මව විසින් සොහොයුරාගේ කටයුතු වෙනුවෙන් ලෙස්ටර්ට මාස හයකට පමණක් එංගලන්තයට යැවූ නිසා ඔහුට මුදල් ප්‍රතිපාදන නිවසින් ලැබුණේ මාස හයකට පමණි. එහෙත් ලෙස්ටර්ගේ රැකියාව නිසාවෙන්ම මාස 6 කෙසේ වෙතත් වසර හයක්ම එහි ජීවත් වන්නට ඔහු කටයුතු සූදානම් කර ගත්තේය. ඒ සඳහා සරිලන වැටුප් ඔහුට ලැබෙන්නට විය.

වාර්තාකරුවකු ලෙස සේවයට බැඳුණු හේ පසුකාලීනව විශේෂාංග ලේඛකයකු මෙන්ම තීරු ලිපි රචකයකු ද ලෙසින් ක්‍රමයෙන් තම පෑන හසුරවන්නට විය. ඔහුගේ පුවත්පත් කලාව සඳහටම අකා මකා දමා ලාංකේය සිනමාවට නිර්මාණ කිහිපයක් එකතු කර ජාත්‍යන්තරයට ගිය ශ්‍රේෂ්ඨ සිනමා කරුවකු වීමට ඔහුට බලපෑ මුලිකම කරුණ වූයේ එංගලන්තයේ ටයිම්ස් පුවත්පත වෙනුවෙන් ඔහු මෙහෙයවූ සම්මුඛ සාකච්ඡාවකි. එහි කතුවරයාට සැළ වී තිබුණේ රැල්ෆ් කීන් නම් වූ සුප්‍රකට චිත්‍රපට කරුවා වාර්තා චිත්‍රපට කිහිපයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පිටත්ව යන බවයි. කතෘවරයා මේ සම්බන්ධව ලිපිය සකස් කරන ට රැල්ෆ් කීන්ව හමුවට යැවීවේ ලෙස්ටර් ය. ලෙස්ටර් මේ මොහොත වන කෙටි චිත්‍රපට නිර්මාණය කළ තිබුණේ තමාගේ විනෝදය පිණිසය. සාකච්ඡාව අතරතුර දී රැල්ෆ් කීන් ලෙස්ටර්ගෙන් ඇසූ ප්‍රශ්නය වූයේ 'ඇයි මෙහෙට වෙලා චිත්‍රපට කරන්නේ ? ලංකාවට ගිහින් ඔබ ඔබේ මිනිසුන්ට චිත්‍රපට කරන්නේ නැත්තේ ඇයි?' යනුවෙනි. එහෙත් ඒ මොහොතේ එකහෙළාම එය පසෙක ගමු ලෙස්ටර්ගේ පිළිතුර වූයේ මගේ කැමැත්ත පත්තර රස්සාවට මේ රස්සාව දාලා මම යන්නෙ නෑ යනුවෙනි.!? කෙසේ හෝ ලංකාවට පැමිණි රැල්ෆ් කීන් දිගින් දිගටම ලෙස්ටර්ට ලිපි යැවීමට වග බලාගත්තේ වරප්‍රසාද සහිතව විශාල වැටුපක් පිරිනමන බැව් පවසා ලංකාවට පැමිණ ඔහු හා සම්බන්ධ වන ලෙසයි. මේ ලිපි ගනුදෙනු අවසන් ප්‍රතිඵලය වූයේ ලෙස්ටර් විසින් තම ප්‍රධාන කතුවරයාට මේ බව දැනුම් දීමයි. කතුවරයාගේ එකම පිළිතුර වූයේ

"අපරාදේ මම තමුසෙව අර මනුස්සයා ළඟට සාකච්ඡාවක් කරන්න යැවිවේ" යනුවෙනි. ඉන්පසුව සියල්ලන්ගෙන් සමුගෙන ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් වූ පුවත්පත් කලාවේදියා 1954 දී ලංකාවට පය තබා කෙටි කලක දී රජයේ චිත්‍රපට සංස්ථාව හා සම්බන්ධ වී උතුරු මැද පළාතේ මැලේරියා රෝග මර්දනය සඳහා නිර්මාණය කරන ලද conquests in the dry චිත්‍රපටයට සම්බන්ධ විය ඊයේ ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් වූ අග්‍රගණ්‍ය සිනමා වේදියාගේ හැරවුම් ලක්ෂ්‍යයයි.

.නිසි තැන දී තමන්ගේ දක්ෂතාව පිළිබිඹු කළා සේම තම ජීවන ගමනේ හැරවුම් ලක්ෂ්‍යය ද තෝරා ගන්නට ඔහු සමත් විය. බොහෝ තැන්හි දී ලෙස්ටර් නම් වූ සිනමා වේදියා ගැන කතා කළ ද ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් වූ පුවත්පත් කලාවේදියා ගැන ලියවෙන්නේ ඉතා අල්ප වශයෙනි.

යම් හෙයකින් සිනමා ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට නොවී ඔහු පුවත්පත් කලාවේදියකු ලෙස නිරත වූවා නම් වර්තමානයේ පුවත්පත් කලාව සහ සිනමාව බොහෝ විට වෙනස්ම වූ ගමන් තල දෙකක ස්ථානගත වීමට බොහෝ සෙයින් ඉඩ තිබුණි.

රජිත බස්නායක

අහසින් පොළොවට

අක්කර පහ

බැද්දේගෙම

දැස නිසා

දෙලොවක් අතර

ගොලු හදවත

කළියුගය

රසමුසු තැන් පිරි ඔබේ සිනමා ලිපි අපට යොමු කරන්න

"අහස්ගවිය" දිනමිණ ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
ahasgawwa@lakehouse.lk

ජනතා මණ්ඩපය

■ ජනතා මණ්ඩපය, දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
■ ෆැක්ස් 2429220 ■ ඊ මේල් - janathamadapayaancl@gmail.com

එකාවන්ව එකට සිතමු

ශ්‍රීලංකාව බ්‍රිතාන්‍යය රාජ්‍යයෙන් නිදහස ලබා ඉකුත් පෙබරවාරි මස 04 වෙනිදාට වසර 73ක් සම්පූර්ණ විය. අපගේ කුඩා දිවයින ලේ සෙලවීමකින් තොරව ලද "නිදහස" අත් කර ගැනීමේදී ඊට දායක කාරක වූ සෑම සිහිපත් කිරීම අගය කටයුතුය. සිංහලයන් පමණක් නොව සෙසු ජාතීන්ද ඊට දායක වූ බව අමතක නොකළ යුතුය. බෞද්ධ මෙන්ම සෙසු ආගමික නියෝජිතයන් ඊට දායක වී ඇති බව ඉතිහාසය අපට පවසයි.

නිදහස දිනා ගැනීමෙන් පසු රටේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූයේ ඩී.එස්.සේනානායක මහතාය. බ්‍රිතාන්‍යයෙන් නිදහස ගැනීමට හැකි වූයේ, කලින් සඳහන් කළ පරිදි ආගමික හා ජාතීන්ගේ සංකලනයකින් බව පැවසීම යුක්ති යුක්තය. සිංහල ජාතික බහුතරයක් ජීවත් වන අප දිවයින තුළ අන්තර්ජාතීන් හා අන්තර් ආගමිකයන් අතර සහෘද බව රැක ගැනීමට පොදුවේ අප කවුරුනුත් සහයෝගය දිය යුතුය. ජාති හා ආගම් භේද දුරර රටක් වශයෙන් එකමුතුව කටයුතු කිරීමට අප කවුරුනුත් හිතට ගැනීම වැදගත් වෙයි. ඊට පටහැණිව කටයුතු කරන අයගැනද ඉඳහිට අසන්නට ලැබීම කනගාටුවට හේතුවකි. ජාති හා ආගම් වශයෙන් භේදහින්න වී කටයුතු කිරීමෙන් වැළකී සිටීමට අපි කවුරුනුත් හිතට ගත යුත්තෙමු. අවස්ථාවාදීව එවන් භේදහින්න කරන්නන් අපි පිටු දැකිය යුත්තෙමු.

සමයාන්තර හා ජාතින් අතර සහෘද බව වර්ධනය කර ගනිමින් බාල පරපුරට ද එම ආභාසය දීම වැඩිහිටි පරපුරේ යුතුකම වෙයි. රටට, ජාතියට, ආගමට හිතෛෂීව දිවි ගෙවන ජනතාවක් සිටීම වාසනාවකි. එවන් රටක් තුළ ජනතාව සතුටු සිතින් ජීවත් වනු ඇත. ශ්‍රී ලාංකේය ජනතාවක් වශයෙන් සුළු හෝ භේද අත හැර දමා "ආදර්ශවත් ජනතාව" ක් වීමට අප හිතට ගනිමු! නිදහස සැමරු ජනතාවක් වශයෙන් මෙවන් "යහපත් ආකල්ප" වලින් දියුණු රටක් කරා පා තැබීමට හිතට ගනිමු.

ඩික්සන් කොංගනීගේ
රාගම

සංවර්ධනය කරමු පරිසරය රකිමු

කලින් කලට ජනතාවට බලපාන ප්‍රශ්න විවිධාකාරය. ඒ ප්‍රශ්න නිසා ජනතාව පීඩාවට පත්වන්නේ ද විවිධාකාරයෙනි. 2004 වසරේ සුනාමි විපත මේ රටේ විශාල පිරිසක් සෘජුවම පීඩාවට පත් කළේය. ඉන්පසු විවිධ අවස්ථාවල නියඟය, සුළි කුණාටු, ජල ගැලීම්, නායයෑම් වැනි ස්වාභාවික විපත්වලින් ජනතාව පීඩාවට පත්විය. වර්තමානයේ රටේ සැමට නොවුනත් වන අලි ගම් වැදීම ප්‍රබල ප්‍රශ්නයක් වී ඇත. වසර ගණනාවක් ඉතා දුක සේ ගොඩනගා ගත් ගේ දොර දේපළ වගාවන් එක් රැයකින් විනාශ වන අතර, බොහෝ අවස්ථාවල ජීවිත හානි ද සිදුවේ. අප රටේ ගොවිතැන් කරන වැඩි පිරිසක් බැංකුවලට හෝ ගමේ මුදලාලිලාට ණය වෙමින් තම වගාවන් සිදුකරන අතර, බහුතරය දිළිඳු පිරිසකි. මේ වන විට සේනා දළඹු උවදුර, කීඩෑ උවදුර, ජල හිඟය වැනි ප්‍රශ්න නිසා ගොවීන් පීඩාවට පත්ව සිටිති. ඒ අතර කොවිඩ් වසංගතය නිසා මුළු රටේම ජීවිත අවිනිශ්චිත තත්ත්වයට පත්ව ඇත. ඒ සියල්ල අතරින් මේ දිනවල මාධ්‍යවල කතා කරන මාතෘකාව බවට පත්ව ඇත්තේ මධ්‍ය අධිවේගී මාර්ගයේ පණුකරඳ ගසයි. රටේ දේශපාලනඥයාට ද සැබෑ ප්‍රශ්න අමතක කර කතාකරන්නට මාතෘකා සපයා දී ඇත. කොවිඩ් වසංගතයට ද වඩා දැඩි ලෙස මේ ගැන කතාබහට ලක්වේ. පරිසරය රැකගැනීම සියලු දෙනාගේම යුතුකමක් මෙන්ම වගකීමකි. රටේ සංවර්ධනය සිදු කරන විට බොහෝ කැපකිරීම් කරන්නට සිදුවේ. මහවැලි ව්‍යාපාරයේ ඉදිකළ විශාල ජලාශ වූ වික්ටෝරියා,

රන්දෙණිගල, රන්ටැඹේ, උල්හිටිය වැනි ජලාශ වලින් පාරම්පරික ගම්මාන, පුරාවිද්‍යාත්මක ස්මාරක වැසී ගියහ. ඒ තුළින් එතෙක් පැවති සංස්කෘතිය ජන සමාජය වෙනස් වී නව සංස්කෘතියක්, නව සමාජයක්, නව ගම්මාන, ගේදොර ඉඩකඩම් අලුතින් බිහි විය. සංවර්ධනය නිසා ඉපැරණි ගම්මාන විනාශ වන්නේ යැයි අරගල කරන්නට ජනතාව යොමු වූයේ නම්, අද වන විට මහවැලි ව්‍යාපාරයේ ඉදි වී ඇති විශාල ජලාශ අපට අහිමි වනු ඇත.

පොළොන්නරුව, දෙහිඅත්තකණ්ඩිය වැනි නව ගම්මාන බිහි නොවනු ඇත. මෙවැනි තත්ත්වයන් යටතේ පරිසර හානිය අවම කර ගැනීමට සුදුසුම විකල්ප සොයනවා වෙනුවට අනවශ්‍ය ලෙස බාධා කිරීමෙන් හෝ විරෝධය පෑමෙන් සිදු වන්නේ එක් පැත්තකින් රටේ සංවර්ධනයට බාධා පැමිණීමකි. එසේම ජනතාවට ලැබෙන සහනදායී ප්‍රතිලාභයන් නොලැබී යාමකි.

පසුගිය දා අපේ මහ සඟරුවන වැඩම කරවා මාතෘකාවට ලක්වී ඇති ගසට චීවර පූජාවක් පවත්වා සඟ සතු කළ බවත් මාධ්‍ය වලින් දැකගත හැකි විය. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළ පසු අප රටේ මහා සංස්කෘතියක් බිහිවුණි. බුද්ධිමත්ව සිතා බලා නිවැරදි තීරණ ගැනීම, අවශ්‍ය තැන්වල දී ප්‍රශ්න කිරීමම වැනි උතුම් ගුණාංග බෞද්ධ දර්ශනය තුළින් ජනතාවට පුහුණු කර ඇත. මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමමට පෙර ලංකාවේ විවිධ ඇදහිලි, පුද පූජා පැවති අතර, ගස් ගල් පිදීම පවා ඒ අතර පැවතුණි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ බෞද්ධයාගේ වැඳුම් පිදුම්වලට ලක් වන්නේ පැවති මිථ්‍යා විශ්වාස ජනතාව අතරින් ඉවත් කිරීමට ද මග පාදමිනි. මෙවැනි යුගයක පඬුකරඳ ගසකට සිවුරු පොරවා තැබීම කොතරම් උචිත දැයි කෙනෙකුට සිතෙනු ඇත. මෙම ශාකය දිවයිනේ තවත් ස්ථාන කීපයක ඇති බවට තොරතුරු වාර්තා වී ඇත. ජනතාවට නිතර අවශ්‍ය වන පොල් ගස අද සීඝ්‍රයෙන් විනාශයට පත්වෙමින් ඇත. පොල් ගසට ද මෙවැනි සත්කාරයක් කළහොත් විනාශ වන පොල් ගස් ටික ආරක්ෂා කරගත හැකිවනු ඇත.

එස්.කන්දගේ - මාතර

පොඩි මිනිසුන් හිරි වට්ටන මුදලාලිගේ ගිනි පොලිය

අපේ රටේ විවිධ වූ මාෆියාවන් පිළිබඳව කලින් කලට අසන්නට ලැබෙයි. මේ කියන්නට යන මාෆියාව නම් අනෙක් හැම මාෆියාවකටත් වඩා අහිංසක ජනතාවගේ රිරිමාංශ උරාබොන මාෆියාවකි. දුප්පත් අහිංසක මිනිසුන් මුළු ජීවිත කාලය තුළම තම අණසක යටතේ තබාගෙන යටිමඩි තර කරගැනීම ඔවුන්ගේ ජාවාරමක් කරගෙන ඇත. පෙර දවස පොලී මුදලාලිලා ලෙස හැඳින් වූ මොවුන් අද දවසේ හැඳින්විය යුත්තේ විසකුරු මාපිලුන් හැටියටය. ඒ තරමටම මොවුන් දරුණුය. අහිංසක මිනිසුන් තළා පෙළා පොඩිකර බියට පත් කර පොලී, පොලී කියමින් සල්ලි ගරා ගැනීමේ මංකොල්ලයක යෙදී සිටිති.

ගිනි පොලීකරුවාගේ පොලී සූත්‍රයද දුප්පතෙකුට ගොඩ ඒමට නොහැකි අමුතුම ගණිත ක්‍රමයකි. එය දවසේ පොලී, සතියේ පොලී, දින දහයේ පොලී , මාසයේ පොලී වශයෙන් තමන්ගේ සාක්කුව පුරවා ගැනීමම අරමුණු කරගත් අමුතුම සංඛ්‍යාත්මක ක්‍රමවේදයකි. මැර බලය දේශපාලන බලය නීතියේ බලතල ද යොදා ගනිමින් පොලී ගැනීම ගිනි පොලීකරුවාට පහසු දෙයකි.

දවසේ පොලී ක්‍රමයට රුපියල් ලක්ෂයක් පොලියට දෙන ඔවුන් ඒ සඳහා දවසට රුපියල් දාහක්, දින දහයට රුපියල් දසදහසක්, මාසයකට රුපියල් තිස්දහසක් කොල්ල කා ගනිති. එය හරියට පුද්ගලයකුගේ මාසික පඩියක් හා සමානය. කිසිම මහන්සියක්, වියදමක් හෝ කාලයක් වැය නොකර රුපියල් ලක්ෂයක් ආයෝජනය කර දින 30කට රුපියල් තිස් දහසක් උපයා ගැනීම කොතරම් නම් වංචා සහගත ක්‍රියාවක්ද...? ඉතින් මේ ආකාරයට රුපියල් දස ලක්ෂයක් කාට කාට හෝ පොලියට දී ගන්නට ලැබුණොත්? ඔහුට ලැබෙන ආදායම කොපමණද?

රෝග බිය, මරණ බිය ඇති අද දවසේ ගිනි පොලී යක්ෂයාගේ බියද එකතු වූ විට අහිංසක මිනිසුන්ට තුන්බියම දැනේ. අහිංසකයකු පොලියකට මුදලක් ගැනීමට පෙලඹෙනුයේ නැතිවම බැරි අවශ්‍යතාවයකටය. සමහර විට තවත් කරදරකාරි ණයකින් බේරීමට විය හැකිය. තම ආදරණීය දරුවකුගේ වැදගත්ම කටයුත්තකට විය හැකිය.

බැංකුවකින් ණය මුදලක් දෙන්නේ ගෙවීමේ හැකියාව ආදායම ආදී කරුණු ගණනාවක් තහවුරු කරගෙනය. එහෙත් ගිනි පොලීකරුවාට කෙනෙකුගේ ආදායමෙන් හෝ ගෙවීමේ හැකියාවෙන් වැඩක් නැත. ඔහුගේ මුදල හා පොලී අයකර ගැනීමේ ක්‍රම සහ විධි රාශියක්ම ඇති නිසා වැඩිපුර මුදලක් කාගේ හෝ ඇගේ ගැසීමට නිතරම ඔහු කුරුමානන් අල්ලයි. මේ කටයුත්තට බ්‍රෝකර්ලා ද පත්කර ඇත.

තවත් පැත්තකින් ගිනි පොලීකරුවා තම මුදලට බිය නොවන්නේ ණයකරුගේ පංචස්කන්දයේ පටන් ඉඩකඩම්, ගෙවල් දොරවල්, යාන වාහන, දරු මල්ලන් හා අනාගතයේ උපදින්නට ඉන්නා දරුවන් ද ඇපයට තබා ගන්නා නිසාය.

මා දන්නා තරමින් මූල්‍ය ආයතනයකට අයකර ගැනීමට අයිතිය ඇත්තේ (කොතරම් කාලයක් ගතවුව ද) උපරිම වශයෙන් මූලික මුදලට සමාන පොලියකි. ඊට එහා යාමට නීතියෙන් ද ඉඩක් නැත. එහෙත් ගිනි පොලීකරුවා අයකරනු ලබන පොලියට සීමා මායිම් නැත. ඔහු ලබාගන්නා පොලියට රිසිට් පතක් හෝ වෙනත් ලියකියවිල්ලක් වත් ලබා නොදෙයි. මේ නිසාම අහිංසක ජනයාට නීතියේ පිළිසරණක්ද නැත.

ගිනි පොලීකරුවා දෙන මුදලේ ආරක්ෂාවට ඔහුට ඇති තරම් ලියකියවිලි ඇතත් අහිංසක ණයකරුවාට කිසිදු ලියවිල්ලක් නැත. ඔහු ලබා දෙන මුදලට රිසිට් පතක් හෝ ලිපියක් ඉල්ලා සිටියහොත් ඔහුට එල්ලුම් ගස් පෙන්නන්ට තරම් ගිනි පොලීකරුවා නීතිමය පැත්තෙන් ද බලවත් බව අඟවයි. පොලියට මුදල් ලබා ගන්නා තැනැත්තාව හැම විටම සලකන්නේ මූල්‍ය අපරාධයක් සිදු කළ අයකු හැටියටය. ජනතාවට නිරන්තර සුර පුරයක සිහින දල්වා බලයට එන දේශපාලකයින්ද බැටකන අහිංසකයන් පිළිබඳව කරුණු නොදන්නවා නොවේ. පසුගිය ඡන්ද කාලයේ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලක හිරවී සිටි ජනයා ගැන සොයා බලන්නට ඉදිරිපත් වූ දේශපාලකයෝ ද සිටියහ. ඉන් ජනතාවට සෙතක් සැලසුවා දැයි මා නොදනිමි.

රාජපක්ෂ මුදලිගේ - පානදුර

ඔන්ලයින් ඉගෙනුම සාර්ථක වැඩක් ද?

සුදෝ සුදු ගවුම් පොඩියට ටයි පටිය පැළඳ,සුදු කලිසමට බොත්තම් පියවුනු කමිසය හැද මහ පාන්දරින් දුවන පුංචි එවුන් දකින්නටවත් නැතිය. විශේෂයෙන් බස්නාහිරට එහෙම කලඑළියක් පෙනෙන්නට වත් නැතිව ගොස් ය.

ලොවම ගිලගත් මහා වසංගත තත්වය (covid 19) ශ්‍රී ලාංකීය ආර්ථිකය පමණක් නොව මුළු මහත් අනාගතයට ම ආයෝජනයක් වූ අධ්‍යාපනය පවා බිඳ හෙළන්නට පටන්ගෙන ඇත.පාසල් අධ්‍යාපනය දරුවන්ගේ අයිතියකි. අයිතියක් වූ නමුත් කොවිඩ් මාරයා ඒ අයිතීන් උල්ලංඝනය කර අවසන්ය. පාසල් අධ්‍යාපනයෙන් පරිබාහිර වූ අන්තර්ජාලයේ මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදයක් (online) මේ වන විට ක්‍රියාත්මක වේ.

ශිෂ්‍ය ප්‍රජාවට ම අධ්‍යාපනයේ සම අයිතියක් වුවද මාර්ගත අධ්‍යාපන ක්‍රමය යටතේ එම වරප්‍රසාදය සමසේ සැමදෙනාටම භුක්ති විඳීමට නොහැකි ය. දරුවන්ගේ පවුලේ ආර්ථික මට්ටම, සමාජ මට්ටම මේ සඳහා සෘජුව බලපා ඇත. නගරබද පළාතෙන් පිට ගම්බද දරුවන් අන්තර්ජාලීය ඉගැන්වීම ඉදිරියේ බොහෝ සේ අසරණව ඇත.

දෛනික වැටුප් ලබන කම්කරු මහතාගේ දරුවාටත් , කන්නයකින් අටුකොටු පුරවා ගන්නා ගොවි මහතාගේ දරුවාටත් සමසේ මේ ක්‍රමය තුළ සිටීමට නොහැකිය. එදිනෙදා නිවසේ අවශ්‍යතාවයන් සරි කරගන්නවා හැර ඔන්ලයින් ක්‍රමවේදය සඳහා අවැසි ජංගම දුරකථන, ලැප්ටොප් පරිගණක, ටැබ් ආදිය ගැනීම ඔවුන් මත පැටවෙන මහ බරකි.

එ පමණක් ද නො වන අතර තාක්ෂණය භාවිතය නොදැනුවත් භාවය මෙන්ම උපාංග පරිහරණය තුළ දුර්වල තාවය ද බොහෝ දෙමාපියන් සතු වන්නකි. ප්‍රාථමික පන්ති පැවැත්වීමේ දී (පෙර පාසල් හා 1 2 ශ්‍රේණි) දරුවන් පවා මෙහිදී නොසන්සුන් තාවයට පත් වෙති. ඔවුන්ට නුහුරු මේ ක්‍රමවේදය තුළ ඔවුන් විමති සහගතය හිස අතගා ළඟට ගෙන තම ඇස් මානයේ සිට කියාදෙන ගුරුවරයා ඇසට වත් හසු නොවන රූප රාමුවක සිර වී උගන්වනවා දකින දරුවාට ඉගැන්වීම දැනෙන්නේ නැත.

මේ කරුණු කාරණා වලට අමතරව අන්තර්ජාල භාවිත කරමින් ඉගැන්වීම සඳහා ගුරු පාර්ශවයේ බොහොමයක් දෙනා සඳහාද විධිමත් පුහුණුවක් නොමැති වීම යම් ගැටලුකාරී තත්ත්වයකි. එහෙයින් වගකිවයුතු බුද්ධිමත් පාලන තන්ත්‍රයට කිව යුතුම වන්නේ මේ වසංගත තත්ත්වය කාරණා කොට ගෙන එන අභියෝග ආශිර්වාදයක් කරගනිමින් පවතින ඕනෑම තත්ත්වයකට මුහුණ දීමට හැකි මට්ටමේ ගුරු- සිසු පිරිසක් සඳහා විධිමත් තාක්ෂණික දැනුම මෙන්ම ගම නගරය යා කරමින් පාලමක් හදනු මිස රුවලක් පාරුවක් වැනි තාවකාලික නිමැවුම් කිරීම ඒලක් නැත.

එවිට ගම් නගර යා කරමින් පන්ති ප්‍රාන්තර භේදයකින් තොරව සියලු දරුවෝ සතුවින් අධ්‍යාපනයේ යෙදෙනු ඇත.

නිලූෂා දිල්රුක්ෂි
ගණේමුල්ල

මිථ්‍යා මතවලට රට යට වෙලාද?

දෙල්ගොඩ කඳුබොඩ ප්‍රදේශයෙහි නිවසක විසූ අමනුෂ්‍ය බලවේගයකින් නව හැවිරිදි දැරියක් වෙත ශාන්තිකර්මයක් මඟින් ප්‍රතිකාර කිරීමට යන ලද අසල්වැසි කාන්තාවක් හට එම ශාන්ති කර්මය වැරදී යෑම හේතුවෙන් එනම් මැය විසින් දැරියට වේවැලක් තුළින් පහර දී ඉක්බිති ඇය සිහිසුන් වී බියගම රජයේ රෝහල වෙත ඇතුළත් කිරීමෙන් අනතුරුව මිය යෑමේ ශෝචනීය පුවතක් රූපවාහිනී මාධ්‍ය තුළින් 2021.02.28 වෙනි දින 12.30 දිවා ප්‍රවෘත්ති විකාශය තුළින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම මරණයෙහි ස්වභාවය කදිම ලෙස අධ්‍යයනය කරන විටදී ගම්‍ය වන්නේ අමානුෂික වූත් සාහසික පහරදීමෙහි ප්‍රතිඵලයක් බැවිය. බොහෝ විටදී මෙබඳු පුවත් වාර්තා වන්නේ ග්‍රාමීය ප්‍රදේශයන් තුළින් යැයි පෙනී යන්නේය. එමෙන්ම සන්නිවේදනය අංශයෙන් නොදියුණු පෙදෙස්හි වෙසෙන ජනතාව අදෘශ්‍යමාන බලවේගයන් පිළිබඳව තබා ඇති විශ්වාසයන්හි අනිසි අහිතකර ඵලයක් වෙත ගොදුරුවීම මෙබඳු ගණයෙහි සිද්ධීන් ලෙස හුවා දැක්විය හැකිය.

දේව හාස්කම් බැව් පවසා ප්‍රචලිත කරමින් මුදලට හිඟුවන ලද ඇතැම් අන්‍යාගමික මූලධර්මවාදීන්ගේ සූක්ෂ්ම අයුරින් සිදුකරන ලද කූට වංචනික පුද්ගලයින්, ආයතනයන්ගේ ග්‍රහණයට බඳුන්ව ඛේදනීය ලෙස මරු වැලඳගත් අවස්ථාවන් පිළිබඳව ඉතිහාසයෙහි පටන් සිදු වූ කතා බහට නතු වූ අවස්ථාවන් එමටය. සුලභය.

දෙවිවරුන් හාස්‍යයටත් අවඥාවටත් නතු කරමින් යාඥ තුළින් ඇතැම් පිරිස් ජනතාව රවටමින් නොමඟ යවමින් ලෙඩ දුක් සුව කරනවා වෙනුවට වටිනා ජීවිත මරුතුරුල වෙත යොමු කරවන තැනැත්තන් හට උපරිම දඬුවම් පමුණුවිය යුතුය.

එපමණක් ද නොව මෙවන් වූ පාපතර ක්‍රියාවන් උතුම් බුදුදහමට , ඔවදනට අනුව අදාළ පුද්ගලයින් වෙත අපායෙහි දොරටු විවර වන අපාගාමී සිදුවීම්ය. නියෝජ්‍ය පොලිස්පතිතුමන්ගේ ප්‍රකාශයට අනුව මෙලෙස අකල් මරණයකට ගොදුරු වූ මෙම දැරිය ජීවිතය පටන් ගත්තා පමණි.

සරත් ලියනගේ - රන්මුතුගල

උපාධියට ගැළපෙන්න රස්සාව දෙන්න

උපාධිය යනු උගත්කමේ සංකේතයකි. වසර 13ක් පුරා පාසල් අධ්‍යාපනය අඛණ්ඩව ලබා ගනිමින් ඉන් ඔබ්බට වසර තුනක් හෝ හතර හමාරක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ඉන් උපාධිය සමත්ව පිටවන ඕනෑම අයකු බලාපොරොත්තු වන්නේ තමන්ගේ අධ්‍යාපනික උගත්කමට සරිලන රැකියාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. මෙය මෙසේ වන්නේ තමන්ගේ අනාගත දිවිය සාර්ථක කර ගැනීමේ මූලික අභිප්‍රායක් ජනිතව ඇති බැවිනි.

මෙම අපේක්ෂාවෙන් හංගත්වයට පත් කරවමින් වසර ගණනාවක් විරැකියා පෝලිමේ සිට වර්තමානයේ සමහර උපාධිධාරීන් සුදුසු රැකියාවක් ලබා ගැනීමේ අපහසුතාව නිසාම තමන්ගේ සුදුසුකම්වලට අනුරූපී රැකියාවල නොයෙදෙන බව පසුගිය දිනවල මුද්‍රිත මාධ්‍ය තුළ පළවූ ප්‍රවෘත්ති තුළ ද පැහැදිලි වූ කරුණකි. එය එසේ වුව ද මෙම රජය මඟින් උපාධිධාරීන් 60000 කට පමණ පුහුණුවීම්වලට යටත්ව සුදුසු රැකියා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් රජයට ස්තුතිය පුද කළ යුතුව ඇත.

එහෙත් මෙම තත්ත්වයන්ට හේතුව සමහර උපාධිධාරීන් රජයේ ආයතනවල කම්කරුවන් ලෙස ද, රෝහල් උපස්ථායක, කළමනාකරණ සහකාර, සමෘද්ධි සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරීන් ලෙස ද හා ඒවාට සමගාමී වන වෙනත් රැකියාවල අද සේවය කරනු ලබති. මෙසේ වීමට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ ද විරැකියාව හා සුදුසු රැකියාවක් ලබා ගැනීමට තිබූ අපහසුතාව විය හැක.

එසේ වුව ද මෙම තනතුරුවල සේවය කරන්නන් හට එම ක්ෂේත්‍රයේ උසස්වීමක් ලබා ගැනීමට බලාපොරොත්තුවක් හෝ තබා ගැනීමට නොහැකිව ඇත්තේ එම උසස්වීම් පෙනෙන තෙක් මානයේ නොවීමයි. මෙම තත්ත්වය යටතේ ඔවුනට උසස්වීම් අවස්ථාවක් ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී ඇති අතර, ඒ හා සමගම තමන් වයස්ගත භාවයට යාම ද සිදු වේ. උදාහරණයක් ලෙසගත් කල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ සුදුසුකම අ.පො.ස.(උ/පෙළ) වුවත් උපාධිධාරීන් සෑහෙන ප්‍රමාණයක් තරග විභාග හරහා සුදුසු රැකියාවක් ලබා ගැනීමට නොහැකි වීම නිසාම එම තනතුරුවල සේවය කරන අය බොහෝය. සමෘද්ධි කළමනාකරුවන් බඳවා ගැනීමේ සුදුසුකම උපාධිය වුවත් උපාධිය සහිතව දැනට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට එම තනතුරට උසස්වීම් ලබා ගැනීමට ඉඩකඩ තිබුණ ද වර්තමානයේ වසර ගණනාවක්ම එකී තනතුරේ සිටීමට සිදුව ඇත. මෙවන් තත්ත්වයක් යටතේ රජයේ යුතුකම වන්නේ උපාධියට සරිලන එම රැකියාවලට ඔවුන් අනුගත කිරීමයි.

මෙම තත්ත්වයන් යටතේ අනිවාර්යයෙන්ම පහළ මට්ටමේ රැකියාවල නියුතු උපාධිධාරීන් සම්බන්ධයෙන් සංගණනයක් කොට ඔවුන් හට ඔවුන්ගේ උපාධියට සරිලන රැකියාවල නියුතු කරවීම රජයේ යුතුකමක් ලෙස දැකිය හැක. එය සාර්ථකව ඉටු කර ගතහොත් උපාධියේ ගෞරවාන්විතභාවය තබා ගෙන ඔවුනට තම රැකියාවේ නියැළීමට අවස්ථාව උදා වනු ඇත. එසේ නොවුණහොත් උපාධිය ද අනිවාර්යයෙන්ම සැහැල්ලුවට ලක් වනු ඇත.

එම්. ඒ. ජයවීර -
වැලිගම

මේ ගැනත් සිතන්න

දිනෙන් දින රට සංවර්ධනය කරා යමින් සිටින මොහොතක ඒවා කඩාකප්පල් කරමින් හැසිරෙන සමහර මෝඩ මිනිසුන් රටටත් ජාතියටත් අනාගත පරපුරටත් කරන කියන දේවල් අහෝහනය.

රටක දියුණුවට බොහෝ සෙයින් වැදගත් වනුයේ පාරවල්ය. මොනතරම් පාරවල් ප්‍රමිතියෙන් උසස්ව හැදුවත් එම පාරවල් අබලන් වීමට බොහෝ සෙයින් හේතු වන්නේ බර වාහන ප්‍රවාහනයේ දී බැව් පැහැදිලිය.

ගල් වැලි සිමෙන්ති වගේම වෙනත් ගොඩනැගිලි ද්‍රව්‍ය ලොරිවල පටවාගෙන ප්‍රවාහනය නිසා බොහොමයක් පාරවල් අබලන් වෙමින් පවතී. එම නිසා එවැනි වාහන හිමිකරුවන්ට වගේම රියදුරු මහතුන්ට යම් කිසි ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට බලපත්‍රයක් නිකුත් කරන්නේ නම් යෙහෙකි.

වඳුරාමුල්ලවත්තේ - ලයනල් ජයලත්

කොටවිල ආදාහනාගාරය ආදාහනය වුණාද?

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම ආදාහනාගාරයක් නොමැත. මීට වසර දහයකට වැඩි කාලයකට පෙර කඹුරුගමුව කොටවිල ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදි කිරීමට මුල්ගල් තබා ලක්ෂ 25 – 30 ක පමණ මුදලක් වියදම් කර පසුව එය අතහැර දමා තිබේ. මෙම නිසා වැලිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජනතාවට අවමඟුලක් සිදු වූ විට වැලිගම නගර සභාවේ හෝ මාතර මහ නගර සභාවේ පිහිට පැතීමට සිදුවේ.

රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර කඹුරුගමුව කොටවිල ප්‍රදේශයේ අඩක්, වැඩ නිමකර ඇති ආදාහනාගාරයේ ඉතිරි කටයුතු නතර වී ඇත්තේ දැයි නොදනිමි.

එම නිසා මේ පිළිබඳව වගකිව යුතු බලධාරීන් ගේ අවධානය නොපමාව යොමු විය යුතුය.

වසන්ත ද සිල්වා -
වැලිගම

දැනමිණ දසන
දස අත ම එක තැන

නරකමුල්ල පුරාවිද්‍යා ස්ථානය නිදන් සොරුන්ගේ කෙළි බිමක් වෙලා පිටුව 17

වැකුණුගොඩ වැසියන් රැසකට ගුද මාර්ගයේ පිළිකා පිටුව 18

වැස්ස එනකොට අපි ඉස්කෝලෙට දුවනවා පිටුව 16

ඩී. මිහිඳුකුල - කොච්චිකඩේ

වැල්ලවීදියේ කාන්තා මළ සිරුරේ යට ඇඳුමේ දෙකට නවපු ලියුමක්

මීගමු වැල්ලවීදිය නිවෙසක ගරාජයක් තුළ ගෙල වැලලාගෙන මියගොස් ඇති බවට හඳුනාගෙන ඇති තැනැත්තියකගේ මරණය පිළිබඳව නීතිපති උපදෙස් ලබාගන්නා ලෙසත් එම සිද්ධියට චෝදනා ලබා ඇති සැක සහිත පුද්ගලයා තමා වෙත ඉදිරිපත් කරනා ලෙසත් මීගමුව නාගරික හදිසි මරණ පරීක්ෂක වෛද්‍ය සිරි ජයන්ත වික්‍රමරත්න මහතා මීගමුව පොලිසියට පෙරේදා (10) නියම කර තිබේ.

සිද්ධියෙන් මියගොස් ඇත්තේ අංක 182, මීගමුව වැල්ලවීදිය ප්‍රදේශයේ පදිංචිව සිටි මනෝහරන් ඇනස්ටිස් ලක්ෂිනි (24) නමැත්තියකි. මේ තැනැත්තියගේ මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කළ මීගමු රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී ඩී. කේ. විජයවර්ධන මහතා මරණය ගෙල වැලලාගෙන සිදු කර ගත් එකක් බව සඳහන් කර තිබිණි.

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා සිරුර පරීක්ෂා කිරීමේදී යට ඇඳුම් තුළ තිබී සොයාගත් මියගිය තැනැත්තිය විසින් ලියනා ලදැයි කියනා ලිපියක් හමුව තිබේ. මීගමුවේ හෝටලයක සිටින බව කියනා පුද්ගලයකු තමාව එම හෝටලේට කැඳවාගෙන ගොස් කීප අවස්ථාවක් ලිංගිකව හැසිරුණු බවත් මුල් අවස්ථාවේ අප දෙදෙනා එකට සිට ගත් ඡායාරූප ප්‍රසිද්ධියට පත් කරන බවත් මේ තැනැත්තා මා වෙත ප්‍රකාශ කර බිය ගැන්වීම හේතුවෙන් මොහු සමඟ මෙලෙස නිතර නිතර හැසිරීමට සිදු වුණු බවත් එම ලිපියෙහි සඳහන්ව තිබී ඇත. මේ සැකකාර පුද්ගලයාගේ නම ලිපියෙහි සඳහන් කර ඇත්තේ ශ්‍රී ලාල් ප්‍රනාන්දු යනුවෙනි.

මේ ලිපියෙන් කියැවෙනා සැකකාර පුද්ගලයා ගෙන්වාගෙන හදිසි මරණ පරීක්ෂකට ප්‍රකාශයක් ලබා ගන්නා ලෙස ද අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ලිඛිත ඉල්ලීමක් කර ඇත. මීගමු පොලිසියේ සැරයන් (25274) රෝහණ මහතා සාක්කි මෙහෙයවීය. වෛද්‍ය වාර්තා සැලකිල්ලට ගෙන මීගමුව නාගරික හදිසි මරණ පරීක්ෂක වෛද්‍ය සිරි ජයන්ත වික්‍රමරත්න මහතා මෙය ගෙල සිර කර හුස්ම හිරවීමෙන් සිදුවූ මරණයක් බව සඳහන් කර තිබිණි.

ගයාන් සංජය

බල්ලන් 8ක් මුරට දාලා: ඌරු කොටුව මැදින් කසිප්පු එළියට

කොරසේ කුඩු තුෂාරගේ බිරිය අල්ලයි

සුබෝපභෝගී නිවෙසක අඩි දොළහක් උස තාප්පවලින් වට කර සුනඛයන් අට දෙනකු ද ඇති කරමින් සීසීටීවී ද සවි කර රහසිගතව කසිප්පු පෙරීම සිදු කළ කසිප්පු තිප්පොළක් වැටලීමට වේයන්ගොඩ පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්න වෑත්තෑව මහතාගේ මෙහෙයවීමෙන් වේයන්ගොඩ පොලිසියේ නිලධාරීන් සමත් වී තිබේ.

මෙලෙස සූක්ෂ්මව කසිප්පු පෙරීම සිදු කර ඇත්තේ කොරස, මල්කෝන ප්‍රදේශයේ නිවෙසකය. නිවෙසෙහි අයිතිකරු කුඩු තුෂාර නමැති අන්වර්ථ නාමයෙන් පෙනී සිටිනා මාරසිංහ පේඩිගේ තුෂාර කුමාරසිරි නමැත්තකු වන අතර මොහු දැනට මාසයකට පමණ පෙර බන්ධනාගාරගතව සිට ඇත. මේ නිවෙසේ සිවිවැනි මහලේ සූක්ෂ්ම අයුරින් කසිප්පු පෙරීම සිදු කර ඇති අතර කිසිවකුට සැක නොසිතෙනා අයුරින් උඩු මහලේ සිට පහළ පිහිටි ඌරු කොටුවක් වෙත නළ මාර්ගයෙන් කසිප්පු රැගෙන ගොස් විකිණීම සිදු කර ඇත.

මෙහිදී කසිප්පු මිලිලීටර 101,250ක්, ගෝඩා මිලිලීටර 1,360,000ක්, ගෑස් ළිප් හා දඟර කිහිපයක් අත්අඩංගුවට ගෙන තිබේ. වැටලීම සිදු කරනා අවස්ථාවේ කුඩු තුෂාර නමැත්තාගේ බිරිය සිට ඇති අතර එම සැකකාරිය අත්අඩංගුවට ගෙන ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ නියෝගය මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජය ශ්‍රී, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරි ප්‍රභාත් දයානන්ද යන මහත්වරුන්ගේ මෙයෙවීමෙන් වේයන්ගොඩ පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. චන්න වෑත්තෑව, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. හෂාන් වීරසිංහ, උ.පො.ප. ප්‍රියංග, පො.සැ. වරුන් වන (45582) බාලසූරිය, (37956) බියංවිල, (49420) ප්‍රියන්ත, (20925) බාලසූරිය, කා.පො.සැ. (4617) චන්ද්‍රාණි, පො.සැ.රි. (7480) බණ්ඩාර යන මහත්වරු වැටලීමට එක් වූහ.

ඩබ්ලිව්. සී. බී. ප්‍රනාන්දු - පුත්තලම සමූහ

ආරච්චිකට්ටුවට සැඩ සුළඟක්

හදිසියේ හමාගිය වේගවත් සුළිසුළඟක් හේතුවෙන් ආරච්චිකට්ටුව ප්‍රදේශයේ ගම්මාන කිහිපයක ගස් කඩා වැටී නිවාස කිහිපයකට හා වෙළෙඳසලකට ද තදබල ලෙස හානි සිදු වී ඇත. පසුගියදා (10) මේ සුළිසුළඟ හමා ගොස් ඇති අතර එම සුළං හේතුවෙන් තදබල හානි සිදු වූ නිවාස සංඛ්‍යාව 13ක් බවත්, ඊට අමතරව වෙළෙඳසලකටත් තදබල ලෙස හානි සිදු වී ඇති බවත්, පුත්තලම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රකාශ කළේය.

මේ හදිසි ආපදාව හේතුවෙන් එම ප්‍රදේශයේ පවුල් 15ක පුද්ගලයන් 63 දෙනෙක් අවතැන් වී ඇති බවද පවසනා ආපදා කළමනාකරන මධ්‍යස්ථානය එසේ අවතැන්වූවන්ට සහන සැලසීමේ කටයුතුද ක්‍රියාත්මක කර ඇති බවට ප්‍රකාශ කළේය.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

වෙස් වළාගෙන ඇවිත් මිතුරාගේ භාෂා පේපරේ ලියලා

බළන්ගොඩ ප්‍රදේශයේ පාසලක සිසුවකු අන් අයකු ලෙස අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ රැසියානු භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීම හේතුවෙන් පෙරේදා (10) සාමාන්‍ය පෙළ විභාගය ලියමින් සිටියදී අත්අඩංගුවට ගත් බව පොලිසිය ප්‍රකාශ කළේය.

බළන්ගොඩ ප්‍රදේශයේ පාසලක ඉගෙනුම ලබනා සිසුවකු මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ. බළන්ගොඩ ජ්‍යෙලානි මහා විද්‍යාල මධ්‍යස්ථානයේ පැවති සාමාන්‍ය පෙළ විභාගයට එම සිසුවා විසින් රැසියානු භාෂා විභාග ප්‍රශ්න පත්‍රයට මෙලෙස පෙනී සිට ඇති අතර එම විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති පෙරුමාල් තම්බිරාජා මහතා විසින් කරනා ලද පැමිණිල්ලකට අනුව එම සිසුවා අත්අඩංගුවට ගෙන ඇතැයි පොලිසිය ප්‍රකාශ කළේය. නමුත් එම අයදුම්පත් පත්‍රයේ ලිපිනය නිවැරදිව සිසුවාගේ ලිපිනය සඳහන්ව ඇත.

අන් අයකු ලෙස විභාගයට පෙනී සිටීමේ චෝදනාවට එම සිසුවා අත්අඩංගුවට ගත් බව පොලිසිය ප්‍රකාශ කළේය. මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සිසුවාගෙන් ප්‍රකාශ සටහනක් කර ගැනීමෙන් අනතුරුව ඊයේ (11) බළන්ගොඩ මහෙස්ත්‍රාත් වරයා හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

සී. ගමගේ - සොරණාතොට සමූහ

බීඩි ගන්න ඇවිත් පවුම් 5ගේ මාලෙ කඩාගෙන

බීඩි මිල දී ගන්නා මුවාවෙන් දියතලාව අලුත්වෙල තැන්නපිට ප්‍රදේශයේ වෙළෙඳසලකට පෙරේදා (10) පැමිණි දෙදෙනකු වෙළෙඳසලේ සිටි කාන්තාවකගේ ගෙල බැඳි රුපියල් ලක්ෂ පහක් පමණ වටිනා පවුම් 5ක් බර රන් මාලයක් කොල්ලකා යතුරුපැදියක නැඟ පලා ගොස් ඇතැයි දියතලාව පොලිසිය ප්‍රකාශ කළේය.

යතුරුපැදියකින් පැමිණි මේ පුද්ගලයන් දෙදෙනා යතුරුපැදිය වෙළෙඳසල අසල නවතා බීඩි මිල දී ගැනීමට වෙළෙඳසල තුළට පැමිණ සිටියදී එක් පුද්ගලයකු එහි තිබූ කිසියම් නාම පුවරුවක් පිළිබඳව වෙළෙඳසලේ සිටි කාන්තාවගෙන් විමසමින් සිටියදී එකවරම ඇගේ ගෙල බැඳි රන් මාලය කොල්ලකා මොවුන් දෙදෙනා යතුරුපැදියේ නැඟ පලා ගොස් තිබේ.

බදුල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජී. කේ. ජේ. අපොන්සු, බණ්ඩාරවෙල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි i බී. ඇම්. දසනායක යන මහත්වරුන්ගේ උපදෙස් මත දියතලාව පොලිසියේ නිලධාරිහු පරීක්ෂණ පවත්වති.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

ඉංග්‍රීසි ගුරු ප්‍රශ්න පත්තරේ කලින් පිට වීම හොයන්න කමිටුවක්

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ඉංග්‍රීස ගුරුවරු බඳවා ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පැවැත්වූ ඉංග්‍රීසි ගුරු විභාගයේ ප්‍රශ්න පත්‍ර, විභාගයට කලින් පිටවීමේ සිද්ධිය විමර්ශනය කිරීමට නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ මහතා පංචපුද්ගල විමර්ශන කමිටුවක් පත් කර තිබේ.

මේ පංචපුද්ගල විමර්ශන කමිටුවේ සභාපති ලෙස ආණ්ඩුකාර ලේකම් එල්. පී. මදනායක මහතා පත් කර තිබේ. මේ කමිටුවේ සෙසු සාමාජිකයක් වන්නේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් කලාමදි පත්මරාජා මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, (පරිපාලන) එච්. ඊ. එම්. ඩබ්. ජී. දිසානායක, නියෝජ්‍ය ලේකම් (මුදල්) අයි. එම්. හුසේන්, පළාත් අභ්‍යන්තර විගණක එච්. එම්. එම්. රසීඩ් යන මහත්වරුන්ය. අදාළ විමර්ශන වාර්තා මසක් ඇතුළත ලබාදිය යුතු බව ප්‍රධාන ලේකම්වරයා පංචපුද්ගල විමර්ශන කමිටුවට දැනුම් දී තිබේ.

මේ සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දුන් පළාත් ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ මහතා පැවසුවේ කමිටුව ලබන සතියේ පළමු වරට රැස්වන බවය.

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

අම්බාල්කුලම වැවෙන් හමු වූ කාන්තා මළ සිරුර: මරා වැවට දමලා

කිලිනොච්චිය අම්බාල්කුලම වැවේ තිබී හමු වූ කාන්තා මළ සිරුර වැවට දමා ඇත්තේ ඝාතනය කිරීමෙන් අනතුරුව බවට පෙරේදා (10) කිලිනොච්චිය රෝහලේ පැවති පශ්චාත් මරණ පරීක්ෂණයේදී නිගමනය කොට තිබේ.

ඒ අනුව සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට ඉදිරිපත් කරනා ලෙසට ද කිලිනොච්චිය මහෙස්ත්‍රාත්වරයා පොලිසියට නියෝග කොට තිබේ. කිලිනොච්චියේ අම්බාල්කුලම වැවේ මසුන් මැරීමට ගිය ධීවරයන් පිරිසක් වැවි ඉස්මත්තේ තිබී කාන්තා අත් බෑගයක් හා සෙරෙප්පු යුගලයක් සොයා ගැනීමෙන් අනතුරුව ඒ පිළිබඳ කළ සොයා බැලීමකදී වැවේ තිබී මේ කාන්තා මළ සිරුර හමු වී ඇත.

මියගිය කාන්තාවගේ මළ සිරුර ගොඩ ගත් පොලිසිය ඒ පිළිබඳව කළ පරීක්ෂණවලදී මියගොස් ඇත්තේ කමලරාජ් තිලකවතී නමැති 37 හැවිරිදි කාන්තාවක් බවට හඳුනාගෙන ඇත.

ඇයගේ සැමියා ඇය අත්හැරීමෙන් අනතුරුව වසර තුනක දරුවකු සමඟ ඇය කිලිනොච්චියේ කුලී නිවෙසක ජීවත්ව සිටියදී ඇයව ඝාතනය කොට ඇගේ මළ සිරුර වැවට දමා ඇති බවට තොරතුරු හෙළි වී තිබේ. කිලිනොච්චිය පොලිසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

සේරුවිල සභාවේ මන්ත්‍රී දීමනාව මාස දෙකකින් නෑ

සේරුවිල ප්‍රාදේශීය සභාවේ සභාපති අර්බුදය හේතුවෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට මාස දෙකක මන්ත්‍රී දීමනා නොලැබුණු බවත් මන්ත්‍රීවරු හරහා සිදු කරනා සංවර්ධන කටයුතු මාස දෙකක සිට ඇනහිට ඇති බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පවසති.

2021 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය පරාජයට පත්වීමත් සමඟ සභාපතිවරයා ඉවත් කර උප සභාපතිනියක වැඩ බැලීමට පත් කිරීම හේතුවෙන් අර්බුදය හටගෙන තිබිණි. ඒ අනුව හිටපු සභාපති රණසිංහ බණ්ඩා මහතා කොළඹ අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කරමින් උප සභාපතිනියට වැඩ බැලීම වාරණයට ලක්කර තමන් නැවත සභාපති ධුරයේ පිහිටුවන ලෙස පෙත්සම ගොනු කර තිබේ. මේ වන විට පෙත්සම විභාගයට ගෙන ඇති අතර උප සභාපතිනියට වාරණ නියෝගය එවා තිබේ.

මේ සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දුන් ත්‍රිකුණාමලය සහකාර පළාත් පාලන කොමසාරිස් ඒ. ජී. එස්. එල්. තෙන්නකෝන් මහතා පැවසුවේ අභියාචනාධිකරණයේ පෙත්සම විභාගය අවසන් වී තීන්දුවක් ලැබෙනාතුරු කිසිවක් කළ නොහැකි බවය. අදාළ ප්‍රාදේශීය සභාවේ දෛනික කටයුතු වැටුප් ගෙවීම් පරිපාලන කටයුතු පමණක් සිදු කෙරෙනා බව වැඩි දුරටත් කියා සිටියේය.

මිහිර විජේසේකර - මාරවිල සමූහ

හොරට වැලි ජාවාරම කරන ගමන් පසුත් හොරෙන් කපලා

මුන්දලම ජයරාජපුර ප්‍රදේශයේ බලපත්‍ර නොමැතිව නීතිවිරෝධී අන්දමින් පවත්වාගෙන ගිය වැලි ජාවාරමක් මුන්දලම පොලීසියෙන් වටලා ඇත. මෙම වැටලීමේදී බැකෝ යන්ත්‍ර දෙකක් හා උපකරණ තොගයක් පොලිස් බාරයට ගෙන තිබේ.පිටත ස්ථානවලින් වැලි රැගෙන විත් ගබඩා කර එම වැලි සේදීම සිදුකර ඇති බවත් එම කටයුතුවලට යොදා ගත් බැකෝ යන්ත්‍ර දෙකක් සමඟ වැලි සේදීමට යොදා ගන්නා යන්ත්‍රද මෙසේ අත්අඩංගුවට ගත් බව පොලීසිය පවසයි.මෙසේ වැලි සේදීම සිදු කරන අතරතුරදී එම භූමියේ අනවසරයෙන් පස් කපා ඇති බව ද පොලීසිය පවසයි.

අදාළ ස්ථානයට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මඟින් ලබා දෙන කිසිදු නීත්‍යනුකූල බලපත්‍රයක් නොතිබූ බවත් ඒ සමගම අදාළ පරිසර වාර්තා පවා නොමැති බවත් වැටලීම් සිදුකළ මුන්දලම පොලීසියේ පරිසර ඒකකයේ නිලධාරීහු පවසති.

වැලි ගබඩා කිරීමේ ස්ථානය පවත්වාගෙන ගිය ව්‍යාපාරිකයාට පුත්තලම අධිකරණයට ඉදිරිපත් වන ලෙසද පොලීසිය නියෝග කළේය.

මුන්දලම පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අසිත ලක්රුවන් මහතාගේ උපදෙස් මත පරිසර ඒකකයේ ස්ථානාධිපති කේ.ඒ.ඒ .ඩී. රන්ජන් මහතා සමඟ පොලිස් සැරයන් වරුන්වන 38085 අමරසිංහ , 40868 සිල්වා යන ඇතුළු නිලධාරින් වැටලීමට එක්වූහ.

රූපිකා කේ.බණ්ඩාර කුරුවිට සමූහ

කුරුවිට නිවාස රැසක අනුපවුල් තුන-හතර

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසම් 39 තුළම බිම් අඟලක උරුමයක් නැති පවුල් විශාල පිරිසක් සිටිති.එකම නිවසේ අනුපවුල් තුන හතර ජීවත් වුවද ගෘහමුලිකයා ලෙස සඳහන් කිරීමට සිදුවන්නේ එක පුද්ගලයකුටය. එදා ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ එවකට සිටි දේශපාලනඥයන් විසින් බෙදා දුන් ඉඩම්වල අද වනවිට නිවාස තුන හතර ඉදිවී ඇත්තේ වැසිකිළියක් හා ළිඳක් එකම ඉඩමේ ඉදිකර ගැනීමට ඇති ඉඩකඩද අවුරමිනි.මෙම වසම් හතර වටේම වැවිලි සමාගම් සතු කිසිදු වගාවක් නොකළ ඉඩම් තිබෙන බවද ඒවා වනවගාවන් සඳහා යොදාගන්නා බව පවසමින් පාලනාධිකාරිය ජනතාව නොමග යවන බවද ජනතාව පෙන්වා දෙති.පුස්සැල්ල වැවිලි සමාගමට අයත් කීරගල වත්ත,උස්සන්ගොඩ වත්ත,බලංගොඩ වැවිලි සමාගමට අයත් ඩුහලෝ වත්ත,දම්රෝ සමාගමට අයත් මැරේකැලේ වත්ත, පැරඩයිස් වත්ත, හා කට්ටදෙණිය වත්ත ,එල්ලාවල පිටකන්ද වත්ත හා මූනංගල වත්තේ ජනතාවට බෙදාදිය හැකි ඉඩම් තිබෙන බවද ඔවුහු පවසති.වැවිලි සමාගම්වල ඉඩම් අද කොම්පැණි සතුවී තිබෙන බවද ඉඩම්වල රක්ෂිතයන් වගාකිරීමට කටයුතු කරන බවද ජනතාව සඳහන් කරති.

එන්. නවරත්න මීගහකිවුල සමූහ

බදුල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ අභිනව ලේඛකාධිකාරී හේමාලෝක හිමි

බදුල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ 2021 අභිනව ලේඛකාධිකාරී ලෙස කණවරල්ලේ හේමාලෝක හිමියෝ නිතරගයෙන් තේරී පත්වූහ.

බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී නිලවරණය පැවැත්විණ. මේ වන විටත් බදුල්ල දිස්ත්‍රික් ශසනාරක්ෂක බළමණ්ඩලයේ ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කරන්නේද හේමාලෝක හිමියන් වන අතර උන්වහන්සේ බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පතිවරයෙකි. හේමාලෝක හිමියෝ 1990 වසරේ සිටම වරින්වර බදුල්ල ශාසනාරක්ෂක බළමණ්ඩලයේ ලේඛකාධිකාරී හා සභාපති තනතුර හොබවමින් ප්‍රදේශයේ ජාතික ආගමික කටයුතු සඳහා විශාල මෙහෙයක් ඉටුකර ඇති අතර ශ්‍රී සුධර්මවාදිනී කාරක මහා සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වශයෙන්ද කයිලගොඩ මහා මහේන්ද්‍ර දහම් පාසලේ ප්‍රධානාචාර්ය වශයෙන්ද කටයුතු කරති.

නාදල සමූහ

මාතලේ වනඅලි එළවන මෙහෙයුම සඳුදා සිට

මාතලේ දිස්ත්‍රික්කයට දිනෙන් දින සිදුවන වන අලි ගැටලුවට විසඳුමක් ලෙස අලි පලවා හැරීමේ මෙහෙයුමක් ලබන සඳුදා(15) ආරම්භ කරන බව මාතලේ - රජ්ගම්මන වනජීවී කාර්යාලය කියයි.දින දහයක් පුරා ක්‍රියාත්මක මෙම මෙහෙයුමේදී මින්නේරිය ගිරිතලේ සොභා රක්ෂිතය දක්වා වන අලින් පලවා හැරීමට නියමිතය.මේ මෙහෙයුම සඳහා පොලීසිය මෙන්ම සිවිල් සංවිධානවලද සහාය ලැබේ.නාදල,පල්ලේපොළ,අඹන්ගග කෝරළේ ආදී ප්‍රදේශ හරහා මෙම මෙහෙයුම සිදුවන බවත්, මේ සඳහා මහජනතාවගේ සහාය අවශ්‍ය බවත් වනජීවී කාර්යාලය කියයි.

මාතලේ - රජ්ගම්මන වනජීවී කාර්යාලයේ අඩවි ආරක්ෂක පි.එම්.බි.විජේකෝන් මහතා කියා සිටියේ මිනිස් ගැටුම අවම කිරීමේ අරමුණින් වන අලින් පලවා හැරීමට අමතරව අලි වැට ඉදිකර ක්‍රියාත්මක කිරීම,ප්‍රජාව දැනුවත් කිරීම ආදි කරුණු ගණනාවක් කෙරෙහි වනජීවී දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇති බවයි.

දිනමිණ දසත දස අත ම එක තැන

රාගම සමූහ

පෑලියගොඩ ශ්‍රී රෝහණ විහාරයේ කොත් කැරැල්ල නාම පුවරුවකට වැහිලා

පෑලියගොඩ නගරසභා බල ප්‍රදේශයේ පිහිටි ඉපැරණි බෞද්ධ සිද්ධස්ථානයක් වන පෑලියගොඩ ශ්‍රී රෝහණ විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකළ චෛත්‍යය රාජයාණන් වහන්සේගේ කොත්කැරැල්ල නගරයට පිවිසෙන ජනතාවගේ සිතට බුද්ධාලම්බන ප්‍රීතිය ඇති කිරීමට හේතුවී ඇති නමුත් චෛත්‍ය කොත්කැරැල්ල වැසීයන ලෙස සවිකර ඇති ඒ අසළ පිහිටි ව්‍යාපාරික ආයතනයක දැවැන්ත වෙළෙඳ නාම පුවරුව නිසා එයට බාධා පැමිණ ඇතැයි පෑලියගොඩ නාගරික මංත්‍රී ඩී. එම්. ආනන්ද සරත් මහතා නගර සභාවේ මහ සභාවාරයේදී පෙන්වා දුන්නේය. පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි මෙම ව්‍යාපාරික ස්ථානයේ හිමිකරුවන් වෙත සිද්ධිය පිළිබඳ දැනුම් දී එම දැවැන්ත වෙළෙඳ නාම පුවරුව මදක් වෙනසකට ලක් කිරීමට පියවර ගන්නා ලෙසද මංත්‍රීවරයා ඉල්ලා සිටියේය. මේ පිළිබඳ එම ආයතනයෙන් ලිඛිතව ඉල්ලීමක් කිරීමට පියවර ගන්නා ලෙස නගරාධිපතිවරයා එහිදී උපදෙස් ලබා දුන්නේය.

ඩබ්ලිව් රෝහණ බුලත්කොහුපිටිය සමූහ

මොරොන්තොට-කොළඹ බස් සේවය යළි ඇරැඹේ

මොරොන්තොට,කොළඹ බස් සේවාව මාර්තු මස පළමු දින සිට යළි අවිස්සාවේල්ල ඩිපෝව මඟින් ධාවනය ආරම්භ කර තිබේ.ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යය දිලුම් අමුණුගම මහතාගෙන් කබගමුව ප්‍රදේශයේ පදිංචි කෑගල්ල බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් සුනිල් රංජිත් මහතා ඇතුළු පිරිසක් කළ ඉල්ලීක් මත අවිස්සාවේල්ල ඩිපෝව විසින් මෙසේ බස් රථය ධාවනයට එක් කර තිබෙයි.මොරොන්තොටින් උදෑසන හයයි දහයට පමණ ආරම්භ වන මේ බස් රථය බුලත්කොහුපිටිය,අවිස්සාවේල්ල හරහා පරණ පාර ඔස්සේ කොළඹට ළඟා වෙයි.

බදුල්ල නිශාන්ත අබේගුණවර්ධන

හපුතලේ එළවලු මිල පහළ බැහැලා

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ විශේෂ ආර්ථික මධ්‍යස්ථානය හා බණ්ඩාරවෙල පිහිටි එළවලු තොග වෙළෙඳ මධ්‍යස්ථානයට වඩා හපුතලේ එළවලු තොග වෙළෙඳ මධ්‍යස්ථානයේ එළවලු කිලෝවක තොග මිල ගණන් පහත මට්ටමක පැවති බව වාර්තා වේ.ඒ අනුව හපුතලේ එළවලු තොග වෙළෙඳ පොළේ කැරට්,බීට්රූට්,අර්තාපල්,ලීක්ස්,මාලු මිරිස් යන එළවලු කිලෝවක තොග මිල ගණන් රුපියල් 50 – 100 ත් අතර පහළ මිලක පැවති බවද ගෙඩි ගෝවා,තක්කාලි,අමු මිරිස්වල මිල ගණන් අනෙක් වෙළෙඳ මධ්‍යස්ථාන දෙක සමඟ සම මට්ටමේ පැවති බවද වෙළෙඳුන් කියති. අතු ගෝවා කිලෝවක් කැප්පෙට්පොළ හා බණ්ඩාරවෙල රුපියල් 80 – 100 ත් අතර මිලකටද, බටු කිලෝවක් රුපියල් 50 – 70 ක් වුවද හපුතලේ වෙළෙඳ මධ්‍යස්ථානයේ එම එළවලු කිලෝවක තොග මිල රුපියල් 30ක් දක්වා පහළ බැස තිබුණි.

අනෙක් තොග වෙළෙඳ මධ්‍යස්ථාන දෙකට වඩා පිපිඤ්ඤාවල මිල පමණක් ඉහළ ගොස් තිබූ අතර එහි මිල කිලෝවක් රුපියල් 80 දක්වා අගයක පැවති බවද වාර්තා වේ.හපුතලේ,ඔහිය, දල්ගස්හින්න, දඹේතැන්න,පුනාගල,කොස්ලන්ද ඇතුළු ප්‍රදේශවලින් එළවලු මෙම වෙළෙඳ මධ්‍යස්ථානය වෙත ගොවින් විසින් රැගෙන ඒන අතර වැල්ලවාය,කතරගම,තිස්සමහාරාමය තණමල්විල,හම්බන්තොට,රත්නපුර , බලංගොඩ,පැල්මඩුල්ල යන ප්‍රදේශවලට මින් එළවලු වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමද සිදු කෙරේ.

කුරුවිට සමූහ - රූපිකා කේ.බණ්ඩාර

අස්වැද්දූ පුරන් කුඹුරෙන් සරුසාර අස්වැන්නක්

ජලය ලබාගැනීමේ අපහසුතාව නිසා ඉතා දිගුකලක් පුරන්ව තිබූ කුරුවිට,වළඳුර වෙල්යායේ කුඹුරු අක්කර දෙසිය පනහක පමණ ප්‍රමාණයක් ඉකුත් කන්නයේදී වගාකරනු ලැබීය. එම කන්නය වගා කිරීමේදි ජලය ලබාගත්තේද අතහැරදමා තිබූ අමුණක් ප්‍රතිසංස්කරණය කිරීමෙනි. මෙහි විශේෂත්වය වන්නේ එම කුඹුරු යාය මෙවරද අස්වද්දා ඇත්තේ අතහැරදමා තිබූ තවත් අමුණක් ප්‍රතිසංස්කරණය කිරීම මඟිනි.මේ වනවිට එහි අස්වනු නෙළීමට ආසන්නව පවතින බවද ගියවරට වඩා වැඩි අස්වැන්නක් මෙවර ලබාගත හැකිවන බවද ගොවියෝ පවසති.

පියසේන වතුදුර - දිගාමඩුල්ල සංචාරක

පදියතලාව කෝමාන විදුහලට පානීය ජල පහසුකම්

බීමට පිරිසුදු ජලය නොමැතිව ඉගෙනීමේ කටයුතුවල යෙදෙන පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝමාන විද්‍යාලයේ දරුවන් 300කට වැඩි පිරිසකට පිරිසුදු පානීය ජලය සැපයීම සඳහා දිගාමඩුල්ල ප්‍රජා සහන පදනම මඟින් වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෝමාන, හේන් ගොවිතැන සහ එදිනෙදා කුලී වැඩවලින් ජීවත්වන අඩු ආදායම්ලාභී ජන කොට්ඨාසයක් ජීවත්වන පැරණි ගම්මානයකි.ජල මූලාශ්‍ර නොමැති නිසා විදුහල් බිමේ ඉදි කර ඇති නළ ළිඳකින් පිරිසුදු නොකර ලබා ගන්නා ජලය මඟින් පිපාසය සංසිඳුවා ගැනීමට පාසල් දරු දැරියෝ පුරුදුව සිටිති.නළ ළිඳෙන් ලීටර 2000ක ටැංකියට පුරවා ගන්නා පිරිසුදු නොකළ ජලය, ෆිල්ටරයක් මඟින් බැර ලෝහ ඉවත් කර වෙනත් ටැංකියකට පුරවා පාසල තුළ නළ මඟින් බෙදා හැර පාසල් දරුවන්ට බීමට සැලැස්වීමට අවශ්‍ය ටැංකි ඉදි කිරීම සිදු කර යන බව දිගාමඩුල්ල ප්‍රජා සහන පදනමේ සභාපති එච්.ආර්. අමරසූරිය සෙනෙවිරත්න මහතා පවසයි. නෙදර්ලන්තයේ පදිංචි හිතවතුන් දෙදෙනකු විසින් එරට පදිංචි සමාජ සේවයට ළැදි පිරිසක් එක් කර ගනිමින් ලබා දුන් යුරෝ 2000ක් වැය කරගෙන විද්‍යාලයීය ආදිශිෂ්‍යයින්,ගුරු මණ්ඩලය සහ මවුපියන්ගේ සහයෝගය මේ සඳහා නොමසුරුව ලැබෙන බව අමරසූරිය මහතා පවසයි.

ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ

කඹුරුපිටිය-දෙවිනුවරට විශේෂ ජල ව්‍යාපෘතියක්

මාතර දිස්ත්‍රික්කයේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන දහඅට දහස් දෙසීය අටකි.මේ යටතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය සහ දෙවිනුවර මැතිවරණ බල ප්‍රදේශයන්හි සම්පූර්ණ පානීය ජල අවශ්‍යතාව සහ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහසයෙන් දහයක් සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදී ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රමයේ ජල සම්පාදන මණ්ඩලයේ 4 වැනි අදියර කඹුරුපිටිය ආසනයේ යටියනදී පසුගියදා ආරම්භ කෙරිණි.

විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන් ධීවර රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර මහතාගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය වසර තුනකින් අවසන් වන අතර කොරියානු සමාගමක් වන කොලෝන් සැම්සුන් සමාගම ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබයි.

වැස්ස එනකොට අපි ඉස්කෝලෙට දුවනවා

මහදෝව වත්තේ කම්කරු පවුල් විදින දුකක්

ටී.සුභා

කුමාර් විපුලානන්දන්

බී.කෝවිස්වරන්

ආර්.එම්.විජේරත්න - හාලිඇල සමූහ

දැනට වසර හතක පමණ කාලයක සිට නායයාමේ දැඩි අවදානම සහිත වතු පේලි නිවාස කිහිපයක ජීවත්වන ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මහදෝව වත්තේ වතු කම්කරු පවුල් 15ක් පදිංචියට සුදුසු ආරක්ෂිත ස්ථානයක නිවාස තනා දෙන ලෙස වගකිවයුතු බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති. පසුගිය 2013 වසරේදී පමණ මහදෝව වත්ත අමුණුදෝව කොටසේ ලැයිම් අංක 11, 12, 13 යන පේලි නිවාසවල ආශ්‍රිතව ඇතිවූ තදබල පිපිරීම්, ඉරිතැලීම් රැසක් හේතුවෙන් එම නිවාස ඒකකවල වාසය කළ පිරිස් මෙම අවදානමට ලක්ව සිටිති. මෙම තත්ත්වය මත අවදානමට ලක්ව සිටින පවුල්වලට එම නිවෙස්වලින් ඉවත්ව ආරක්ෂිත ස්ථානයක පදිංචි වන ලෙස අදාළ බලධාරීන් දන්වා ඇතත් තමනට යෑමට තැනක් නැතැයි ඔවුහු පවසති. මේ වන විට මෙම ලැයිම් පේලිවල ඇතැම් නිවෙස් අත්හැර දමා ඇති අතර තවත් නිවාස කිහිපයක්ම කඩාවැටීමේ අවදානමක තිබේ.සෙසු නිවාසවල පිපිරීම්, ඉරිතැලීම්, තාවකාලිකව අලුත්වැඩියා කරගෙන ඇති අයුරුද දක්නට ඇති අතර පවතින තත්ත්වය සම්බන්ධයෙන් එම වතු ජනතාව මෙසේ පැවසූහ.

කුමාර් විපුලානන්දන් මහතා- දැනට අවුරුදු හත අටකට විතර කලින් මෙම ප්‍රදේශයේ පිපිරීම් හා ගිලාබැසීම් ආරම්භ වුණා. ඊට පසුව අදාළ අංශ ඇවිත් පරීක්ෂා කර බලා කිවේ අවුරුදු 10ක් ඇතුළත මේ නිවාස නායයෑමට ලක්විය හැකියි කියලයි. ඒ නිසා මේ ලැයිම්වල පදිංචි පවුල් 17 කට වහාම එම ස්ථානවලින් ඉවත් වන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා දැන්වුවා. ඒත් අපට යන්න තැනක් නෑ. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වෙන්කර තිබෙන ඉඩමත් පදිංචියට සුදුසු නෑ.

එස්.ජීවරත්නම් මහතා- මේ නායයෑමේ අවදානම නිසා අපි හැමදාම ඉන්නෙ බයෙන්. වැස්සක් එනකොට අපට ඉස්කෝලෙට ගිහින් නතර වෙන්න කියලා නිලධාරීන් කියනවා. ඒත් හැමදාමත් ඒක කරන්න පුළුවන්ද? සමහර කාලෙට නිතරම වැස්ස. වැස්සක් එන එන වෙලාවට පවුල් පිටින් ඉස්කෝලෙට ගියාම ඉස්කෝලෙ ළමයි කොහොමද ඉගෙනගන්නේ. අපට වෙන්කළා කියන ඉඩමට අපි කැමති නෑ. රිළවු ඉන්න කැලේ. පහසුකම් මොකුත් නෑ. අපිට රස්සාවක්වත් හරියට නැතිව ගෙවල් දොරවල් හදාගන්නේ කොහොමද? ඒ නිසා අපිට සුදුසු තැනක ගෙවල් හදා දෙන්න කියලයි අපි ඉල්ලන්නේ.

ටී.සුභා මහත්මිය-අපි පොඩි දරුවනුත් තියාගෙන රෑට මේ ගෙවල් ඇතුලේ නිදාගන්නේ හරි බයෙන්. ළමයි ගේ ඇතුළේ තියලා වැඩට යන්නෙත් බයෙන්. අපිට වෙන තැනකින් ගෙවල් හදා දෙන්න කියලා 2014 සිට ඉල්ලනවා. ඒත් තාම විසඳුමක් නෑ.

බී.කෝවිස්වරන් මහතා- අපි ඉන්න ලැයිම් නායයනවා කියලා එන්.බී.ආර්.ඕ.රිපෝට් එකත් දීලා තිබෙනවා. අපේ ලැයිම්වල බිත්ති සේරම පුපුරලා. ගල්බැම් ගැලවෙලා. කොයිවෙලේ පෙරලෙයිද දන්නෙ නෑ. වැස්සදාට ඉස්කෝලෙට ගියත් ආපහු ඇවිත් ඉන්න වෙන්නේ මෙතැනමයි. අපට ඉඩම් දුන්නත් ඒ ඉඩම්වල ගෙවල් හදාගන්න අපට සල්ලි නෑ. වත්තෙ රස්සාවෙන් එදා වේල කාල ජීවත් වෙන්නෙත් අමාරුවෙන්.

මෙම ගැටලුව සම්බන්ධයෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් ඩී.එම්.එන්.දිසානායක මහතා පැවසුවේ මෙම අවදානම් සහිත පවුල් යළි පදිංචි කිරීම සඳහා ඉඩමක් වෙන්කොට ඇති අතර ඊට අදාළ පවරාගැනීම් හා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ලබාගැනීම සම්බන්ධ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින බවයි. එම කටයුතු අවසන් වූ වහාම පදිංචියට ප්‍රමාණවත් පහසුකම් ලබාදී මෙම අවදානමට මුහුණපා සිටින පවුල් එම ස්ථානයේ යළි පදිංචි කිරීමට පියවර ගන්නා බවද ප්‍රාදේශීය ලේකම්වරයා සඳහන් කළේය.

වයඹ පළාත් සංචාරක

කුරුණෑගල පොල් ඉඩම් කැබලි කර විකිණීම ජයටම

සරුසාර පොල් ඉඩම් කැබලි කර විකිණීමේ ජාවාරම කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා ජයටම කෙරෙමින් පවතී. පොල් ඉඩම් කැබලි කිරීම තහනම් කරමින් නීතිරීති ගෙන ආවද එම නීති පොත්වලට පමණක් සීමා වී ඇති බව පෙනේ. පොල් ත්‍රිකෝණයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද පොල් ගෙඩියක මිල රුපියල් 80ත් 100ත් අතර වෙයි. දිනෙන් දින සරුසාර පොල් ඉඩම් කැබලි කර විකිණීමේ ජාවාරම පසුපස සිටින්නේ ඉඩම් වෙන්දේසි කරන ප්‍රධාන පෙළේ සමාගම්ය. මෙම සමාගම්වලට කිසිදු නීතියක් බලපාන්නේ නැත. සියලු නීතිරීති අමු අමුවේ උල්ලංඝනය කරමින් සිදුකරන පොල් ඉඩම් කැබලි කර විකිණීමේ ජාවාරම නතර නොකළහොත් පොල් ගෙඩියත් පිටරටින් ගෙනඒමට සිදුවන බව අමුතුවෙන් කිව යුතු නැත. එසේම පොල් ත්‍රිකෝණයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පොල් ඉවත් වී ත්‍රිකෝණය පමණක් ඉතිරිවනු ඇත. කුලියාපිටිය නගරයට ආසන්න ගයියාල ප්‍රදේශයේ සරුසාර පොල් ඉඩමක් කැබලි කර විකිණීමට සූදානම් කර තිබෙන අයුරු 'දිනමිණ' කැමරාවට හසුවූයේ මෙලෙසින්.

ඡායාරූපය - ගිරිදල්ල සමූහ

එස්.ජී.උඩේපාල-කැබිතිගොල්ලෑව සමූහ

නරකමුල්ල පුරාවිද්‍යා ස්ථානය නිදන් සොරුන්ගේ කෙළි බිමක් වෙලා

පුරා වස්තු භූමි නිදන් හොරුන්ගේ කෙළි බිමක් වී ඇති අයුරු.

මඩකළපුව කිරාන්තොප්පි ගලට ආසන්නව පිහිටා ඇති නරකමුල්ල පුරාවිද්‍යා ස්ථානය මේ වන විට නිදන් හොරුන්ගේ කෙළි බිමක් බවට පත්ව ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

මඩකළපුව කිරාන් තොප්පිගලට ආසන්නව පිහිටා ඇති ඉතා වැදගත් ස්ථානයක් වන මෙම පුරා විද්‍යා ස්ථානයේ ස්ථූප, පදානඝර, කටාරම්ලෙන්, ලෙන් ලිපි, සීමා බැම්, සඳකඩ පහන, විශාල සැතපෙන පිළිමයක ශේෂව ඇති පුරා වස්තු කීපයක් පිහිටා ඇත.

එවක මෙම ස්ථානයෙන් ගලා බසින දිය පාර ආරාමවාසී සංඝයා වහන්සේලාගේ ජල පහසුකම් සපුරා තිබෙන බවට සාක්ෂි දරයි.

එමෙන්ම මෙවන් විශාල ආරාමයකට අවැසි සිව්පසය සපයන්නන්ට විශාල ජනාවාසයක් පැවැති බවට මේ වන විට ජරාවාසව ඇති දැව සාක්ෂි දරයි.

අනාගතයේදී මේ නටඹුන්ද ඉතුරු වේ යැයි සිතීමට නොහැකි තරම් එම ස්ථානය නිදන් හොරුන්ගේ කෙළි බිමක් වී හමාර බව ගම්වාසීහු පෙන්වා දෙති. මේ පිළිබඳ විධිමත් සැලසුමක් ක්‍රියාත්මක කරමින් මෙම පෞරාණික වටිනාකමක් ඇති පුජා භූමිය ආරක්ෂා කර දෙන ලෙස බලධාරීන්ගෙන් ගම්වාසීහු ඉල්ලා සිටිති.

දිනමිණ දසත දස අත ම එක තැන

එන්. විජේරත්න - නාගොඩ විශේෂ

පාසල් වසා දැමූ කාලයේ සිට නොමිලේම දරුවන්ට උගන්වන ගුරුවරයෙක්

කළුතර, මොරොන්තුඩුවේ පදිංචි ප්‍රියාන් මහේෂ් නම් වූ ගුරු මහතා 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ පාසල් හා උපකාරක පන්ති වසා දැමූ කාලයේ සිට මේ දක්වා අඛණ්ඩව තම පෞද්ගලික ධනය, කාලය හා ශ්‍රමය වැයකරමින් නොමිලයේ දරුවන්ට ඉගැන්වීම සිදුකරන බව වාර්තාවේ.

දරුවන් වෙනුවෙන් මෙසේ විශාල මුදලක් වැයකරමින් නිබන්ධන සකසා දෙමින් සිදුකරන මේ සද්කාර්යය පාසල් පටන් ගන්නාතෙක්ම සිදුකරනු ලබන බව ද වැඩිදුරටත් වාර්තාවේ.

අපේ රටේ කොරෝනා වසංගතය ආරම්භ වූ අවදියේදී මෙතුමා ශිෂ්‍යත්ව විභාගයට මුහුණදුන් දරුවන් වෙනුවෙන් අතිවිශාල මුදලක් වැයකර නොමිලයේම ප්‍රශ්නපත්‍ර කට්ටල, පාසල් උපකරණ හා ආහාර පාන ලබාදී සම්මන්ත්‍රණ පවත්වමින් සිදුකළ සේවය ද සුළුපටු නොවේ.

වර්තමානයේදී මුදල් පසුපසම හඹායමින් ගුරු වෘත්තිය හැල්ලුවට ලක් කරන තත්ත්වයක් තුළ ප්‍රියාන් මහේෂ් ගුරු මහතා සිදුකරන සුවිශේෂී මෙහෙය මහත්සේ ඇගයීමට ලක් විය යුතුව තිබේ.

ඒ.ටී. කහඳුගොඩ- වීරකැටිය සමූහ

රැඳවියන් සිටින සිර මැදිරි දෙසට හෙරොයින් විසිකරලා

අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවියන් සිටින සිර මැදිරි දෙසට හෙරොයින් ග්‍රෑම් 4යි මිලිග්‍රෑම් 630ක් විසි කළ බව කියන පුද්ගලයකු 10දා දහවල් බන්ධනාගාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට පත් මැදමුලන කිංචිගුනේ පදිංචි සැකකරු පරීක්ෂා කිරීමේ දී ඔහු ළඟ තිබී සිම්පත් හතරක් ඩේටා කේබලයක කොටසක් සහ දුම්කොළ සහ සුරුට්ටු කුඩු ස්වල්පයක් ද සොයා ගැනීමට බන්ධනාගාර නිලධාරීන්ට හැකි වී තිබේ.

මෙම සැකකරු වැඩිදුර පරීක්ෂණ සඳහා අඟුණකොළපැලැස්ස පොලිසිය වෙත බාර දී ඇති අතර පොලිසිය විසින් ඔහු අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා තිබුණි.

සූරියවැව විශේෂ - නුවන් ජයසේකර



ලුණුගම්වෙහෙර සුව බොජුන්හල විවෘත කරයි

වස විසෙන් තොට ආහාර වේලක් ජනතාවට භුක්ති විඳීමට අවස්ථාව උදාකිරීම වෙනුවෙන් ලුණුගම්වෙහෙර සමෘද්ධි සුව බොජුන් හල ජනතා අයිතියට පත් කිරීම වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දින සිදුකෙරුණි.

නීරෝගිමත් පුරවැසියන් බිහිකිරීම සඳහා රජය ගන්නා පියවරයන් අතර සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව පෝෂ්‍යදායක ආහාර අලෙවිසල් සුලභ කිරීමේ අරමුණින් හැකි සෑම තැනකම කාබනික වගාව සහ ඒ ආශ්‍රිත ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ එක් පියවරක් ලෙස ලුණුගම්වෙහෙර සුව බොජුන් හල ජනතා අයිතියට පත් කර තිබේ.

මෙම අවස්තාව සඳහා කැන්දගස්මංකඩ ශ්‍රී රත්නාරාම පුරාණ විහාරාධිපති ගලපිටගල ප්‍රේමරත්න නායක ස්වාමීන්වහන්සේ ප්‍රමුඛ මහාසංඝරත්නය, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් එච්.ඩබ්ලිව්.කරුණාරත්න,ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා සභාපති රසික දිනේෂ් ඇතුළු මහජන නියෝජිතයන්, සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් නීතිඥ බන්දුල කිත්සිරි යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු රැසක් ද සහභාගී වී සිටියහ.

එස් දියගහගේ දකුණු පළාත් සංචාරක

ගාල්ල බන්ධනාගාරයෙන් පලා යෑමට තැත් කළ චූදිතයන්ට එරෙහිව පැවරූ නඩුව කල්යයි

සුනාමි දින (2004 .12.26) ගාල්ල බන්ධනාගාරයෙන් පලා යෑමට තැත් කළ චූදිතයන් පනස්හත් දෙනකුට එරෙහිව පවරා ඇති නඩුව (10) කැඳවූ අවස්ථාවේ වැඩිදුර විභාගය ඔක්තෝබර් 13 වනදින දක්වා කල් තැබීමට දකුණු පළාත් බද ගාල්ල මහාධිකරණ විනිසුරු ඩබ්ලිව්.පී.එස්.නිස්සංක මහතා නියම කළේය.

මේ වනවිට චූදිතයන් පනස්හත් දෙනාගෙන් දෙදෙනකු මියගොස් ඇති අතර හතර දෙනෙකු අධිකරණයේ පෙනී සිටියේ නැත.ඒ අනුව අධිකරණයේ පෙනි සිටියේ චූදිතයන් පනස් එක් දෙනෙක් පමණි.

සුනාමි දින(2004.12.26) නීති විරෝධී ජන රාශියක සාමාජිකයන්වී ගාල්ල බන්ධනාගාරයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ නිත්‍යානුකූල බාරකාරත්වයෙන් මිදී පලායෑමට තැත් කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් රුපියල් 153961325 දේපළ කඩා බිඳ දමා අලාභ කිරීම බන්ධනාගාර නියාමකවරුන්ට පහරදී තුවාල සිදු කිරීම රුපියල් 6200ක් කොල්ලකෑම ඇතුළු අධි චෝදනා එකොළහක් යටතේ මෙම චූදිතයන්ට එරෙහිව නඩු පවරා ඇත.

.අධි චෝදනා බාරදුන් සැකකරුවන් එක් අයකු රුපියල් ලක්ෂ දෙකක ශරිර ඇප මත මුදා හැරඇත.

රජයේ අධි නීතිඥ රන්දිමා ප්‍රනාන්දු මහත්මිය විසින් විසින් පැමිණිල්ල මෙහෙයවන ලදී.

රංජිත් අම්පිටියාවත්ත - බියගම විශේෂ

සපුගස්කන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පුස්තකාලයක් විවෘත කරයි

ශ්‍රී ලංකාවේ 73 වැනි නිදහස් දින සැමරුම් උත්සව දිවයින පුරා පැවැත්වෙද්දී බියගම, සපුගස්කන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රුක් රෝපණය සහ නව පුස්තකාලයක් ආරම්භ කිරීම සිදුකෙරිණි.

ප්‍රාදේශීය ලේකම් චන්දිමා සූරියආරච්චි මහත්මියගේ මෙහෙයවීමෙන් සහකාර ප්‍රා. ලේකම් ශසිකා ලියනගේ මහත්මිය රුක්රෝපණය කර පුස්තකාලය ද විවෘත කළාය.

මෙම උත්සව අවස්ථාවට ගණකාධිකාරී රංගන ප්‍රියදර්ශන, සහකාර අධ්‍යක්ෂිකා (සැලසුම්) ටී. කේ. හේරත්, සහකාර අධ්‍යක්ෂිකා සඳමාලි, චම්ලා ගුණසිංහ (පරිපාලන නිලධාරිනී) වයි. ආර්. ජයවීර (පරිපාලන ග්‍රාම නිලධාරි) මහත්ම මහත්මීහු ද සහභාගි වූහ.

කල්පිටිය සමූහ

හෙරොයින් සමඟ ධීවරයෙක් අත්අඩංගුවට

හෙරොයින් මත් ද්‍රව්‍ය ග්‍රෑම් දෙකකුත්,මිලි ග්‍රෑම් 890ක් තම සන්තකයේ තබාගෙන සිටි ධීවරයකු,කල්පිටිය කන්ද කුලිය ධීවර ගම්මානයේ දී 10 දින රාත්‍රියේ කල්පිටිය පොලිසියේ දූෂණ මර්ධන ඒකකය මගින් අත් අඩංගුවට ගෙන ඇත.

මෙම සැකකරු තදින්ම හෙරොයින් පානයට ඇබ්බැහි වූ 30 හැවිරිදි විවාහකයකු බැව්,පොලිසිය පවසයි.

කල්පිටිය පොලිස් ස්ථානාධිපති එම්.මව්ශාන් මහතාගේ උපදෙස් පරිදි,දූෂණ මර්ධන ඒකකයේ ස්ථානාධිපති පොලිස් සැරයන් 50022 රාජකරුණා මහතා විසින් මෙම වැටලීම සිදු කොට ඇත.

සැකකරු පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත ය.

චන්ද්‍රතිලක රත්නායක-ඉබ්බාගමුව විශේෂ

ඓතිහාසික දොළුකන්ද නිදන් සොරුන්ගේ ග්‍රහණයට

හිරියාල ආසනයේ ඓතිහාසික දොළුකන්ද මුදුනේ පිහිටි මාලිගා තැන්න ප්‍රදේශයේ තිබෙන නිදන් සියල්ල නිදන් හොරුන් විසින් වරින් වර හාරා රැගෙන ගොස් තිබෙන අන්දමත් එහි විශාල විනාශයක් කර තිබෙන අයුරුත් එහි සංචාරය කළ අපට සියැසින් දැක බලා ගැනීමට හැකිවිය.

මාලිගා තැන්නේ සුන්දර ගල්තලාවක ඉදිකර තිබූ ඉපැරණි දාගැබ නිදන් හොරුන් විසින් හාරා බිමට සමතලා කොට තිබෙන අතර අද එතැන දක්නට ඇත්තේ පස් ගොඩක් සහ කැලයක් පමණි.එහි තිබෙන ගල් ගුහාවක මිනිසුන් හා භික්ෂූන් වාසය කළ බව එහි ඇති ඉවුම් පිහුම් උපකරණ සාක්ෂිදෙයි.මලිගාතැන්නේ දාගැබ අසල සිට ජලය ගලා යෑමට ගලින් ම සකස් කොට තිබෙන කුඩා ඇළද කුමන හෝ හේතුවකට ශුද්ධ පවිත්‍රකර තිබේ.එම භූමිය පුරා නිදන් ගත් බවට සැක උපදවන වළවල් රැසකි.

එසේම හෙළයේ මහා වෙදදුරු බුද්ධදාස මහ රජතුමන්ගේ ඔසු උයන සේ සැලකෙන හිරියාල ආසනය මධ්‍යයේ පිහිටි ඓතිහාසික දොළුකන්ද ඔසු උයනෙහි ඇති දුර්ලභ ගණයේ ඖෂධ පැළෑටි සහ ඒවායෙහි මුල් පොතු ගෙඩි මල් ආදිය හොර රහසේ පිට පළාත්වලට අලෙවි කිරීමේ ජවාරමක් කලක සිට සිදුවන බව කන්ද පාමුල පදිංචිකරුවෝ පවසති.

මුහුදු මට්ටමේ සිට අඩි 700 ක් පමණ උසින් පිහිටි දෝල පබ්බත හෙවත් දොළුකන්ද හා අරන්කැලේ දුන් කන්ද කඳු දෙක එකට ගත්විට එය දිගින් කිලෝ මීටර් පහ හමාරක් පමණ වූ ප්‍රදේශයකි. ඉර රාජ,සඳ රාජ, කුඩා හැඩයා, මහ හැඩයා, විෂ්ණුක්‍රාන්ති, සුදු හඳුන්, රත් හඳුන්, වනරාජා, ගරුඬරාජා, දුටුසතුටු. මහනයි. සුළුනයි, මහසුදනා, කුඩාසුදනා, මහනාම්බා, අරළු, බුළු, නෙල්ලි, මහා පද්මයා, කුඩා පද්මයා, හාතා වාරිය ,කළුකොහිල, මදාරා, කලුවෙල්ලන්ගිරිය, මයුරපාද. කොතල හිඹුටු, බිංකොහොඹ, කොටකිඹුලා ආදී පහසුවෙන් සොයාගත නොහැකි ඉතා දුර්ලභ ගනයේ ඔසු පැළ වර්ග දහස් ගණනක් දොළුකන්ද වනාන්තරය පුරා ව්‍යාප්තව පවතී.

ජාවාරම්කරුවන් මෙන්ම ඔසු උයන නැරඹීමට පැමිණෙන ආයුර්වේද වෛද්‍යවරු සහ සිසුන් පමණක් නොව පැමිණෙන වෙනත් පිරිස්ද ඔසු පැළ වර්ග මෙන්ම දුර්ලභ ගනයේ මල් පළැවිද ගලවාගෙන යන බව ඔසුඋයන පාමුල පදිංචිකරුවෝ පවසති.ඔවුන් මේ කරන විනාශය කණගාටුදායකය.මෙකී ඔසු පැළ වර්ග වෙනත් පළාත්වල රෝපණය කළ නොහැකි බවත් දොළුකන්ද මුදුනේ ඇති දේශගුණය වෙනත් පළාත්වල නොමැති නිසා එම පැළ විනාශ වී යන බවත් ඔවුහු පෙන්වාදෙති.මේ බව නොදන්නා පිරිස් මේ විනාශය සිදුකරන බවද අවට පදිංචිකරුවෝ කියති. මුදලට ඇති කෑදරකමත් දුර්ලභ ඖෂධ පැළෑටි අලෙවි කිරීමෙන් වැඩි ආදායමක් ලබා ගැනීමටත් හැකිවීම නිසා මෙම ඔසු දිනෙන් දිනම විනාශවී යමින් පවතී.

මෙම විනාශය පිළිබඳව සොයා බැලීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක්ද නැත.අදාළ අංශ මේ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකළහොත් දොළුකන්ද ඔසු උයන මෙන්ම එහි තිබෙන නිධන් සියල්ලද නුදුරු අනාගතයේදී අතුරුදන්වනු ඇතැයි ප්‍රදේශවාසීහු බිය පළකර සිටිති.

ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල

අරුණගම කෝප් සිටි ප්‍රාදේශිකය කැලෑ වෙලා

ඉංගිරිය රයිගම් උඩුගහපත්තු විවිධ සේවා සමූපකාර සමිතියට අයත් 'අරුණගම කෝප් සිටි' ප්‍රාදේශිකය වසර දෙකකට අධික කාලයක සිට වසා දැමීමෙන් තමන් මහත් පීඩාවට පත්ව ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

අරුණගම, ගණේතැන්න, මානාන, කළුපහන වැනි ගම්මානයන්හි ජනතාව මෙන්ම පර්ත් වත්ත දම්ළ පුරවැසියන් විශාල පිරිසක් සේවය සලසා ගන්නා ලද මෙම ප්‍රාදේශිකය මේ වනවිට සම්පූර්ණයෙන්ම වල්බිහිවී, එහි වහළ මට්ටම තෙක්ම කැළෑවෙන් වැසීගොස් පවතී.

විවෘතව පැවති කාලයේ ඉහළ අලෙවියක් පෙන්වන ලද මෙම සමූපකාරය හොරණ කර්මාන්තපුරය පසුබිම් කරගත් භූමි භාගයක පිහිටා තිබීම හේතුවෙන් මෙලෙස වසාදමා තිබීම මහත් අපරාධයක් බව ප්‍රදේශවාසීහු පෙන්වාදෙති.

කල්පිටිය සමූහ සහ මුන්නේශ්වරම සමූහ

කැනඩා පනින්න ගිය 24ක් කුරක්කන්හේනේ මාළු වාඩියක

නාවික හමුදාවෙන් අල්ලා ගනී

නීතිවිරෝධී ලෙසින් මුහුදු මඟින් කැනඩාවට යාමේ බලාපොරොත්තුවෙන් කල්පිටිය කුරක්කන්හේන ප්‍රදේශයේ මාළු වාඩිවක ලැගුම්ගෙන සිටි පුද්ගලයන් 24 දෙනෙකු ඊයේ (11) අලුයම කල්පිටිය විජය නාවික හමුදා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් ප්‍රවාහනය සඳහා යොදාගත් ලොරි රථයක් ද ඒ සමඟ අත් අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් අතර එක් කාන්තාවක සහ කුඩා දැරියෝ දෙදෙනෙක් ද වෙති.

සැකකරුවන් මඩකළපුව ප්‍රදේශයේ පදිංචිකරුවෝ ය.

මෙම පිරිස රුපියල් ලක්ෂ තුන හා ලක්ෂ පහ බැගින් වන මුදලක් යාපනයේ පදිංචි තැරැව්කරුවකුට මීට මාසයකට පමණ ඉහත ලබා දී ඇත. තැරැව්කරුගේ උපදෙස් අනුව, පිරිස මඩකළපුව සිට වත්තලටත්, වත්තලින් කොළඹටත්,කොළඹ සිට මීගමුවටත් මීගමුවේ සිට කල්පිටිය දක්වාත් පැමිණ ඇත. අනතුරුව කල්පිටිය කුරක්කන්හේන ප්‍රදේශයේ මාළු වාඩියක නවාතැන්ගෙන සිට ඇත. ඔවුන්ව කුඩා කණ්ඩායම් වශයෙන් දියඹ ඇති බහුදින යාත්‍රාවක් කරා රැගෙන යෑමට කුඩා බෝට්ටු (ඩිංගී) එනතුරු රැඳී සිටියදී ඊයේ (11) අලුයම කල්පිටිය විජය නාවික හමුදා අත්අඩංගුවට මෙසේ පත්ව ඇත. සැකකරුවන් කල්පිටිය පොලිසියට භාර දීමට නියමිත ය.

බී. ඩබ්. ඩී. ධර්මකීර්ති - තඹුත්තේගම

වී වගාව කහ වීමේ රෝගයක්

අනුරාධපුර, පොලොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ඇතුළු දිවයිනේ ප්‍රදේශ රැසකින් වී වගාව කහ වීමේ රෝගයක් වාර්තා වීමත් සමඟ ගොවීන් දැඩි අපහසුතාවකට පත්ව ඇතැයි ඔවුහු පවසති. එම රෝගය පිළිබඳ සොයා බැලීම සඳහා බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කීටවිද්‍යා හා පර්යේෂණ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්. ආර්. සරත්චන්ද්‍ර මහතා පසුගියදා මහවැලි එච් කලපයේ තඹුත්තේගම නල්ලච්චිය ප්‍රදේශයේ වී වගාවේ කහ රෝගය ව්‍යාප්ත තිබෙනා ගොවිබිම් නිරීක්ෂණය කිරීම සඳහා ගොස් තිබිණි. එහිදී අධ්‍යක්ෂවරයා ගොවීන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදි.

එහිදී සරත්චන්ද්‍ර මහතා කියා සිටියේ මේ රෝගය සඳහා කරුණු කිහිපයක් බලපානා බවයි. නමුත් ගොවි මහතුන් ඉතා උනන්දුවෙන් තම වී වගාව පැළ ගොයමේ සිට නිරීක්ෂණය කරන්නේ නම් මේ සියලු රෝගයන් ආරම්භ වීමටත් පෙර හඳුනාගැනීමට හැකි වන බවත් එය සම්පූර්ණයෙන්ම පාලනය කරගත හැකි බවත් පවසා සිටියේය.

කළුතර මධ්‍යම විශේෂ

හරිත පා ගමනේදී මඟ දෙපස කුණු කසළත් එකතු කරති

මහා ශිව රාත්‍රිය යෙදී තිබූ ඊයේ (11) පාණ්දුර ගලගොඩ විහාරස්ථානයේ දී හරිත පා ගමනක් සහ රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි.

"කසළ නසන, වන වදුල රකින, සොඳුරු පරිසරයක් ගොඩනඟන හරිත පා ගමන සමඟ රුක් රෝපණය" ලෙස නම් කර තිබූ මෙම වැඩ සටහනේ අරමුණ, පාණ්දුර නගරයේ විවිධ පරිසර සංවිධාන හා ස්වේච්ඡා සංවිධානවලින් ලැබී තිබූ විවිධ පැළ වර්ග පාණ්දුර නගරයේ ගෙන්

ගෙට ගොස් බෙදා දී ඒවා රෝපණය කරමින් එම පැළවල නඩත්තුව හා පෝෂණය ද පවුල්වල බාලම සාමාජිකයාට භාර දෙමින් එම පුද්ගලයාගේ නමින් ම ලියාපදිංචි කොට එම ශාකයේ ඉදිරි පැවැත්ම හා ආරක්ෂාව සඳහා 'උප්පැන්නයක්ද ', සකස් කර දීම බව පා ගමන ආරම්භ වීමට පෙර රැස්ව සිටි පිරිස අමතමින් පාණ්දුර සර්වආගමික පදනමෙ සභාපති පාණ්දුර තොටමුණේ ප්‍රධාන සංඝනායක පාණ්දුර ගල්ගොඩ ශ්‍රීමහා විහාරාධිපති පොතුපිටියේ පඤ්ඤාසේකර මාහිමියෝ ප්‍රකාශ කළහ. පාණ්දුර වික්ෂෝප කතෝලික දෙවිමැදුරේ අධිපති ගීහාන් රිඩල් පියතුමාගේ සහභාගිත්වය සේ ම මේ පාගමනේ දී මාර්ගය දෙපස එකතු වී තිබූ කසළ එකතු කිරීම ද විශේෂත්වයක් විය.

සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

මෘදුකාංග නිර්මාණ තරගාවලියේ ජය සබරගමුව විශ්වවිද්‍යාලයට

විශ්වවිද්‍යාල ඉංජිනේරු, තාක්ෂණ පීඨ හා කාර්මික විශ්වවිද්‍යාල අතර පැවති පරිගණක මෘදුකාංග (කැඩ් ඩිසයිනින්) කාර්මික නිර්මාණ ජාතික තරගාවලියේ ජය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයට හිමි කර ගැනීමට සමත්ව ඇත. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ විද්‍යා පීඨයේ සබඳ අතාවුද ප්‍රථම ස්ථානය ලබමින් රුපියල් 150,000ක මුදල් ත්‍යාගයක් හිමි කරගෙන ඇති අතර එම තරගයේ සිව්වැනි ස්ථානය එම පීඨයේ කමිත් ජයවීර සිසුවා හිමි කර ගෙන තිබේ.

එම ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය පසුගියදා (09) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති කාර්යාලයේදී උපකුලපති මහාචාර්ය උදය රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

අම්බලන්ගොඩ සමූහ ආර්. සදාණදාස

'ගම සමඟ පිළිසඳර' 14 දා රත්ගම ගලගොඩ කනිෂ්ඨයේදී

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගී වන "ගම සමඟ පිළිසඳර" 14 වැනි වැඩසටහන රත්ගම මැතිවරණ කොට්ඨාසයේ මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් දුෂ්කර ගම්මානයක් වන ගලගොඩ කනිෂ්ඨ විද්‍යාලයීය භූමියේ දී මේ මස 13 දින පෙරවරුවේ පැවැත්වීමට කටයුතු යොදා තිබේ. මේ අවස්ථාවට ගාල්ල දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරුන් මෙන්ම රාජ්‍ය නිලධාරීන් හා මහජන නියෝජිතයන් ද සහභාගීවීමට නියමිතය. ප්‍රදේශයේ දැවෙන ප්‍රශ්න හා මහජන ගැටලු සියැසින් දැක බලාගෙන ඒවාට කඩිනමින් විසඳුම් ලබා දීම පිණිස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව මෙම ගම සමඟ පිළිසඳරක් වැඩසටහන ක්‍රියාවට නැංවෙයි.

මල්වාන සමූහ මහානාම විතානගේ

කාන්තාවන් තිදෙනකු ඇතුළු 15ක් සුරාබදු නිලධාරී අත්අඩංගුවට

මල්වානේ වල්ගම, කඳුබොඩ, හැලුම්මහර, මාකොළ, බියන්විල, හෙයියන්තුඩුව හා කඩවත යන ප්‍රදේශවල කසිප්පු අලෙවි කිරීමේ යෙදුණු කාන්තාවන් තිදෙනකු ඇතුළු පුද්ගලයන් 15 දෙනෙකු පුගොඩ සුරාබදු කාර්යාලයේ සුරාබදු නිලධාරීන් විසින් පෙරේදා හා පළමු දා යන දෙදින අත්අඩංගුවට ගන්නා ලදී. මොවුන් ළඟ තිබි කසිප්පු බෝතල් 31 කට වැඩි ප්‍රමාණයක් (මිලි ලීටර් 23500 ක්) තම භාරයට ගෙන තිබෙන අතර ඉන් එක් පුද්ගලකු ළඟ තිබි කසිප්පු පෙරීමට උපයෝගී කර ගන්නා තඹ දඟරයක් හා හිස් බැරල් ද සොයා ගැනිණි. එම ප්‍රදේශවලම පදිංචි මොවුන් මහර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට දැන් කටයුතු කර ගෙන යති.

එන්. නවරත්න - මීගහකිවුල සමූහ

ඔයේ වතුර වැඩි වුණොත් මිනියත් තියාගෙන ඉවුරට වෙලා ඉන්න වෙනවා

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභාපති ලලිත් ජයවර්ධන

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී සමන්ත කුමාර

ආර්. එම්. කරුණාපාල



එස්. එම්. චන්‍රපාල

එස්. එම්. ජයසුන්දර

බදුලුඔයේ අහස්මංකඩ තොටුපළ හරහා එහා මෙහා යෑමට පාලමක් නැති වීමෙන් මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තල්දෙන කොහාන, වැවතැන්න 11 කණුව, ගල්ගේලන්ද මාළිගාතැන්න ඇතුළු ගම්මාන රැසක දහස් සංඛ්‍යාත පිරිසකට බදුලුඔයේ කරවටක් ගිලෙමින් ඔය හරහා එහා මෙහා එගොඩ මෙගොඩ වීමට සිදුව ඇතැයි ගම්මු පවසති. ගමේ අයකු මියගිය අවස්ථාවන්හිදී ඔයෙන් එගොඩ පිහිටි සුසානභූමිය වෙත මළ සිරුර ගෙන යෑමට සිදුව ඇත්තේද කරවටක් ජලයේ ගිලෙමින් බවට ගම්මු පවසති.

මේ පිළිබඳ අදහස් දක්වමින් ආර්. එම්. කරුණාපාල මහතා මෙසේ පැවසීය.

"මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තල්දෙන කුකුරුමහන්තැන්න, කොහාන, වැවතැන්න 11 කණුව, ගල්ගේලන්ද කියන්නේ හරිම දුෂ්කර ගම්මාන කීපයක්. එදිනෙදා කරන ගොවිතැනකින් ජීවත්වෙන පිරිසක් තමයි මේ ගම්වල ජීවත් වෙන්නේ."

එස්. එම්. ජයසුන්දර මහතා,

මේ මිනිස්සුන්ගේ කුඹුරු තියෙන්නෙත් ඔයෙන් එහා පැත්තේ. පොදු සුසානභූමිය තියෙන්නෙත් වෙල පාමුල. ගමෙන් එහා තියෙන වෙල්යායට හරි සොහොනට හරි යනව නම් ගම හරහා ගලා යන බදුලුඔයෙන් එගොඩ වෙන්න ඕනෑ."

එස්. එම්. චන්‍රපාල මහතා,

"ඔය හරහා එගොඩ මෙගොඩ වීමට පාලමක් නෑ. ඒ නිසා ගමේ අය ඔයෙන් එගොඩ මෙගොඩ වන්නේ බදුලුඔයේ කරවටක් ගිලිලයි. ඔයේ උඩහ ප්‍රදේශයට හදිස්සියෙවත් වැහැලා ඔයේ වතුර වැඩි වුණොත් වතුර බහිනකන් ඔය ඉවුරට වෙලා මිනියත් තියාගෙන බලාගෙන ඉන්න වෙනවා. එහෙම නැති නම් වැලි පාරුවක තියලා පෙට්ටිය ගැට ගහලා තමයි එහා ගොඩට අරගෙන යන්නේ. විකල්ප පාරකින් එහා පැත්තට යනව නම් උඩහින් හරි පල්ලෙන් හරි කිලෝමීටර තුන හතරක් වටේ ගිහින් පාලමකින් එගොඩ වෙලා තමයි යන්නේ. වෙලට යනකොට දවසින් බාගයක් ඉවරයි. සමහර වෙලාවට මේ වතුර වැඩි වෙලාවට මිනිස්සු ඔයේ බැහැලා ඒගොඩ වෙන්න ගිහින් වතුරේ ගහගෙන ගිහිල්ලා අනතුරට ලක් වෙලත් තියෙනවා.

මිනිස්සු ජීවිත අවදානම නොතකා හරි ඔයෙන් එගොඩ වෙන්නෙ තමන්ට ජීවත් වෙන්න තියෙන එකම මාර්ගය වෙච්ච ගොවිතැන කර ගන්න. එහෙම නැත්නම් අවසන් ගමන් යන දවසට මිනිය අරගෙන යන්න."

මීගහකිවුල ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත කුමාර මහතා,

"ගම්වල මිනිස්සු විඳින මේ කරදර ගැන අපි හැමෝටම කියනවා. පහුගිය යහපාලන ආණ්ඩුව පාලමක් හදන්න පටන් ගත්ත. බැම් දෙක තුනක් බැන්ද. ඊක කාලෙකින් ඒ අය ආගිය අතක් නැති වුණා. දැන් අපිට කලින් වතුරෙ බැහැල ගිය තොටුපළත් අවහිර වෙලයි තියෙන්නේ. අඩුම තරමේ මේ ගැන අහන්න බලන්නවත් කෙනෙක් නෑ."

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභාපති ලලිත් ජයවර්ධන මහතා,

"යහපාලන ආණ්ඩුව සමයේ මේ ප්‍රදේශවල ආරම්භ කළ ව්‍යාපෘති රැසක්ම මේ විදියට අතරමඟ නවතා දමා තිබෙනවා. නමුත් අපි අවශ්‍ය යකඩ ගෙන්නගෙන මේක ඉක්මනින් අවසන් කරනව."

එස්. ලොකුකරවිට - කරාපිටිය සමූහ

වැකුණුගොඩ වැසියන් රැසකට ගුද මාර්ගයේ පිළිකා

ගාල්ලේ වැකුණුගොඩ කසළ කන්ද ආශ්‍රිතව ගාල්ල නගර සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති කවෂිමා ව්‍යාපෘතියට එරෙහිව අඛණ්ඩ සත්‍යග්‍රහයක් සහ මාරාන්තික උපවාසයක් ආරම්භ කරනා බවට ප්‍රදේශවාසීහු පවසා සිටිති. ඔවුන් චෝදනා කරන්නේ වසර ගණනාවක සිට මහජන විරෝධය නොතකා වැකුණුගොඩ වැල්මුරුංග කලපුව අසල කුණු ගොඩ ගැසූ ගාල්ල මහ නගර සභාව මහජන අදහස් නොතකමින් මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වැනි ආයතනවල ද අනුමැතියකින් තොරව නීති විරෝධී ලෙස කසළ කළමනාකරණයට යැයි පවසමින් අසාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් සිටිනා බවයි.මේ පිළිබඳ අදහස් දක්වමින් වැකුණුගොඩ පදිංචිකරුවකු වන කුමාර ආරච්චිගේ මහතා මෙසේ පැවසීය.

"මෙතන කුණු දැමීමෙන් මේ අවට පදිංචිකරුවන්ගේ ජීවිත පවා අනතුරට පත්ව තිබෙනවා. පර්යේෂකයන් පවසනවා මේ කුණු කන්ද නිසා වැසිකිළි වළවල්වලට පවා මීතේන් වායුව ඇවිත් වැසිකිළි කටෙන් පිටවන බව. දැන් එය සනාථ වෙලා මේ අවට ගෙවල් රැසක ගුද මාර්ග පිළිකා සැදුණු විශාල පිරිසක් ඉන්නවා. නගර සභාව මේකට වගකියන්න ඕනෑ. පරිසර අධිකරියේ කිසිදු අනුමැතියකින් තොරව මේ වගේ ඉදිකිරීම් කරනවා. නමුත් ඒවා හරියට ක්‍රියාත්මක වෙන්නේ නෑ. දැන් එක පැත්තක පරණ කුණුගොඩ වැල් වර්ගවලින් වැසී යන්න සලස්වලා අනිත් පැත්තේ තව කුණු ගොඩක් එකතු කරනවා. මේකට විරෝධය පළ කරමින් අපි කොතෙක් උද්ඝෝෂණ කළත් වැඩක් නෑ."

ලහිරු කුමාර මහතා,

"මැසි මදුරු කරදරයත් ඉවරයක් නෑ. මේ කුණු කන්දෙන් එන දුඟඳ නිසා අපිට ගෙවල්වල ඉන්න බෑ. මේ අපහසුතාව නිසා බොහෝදෙනකු හිසරදයෙන් පීඩා විඳිනවා. මේවාට කවුරුවත් විසඳුම් දෙන්නේ නෑ. ජපානයෙන් ත්‍යාගයක් ලෙස ලැබුණා කියා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ගෙනවිත් මෙතැන සවි කළා. නමුත් එය සාර්ථක දෙයක් නෙවෙයි කියලා අපි දන්නවා. නගර සභාව මෙතැනට කුණු දාන්නේ පාරිසරික නීති සියල්ල උල්ලංඝනය කරමින්. මේ ගැන වගකිව යුතු ආයතන සියල්ල නිහඬයි."



ලහිරු කුමාර මහතා



කුමාර ආරච්චිගේ මහතා

මේ පිළිබඳ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීර මහත්මියගෙන් විමසූ විට ඇය මෙසේ පැවසීය.

"මේ ඉඩමට කෙනෙක් නඩුවක් දාලා තියෙනවා. නඩුවට අදාළ නොවන කොටස නගර සභාවට දීමට අවශ්‍ය කටයුතු යොදා තිබෙනවා. තවම එය සම්පූර්ණ වුණේ නෑ."

වැකුණුගොඩ කුණු වත්තේ ක්‍රියාත්මකවන කවෂිමා ව්‍යාපෘතිය ගැන ගාල්ල නාගරික කොමසාරිස් ධුරයේ වැඩ ආවරණය කරනා රනිල් වික්‍රමසේකර මහතාගෙන් විමසූ විට හෙතෙම කියා සිටියේ කවෂිමා ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මේ වන විට අවසන් අදියරට පැමිණ ඇති බවයි. එය තවත් නොබෝ දිනකින් විවෘත කරනා බව ද හෙතෙම පැවසීය. ඉන් පසු කුණු කසළ සියල්ල කොම්පෝස්ට් බවට පත් කිරීමට කටයුතු කරනා බවත් ඒවා අලෙවි කිරීමෙන් නගර සභාවට ආදායමක් ගත හැකි බවත් කොමසාරිස්වරයා කියා සිටියේය.

බ්‍රසීලයේ පළමු වරට එක් දිනක කොවිඩ් මරණ 2,000 ඉක්මවයි

රෝගීන් වැඩි වීමෙන් බ්‍රසීලයේ නගර රැසක සුව සේවා දැඩි පීඩනයක



ආසාදන අනුපාතය ඉහළ යන බැවින් බ්‍රසීලයේ පළමු වරට එක් දිනක කොවිඩ් ආශ්‍රිත මරණ 2,000 ඉක්මවා ඇත. මරණ සංඛ්‍යාව 268,370 ක් වන එක්සත් ජනපදයට වඩා ලෝකයේ දෙවන වැඩිම මරණ සංඛ්‍යාව ඇත්තේ බ්‍රසීලටයි. බදාදා (10) දිනයේ මරණ මුළු එකතුව 2,286 කි. විශේෂඥයන් අනතුරු අඟවන්නේ සම්ප්‍රේෂණ වේගය වැඩි බෝවන ප්‍රභේද මගින් නරක අතට හැරී ඇති බවයි.

වසංගතය අතරතුරදී ගත් ජනාධිපති ජෙයාර් බොල්සොනාරෝගේ "මෝඩ" තීරණවලට හිටපු නායක ලුයිස් ඉනාසියෝ ලූලා ඩා සිල්වා පහර දුන්නේය. බදාදා මාසයකට පසු පළමු වරට වෙස්මුහුණක් පැළඳ සිටින අයුරු දැක්වෙන බොල්සොනාරෝ මහතා වයිරසය නිසා ඇති වන තර්ජනය අවතක්සේරු කිරීමට නිරන්තරයෙන් උත්සාහ කර ඇත.

මේ සතිය මුලදී ඔහු මිනිසුන්ට කීවේ "හිනාවීම නවත්වන්න" කියාය. රෝගීන්ගේ වැඩිවීම බ්‍රසීලයේ විශාලතම නගර බොහොමයක සෞඛ්‍ය පද්ධති දැඩි පීඩනයකට ලක්කර ඇති අතර බොහෝ ඒවා කඩා වැටීමට ආසන්නව ඇති බව බ්‍රසීලයේ ප්‍රමුඛ මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානයක් වන ෆියෝක්‍රස් අනතුරු අඟවයි. ෆියෝක්‍රස්හි වෛද්‍යවරයකු හා පර්යේෂකයකු වන මාග්‍රෙත් ඩල්කොල්මෝ පැවසුවේ රට "වසංගතයේ දරුණුතම මොහොතේ" පවතින බවයි. "2021 තවමත් ඉතා දුෂ්කර වසරක් වනු ඇත" ඇය ඒ.එෆ්.පී. ප්‍රවෘත්ති ඒජන්සියට පැවසුවාය.

ලොව වටා

AROUND THE WORLD

ජෝ බයිඩන්ගේ සහන පනතට කොංග්‍රසයේ අවසන් බාධකයත් ඉවත් කරයි

කොවිඩ් -19 වසංගතයේ බලපෑම සමඟ කටයුතු කිරීමට අමෙරිකානුවන්ට උපකාර කිරීමට ජනාධිපති ජෝ බයිඩන්ගේ ඩොලර් ට්‍රිලියන 1.9 සහන පනතට කොංග්‍රසයේ අවසන් බාධකය ඉවත් කර තිබේ. 220-211 ලෙස දැවැන්ත ආර්ථික ආධාර සැලැස්ම ජයග්‍රාහී ලෙස නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් බදාදා අනුමත කරන ලදී. මේ වන විටත් සෙනෙට් සභාව හරහා ගොස් ඇති සහන පැකේජය නීතියට අත්සන් කිරීම සඳහා බයිඩන් මහතාගේ මේසය වෙත යොමු වේ. මේ හයවන කොවිඩ් -19 සහන පනත බයිඩන් මහතාට ලැබුණු ප්‍රධාන ව්‍යවස්ථාමය ජයග්‍රහණයකි.

මේ පනත සම්මත වූයේ එක් ඩිමොක්‍රට්කයකු හැර අන් සියල්ලන්ම පක්ෂව ඡන්දය දීමෙනි. ධවල මන්දිර ප්‍රකාශක ජෙන් සාකි පැවසුවේ සිකුරාදා (12) ජනාධිපතිවරයා මේ පනත නීතියක් කිරීමට අත්සන් කරන බවයි. මේ පනත් කෙටුම්පත "මේ ජාතියේ කොඳු නාරටිය වන අත්‍යවශ්‍ය කම්කරුවන්ට, මේ රට ගොඩනඟන වැඩකරන ජනතාවට, මේ රට ඉදිරියට ගෙනයන ජනතාවට, සටන් කිරීමේ අවස්ථාවක් ලබා දීමක්" යැයි බයිඩන් මහතා පැවසීය. අමෙරිකානුවන්ට ප්‍රතිශක්තිකරණය ලබාදෙන බවට සහතික වීමෙන් පසු ඕනෑම අතිරික්ත කොවිඩ් -19 එන්නත් ප්‍රමාණයක් ගෝලීයව බෙදා ගැනීමට ඔහු පසුව පොරොන්දු විය. "අපට අතිරික්තයක් තිබේ නම්, අපි එය සෙසු ලෝකය සමඟ බෙදා ගන්නෙමුයි" ඔහු පැවසීය.

මියන්මාර හමුදා නියෝග ක්‍රියාත්මක කරන්න බෑ:

පොලිස් නිලධාරීහු පිරිසක් ඉන්දියාවට පලායති

පසුගිය මාසයේ කුමන්ත්‍රණයකින් බලය අත්පත් කරගත් හමුදාවේ නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු තමන් දේශ සීමාව හරහා ඉන්දියාවට පළාගිය බව මියන්මාරයේ පොලිස් නිලධාරීහු පිරිසක් බී.බී.සී.යට පවසා තිබේ. මේ පළමු සම්මුඛ සාකච්ඡාවලදී, මේ පිරිස කියා සිටියේ සිවිල් වැසියන් ඝාතනය කිරීමට හෝ ඔවුන්ට හානි කිරීමට තමන්ට බල කෙරෙනු ඇතැයි යන බියෙන් ඔවුන් පැන ආ බවයි. "විරෝධතාකරුවන්ට වෙඩි තැබීමට මට නියෝග ලැබුණා. මම ඔවුන්ට කීවා මට බැහැ කියා" වසර නවයක් තිස්සේ නයින්ග් (ඔහුගේ ආරක්ෂාව සඳහා ඔහුගේ නම වෙනස් කර ඇත) මියන්මාරයේ පොලිස් නිලධාරියකු ලෙස සේවය කර ඇත.

දැන් 27 හැවිරිදි ඔහු ඊසානදිග ඉන්දියානු ප්‍රාන්තයක් වන මිසෝරාම්හි සැඟවී සිටී. ඔවුන්ගේ විසි ගණන්වල සිටි පොලිස් නිලධාරීන් සහ කාන්තාවන් කණ්ඩායමක්, ඔවුන් තම රැකියාවෙන් පළාගොස් ආපසු ගෙදර යන බව පවසමින්, නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු "හමුදාවට එරෙහිව විරෝධය දක්වන අහිංසක මිනිසුන්ව ඝාතනය කිරීමට හෝ ඔවුන්ට හානි කිරීමට මට බල කෙරෙනු ඇතැයි මම බිය වෙමි," එක් නිලධාරියෙක් පැවසීය. "තේරී පත් වූ රජයක් පෙරළා දැමීම නිසා හමුදාව වැරැදිසි කියා අපට හැඟේ." ටැට්මඩාව ලෙස හැඳින්වෙන මියන්මාර හමුදාව පෙබරවාරි 1 වැනි දින බලය අත්පත් කරගත් දා සිට ප්‍රජාතන්ත්‍රවාදී ගැති විරෝධතාකරුවන් දහස් ගණනක් පාරට බැස ඇත.

අයිවරි කෝස්ට්හි අගමැති ජර්මනියේ දී මියයයි



අයිවරි කෝස්ට්හි අගමැති හමීඩ් බකයෝකෝ ජර්මනියේ රෝහලකදී මියගොස් ඇති බව බලධාරීහු පවසති. පිළිකා රෝගයට ප්‍රතිකාර ලබමින් සිටි බකයාකෝ සිය 56 වන උපන්දිනයට දින කීපයකට පසු බදාදා අභාවප්‍රාප්ත විය. ඔහුගේ පූර්වගාමියා වූ අමදූ ගොන් කූලිබාලිගේ හදිසි මරණයෙන් පසු ජූලි මාසයේදී ඔහු අගමැති ධුරයට පත්විය. ජනාධිපති ඇලසේන් ඔවාටාරා බකයෝකෝ මහතා විස්තර කළේ "ශ්‍රේෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයෙක්, තරුණයන්ට ආදර්ශයක් සහ ආදර්ශවත් පක්ෂපාතී මිනිසකු" ලෙසයි.

වෛද්‍ය පරීක්ෂණ සඳහා බකයෝකෝ මහතා පෙබරවාරි මාසයේදී ප්‍රංසයට ගෙන යන ලද අතර පසුව ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම හේතුවෙන් ජර්මනියට මාරු කරන ලදී. දේශපාලනයට යොමුවූ හිටපු මාධ්‍ය විධායකයකු වූ ඔහු සියවසේ පළමු දශකයේ අයිවරි කෝස්ට්හි සිවිල් යුද්ධයේදී ප්‍රමුඛ මැදිහත්වීමේ කාර්යභාරයක් ඉටු කළේය.

"ඔහු දේශපාලන ක්‍රීඩාවේ ප්‍රධාන ක්‍රීඩකයෙක් සහ ප්‍රතිසන්ධානයේ ප්‍රධාන ක්‍රීඩකයෙක් විය. එය සැබෑ ලැජ්ජාවක්" යැයි විපක්ෂයේ අයිවරියන් ජනප්‍රිය පෙරමුණේ ප්‍රකාශක ඉසියාකා සංගාරේ ඒඑෆ්පී ප්‍රවෘත්ති ඒජන්සියට පැවසීය.

ඔස්ට්‍රේලියානුවන්ට දේශීය නිවාඩු ස්ථාන රැසකට ගාස්තුවෙන් බාගයක් ගෙවා ගුවන් ප්‍රවේශපත් මිල දී ගත හැකියි

රජය කියයි

සංචාරක කර්මාන්තය නංවාලීම සඳහා නව යෝජනා ක්‍රමයක් යටතේ ඔස්ට්‍රේලියානුවන්ට දේශීය නිවාඩු ස්ථාන රැසකට ගාස්තුවෙන් අඩක් ගෙවා ගුවන් ප්‍රවේශපත් මිලදී ගත හැකි බව රජය පවසයි. සහනාධාර සහිත ගමනාන්ත ලැයිස්තුවට ගෝල්ඩ් කෝස්ට්,කේන්ස්, විටසුන්ඩේස්, ඇලිස් ස්ප්‍රින්ග්ස් සහ බෑම් ඇතුළත් වේ.

වසංගතය මධ්‍යයේ දේශීය සංචාරක අංශය පුනර්ජීවනය කිරීමට ඩොලර් බිලියන 1.2 ක යෝජනා ක්‍රමය අපේක්ෂා කරන බව රජය පවසයි. පසුගිය වසර මුල සිට දේශසීමා වසා දැමීම් සහ සංචාරක සීමා කිරීම් හේතුවෙන් එම කර්මාන්තයට දැඩි ලෙස පහර වැදී ඇත. අග්‍රාමාත්‍ය ස්කොට් මොරිසන් පැවසුවේ අප්‍රේල් සහ ජූලි අතර මිල අඩු ගුවන් ගමන් 800,000 ක පැකේජයක් රටේ සෙසු ප්‍රදේශවලට යෑමට ප්‍රදේශවාසීන් දිරිමත් කරන බවයි.

රජයේ "ජොබ්කීපර්" වැටුප් සහනාධාර ක්‍රමය මාර්තු මස අවසානයේදී අවසන් කිරීමට නියමිත නමුත් සංචාරක අංශය සාමාන්‍යයෙන් ජාත්‍යන්තර අමුත්තන් මත යැපෙන බැවින් තවමත් සහාය අවශ්‍ය බව මොරිසන් මහතා පැවසීය. සිඩ්නි ගුවන්තොටුපොළේදී මාධ්‍යවේදීන් අමතමින් ඔහු කියා සිටියේ, මිනිසුන් ඔවුන්ගේ රැකියාවල තබා ගැනීමට අපට ගුවන් යානා අහසට දැමිය යුතු අතර සංචාරකයන් බිම හෙළීමට අපට සිදුව ඇති බවයි. එහෙත් කම්කරු විපක්ෂය තර්ක කර ඇත්තේ මේ පැකේජය "තෝරා බේරා" ඇති අතර ප්‍රධාන වශයෙන් ගුවන් සමාගම්වලට ප්‍රතිලාභ ලබාදෙන බවයි. සංචාරක හා හෝටල් ක්‍රියාකරුවන් සඳහා සෘජු අරමුදල් නොමැති බව පෙන්වා දෙයි.

අවුන් සාන් සූකී නීතිවිරෝධීව ඩොලර් 600,000ක් සහ රන් බාරගෙන ඇතැයි චෝදනා

චෝදනාවට කිසිම සාක්ෂියක් නෑ

හමුදා පාලකයන් විසින් නෙරපා හරින ලද මියන්මාරයේ නායක අවුන් සාන් සූ කී නීතිවිරෝධී ලෙස ඩොලර් 600,000 ක් සහ රන් භාරගෙන ඇති බවට මියන්මාරයේ හමුදා පාලකයෝ චෝදනා කරති. මේ චෝදනාව පෙබරවාරි 1 වැනි දින සූ කී මහත්මිය සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය පෙරළා දැමීමෙන් පසුව මිලිටරිය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රබලම අවස්ථාවයි. චෝදනාවට කිසිදු සාක්ෂියක් සපයා නැත.

ජනාධිපති වින් මයින්ට සහ කැබිනට් ඇමැතිවරුන් කීපදෙනෙකුට දූෂණ චෝදනා එල්ල කළ බව බ්‍රිගේඩියර් ජෙනරාල් සැව් මින් ටුන් චෝදනා කළේය. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (එන්.එල්.ඩී.) සූ කීගේ පක්ෂය පසුගිය වසරේ පැවති මැතිවරණයෙන් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබාගත් නමුත් හමුදාව දැන් කියා සිටින්නේ මැතිවරණය වංචනික බවයි.

ස්වාධීන ජාත්‍යන්තර නිරීක්ෂකයින් හමුදාවේ ප්‍රකාශය පිළිබඳ විවාද මතු කර ඇත. ඔවුහු පවසන්නේ කිසිදු අක්‍රමිකතාවක් නිරීක්ෂණය නොකළ බවයි. සූ කී මහත්මිය පසුගිය සති පහක කාලයේ අනාවරණය නොකළ ස්ථානයක රඳවා සිටින අතර "බිය සහ අනතුරු ඇඟවීම" ඇති කිරීම, නීති විරෝධී ලෙස ගුවන් විදුලි උපකරණ ළඟ තබා ගැනීම සහ කොවිඩ් -19 සීමා කඩ කිරීම ඇතුළු චෝදනා කීපයකට මුහුණ දී තිබේ.

- නිවැරදි කිරීමකි -

ශ්‍රී ලංකා දුම්රිය සේවය
ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ජන්ක්ෂන් පිෂ්ප්ලේට්, බෝල්ට්ස් ඇන්ඩ් නට්ස් සහ 88 ibs ඩෝග් ස්පයික්ස් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F.7741

2021 මාර්තු මස 05 දින දිනමිණ පුවත්පතේ 30 පිටුවේ පළවූ දැන්වීමේ ඡේද අංක 04 පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

04. ලංසු භාරගැනීම 2021.04.20 දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 2.00 ට අවසන් කෙරේ.

දුරකථන අංක : 2438078 / 2436818 ෆැක්ස් අංක : 2432044
යොමු අංක : SRS/F.7741

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

ලංසු ආරාධනයයි

ඌව, බස්නාහිර, මධ්‍යම, උතුරු හා සබරගමුව පළාත්වල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලවලට තාපසුවිකාර්ය ද්‍රව්‍ය සැපයීම සහ ගෙනැවිත් දීම සඳහා ලංසු කැඳවීමේ කාල සීමාව දීර්ඝ කිරීම

කොන්ත්‍රාත් අංක: RDA/DPR/RMUP/2021/54, RDA/DPR/RMWP/2021/55,RDA/DPR/RMCP/2021/56, RDA/DPR/RMNP/2021/57, RDA/DPR/RMSABP/2021/58

1. ඉහත ව්‍යාපෘතිවලට අදාළව **2021.03.02** දින පල කරන ලද ලංසු ඇරයුමේ ලංසු කාල සීමාව **2021.03.17** සිට **2021.03.24** දක්වා දීර්ඝ කරන ලදී.
2. ලංසු ආරක්ෂණ **2021.07.21** දක්වා වලංගු විය යුතු ය.
3. ලංසු, **පිටපත් දෙකකින්** යුතුව, **2021.03.24** දින **පැය 14.00** හෝ එදිනට පෙර **සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, අමාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "මගනැගුම මහමැදුර" ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.
4. ලංසු **2021.06.23** දක්වා වලංගු විය යුතු ය.
5. **2021.03.02** වන දින පල කළ ලංසු ඇරයුමේ අනෙක් කොන්දේසි නොවෙනස්ව පවතී.

සභාපති
මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,
මාර්ග සංවර්ධන අධිකාරිය,
1 වන මහල, "මගනැගුම මහමැදුර",
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)

යෝජනා සඳහා ඉල්ලීමයි

ප්‍රධාන ජලාශවල උපයෝගිතා - පරිමාණයේ පාවෙන සූර්ය ව්‍යාපෘති දෙකක් සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම

ප්‍රසම්පාදන අංකය : SEA/PD/RES/10-2021

01. දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ප්‍රධාන ජලාශවල උපයෝගිතා - පරිමාණයේ පාවෙන සූර්ය ව්‍යාපෘති දෙකක් සඳහා ශක්‍යත අධ්‍යයනයක් සිදුකිරීම සඳහා, සුදුසුකම්ලත් සේවා සපයන්නන් වෙතින් ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින්, ලංසු කැඳවනු ලැබේ.

02. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, SLSEA ආයතනයේ වෙබ් අඩවිය වන www.energy.gov.lk වෙත පිවිසීමෙන්, ලංසුලේඛන පරීක්ෂා කොට බැලීමක්/ බාගත කිරීමක් කළ හැක. ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් ඒ සඳහා ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 1,000.00, ලංකා බැංකුවේ ටොරිංටන් චතුරශ්‍ර ලංකා බැංකු ශාඛාවේ 453 පිහිටි SLSEA ආයතනයේ පොදු ගිණුම් අංක 0074944408 වෙත මුදලින් ගෙවිය යුතුය.

03. ඉහත ගෙවීම් කොට ලබාගත් ලදුපතේ පිටපතක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. එසේ ලදුපතේ පිටපතක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. එම ලදුපතේ ස්කෑන් කළ පිටපත්, procurement.slsea@gmail.com සහ slseafinance@gmail.com වෙත එවිය යුතුය. ලංසු ලේඛනයන්හි සඳහන් පරිදි මේ සම්බන්ධ පෙර ලංසු හමුවක්, 2021 මාර්තු 19 දින පෙරවරු 10.00 ට මාර්ගත ක්‍රමවේදය තුළින් පැවැත්වීම නියමිතය.

04. මුදු, තැබූ ලංසු, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "ප්‍රධාන ජලාශවල උපයෝගිතා - පරිමාණයේ පාවෙන සූර්ය ව්‍යාපෘති දෙකක් සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, 01 වන මහල, 5 ඒකකය, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට එවීමෙන් හෝ BMICH හි 5 ඒකකයේ, 01 වන මහලේ, SLSEA කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් 2021 අප්‍රේල් 19 දින පෙරවරු 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, රටෙහි පවත්නා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, ලංසුකරුවන්ගේ පුද්ගලික සහභාගීත්වයෙන් තොරව ලැබී ඇති ලංසු විවෘත කරනු ලබන අතර, අවශ්‍ය වෙතොත් ලංසුකරුවන්හට, මාර්ගත ක්‍රමවේදය තුළින් එයට සහභාගි විය හැකිය. ඒ සඳහා ඔවුන් විසින් "ගූගල් මීට්" හරහා කවරයේ (ලංසුව) පිටපත ඊමේල් ලිපිනයක් සඳහන් කිරීමෙන් සබඳතාවයක් (LINK) ලබාගත හැක. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා රුපියල් 100,000.00 වටිනා ලංසු ඇපකරයක්, මුදලින්, ඉහත 2 උප වගන්තියේ සඳහන් SLSEA පොදු බැංකු ගිණුම් අංකය වෙත තැන්පත් කිරීමෙන් හෝ විශේෂිත ආකෘතිය ප්‍රකාරව, 2021 අගෝස්තු 03 දින දක්වා වලංගු බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

05. අවශ්‍ය වැඩිදුර විස්තර, දුරකථන අංක 0112677445 හෝ 0112676515 දිගුව 430 මගින් කාර්යාල වේලාවන් තුළ ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,
1 වන මහල, 5 ඒකකය, BMICH,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථනය : 94(0) 112677445 ෆැක්ස් : 94(0) 112682534
ඊමේල් : info@energy.gov.lk වෙබ් අඩවිය : www.energy.gov.lk

2021 මාර්තු 12 දින

දිනමිණ රැකී රක්ෂා

322

ඇඬෑර්තු
මේසන්වරු/වඩුබාස්වරු

මේසන් බාස්වරු, අත්උදව්කරුවන් අවශ්‍යයි. ආහාර / නවාතැන් පහසුකම් ඇත. 0777311468, 0718475041 018527

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

ඇඬෑර්තු
කාර්මික තාක්ෂණ ආයතනය
තාක්ෂණ අමාත්‍යාංශය

ප්‍රධාන පරිගණක පද්ධති ඉංජිනේරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021-03-26 වැඩි විස්තර සඳහා 2021-03-12 Daily News පුවත්පත බලන්න.

අධ්‍යක්ෂ ජනරාල් / ප්‍ර.වි.නි.
කාර්මික තාක්ෂණ ආයතනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)

ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති අංශය සඳහා පුළුල් වූ සන්නිවේදන (යාකරන) අතුරු මුහුණතක් (INTERFACE) ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සබඳතා නියෝජිතායතනයක (PR) සේවය ලබාගැනීම

ප්‍රසම්පාදන අංක : SEA/PD/OP/02-2021

01. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් සේවා සපයන්නන් වෙතින්, ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති අංශය සඳහා පුළුල් වූ සන්නිවේදන (යාකරන) අතුරු මුහුණතක් (Interface) ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින්, සුදුසු මහජන සබඳතා නියෝජිතායතනයක් තෝරාගැනීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

02. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, අදළ ලංසු ලේඛන SLSEA ආයතනයේ වෙබ් අඩවිය වන www.energy.gov.lk වෙතින් පරීක්ෂා කොට බැලීමත් / බාගත කිරීමත් කළ හැක. ලංසු ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් ඒ සඳහා ලංකා බැංකුවේ ටොරිංටන් චතුරස්‍ර ශාඛාවේ (453) පවත්නා SLSEA ආයතනයේ පොදු ගිණුම් අංක 074944408 වෙත, මුදලින් **ශ්‍රී ලංකා රුපියල් 1,500.00 ක්** ගෙවිය යුතුය.

03. ඉහත මුදල් ගෙවා ලබාගත් ගෙවුම් ලදුපතේ පිටපතක් ලංසුව සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ගෙවුම් ලදුපත් පිටපත් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. එම ලදුපතේ ස්කෑන් කරන ලද පිටපතක්, procurement.slsea@gmail.com සහ slseafinance@gmail.com වෙත එවිය යුතුය.

04. මුදු, තැබූ ලංසු, අදළ කවරයේ වම් ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති අංශය සඳහා පුළුල් වූ සන්නිවේදන අතුරු මුහුණතක් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සබඳතා නියෝජිතායතනයක් තෝරා ගැනීම - SEA/PD/OP/02-2021"** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, 01 වන මහල, 5 ඒකකය, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට එවීමෙන් හෝ BMICH හි 5 ඒකකයේ, 01 වන මහලේ, SLSEA කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් 2021 අප්‍රේල් 01 වන දින **පෙරවරු 10.30** ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම දැනට රටෙහි පවත්නා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, ලංසුකරුගේ පුද්ගලික සහභාගීත්වයෙන් තොරව ලැබී ඇති ලංසු විවෘත කරනු ලබන අතර, අවශ්‍ය වෙතොත් ඔවුන්හට, "ගූගල් මීට්" හරහා මාර්ගගතව සම්බන්ධ විය හැකි අතර, එසේ මාර්ගගත හමුව වෙත සම්බන්ධවීම (LINK) සඳහා (ලංසු) කවරයේ පිටතින් ඊමේල් ලිපිනයක් සඳහන් කළ යුතුවේ. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් 100,000.00 වටිනා ලංසු ඇපකරයක්, මුදලින් ඉහත උපවගන්ති 2 ප්‍රකාරව SLSEA පොදු බැංකු ගිණුම වෙත තැනැපත් කළ හැකි අතර, නැතහොත් උපලේඛනයෙහි නියමිත, 2021 ජූනි 25 දින දක්වා වලංගු බැංකු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය.

05. අවශ්‍ය වැඩිදුර විස්තර, කාර්යාල වේලාවන් තුළදී දුරකථන අංක 0112677445 හෝ 0112676515 දිගුව 430 මගින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,
1 වන මහල, 5 ඒකකය, BMICH,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථනය : 94(0) 112677445 ෆැක්ස් : 94(0) 112682534
ඊමේල් : info@energy.gov.lk වෙබ් අඩවිය : www.energy.gov.lk

2021 මාර්තු 10 දින

BE BETTER INFORMED!

Dinamina Daily News Thinakaran

News you can trust now free on your mobile phone.

Visit - **apps.lakehouse.lk**

DOWNLOAD TODAY!



AVAILABLE AT

LAKE HOUSE

දවසේ රාහු කාලය

මාර්තු 12 සිකුරාදා උදේ 10-50 - 12.21 රාත්‍රී 10.50 - 12.20 දක්වා

දින තත්ත්වය

කුම්භ රවි 28 භාග නවම් අව තුදුස්වක තිථිය ලත් කිවි දින ඉර උදාව 6.19ට ඉර බැසීම 06.22ට සියාවස නැකත රාත්‍රී 10.54න් ගෙවී පුවපුටුව නැකත ලබයි. නවම් අව තුදුස්වක තිථිය සවස 03.07න් ගෙවී අමාවක තිථිය ලබයි. සිද්ධ යෝගය උදේ 08.31න් ගෙවී සාධ්‍ය යෝගය ලබා පවතී. විෂ්ඨිකරණය අලුයම 02.51න් ගෙවී ශකුණ කරණය ලබා එය සවස 03.07න් නිමා වී චතුස්පාදකරණය ලබයි.

විෂ කලාව - ලිංග - යෝනි අමෘත කලාව - පතුල

මරු සිටින දිසාව - ගිනිකොන යෝගිණී - දකුණ සුබ දිසාව - නැගෙනහිර

සුබසෙත
ජ්‍යෙෂ්ඨ කර්තෘ
ප්‍රවීණ
ජ්‍යෙතිෂවේදී
අජිත්
ධර්මසිරි

දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

උදේ
06.19 සිට 07.19 දක්වා - සිකුරු හෝරාව
07.19 සිට 08.19 දක්වා - බුධ හෝරාව
08.19 සිට 09.19 දක්වා - සඳු හෝරාව
09.19 සිට 10.19 දක්වා - සෙනසුරු හෝරාව
10.19 සිට 11.19 දක්වා - ගුරු හෝරාව
11.19 සිට 12.19 දක්වා - කුජ හෝරාව

සවස
12.19 සිට 01.19 දක්වා - රවි හෝරාව
01.19 සිට 02.19 දක්වා - සිකුරු හෝරාව
02.19 සිට 03.19 දක්වා - බුධ හෝරාව
03.19 සිට 04.19 දක්වා - සඳු හෝරාව
04.19 සිට 05.19 දක්වා - සෙනසුරු හෝරාව
05.19 සිට 06.19 දක්වා - ගුරු හෝරාව

රාත්‍රී
06.19 සිට 07.19 දක්වා - කුජ හෝරාව
07.19 සිට 08.19 දක්වා - රවි හෝරාව
08.19 සිට 09.19 දක්වා - සිකුරු හෝරාව
09.19 සිට 10.19 දක්වා - බුධ හෝරාව
10.19 සිට 11.19 දක්වා - සඳු හෝරාව
11.19 සිට 12.19 දක්වා - සෙනසුරු හෝරාව

අලුයම
12.19 සිට 01.19 දක්වා - ගුරු හෝරාව
01.19 සිට 02.19 දක්වා - කුජ හෝරාව
02.19 සිට 03.19 දක්වා - රවි හෝරාව
03.19 සිට 04.19 දක්වා - සිකුරු හෝරාව
04.19 සිට 05.19 දක්වා - බුධ හෝරාව
05.19 සිට 06.19 දක්වා - සඳු හෝරාව

බබාට නමක්

මෙදින රාත්‍රී 10.54 දක්වා සියාවස නැකත යෙදෙන අතර, නම් තැබීම සඳහා ගො, ස, සි, සු අකුරු ද ඉන් පසු උදා වන පුවපුටුව නැකතට අනුව සෙ, සො, ද, දි අකුරු ද දිනට අදාළව ච, ජ, ඡ අකුරු ද මුල්කොට නම් තැබීම සුබ වේ.

දවසේ ලග්න පලාපල

මේෂ ලග්නය - විවාහ ස්ථානගත අන්‍යෝන්‍ය සුහදත්වය

මේෂ ලග්නය හිමි ඔබට අද දින සිය ආර්ථික වශයෙන් සතුටුදායක වෙයි. රාජ්‍ය තාන්ත්‍රික ඇප උපකාර ලැබෙන රාජ්‍ය ගෞරවයට ලක්වන දිනයකි. විශේෂයෙන් තම සහකරු හෝ සහකාරිය අතර සුහදතාවය ආරක්ෂා වීම නිසා තවදුරටත් තම ආර්ථිකය සපල ගන්වා ගැනීමට ද හැකිවේ. ස්වඋත්සාහය දැඩි වන දිනයකි. තුනටියට යම් ආපදා තත්ත්වයක් විය හැකි නිසා පරිස්සම් වන්න. වාහනවලින් ගමන් කිරීමේදී අධික වේගය සුදුසු නැත.

වෘෂභ ලග්නය - යුග දිවියට තුන්වන පාර්ශ්වයකින් බාධා

වෘෂභ ලග්නයට අදාළව අද දින තම අධිෂ්ඨානය පල ගන්වමින් රැකියාගත අභිවෘද්ධිය උදාවේ. තම වෘත්තීය දැනුමට තව තවත් දැනුම් සම්භාරයක් ලැබෙන දිනයකි. කෙසේ නමුදු තම ආත්ම අභිමානය සලකා වැඩි කාලයක් ගත කිරීමට උනන්දු වේ. ඒ අතර සමාජසේවා කටයුතුවලට ප්‍රමුඛත්වය දෙනු ඇත. සිතට වදදෙන කරුණු කීපයක් නිසා පසුතැවීමට ලක්වන අතර, පසුබෑමකට ද හේතු වෙයි. යුගදිවියට විවිධ බාධා කිරීම් හා තුන්වන පාර්ශ්වයකින් අවහිරතා ද පැන නගී.

මිථුන ලග්නය - දියුණුවට හේතු වන කරුණක් සපල වේ

මිථුන ලග්නයට අනුව ඔබට ඔබගේ දියුණුවට හේතු වන කාරණා කීපයක් මල්පල ගැන්වෙනු ඇත. යටිබඩට අපල මතු කෙරේ. පාදයේ වසර කීපයකට පෙර සිදු වූ ආපදාවක අතුරු ආපදා යළි පැන නගින තත්ත්වයක් පෙන්වයි. තම දියුණුවට විශාල කැප වීමක් පරිශ්‍රමයක් දැරීමට සිදු වේ. තම ආර්ථික මට්ටමේ ක්‍රියාකාරකම් අතර, කිසියම් ගනුදෙනුවකදී සිදු වන අතපසුවීමක් නිසා පාඩු සිදු වීමේ අවදානමක් ඇත. කිසියම් සකසුරුවම් බවකින් කටයුතු කළ හැකි නම් විය හැකි ව්‍යාකූලතා මගහරවා ගත හැකිය.

කටක ලග්නය - හදිසි ධන හානි

කටක ලග්නයට අදාළව අද දින ඔබට වියැ හැකි අසුබතාවක් අනුව හදිසි ධන හානියක් පෙන්වයි. තම අපරික්ෂාකාරී බව හේතුකොට ගෙන සිදුවන මෙම ධන හානිය අවම කර ගැනීමට තම එදිනෙදා කටයුතු කෙරේ සැලකිලිමත් විය යුතුයි. ආදරය, ආලය සම්බන්ධ කටයුතුවලදී විශ්වාසය ගොඩනැගෙන අයුරින් කටයුතු කිරීම සුබවාදී වෙයි. තම ඥාති පාර්ශ්වයෙන් එල්ලවන විවිධ විරෝධතා නිසා තමාට දවසේ කටයුතු අතපසු වී යෑමටද පුළුවන.

සිංහ ලග්නය - උත්සාහයේ තරමට ප්‍රතිඵල

සිංහ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනයක් වෙයි. චන්ද්‍රයා 7 වැන්නේ රවි හා බුධ සමඟ සංයෝගවී සිටීම යුගදිවිය සඵල භාවයට පත්කෙරෙන පිහිටීමකි. තම ගෘහ ජීවිතයේ අලුත් අලුත් ක්‍රියාමාර්ග කීපයකින් ආර්ථික අභිවෘද්ධිය උදා වන අතර, සිතේ සතුට සමාදානය උදාකෙරෙනු ඇත. දූ දරුවන් පිළිබඳ දැඩි කැපවීමක් දැරීමට සිදු වේ. තම උත්සාහයේ තරමට ප්‍රතිඵල උදාකර ගත හැකි දිනයකි. දණහිස ආශ්‍රිත උවදුරු පෙන්වයි.

කන්‍යා ලග්නය - විදේශ සබඳතා ගොඩනැගේ

කන්‍යා ලග්නයට අනුව අද ඔබට පුණ්‍යවන්ත කටයුතු රැසක නියැලීමට අවස්ථාව උදාවේ. ඒ අවස්ථාවලදී බාහිර සමාජය සමඟ ගැටෙන තත්ත්වයක් නිසා බොහෝදෙනකුගේ අප්‍රසාදයට ද පාත්‍ර වීමට සිදුවේ. තම ඇසුරට පත්වන කෙනකු නිසා විවිධ අපවාද චෝදනා රැසක් එල්ලවන නමුත්, ඉතා සුපරික්ෂාකාරී ලෙස කටයුතු කළහොත් උවදුරු අවම කරවා ගත හැක. විදේශ සබඳතා ගොඩ නැගෙන අතර, උසස් ගණයේ ආයෝජනයකට ද කටයුතු සැලසේ.

තුලා ලග්නය - අධ්‍යාපන කටයුත්තකින් උසස් ප්‍රතිඵල

තුලා ලග්නය හිමි ඔබට අද දින ජීවිතයේ කලක් සතුටු විය හැකි අවස්ථා කීපයක් උදාකර ගැනීමට හැකි වේ. අධ්‍යාපන කටයුත්තක උසස් ප්‍රතිඵල සම්මුඛ පරීක්ෂණයක උසස් ජයග්‍රහණ මෙන්ම දරු සම්පත් අපේක්ෂා කරන අයට වාසනාවන්ත දරු සම්පත්ද ආර්ථික අභිවෘද්ධිය උදෙසා ගන්නා ක්‍රියාමාර්ග සපල වීම ද පෙන්වයි. තම කුස ආශ්‍රිත ආපදා සැර උෂ්ණ ආහාරපානාදියෙන් අගුණද ඇත.

වෘශ්චික ලග්නය - අධිෂ්ඨානශීලි ජයග්‍රහණයක්

වෘශ්චික ලග්නය හිමි ඔබට අද දින බාහිර සමාජයෙන් එල්ල වන බාධා කිරීම් කීපයක් හමුවේ පසුතැවෙන ගතියක් පෙනෙන්නට තිබේ. තම ආත්ම අභිමානය දුර්වල වන තැනට කටයුතු සැලසුණත් එඩිතර ලෙස ගන්නා ක්‍රියාමාර්ග කීපයක් නිසා අධිෂ්ඨානශීලී ජයග්‍රහණයක් ලැබේ. වාහන ලාභ ඉඩම් හා නිවාස ලාභ මෙන්ම නිවෙසේ උත්සවශ්‍රියක් ඉසිලීම හා මංගල උත්සවයකට සහභාගිව බොහෝ දෙනකු සමඟ සතුටින් ගත කිරීමට අවස්ථාව උදාවේ.

ධනු ලග්නය - දේපළ උරුමයක් ලැබේ

ධනු ලග්නයට අනුව අද ඔබට තමා අපේක්ෂා කළ ජයග්‍රහණ කීපයක් බුක්ති විඳීමට හැකිවේ. සමාජ ගැටලුවක් නිරාකරණය කර ගැනීමට ගන්නා උත්සාහයක් සපලවන ලකුණු පෙනේ. දේපළ ගැටලු විසඳේ. තම සහකරුට හෝ සහකාරියට හිමි විය යුතු දේපළක උරුමය නිසි වේලාවට ලැබේ. තමාට විරුද්ධව කිසියම් කෙනකු ගෙන තිබූ නීතිමය කටයුතුවලින් නිදහස් වීමට ද හැකි වේ. පාදයේ වළලුකර අගුණ මෙන්ම මූත්‍ර ගල් අවදානම නිසා යටි බඩේ ශල්‍ය කර්ම කිරීමට පවා සිදුවේ.

මකර ලග්නය - හදිසි ධන ලාභ

මකර ලග්නය හිමි ඔබට ධන සම්පතක හිමිකමක් උදාකරන දිනයකි අද දිනය. ලැබුණු දේ ආරක්ෂා කර ගැනීමට යුහුසුලු විය යුතු දිනයකි. නැතහොත් එය ක්ෂණයෙන් විය පැහැදම් වන නැති නාස්තිවන බවක් පෙනෙන්නට තිබේ. මගතොට ගමන් කිරීමේදී තම ස්වර්ණාභරණවලට සොර සතුරු බලවේග ක්‍රියාත්මක විය හැක. කුස ආශ්‍රිත උවදුරු හා අක්මාගත රෝගවලින් පෙළෙන අය තෙල් කෑම සැර කෑම වැලඳීමෙන් වැළකී ආරක්ෂා විය යුතු දිනයකි. හිතේ කලක් පැවතුනු බලාපොරොත්තුවක් මල්පල ගන්වා ගැනීමට හැකි වන දිනයකි.

කුම්භ ලග්නය - අධිෂ්ඨානය සපලවේ

කුම්භ ලග්නය හිමි ඔබට අද දින ඉතා සතුටින් තම කටයුතු කරගෙන යාමට අධිෂ්ඨානය ලැබෙන දිනයකි. උත්සාහයේ තරමට ප්‍රතිඵල ලැබේ. අත්හැර දමා තිබූ කටයුත්තක් යළි ආරම්භ කිරීමට උනන්දු වන අතර, අධ්‍යාපනික ජයග්‍රහණ කීපයක් නිසා සමාජයේ කැපී පෙනෙන තත්ත්වයකට පත්වේ. රැකියාගත කාර්යබහුලතාව නිසා ශාරීරික වශයෙන් අපහසුතා දැනෙන අතර, සුපරික්ෂාකාරි නොවුවහොත් තම සුළු සුළු වැරදි නිසා සතුරු බලවේග ක්‍රියාත්මක වන දිනයක් ද වන්නට පුළුවන.

මීන ලග්නය - වෙහෙසකාරී දිනයක්

මීන ලග්නය හිමි ඔබට අද දින සිය වාසස්ථානයෙන් බැහැර යාමට සිදු වන අතර, තම කටයුතු ක්‍රියාවට නැංවීමේදී විශාල වෙහෙසක් පරිශ්‍රමයක් දැරීමට සිදු වේ. තම දියුණුවට බාධා කරමින් සිටින පිරිසකගේ තොරතුරු තමාට දැන ගන්නට ලැබේ. පිටරට ආයෝජන, පිටරට සහසම්බන්ධතා මතු කෙරෙනු ඇත. යටපත්වී තිබූ මාර්ගයක් යළි විවරවීම තුළ ආර්ථික සම්පත් හිමිකමක් ද මතු කෙරේ. උරහිස ආශ්‍රිත උවදුරු පෙන්වන නිසා උඩනැගීම් බිම පැනීම්වලදී සුපරික්ෂාකාරී වන්න.

58 වන ජන්ම දිනය සමරන
මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමියෝ

(මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමිපාණන් වහන්සේගේ 58 වන ජන්ම සැමරුම ඊයේ (11) දිනයට යෙදී තිබිණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි)

වර්තමාන මහාසඟ පරපුරට ආදර්ශවත් වූත්, විනයධර, ධර්මධර, සුපේෂල, ශික්ෂාකාමී, බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ අතර එහි අග්‍රස්ථානයෙහිම වැඩ හිඳින ආගමික, ශාසනික මෙහෙවරකට එහා ගිය මහා යුග මෙහෙවරක් ඉටු කරන මහා යතිවරයාණන් වහන්සේ නමක වන ධර්මපාලවරු හා ධර්මපාල පරපුර සහ පරපුරක උරුමය යන ජාතික සංවිධානයන්හි නිර්මාතෘ, කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමිපාණන් වහන්සේගේ 58 වන ජන්ම සැමරුම ඊයේ (11) දිනයට යෙදී තිබුණි.

වර්ෂ 1963 මාර්තු 11 වන දින දිවුලපිටිය, ඉඳුරාගාර නම් ග්‍රාමයේ ජන්මලාභය ලැබූ උන්වහන්සේ වර්ෂ 1973 මැයි 16 වන වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ පැවිදි බිමට ඇතුළත්ව ඇති අතර වර්ෂ 1983දී පැවිදි උපසම්පදාව ලබා ඇත. වර්ෂ 1968-1973 දක්වා ඉඳුරාගාර සිරිපැරකුම් කනිෂ්ඨ විද්‍යාලයේදී ගිහි කළ මූලික අධ්‍යාපනය ලබා ඇති අපගේ පින්වත් බුද්ධ පුත්‍රයන් වහන්සේ පැවිදිව වර්ෂ 1975-1979 දක්වා ඉහළ මඩම්පැල්ල ශාන්ති නිකේතන විද්‍යාපීඨ පිරිවෙනෙන් සහ බලගල්ල සරස්වතී පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.

තවද 1978 වර්ෂයේ ප්‍රාචීන ප්‍රාරම්භක විභාගය සමත්වීම හා 1979 වර්ෂයේදී අ.පො.ස. සා/පෙළ විභාගය සහ ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වී ඇති අතර වර්ෂ 1986දී ප්‍රාචීන අවසාන විභාගය හා රාජකීය පණ්ඩිත උපාධිය ලබා ඇත. ශාස්ත්‍රපති උපාධිය ඇතුළුව ගෞරව උපාධි කීපයක් ලබා ඇති උන්වහන්සේ කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය (අනුරාධපුර), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය ඇතුළු විශ්වවිද්‍යාල ගණනාවක කටයුතු කරමින් ලක්ෂ සංඛ්‍යාත ගිහි පැවිදි විද්‍යාර්ථයන් රැසක් බිහි කරන්න වෙහෙසන සැබෑම වූ ගුරු දේව භූමිකාවක නිරත යතිවරයාණන් වහන්සේ නමකි.

විටෙක උන්වහන්සේ දෙස් විදෙස් පතල විචිත්‍ර ධර්ම දේශකයාණන් වහන්සේ නමකි. එපමණක් නොව අප රටේ විවිධ කතා බහට ලක්වන මතවාදයන්ට සෘජුව සිය මතවාදය නිරවුල්ව තාර්කිකව ඉදිරිපත් කරන අපේ කාලයේ මහා පඬිරුවනකි.

දෙස බස රැක රට දැය සම්බුදු සසුන ඔපවත් කළ අල්පේච්ඡ ගුණයෙන් හෙබි මේ හෙළ දෙරණේ පිනට පහළ වූ අපේ පින්වත් ගුරු දේවයන් වහන්සේට උතුම් වූ තෙරුවන් ගුණ බලයෙන් නිදුක් නිරෝගී චිර ජීවනයම ලැබේවායි රටවැසි අපි මෙත් සිතින් පතමු.

ප්‍රශාන් රාජපක්ෂ
ජාතික විධායක සභික
ධර්මපාලවරු සහ ධර්මපාල පරපුර

අමෙරිකාවෙන් උණපදුරට !



මීට වසර හතළිහකට පෙර, එනම් 1981 මුල් කාර්තුවේ දිනෙක උදෑසන නුවර පාරේ උණපඳුර හන්දිය ස්පර්ශ කළ අපි වේවැල්දූව කඳුගැටය පිය මැන කැලණි සරසවි භූමියට ප්‍රවේශ වීමු. ඒ අපේ ජීවිතයේ හොඳම කාලපරිච්ඡේදයේ ආරම්භක පියවර විය. අප පිළිගැනීම උදෙසා සැදී පැහැදී සිටි ජ්‍යෙෂ්ඨ උත්තමයෝ පෝලිමේ යන හැටි ද ෆයිල් කවර සිරසෙහි තබා උසස් අධ්‍යාපනයට ගරු කරන හැටි ද අපට කියා දුන්හ. එය සිදු වූයේ යුද්ධයකට යන හමුදා බළ ඇණියකට ආඥාවක් නිකුත් කරන රළු විලාසයකින්ය. එහෙත් පෙරළා බලන විට සොඳුරු ආඥාදායකත්වයක් ද අර්ථදායක නියෝගයක් ද එහි තිබිණි. එදා රැග් එක අද රැග් එක තරම් මුග්ධ නොවීය.

විශ්වවිද්‍යාල ජීවිතයක අරුමය කිමැයි කෙනකු ප්‍රශ්න කළහොත් ඊට දිය හැකි හොඳම පිළිතුර වන්නේ නිදහස් හා ස්වාධීන ජීවිතයකට පෙරහුරුවක් සේම ජීවිත ගොඩනැගීමේ පදනම ද එහි ඇත යන්නය. විශ්වවිද්‍යාල යනු සිය දහස් ගණන් ජීවිත ගොඩනගන මානව සම්පත් කේන්ද්‍ර වේ. ඒවා අඛණ්ඩව හා අනලස්ව ස්වකීය සේවාවේ නිරතව සිටී. විද්‍යාර්ථියා ශාස්ත්‍ර ඥානය පමණක් නොව, ජීවත්වීමේ කලාව ද මෙහිලා උගනී. සමාජානුයෝජනය, මානව සබඳතා, සාමූහිකත්වය හා මූල්‍ය විනය විද්‍යාර්ථියාට නොමිලේ ලැබෙන අගනා පාඩම්ය.

පුංචි පුංචි ආරවුල්, මත ගැටුම්, පෙම්හබ, විවේචන පැවැතිය ද කලාතුරකින් ගුටි කෙළියක් ඇති වුව ද ඒ සියල්ල තාවකාලිකය. කිසිවකු තවෙකකු හා තරහ නැත. වෛර නැත. අපට තිබුණේ පොදු අරමුණුයැයි කිව හැකිය. 1981 සිට 1985 දක්වා කාල පරාසයෙහි සිදු වූ සංසිද්ධි කීපයක් ජීවිත මතක පොතෙන් මකා දැමිය නොහැකිය. ඉන් පළමුවැන්න අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහි ශිෂ්‍ය අරගලයයි. එය අතිසාර්ථක සටනක් වූ අතර, චීනයේ ඓතිහාසික ශිෂ්‍ය අරගලවලට සමාන විය. මේ සටනේදී අපේම සහෝදරියකගේ පාදයක් පොලිස් අශ්වයකුගේ කුර පහරින් දෙකට කැඩිණි. එබඳු ශිෂ්‍ය අරගල යළි කිසිදිනෙක ඇති වන්නේ නැත. දෙවන සිද්ධිය නම්, 1983 කළු ජූලියයි. කැලණිය, දළුගම, කිරිබත්ගොඩ වැනි ප්‍රදේශ ගැටුම්වලින් පිරී පැවැතිණි. ශිෂ්‍ය ප්‍රජාව ජාතිවාදයට එරෙහි වුව එය වැළැක්වීම සඳහා කළ හැකි දෙයක් නොවීය. අප අතින් සිදු වූයේ එහි කම්පනය දරා සිටීම පමණි. කෘරත්වය අත්දුටු සමහරුන් ඒ වෙනුවෙන් කවි හා වෙනත් ප්‍රබන්ධ රචනා කළහ. 1984 සමුගැනීමේ සාදයකට එක්තරා සහෝදරයෙක් දැලි පිහියක් රැගෙන ආවේය. සාදයකට දැලි පිහියක් කුමට? සිදු වන්නට ගිය බරපතළ දෙයක් නතර වූයේ පුද්ගලයා ඉවුරකට හේත්තු කොට කම්මුල් පහරක් දී එළවා දැමීමෙන්ය. අතීතය විවිධාකාර සිදුවීම්වලින් ගහනය.

දැන් අප ගමන් කරනුයේ ඉතිහාසය දිගේය. ජපන් පඬිවරයකු වන ෆුන්සිස් ෆුකුයාමාට අනුව ඉතිහාසය අවසන්ය. ඔහු ඒ සම්බන්ධයෙන් විවාදාපන්න පොතක් ලියා තිබේ. ඊට විචාරයක් සපයන මහාචාර්ය ස්ටැන්ලි හොෆ්මන් 'දී එන්ඩ් ඔෆ් හිස්ට්‍රි' යනු නොටෝරියස් රචනාව කැයි සඳහන් කරයි. තව කතාවකට අනුව අතීතය ගැන ආඩම්බරවීම මුළාවකි. අතීතය ගැන ශෝකවීම මෝඩකමකි. කුමක් වුව ඉතිහාසය මානව සමාජයෙන් දුරස් කළ නොහැකිය. ඉතිහාසයේම ප්‍රති නිර්මාණයක් වන අතීතස්මරණය සඳහා මිනිසා සිය ජීවිත කාලයෙන් සැලකිය යුතු කොටසක් වෙන් කරයි. උපාධිධාරියකුට ඇති තරම් අතීතස්මරණ තිබේ. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් කේම්බ්‍රිජ් යන විශ්වවිද්‍යාලවල ආදී විද්‍යාර්ථීයෝ කලාපීය වශයෙන් සංගම් පිහිටුවාගෙන වාර්ෂිකව උත්සව පවත්වති. ඇතැම් විට සරසවි දෙකට අයත් සංගම්වල සුහද හමු පවත්වති. ශ්‍රී ලංකාවේ ද මෙබඳු සංගම් කීපයක් ඇත.

සංගම් පිළිබඳ අපේ කතාව ඇතට දිව යයි. එය වරින් වර උඩට පැමිණ යළි යට ගියේය. සංගම් පිළිබඳ කතිකාව ද අපේ පරිකල්පන සීමාවෙන් ඔබ්බට පැමිණ යථාර්ථයක් බවට පත් වූයේ නැත. එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය යටතේ සංගම් සිහිනය යථාර්ථයක් බවට පත්වීම හැම අතෙකින්ම පුදුම සහගතය. පොලොන්නරුවේ සෙනවි, අමෙරිකාවේ ගොඩගේ, හොරණ පාලිත, එංගලන්තයේ ගංගා, කුරුවිට විජේ, ගම්පහ අශෝක එහි පෙරමුණ ගත්හ.

'ෂූම්' සන්නිවේදන තාක්ෂණය ඔස්සේ

දැන් අප ගමන් කරනුයේ ඉතිහාසය දිගේය. ජපන් පඬිවරයකු වන ෆුන්සිස් ෆුකුයාමාට අනුව ඉතිහාසය අවසන්ය. ඔහු ඒ සම්බන්ධයෙන් විවාදාපන්න පොතක් ලියා තිබේ. ඊට විචාරයක් සපයන මහාචාර්ය ස්ටැන්ලි හොෆ්මන් 'දී එන්ඩ් ඔෆ් හිස්ට්‍රි' යනු 'නොටෝරියස් රචනාවකැයි' සඳහන් කරයි.

අපේ පළමු රැස්වීම පසුගිය පෙබරවාරි 29දා පැවැත්විණි. ගොඩගේ සභාපතිවරයා ලෙස රැස්වීම මෙහෙයවීය. ඉතාලියේ අනිල් පසුබිම් සංගීතය ද සමඟ ගීතයක් ගායනා කළේය. මහාචාර්ය උපුල් ඉන්දියාවේ සිට ඊට එකතු විය. එක අතෙකින් විද්‍යාව, තාක්ෂණය හා සන්නිවේදනය විසින් ලෝකය කුඩා කරනු ලැබේ. තව අතෙකින් මානව අවකාශ වැඩි කරනු ලැබේ. අප එහි පල නෙළාගත යුතුය.

අපේ කණ්ඩායම හැඳින්විය හැක්කේ 1980/81 කැලණි සරසවි කලා පීඨයේ ආදි විද්‍යාර්ථීන් හැටියටය. වෘත්තීය ජීවිතයේදී කලා උපාධියට ඇති වටිනාකම අඩු බව කියති. කලා උපාධිය නම් ගුරු පත්වීමක් පමණි යැයි සමාජ මතයක් ද පවතී. එහෙත් අපේ කණ්ඩායම එම මතය අනාථ කර තිබේ. මහාචාර්යවරු, දිසාපතිලා, සංස්ථා සභාපතිලා, අමාත්‍යාංශ ලේකම්ලා පමණක් නොව කැපී පෙනෙන විදුහල්පතිවරු ද අපට සිටිති. මේ එකමුතුව රටට හා ලෝකයට වැඩක් කරන සංවිධානයක් කරා ගෙන යා හැකිය.

අපේ පළමු රැස්වීම ආගන්තුකය. එමෙන්ම තරමක් හැඟුම්බරය. හමුවීම හා වෙන්වීම ජීවන යථාර්ථයකි. අප පළමුවරට හමුවී ඇත්තේ මීට වසර හතළිහකට පෙරාතුවය. ඉක්බිති වසර තුනකින් පිරිසක් වෙන්ව ගියහ. වසර හතරකින් තවත් පිරිසක් වෙන්ව ගියහ. ගෙවී ගිය වසර තිස් ගණන තුළ බොහෝ දේ සිදු වී ඇත. කෙනකු ජීවිතය හැර ගොසිනි. තව කෙනකු ලෙඩ ඇඳේය. තවත් කෙනකු ගැන කිසිදු ආරංචියක් නැත. අපේ රැස්වීම මේවා සමතුලනය කරන වේදිකාවක් විය හැකිය.

දීර්ඝ කාලයකට පසු නැවත හමුවීම හැඟීම් දනවන සංවේදී අවස්ථාවකි. එදා දඟකාර වියේ පසු වූ හුරුබුහුටි තරුණියෝ අද දරුවන් දෙතුන් දෙනා ඇති අම්මලාය. ඔවුන්ගේ මුහුණුවල ඇත්තේ වගකීම් සහිත තැන්පත් විලාසයකි. එදා අතිධාවනකාරී වූ ජවසම්පන්න තරුණයෝ අද වැදගත් මහත්වරු වෙති. ඔවුන්ගේ කතාබහ හැසිරීම් වෙනස්ය. අතීතයේ තෙල්බැම්ම, සයිබීරියාව, ලෙනින් ශාලාව, පොල්වත්ත, කැන්ටීම, බණ්ඩාරනායක නිවාසය, වීරසූරිය නිවාසය, පුස්තකාලයේ සිටි කිසිවකු අද නැත. ජනසන්නිවේදන අංශයේ ප්‍රේමේගේ කොණ්ඩය මුළුමනින්ම සුදු වී ඇත. වරායේ ජයා පමණක් තවම තරුණය. එහි කිසියම් රහසක් තිබිය යුතුය. අපේ රැස්වීම ජීවන යථාර්ථය පිළිබඳ ඉඟියක් ලෙස පවතී.

කාලය ගෙවී ගොස් අප වැඩිහිටියන් වී ඇති ආකාරය පුදුම සහගතය. අවුරුදු හැට, හැටට ආසන්න හා හැට පැනපු ආදී ලෙසින් අපේ වයස් සීමාවන් සටහන් කර තැබිය හැකිය. එක්තරා විග්‍රහයකට අනුව වයස හැට යනු ජීවිතයේ තවත් ආරම්භයකි. හැටෙන් පසු නව ජවයකින් ජීවිතය යළි ආරම්භ කළ හැකිය. අලවතුරේ අබේවික්‍රම ඒ බව හඟවන කවියක් ගායනා කළේය. දැන් අප බලා සිටිනුයේ ඊළඟ රැස්වීම් වාරය පැමිණෙන තුරුය.

රන්ජන් අමරරත්න

නුවරඑළිය ක්‍රිකට් කිරුළ කොත්මලේ කිංග්ස් දිනයි

නුවරඑළිය දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති වනජීවි සහ වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මහතා අතින් කිංග්ස් පිලට ශූරතා කුසලාන. ශ්‍රී ලංකා ක්‍රිකට් උප සභාපති රවින් වික්‍රමරත්න, ලේකම් මොහාන් ද සිල්වා මහත්වරු ද මෙහි වෙති.

නුවරඑළිය දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සංවිධාන කළ නුවරඑළිය ප්‍රිමියර් ලීග් 2021 (එන්පීඑල්) ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට කොත්මලේ කිංග්ස් කණ්ඩායම සමත් විය.

කණ්ඩායම් 5ක සහභාගිත්වයෙන් රදැල්ල ක්‍රීඩාංගණයේ පැවැති තරගාවලියේ අවසන් මහා තරගයේදී කොත්මලේ කිංග්ස් පිල හමුවේ මස්කෙළිය සන්රයිසස් කණ්ඩායම කඩුලු 5කින් පරාජයට පත් විය.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් සන්රයිසස් පිල ඕවර 18.2කදී ලකුණු 105කට සීමා කළ කිංග්ස් ක්‍රීඩකයෝ ඕවර 19කදී ජය හිමි කර ගත්තේ කඩුලු 5ක් දැවී තිබියදීය.

ජයග්‍රාහී කිංග්ස් පිලට රෙහා ස්ටීල් කුසලානය සමඟ රුපියල් එක්ලක්ෂ පනස් දහසක මුදලක් පිරිනැමුණු අතර, අනුශූරයන්ට රුපියල් ලක්ෂයක ත්‍යාග මුදල් හිමි විය.

තරගාවලියේ වීරයා ලෙස ජෙගනාදන් සමිතන් සම්මාන දිනා ගත් අතර, තුන් ඉරියව් දස්කම් දැක්වූ චන්දන වසන්ත (කිංග්ස්) අවසන් තරගයේ වීරයා සම්මානය හිමි කර ගත්තේය. තරගාවලියේ දක්ෂතම පන්දු යවන්නා ගයාන් බෝපිටිය (ග්ලැඩියේටර්ස්), දක්ෂතම පිතිකරු මයුර විජේසිංහ (සන්රයිසස්), නැඟී එන ක්‍රීඩකයා දිනුක සඳරුවන් (ග්ලැඩියේටර්ස්) සම්මාන දිනා ගත්හ.

සැඟවුණු දක්ෂතා ඇති තරුණ ක්‍රීඩකයන් ජාතික තලයට රැගෙන යෑමේ අරමුණින් සංවිධාන කළ මේ තරගාවලියට කොත්මලේ, හඟුරන්කෙත, වලපනේ, මස්කෙළිය, නුවරඑළිය ආසන 5ක් නියෝජනය වන අයුරින් කොත්මලේ කිංග්ස්, හඟුරන්කෙත ටස්කර්ස්, වලපනේ නයිට් රයිඩර්ස්, මස්කෙළිය සන්රයිසස් සහ නුවරඑළිය ග්ලැඩියේටර්ස් කණ්ඩායම් එක් වූහ. එම කණ්ඩායම් අතරට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ 17කින් ක්‍රීඩකයන් සිව්දෙනා බැගින් එක් කර තිබූ අතර, ක්‍රීඩා සමාජ 3කින් ක්‍රීඩකයන් දෙදෙනකු බැගින් අවුරුදු 19න් පහළ ක්‍රීඩා කරන ක්‍රීඩකයන් 8 දෙනකු බැගින් ද එම කණ්ඩායම්වලට එක්ව සිටියහ.

තරගාවලියේ සමාරම්භක උත්සවය සහ ජය සංකේත ප්‍රදානය නුවරඑළිය දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති වනජීවි සහ වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා, උප සභාපතිවරුන් වන ජයන්ත ධර්මදාස හා රවින් වික්‍රමරත්න සමඟින් ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා, භාණ්ඩාගාරික ලසන්ත වික්‍රමසිංහ, නුවරඑළිය ක්‍රිකට් සංගමයේ ලේකම් ජගත් ජයසුන්දර යන මහත්වරුන් ද ත්‍යාග ප්‍රදානෝත්සවයට එක්ව සිටියහ.

ශූරතාව දිනූ කොත්මලේ කිංග්ස් කණ්ඩායම ආරාධිතයන් සමඟ.

ගමින් ගමට ක්‍රීඩා පිටි සංවර්ධනය

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව දිපව්‍යාප්තව ආරම්භ කළ ග්‍රාමීය ක්‍රීඩාංගණ 332ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ වැඩ අරඹන ලද ක්‍රීඩාංගණ කිහිපයකි මේ.

මාවනැල්ල අධ්‍යාපන කලාපයට අයත් රඹුක්කන කොට්ඨාසයේ කිරිවල්ලපිටියට අශෝක මහා විද්‍යාලයීය ක්‍රීඩාංගණය මීටර් 400 ධාවන පථයක් සහිතව සංවර්ධන කිරීමට පියවර ගෙන තිබේ. මේ ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු සොයා බැලීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පසුගියදා එහි සංචාරයක නිරත විය. එම අවස්ථාවට රාජ්‍ය අමාත්‍ය කනක හේරත්, රඹුක්කන ප්‍රාදේශීය සභා සභාපති අතුල හඳගම මහත්වරුන් ඇතුළු පිරිසක් ද එක්ව සිටියහ.

ඡායාරූපය - රඹුක්කන උතුර සමූහ
විපුල එස්. කුමාරතුංග

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රන්ගේගම ක්‍රීඩාංගණය සඳහා වැඩ ආරම්භ කිරීම කැගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුදත් මංජුල මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු විය. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපති දුම්න්ද ගාමිනීද මහතා ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සහ රාජ්‍ය නිලධාරීන් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

ඡායාරූපය - පරකඩුව විශේෂ
ඇහැළියගොඩ රංජන් මඩගම්මන

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිටිපොළ ක්‍රීඩාංගණය සංවර්ධන කිරීමේ වැඩ ආරම්භ කිරීම ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් එන්. ධර්මපාල මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා උප සභාපති රුවන් ලියනගේ මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

ඡායාරූපය - පරකඩුව විශේෂ
ඇහැළියගොඩ රංජන් මඩගම්මන

12න් පහළ බාලිකා චෙස් හෙට-අනිද්දා

කරන්දෙණිය සමූහ, අනුරාධ ප්‍රියදර්ශන

ශ්‍රී ලංකා චෙස් සම්මේලනය සංවිධාන කරන වයස 12න් පහළ බාලිකා ඔන්ලයින් රැපිඩ් චෙස් තරගාවලිය හෙට (13) සහ අනිද්දා (14) දෙදින පැවැත්වේ.

ශ්‍රී ලංකා චෙස් සම්මේලනයේ සභාපති හා අන්තර්ජාතික චෙස් ක්‍රීඩා විනිසුරු ලක්ෂ්මන් විජේසූරිය මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම සම්මේලනයේ නිල වෙබ් අඩවිය ඔස්සේ මේ තරගාවලිය පැවැත්වේ.

මේ තරගාවලියට සහභාගී වන ක්‍රීඩිකාවන් සංඛ්‍යාව අනුව තරග වට සංඛ්‍යාව තීරණය කෙරේ. ඒ අනුව ක්‍රීඩිකාවන් සියයකට අඩු නම් තරග වට 7ක්ද ක්‍රීඩිකාවන් සංඛ්‍යාව ඊට වැඩි නම් තරග වට 8ක්ද ක්‍රියාත්මක කරන අතර, ක්‍රීඩිකාවන් දෙසීය දෙනකු සහභාගීවේ නම් තරග වට 9කින් තරගාවලිය පැවැත්වීමට නියමිතය.

තරගාවලියේ ජයග්‍රාහිකාවන්ට රන්, රිදී හා ලෝකඩ පදක්කම් පිරිනැමෙන බව ශ්‍රී ලංකා චෙස් සම්මේලනය පවසයි.

වාන් ඇළ රක්ෂිතයේ වොලිබෝල් පිටියක් එපා

තිරප්පනේ ප්‍රාදේශීය සභාවට විරෝධයක්

තිරප්පනේ සමූහ ඩී.ජේ. දිසානායක
සහ මරදන්කඩවල සමූහ

තිරප්පනේ මහ වැවෙහි වාන් ඇළ රක්ෂිතයේ රුපියල් ලක්ෂ පහළොවක වියදමින් දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා තිරප්පනේ ප්‍රාදේශීය සභාව කටයුතු යොදමින් සිටින බව තිරප්පනේ මහසෙන් ගොවි සංවිධානය කියයි.

කෙසේ වෙතත් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලැබුණු මේ දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණය වාන් ඇළ රක්ෂිතයේ ඉදිකිරීම පිළිබඳ තිරප්පනේ මහසෙන් ගොවි සංවිධානය දැඩි ලෙස විරෝධය පළ කරන බව ද කියා සිටී.

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය මඟින් රට පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරන ග්‍රාමීය ක්‍රීඩාංගණ ඉදිකිරීමේ ව්‍යාපෘතියට සමගාමීව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන අතර, මේ ව්‍යාපෘතියේ කටයුතු පසුගියදා ආරම්භ කිරීමට කටයුතු යොදා තිබිණි.

පසුගිය 2019 වර්ෂයේ දී ද මේ වාන් ඇළ රක්ෂිතය කේන්ද්‍ර කර ගෙන තිරප්පනේ ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පොදු වෙළෙඳ සංකීර්ණයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය ද ගොවි සංවිධානයේ විරෝධතාව හමුවේ නවතා දැමීමට සිදු විය. එහිදී එම රක්ෂිතය ඇතුළු භූමි කොටස මැනුම් කටයුත්තකින් නිරවුල් කර දෙන ලෙස ගොවි සංවිධානය විසින් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් ඇත. එහෙත් කිසිදු මැනුම් කටයුත්තක් සිදු නොකර භූමිය වෙන් කර නැති වටපිටාවක දී නැවත වරක් එම රක්ෂිත කොටසෙහි ඉදිකිරීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කෙරෙහි ගොවි සංවිධානය දැඩි ලෙස කනස්සල්ල පළ කර සිටී.

ආදි සෝකියන්ස් විස්සයි20 ක්‍රිකට් ඉරිදා

කරන්දෙණිය සමූහ, අනුරාධ ප්‍රියදර්ශන

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය ආදි ක්‍රිකට් එකමුතුව සංවිධාන කරන ආදි සෝකියන්ස් විස්සයි20 ක්‍රිකට් තරගාවලිය ඉරිදා (14) අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

මේ තරගාවලියට ධර්මාශෝක විදුහල් ආදි ක්‍රිකට් කණ්ඩායම් හයක් වයස් කාණ්ඩ 3ක් යටතේ සහභාගි වීමට නියමිතය.

අවුරුදු 20-35ත් අතර, අවුරුදු 35-45ත් අතර හා අවුරුදු 45ට වැඩි ලෙස එම කණ්ඩායම් සමන්විත වන අතර, එක් එක් වයස් කාණ්ඩයට කණ්ඩායම් දෙක බැගින් කණ්ඩායම් හයක් මේ තරගාවලියට සහභාගී වන බව තරග සංවිධායකයෝ කියති.

ජාතික යෞවන ක්‍රීඩා උලෙළට සූදානම්

වැලිගම සමූහ, ටී.කේ. මහින්ද

ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශ්‍ය එක්ව ක්‍රියාත්මක සංවිධාන කරන 33 වැනි ජාතික යෞවන ක්‍රීඩා උලෙළ මේ වසරේ පැවැත්වීමට විධිවිධාන යොදා ඇතැයි ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති තෙෂාර ජයසිංහ මහතා පවසයි.

ක්‍රීඩා උලෙළේ පළමු අදියරේ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි ඒ මහතා කියයි. කොරෝනා වසංගතය හේතුවෙන් පසුගිය වසරේ ක්‍රීඩා උලෙළ නොපැවති අතර, එම ක්‍රීඩා උලෙළ මේ වසරේ පැවැත්වුවහොත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ වයස් කාණ්ඩවල ගැටලු ඇති විය හැකි බැවින් 32 වැනි ක්‍රීඩා උලෙළ අත්හැර දැමීමට කටයුතු කළේය.

අවුරුදු 20න් පහළ සහ ඉහළ ලෙස වයස් කාණ්ඩ දෙකක් යටතේ මේ ක්‍රීඩා උලෙළ පැවැත්වෙන අතර, මේ සඳහා සහභාගි විය හැක්කේ 2021 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 15-29ත් අතර වයස් සීමාවේ පසුවන යෞවන සමාජ ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ටය. මලල ක්‍රීඩා ඉසව් හා සියළු කණ්ඩායම් තරග ඉසව්වන්ගෙන් ක්‍රීඩා උලෙළ සමන්විත වන අතර, ලබන මස 30 වැනි දිනට පෙර සියලු ප්‍රාදේශීය තරග අවසන් කිරීමට නියමිත අතර, අනතුරුව දිස්ත්‍රික් යෞවන ක්‍රීඩා තරගත්, ලබන ජූනි මස 15 වැනිදායින් පසුව ජාතික මට්ටමේ කණ්ඩායම් තරගත් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

පවතින කොරෝනා තත්ත්වය සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය උපදෙස් පරිදි ක්‍රීඩා තරගාවලිය පැවැත්වීමට සැලසුම් කර ඇති අතර, මේ වසරේ ක්‍රීඩා උලෙළ සඳහා ලියාපදිංචි කටයුතු 'ඔන්ලයින්' හරහා සිදු කිරීමටත් කටයුතු යොදා ඇත.

www.nyscsports.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ක්‍රීඩා උලෙළට අදාළ තොරතුරු ගත හැකි වන අතර, වැඩි විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත තරුණ සේවා නිලධාරී මහත්ම, මහත්මීන්ගෙන් ලබාගත හැකිය.

ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය අද සහ හෙට දියවන්නාවේදී

ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය විසින් මෙහෙයවනු ලබන 36 වැනි ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය අද (12) සහ (13) රාජගිරිය, කොස්වත්ත දියවන්නා ඔය ආශ්‍රිතව පැවැත්වෙයි. ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගමේ පූර්ණ අනුග්‍රහයෙන් පැවැත්වෙන මේ ශූරතාවලියට අවුරුදු 14න් පහළ, 16න් පහළ, 18න් පහළ සහ අන්තර් මධ්‍යම හා විවෘත කාණ්ඩ යටතේ තරග ඉසව් ඇතුළත්ය. ප්‍රවීණ මෙන්ම ආධුනික ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් තරග වදින ජාතික ඔරු පැදීමේ ශූරතාවලියේ විවෘත තරග අංශය වඩාත්ම කැපී පෙනෙන හා තරගකාරිත්වයෙන් යුතු තරග ඉසව්ව වන අතර, ඒ සඳහා ප්‍රබලතම තරගකරුවෝ රැසක් එක්වී සිටිති.

ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ කොවිඩ් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් පැවැත්වෙන මේ ශූරතාවලියට අදාළ තරග ඉසව් 8 යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 150කට වැඩි පිරිසක් එක්වී සිටිති.

එස්එල්ටී - මොබිටෙල් අනුග්‍රහයේ පැවැති එළියකන්ද කඳු තරණයේදී වේගවත්ම යතුරුපැදි ධාවකයාගේ වාර්තාවත් අලුත් කිරීමට සමත්වූ ජේඩින් ගුණවර්ධනට සදර්න් මෝටර්ස් ස්පෝර්ටස් සංගමයේ සභාපති ආචාර්ය සංජය සේදර සෙනරත් මහතා අතින් කුසලානය පිරිනැමූ අයුරු.

ඡායාරූපය - ප්‍රියාන් ද සිල්වා

ලංකාපුර ප්‍රාදේශීය සභාව හා ලේකම් කාර්යාලය වොලිබෝල් ජය ලබති

ලංකාපුර සමූහ
එච්.එල්. ද සොයිසා

ලංකාපුර ප්‍රාදේශීය සභාව එම කොට්ඨාසය තුළ ප්‍රථම වරට සංවිධාන කළ වොලිබෝල් තරගාවලියේ පිරිමි ශූරතාව දිනා ගැනීමට ලංකාපුර ප්‍රාදේශීය සභා කණ්ඩායම සමත් වූ අතර, කාන්තා ශූරතාව ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධව සේවය කරන බහුකාර්ය සහායිකාවන්ගේ කණ්ඩායම සතු විය.

ජයග්‍රාහී පිරිමි කණ්ඩායම ඩබ්.එම්.එස්.පී.බී. විජේකෝන්ගේ නායකත්වයෙන් සහ කාන්තා කණ්ඩායම කෞෂල්‍යා ජයකොඩිගේ නායකත්වයෙන් තරග කළ අතර, එම කණ්ඩායම් හමුවේ පිළිවෙළින් යූ.ඩී. රසාංග උඩගම මෙහෙයවූ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ සිතාරා පතිරණගේ නායකත්වයෙන් තරග කළ ලංකාපුර ප්‍රාදේශීය සභා කණ්ඩායමට හිමි විය.

මේ තරගාවලියට පිරිමි කණ්ඩායම් 9ක් සහ කාන්තා කණ්ඩායම් 5ක් එක්ව සිටියේය.

ඡායාරූප - ලංකාපුර සමූහ

S-Ion සහ NAITA අවබෝධතා ගිවිසුමක

එස්ලෝන් ලංකා (පෞද්) සමාගම සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) අතර පවතින එකඟතාව තවත් වසර 3 කින් දීර්ඝ කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට දෙපාර්ශ්වය විසින් පසුගියදා අත්සන් තබන ලදි. මේ එකඟතාව යටතේ, සක්‍රීය සාමාජිකයන් 7,000 කට අධික සංඛ්‍යාවක් සිටින එස්ලෝන් ජලනළ කාර්මිකයන්ගේ සමාජයේ සාමාජිකයන්ට සිය වෘත්තීය ජීවිතයේ දියුණුව සඳහා අතිශයින්

වැදගත් වන පුහුණුව හා සුදුසුකම් පිරිනැමීම සිදු කෙරේ.

නවීන තාක්ෂණයන් හා ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් පුහුණුවක් දීම, නවෝත්පාදනය සඳහා මංපෙත් විවර කරදීම, රැකියාව තුළදී අනතුරු ඇති වීමේ ඉඩකඩ අවම කිරීම සහ ජාතික හා අන්තර්ජාතික පිළිගැනීමක් සහිත NTTiy සහ NVQ වැනි සුදුසුකම් පිරිනැමීමේ ක්‍රම ඔස්සේ ජලනළ කාර්මිකයන්ට වඩාත් ගෞරවණීය ලෙස තම වෘත්තීය කටයුතු කරගෙන යෑමට අවස්ථාව සලසා දෙමින්, පාරිභෝගිකයන්ට වඩාත් යහපත් හා වෘත්තීයමය සේවාවක් දීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම මේ එකඟතාවෙහි ප්‍රධාන අරමුණු ලෙස හැඳින්විය හැක. දැනටමත් ජලනළ කාර්මිකයන් 2,000 කට අධික පිරිසක් මේ වැඩසටහන ඔස්සේ වෘත්තීය සුදුසුකම් හිමිකරගෙන තිබේ. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාවට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපති තරංග නලින් ගම්ලත් මහතා සහ කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂ එස්. සී. වීරසේකර මහතා ඇතුළු පිරිසක් එක්වූහ.

ස්වදේශී කොහොඹ කෑරගල රජමහා විහාරය ආලෝකවත් කරයි

ශාකසාර සත්කාර නිෂ්පාදනයේ පුරෝගාමියා සහ වෙළෙඳ පොළ ප්‍රමුඛයා වන කඳානේ ස්වදේශී කර්මාන්තායතනය සිය සමාජ සත්කාර වැඩසටහනක් ලෙසින් ඓතිහාසික කෑරගල රජමහා විහාරයේ 'ආලෝක පූජාව' වෙනුවෙන් පසුගියදා අනුග්‍රාහක දායකත්වය සපයන ලදි. ස්වදේශී සමාගමේ සභාපතිනී, අමරි විජයවර්ධන මහත්මියගේ සංකල්පයක් ලෙස 'ස්වදේශී කොහොඹ ආලෝක පූජා සත්කාරය' සත්වැනි වරටත් දුරුතු පුර පසළොස්වක පොහෝ දින සංවිධාන කෙරිණි.

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කෑරගල රජමහා විහාරය, 13 වැනි සියවසේ දඹදෙණි රාජධානිය තුළ විජයබාහු රජ සමයේ ඉදි කර ඇත. පද්මාවතී පිරිවෙන ස්ථාපිත කර ඇත්තේද කෑරගල රජමහා විහාරයේය. ඒ 15 වැනි සියවසේ හයවැනි පරාක්‍රමබාහු පාලන සමයේදීය.

ස්වදේශී කර්මාන්තායතනයේ සභාපතිනී, අමරි විජයවර්ධන මහත්මිය ආලෝක පූජා වැඩසටහන වෙනුවෙන් සිය අදහස් පළ කළේ මෙසේය. ඊමෙවැනි වාර්ෂික ආලෝක පූජාවන්ට සහයෝගය දැක්වීම මගින් ස්වදේශී, ශ්‍රී ලාංකික සමාගමක් ලෙසින් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සාම්ප්‍රදායික උරුමය ආරක්ෂා කරමින් සාම්ප්‍රදායික වටිනාකම් හා සිරිත් විරිත් ඉහළට ඔසවා තබනවා. සමාජ වගකීමක් ඇති සමාගමක් වශයෙන් අපගේ පූර්ණ අනුග්‍රහය මෙවැනි වැඩසටහන් වෙනුවෙන් දෙමින් මතු පරපුරට සංස්කෘතිය රැක ගැනීමට පූර්ණ ආදර්ශයක් සපයනවා.ඊ

SLINTEC හා මල්ටිලැක් කෙයා වෙතින් කොවිඩ් වයිරසයට එරෙහිව නව නිෂ්පාදන 2ක්

මල්ටිලැක් කෙයා, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) හා එක්ව කොවිඩ් 19ට එරෙහිව කටයුතු කිරීමේ පුරෝගාමී අභිලාසයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම Antiviral සහ Antibacterial Spray හඳුන්වා දෙන ලදි.

කොරෝනා වයිරසය 99%ක් විනාශ කිරීම සඳහා නව NOVID antiviral සහ antibacterial spray ශ්‍රී ලංකාවේ දී එළි දැක්වෙන ප්‍රථම අවස්ථාවයි. කෙටි කාලයකට පමණක් ඵලදායී වන සාම්ප්‍රදායික විෂබීජ නාසකයන් හා සැසඳීමේදී මෙහි ඇති වඩාත් සුවිශේෂී ලක්ෂණය නම්, NOVID antiviral සහ antibacterial spray එක්වරක් ආලේප කිරීම මගින් දිගු කාලයක් පවත්නා උසස් මට්ටමේ ආරක්ෂාවක් තහවුරු කිරීමයි.

නව NOVID antiviral සහ antibacterial spray ආලේප කරන ලද පෘෂ්ඨ මත ඇති වයිරස සහ බැක්ටීරියා 99.9%ක් විනාශ කරන බවට එක්සත් රාජධානියේ ලන්ඩන් හි විද්‍යාත්මක වයිරස් පරීක්ෂණාගාරය විසින් තහවුරු කර ඇත.

මල්ටිලැක් කෙයා හි ප්‍රධාන විධායක නිලධාරිණී මිශා මිස්වර් ඉස්මයිල් මේ NOVID Anti-Septic Spray පිළිබඳ අදහස් පළ කළේ ''අපි ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සමඟ එක්ව කොවිඩ් 19 වයිරසයට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රතිඵලදායී විසඳුමක් සංවර්ධනය කිරීමට කටයුතු කරනවා, මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමට සහාය වෙමින් කොවිඩ් 19 වයිරසයට එරෙහිව සටන් කිරීමේ අපගේ කාර්යභාරය ඉටු කිරීම පිළිබඳ අප ඉතා ආඩම්බර වෙනවා.'' යනුවෙනි.

හයිඩ් පාර්ක් කෝනර් බජාජ් ජෙනුයින් පාර්ට්ස් අවුට්ලට් යළි විවෘතයි

ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි 27 සංවත්සරය සනිටුහන් කරමින් හයිඩ් පාර්ක් කෝනර්, කොළඹ 02 පරිශ්‍රයේ පැවති බජාජ් ජෙනුයින් අමතර කොටස් අලෙවි මධ්‍යස්ථානය පසුගියදා යළි විවෘත කෙරුණි.

මේ නව අලෙවි මධ්‍යස්ථානය වෙතින් බජාජ් වාහනවල දිගුකල් පැවැත්ම තහවුරු කරන සහ හොඳින් ඔරොත්තු දෙන බජාජ් ජෙනුයින් අමතර කොටස් කොළඹ සහ තදාන්න ප්‍රදේශවල බජාජ් පාරිභෝගිකයන්ට සුපුරුදු පරිදි පහසුවෙන් මිලදී ගැනීම හැකියාව උදා වී ඇත.

මේ විවෘත කිරීමේ අවස්ථාවට ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්සේවා ඩීලර්වරු, ත්‍රිරෝද රථ සංගම් නියෝජිතයන්, ජෙනුයින් පාර්ට්ස් පාරිභෝගිකයන් මෙන්ම ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ නිලධාරිහුද සහභාගි වූහ.

කොවිඩ් - 19 වසංගත තත්ත්වයට නිරාවරණය නොවී, ඔබගේ ආරක්ෂාව තහවුරු කරමින් ඔබට අවශ්‍ය බජාජ් ජෙනුයින් පාර්ට්ස් තම නිවෙසටම ගෙනවිත් දීමේ සේවාවක්ද ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මේ වන විට හඳුන්වා දී ඇති අතර එම සේවය ඕනෑම ප්‍රදේශයක සිටින පාරිභෝගිකයකුට අත්විඳිය හැකිය. නව අමතර කොටස් අලෙවි මධ්‍යස්ථානයෙන් බජාජ් පාරිභෝගිකයන්ට අවශ්‍ය අමතර කොටස් පිළිබඳ තොරතුරු බජාජ් ජෙනුයින් සේවා පිළිබඳ දුරකතන අංකය ඇමතීමෙන් දැන ගත හැකිය.

රට වටා මිල ගණන්

	නාරාහේන්පිට ආ. ම.	රත්මලාන ආ. ම.	වැලිසර. ආ. ම.	මීගොඩ ආ. ම.	තඹුත්තේගම ආ. ම.	නුවරඑළිය ආ. ම.	මිල රුපියල්
පහත රට එළවළු	සිල්ලර මිල රු.	සිල්ලර මිල රු.	සිල්ලර මිල රු.	තොග මිල රු.	තොග මිල රු.		තොග මිල රු.
වට්ටක්කා	120	120	120	90 - 100	80	ගෝවා	110
අළු කෙසෙල්	120	110	100	60	35 - 40	කැරට්	150
පිපිඤ්ඤා	80	90	60	40 - 50	20 - 30	ලීක්ස්	70
වැටකොළු	180	200	150	140-160	110-140	රාබු	60
බණ්ඩක්කා	140	140	90	100-110	60-70	බීට්රූට්	90
කරවිල	200	180	130	140	110 - 120	අර්තාපල්	120
පතෝල	140 - 160	100	100	70 - 80	60 - 65	අර්තාපල් රතු	120
මාළු මිරිස්	280	280	240	200	250	නෝකෝල්	90
බටාතා	140	140		100	110	බෙල්පෙපර් රතු	650
මුරුංගා	-	-	-			කහ	650
එළබටු	140	-	70	60-90	40	කොළ	400
කැකිරි	120	120	70	60	30-40	බැසිල්	330
තෝකෝල්	140	140	80	90-100	100	චයිනීස් කැබේජ්	270
මඤ්ඤොක්කා	80	80	50			රෙඩ් කැබේජ්	450
බතල	100	-	60	-	40-50	සැල්දිරි	170
දඹල	100	100	50	60	40-50	කොත්ත මල්ලි කොළ	450
මෑකරල්	160	100	110	70	90	අයිස්බර්ග්	450
උඩරට එළවළු						සලාද	110
බෝංචි	180	160	150	140-150	150-160	රතුසලාද	550
ගෝවා ගෙඩි	160	140	130		100	මිංචි	170
කැරට්	160 - 200	180	150	150-160	160-170	පාස්ලි	550
ලීක්ස්	120	120	100	90	75-90	රුබා	80
රාබු		180			60	රෝස්මරි	700
තක්කාලි	180	180	150	120	80-100	බ්‍රොකෝලි	1000
බීට්රූට්	120	100	90	70-75	70	මල්ගෝවා	850
සලාද	300	160	350		200-250	රතුරාබු	450
ගෝවා කොළ	-	-	100	20-30		පැචර්ලි	150
පලතුරු						සුකිනි	270
අන්නාසි	120	150	110	120	100-110	කහ සුකිනි	270
ඇඹුල් කෙසෙල්	120	80	80	70	30-50	දිගරාබු	140
කෝලිකුට්ටු	200	150	170	150	130-140	තක්කාලි	220
සීනි කෙසෙල්	130	100	90	80	30-60	මාළුමිරිස්	320
ඇම්බුත්	200	160	160				
ගස් ලබු (රෙඩ්ලේඩ්)		100	120		80-100		
ගස්ලබු	150	80	120	110	70-80		
ඇපල් (ආනයනික)	70-80		70				
මිදි (දේශීය)			700				
මිදි (ආනයනික රතු)	1100	1200	900		900		
මිදි (ආනයනික කොළ)	1100	1300	900				
මස්							
කුකුළු මස්- අලුත් (සම රහිත)	600	560	580				
කුකුළු මස් -ශීත කළ (සම සහිත)	480	410	550				
අනෙකුත්							
අමු මිරිස්	280	280			220-250		
දෙහි	140	140			60-70		
අමු ඉඟුරු	240	250					
සහල්							
හාල් (පැකට් නොකළ)							
රතු නාඩු	96	105	106	98	95		
සුදු නාඩු	96	108	106	91-96	91-94		
රතු කැකුළු	93	96	93	90-92			
සුදු කැකුළු	93	100	95	90-92			
සුදු කැකුළු සම්බා	98	125	120	114-115	122		
තම්බපු කැකුළු සම්බා	98	155	125		122		
කීරි සම්බා	150-160	155	155				

biz.dinamina@lakehouse.lk

BIZ LINE

‘තුරුලිය වෙනුවෙන් අපි’ පරිසර ව්‍යාපෘතියට ශ්‍රීලංකන් ගුවන් සේවයෙන් අතහිත

පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා යුද හමුදාවේ ‘තුරුලිය වෙනුවෙන් අපි’ ව්‍යාපෘතියට සහාය වෙමින් වනාන්තරයක අක්කර බාගයක ප්‍රමාණයක් නැවත වගා කර වසර 3ක් යන තෙක් නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවයේ කාර්ය මණ්ඩලය ද පසුගියදා සිය දායකත්වය දැක්වීය.

2021 පෙබරවාරි 20 වන දින ශ්‍රී ලංකා යුද හමුදාවේ 54 වැනි පාබළ සේනාංකය විසින් පැළ නැවත සිටුවීමේ ස්ථානය වන“Sinathnagar” හිදී මේ අරමුදල් නිල වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට භාර දුන් අතර එම උත්සවය මන්නාරමේදී සංවිධාන කර තිබිණි. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්, වෘත්තීය සමිති සහ ගුවන් සමාගමේ පරිසර ඒකකයේ නියෝජිතයන්ගෙන් සමන්විත කණ්ඩායමක් මේ උත්සවය නියෝජනය කළහ. විල්පත්තු ජාතික වනෝද්‍යානයට යාබදව පිහිටි හෙක්ටයාර් 2,000 ක වනාන්තරක් නැවත වගා කිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ආරම්භ කරන ලද ‘තුරුලිය වෙනුවෙන් අපි’ වගා වැඩසටහන සඳහා 2019 වසරේ පරිසර දිනයේදී ශ්‍රීලංකන් ගුවන් සේවයේ කාර්ය මණ්ඩල ද සිය සහයෝගය දැක්වූහ.

පැල්වත්ත සමාගමෙන් කිරි කර්මාන්තයට රු. කෝටි 46ක පහසුකම්

මෙරට ප්‍රමුඛතම පෞද්ගලික කිරි නිෂ්පාදකයා වන පැල්වත්ත සමාගමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ රුපියල් මිලියන 463ක ව්‍යාපෘති පහසුකම් සලසා තිබේ. ඒ අනුව පළමු අදියර ලෙස ඉදිරි මාස 6 තුළ කිරි ගොවීන් 1,000කට මේ යටතේ පහසුකම් සැලසීමට සමාගම සැලසුම් කර ඇත.

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනක් වන අතර ග්‍රාමීය කුඩා වතු හිමි ගොවීන්ට ‘රාජ්‍ය හා පෞද්ගලික නිෂ්පාදක හවුල්කාරිත්වය’ වෙත ප්‍රවේශ වීම සඳහා වාණිජ හවුල්කාරිත්වයන් ගොඩනැගීම, මූල්‍ය ප්‍රවේශය දීම, තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාවට නැංවීම යන මූලික කරුණු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම මෙමගින් අරමුණු කර ගෙන ඇත. මෙහිදී 4P අගය දාම ආකෘතිය කේන්ද්‍ර කර ගනිමින් රාජ්‍ය අංශයේ, ග්‍රාමීය කුඩා වතු හිමි ගොවීන් සහ පෞද්ගලික අංශයේ සමාගම් පොදු වේදිකාවක් කරා ගෙන ඒමට කටයුතු කරනු ඇත. එමගින් ග්‍රාමීය ගොවි ප්‍රජාවන්ගේ ආර්ථික හා සමාජීය ප්‍රමිතීන් උසස් අන්දමින් ඉහළ නංවාලමින් කිරි නිෂ්පාදනයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීමට කටයුතු කෙරේ.

පැලවත්ත කිරි සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සුසන්ත මල්වත්ත මහතා මෙසේ අදහස් දැක්වීය: “පැල්වත්ත සමාගම වෙත මේ වටිනා SAPP ව්‍යාපෘති පහසුකම් හිමි වීම පිළිබඳ අප විශාල ලෙස සතුටට පත්වනවා. අප සතුව දැනට ලියාපදිංචි කිරි ගොවීන් 12,500 කට අධික සංඛ්‍යාවක් සිටින අතර, ඌව, මධ්‍යම, නැගෙනහිර, උතුරු මැද හා වයඹ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 40 කට අධික සංඛ්‍යාවක් තිබෙනවා.”

මධ්‍යම පළාත් විශිෂ්ටතම ව්‍යවසායිකා ශාක්‍යා සැලෝන් ඇන්ඩ් ඇකඩමි

රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයකු වන ශාක්‍යා සැලෝන් ඇන්ඩ් ඇකඩමි මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන සහ ව්‍යවසාය ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව සංවිධාන කළ 2020 රාජ්‍ය තරු සම්මාන උලෙළේදී විශිෂ්ටම ව්‍යවසායිකාවට හිමි තරු සම්මානයෙන් පිදුම් ලැබීය. මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් මහනුවර රෝයල් කැන්ඩියන් හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැති සම්මාන උලෙළේදී ශාක්‍යා සැලෝන් ඇන්ඩ් ඇකඩමි අධිපතිනි සුදර්ශනී ද සිල්වා මහත්මිය වෙත සම්මානය පිරිනමන ලදි.

“විශිෂ්ට සේවයක් සැපයීම සහ ගෙවන මුදලට වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන්ට සැපයීම නිසා අප ආයතනය හැමදාම ජනතා සම්මානයෙන් පිදුම් ලබනවා. මේ සම්මානය ඊට තවත් අගයක් එකතු කළා කිව්වොත් නිවැරදියි. මේ ජයග්‍රහණයට උපකාර කළ මගේ කාර්ය මණ්ඩලයට සහ අප කෙරෙහි විශ්වාසය තැබූ පාරිභෝගිකයන්ට මාගේ ප්‍රණාමය පුද කරනවා.” සුදර්ශනි ද සිල්වා මහත්මිය පැවසීය.

ශාක්‍යා සැලෝන් ඇන්ඩ් ඇකඩමි දශකයකට වැඩි කාලයක් පුරා යුවතියන්ට සුන්දර මනාලියන් ලෙස පෙනී සිටීමට අවශ්‍ය සියලු ආකාරයේ රූපලාවණ්‍ය සේවා ඉහළ ගුණාත්මකභාවයකින් සපයයි. එනිසා ආතතියකින් තොරව සැහැල්ලුවෙන් මංගල ගමනට සූදානම් වීමට මනාලියන්ට හැකිය. ශාක්‍යා සැලෝන් පෞද්ගලිකව රූපලාවණ්‍ය උපදේශන සහ ආයුර්වේද රූපලාවණ්‍ය සේවාද සපයයි. ශාක්‍ය සැලෝන් ආයතනයට සමගාමීව ශාක්‍යා රූපලාවණ්‍ය ඇකඩමියද වසර කිහිපයක සිට සාර්ථකව ක්‍රියාත්මක වේ. ඒ ඔස්සේ රූපලාවණ්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන නව පරපුරට වෘත්තීය දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් සපයයි. ශාක්‍යා සැලෝන් සහ ඇකඩමි ඉදිරියේදී නව සේවා රැසක් සමඟ පුළුල් වීමට නියමිතය.

Ocean Lanka සේවකයන් අගයති

ශ්‍රී ලංකාවේ විශාලතම weft knitted ඇඟලුම් නිෂ්පාදකයා වන Ocean Lanka විසින් පසුගියදා සිය සමාගම තුළ වසර 25ක සහ 20ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් 39 දෙනකු අගයමින් මුදල් ත්‍යාග පිරිනැමිණි.

මේ පිළිබඳ අදහස් දක්වමින් Ocean Lanka හි කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය ඔස්ටින් අවු මහතා අවධාරණය කළේ මෙවැන්නකි. “Ocean Lanka සමාගම කලාපයේ ප්‍රමුඛතම රෙදිපිළි නිෂ්පාදකයා බවට පත් වීම පිටුපස සිටින්නේ අප සමාගමේ වටිනා සේවක මණ්ඩලයයි. අද දින අප සමාගම අත්පත් කර ගෙන ඇති මේ ගෞරවනීය තත්ත්වය උදා කර ගැනීම වෙනුවෙන් නිරන්තරයෙන් පාක්ෂිකත්වයෙන් හා කැපවීමෙන් අප හා රැඳී සිටින සේවක මහත්ම මහත්මීන් පිරිසක් ලැබීම අප ආයතනයේ මහත් භාග්‍යයක්. අප සේවක මණ්ඩලය සඳහා ඉහළ විනිවිදභාවයකින් සහ විශ්වාසයකින් කටයුතු කිරීම සඳහා අවශ්‍ය ආයතනික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අප නිරතුරුවම කැපවෙමින් කටයුතු කරනවා. අප සමඟ මෙතරම් දිගු කාලයක් සේවය කළ සේවක මණ්ඩලයක් සිටීම තුළින් ගම්‍ය වන්නේද අප ආයතනය තුළ සේවකයන් වෙනුවෙන් නිර්මාණය කර ඇති සුවපහසු පරිසරයයි”. Ocean Lanka Service Awards සමාගමේ 25වැනි සංවත්සර සැමරුමේ එක් වැදගත් සේවක ඇගයීම් ක්‍රියාකාරකමක් වන අතර, එය සේවා අභිමන් සේවක ඇගයීමේ සම්මාන උළෙල හා සමාන්තරව ක්‍රියාත්මක වේ.

MillenniumIT ESP සහ STEMUp සහයෝගිතාවක

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදකයකු වන MillenniumIT ESP සමාගම, ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් වන STEMUp හි කර්මාන්ත උපදේශකයකු ලෙස සහයෝගීතාවකට එළඹිණි. මේ සහයෝගීතාවයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සෑම සිසුවකු වෙතම කෘත්‍රිම බුද්ධි තාක්ෂණය සමීප කරවීමේ STEMUp හි නවතම දැක්ම සඳහා සහාය දැක්වීමය. එහිදී විශේෂයෙන්ම විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත යන අංශ කෙරෙහි සිසුන්ගේ කැමැත්ත වර්ධනය කිරීමෙන් එම දැක්ම සාධනය කර ගැනීමට අවශ්‍ය මාවත පිළියෙල කිරීමේ භාරදුර වගකීම මේ සහයෝගීතාව වෙත පැවරී තිබේ.

සහයෝගීතාව මඟින් ශ්‍රී ලංකාව තුළ විශාල වෙනසක් ඇති කළ හැකි බව මේ වන විටත් තහවුරු වී තිබේ. එනම් මේ වනවිටත් සිසුන් ඊට ආකර්ෂණය කර ගනිමින්, තාක්ෂණය පිළිබඳ දැනුවත් අනාගත පරම්පරාවක් නිර්මාණය කිරීමේ කාර්යය සිදු වෙමින් පවතී. අනාගත පරම්පරාව නව හැකියාවන් සොයා යෑමට මෙන්ම, නව නිපැයුම් කිරීමටත් ඒ හරහා සමස්ත සමාජයටම ප්‍රතිලාභ අත්කරදීමටත් මේ වැඩපිළිවෙළෙ මඟින් අවස්ථාව උදා වනු ඇත.

‘STEMUp සමඟ ඇති කර ගත් අපගේ සහයෝගිතාව තුළින්, ශ්‍රී ලංකාවේ අනාගත පරපුරේත්, සමස්තයක් ලෙස සමස්ත රටේත් විශාල දියුණුවක් සඳහා මුලපිරීමේ හැකියාව පවතිනවා. එම නිසා අනාගත පරපුර, අනාගතයට සූදානම් කරලීමේ මේ කර්තව්‍යයට අප ඉතා උද්යෝගයෙන් සම්බන්ධ වී සිටින බව පවසනවා’ යනුවෙන් MillenniumIT ESP අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී ෂෙවාන් ගුණතිලක මහතා පැවසීය.

COSMOS ORGANIC සහතිකය දිනූ එකම සන්නාමය ඩිලාස් ඉන්ටර්නැෂනල්

ශ්‍රී ලංකාවේ සුවඳ විලවුන් හා රූපාලංකරණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ අන්තර්ජාතිකව ප්‍රචලිත ප්‍රමුඛතම නාමයක් වන ඩිලාස් ඉන්ටර්නැෂනල් සමාගම දේශීය නිෂ්පාදන පෙළකට අන්තර්ජාතිකව පිළිගත් COSMOS ORGANIC සහතිකය දිනූ ප්‍රථම හා එකම සමාගම බවට පත් විය. නෙදර්ලන්තයේ කන්ට්‍රෝල් යුනියන් ආයතනය මේ සහතිකය ප්‍රදානය කරන්නේ යම් නිෂ්පාදනයක් ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන්ම නිපදවන බව සහතික කරමින්

පාරිභෝගිකයන්ට විශ්වාසයෙන් යුතුව මිලදී ගැනීමටය. මේ සඳහා සමාගම් සිය නිෂ්පාදන ක්‍රියාවලිය දැනටෙ ලෝකයේ භාවිත කළ හැකි තිරසර, ස්වභාවික, කාබනික මෙහෙයුම් හා ක්‍රියාවලි වෙත අන්තර්ග්‍රහණය කළ යුතඅෙතර අදාළ ක්‍රියාවලි සුපරික්ෂණයෙන් මේ සහතිකය නිකුත් කරයි. මේ නිෂ්පාදන ක්‍රියාවලි අතර කාබනික කෘෂිකර්මාන්තයෙන් සියලු අමුද්‍රව්‍ය සපයා ගැනීම, පරිසර හිතකාමී බව හා පාරිභෝගික සෞඛ්‍ය කෙරෙහි සැලකිලිමත් වෙමින් නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම, පරිසර හිතකාමී හරිත රසායන භාවිතය ආදී කරුණු රැසක් වෙයි. කෘෂිකර්මය මත පදනම්ව ආහාර, පෝෂණය, වනාන්තර, ජෛව සාධක, ජෛව බලශක්ති, සමාජ අනුකූලතා හා ඇඟලුම් ආදී ක්ෂේත්‍ර රැසක තිරසර කාර්මික සැපයුම් සංවර්ධනය සඳහා කන්ට්‍රෝල් යුනියන් ආයතනය රටවල් 70කට අධික ප්‍රමාණයක කටයුතු කරයි. දකුණු කොරියානු කන්ට්‍රෝල් යුනියන්හි අධීක්ෂණයෙන් එහි මෙරට ශාඛාවේ කළමනාකාර අධ්‍යක්ෂ රොෂාන් රණවක මහතා ඩිලාස් ඉන්ටර්නැෂනල් වෙත පිරිනැමීය. HDDES සමූහයට අයත් ඩිලාස් සමාගම fine fragrances, aromatic soaps, aromatic shampoos, body lotions, conditioners, shower gels, aromatic diffusers සහ AURA හඳුන්කුරු ආදි නිෂ්පාදන රැසක් අන්තර්ජාතික සහ දේශීය වෙළෙඳපොළට නිකුත් කරයි.

CIC Besto චිකන් බෙදා හැරීම් පුළුල් කරයි

CIC Poultry Farms සමාගම පාරිභෝගික විශ්වාසය ඉහළින්ම දිනූ CIC Besto කුකුල් මස් නිෂ්පාදන පෙළ තව දුරටත් බෙදා හැරීමේ කටයුතු පුළුල් කරයි. ඒ අනුව දිවයින පුරා පිහිටි බොහෝ සුපිරි සහ ප්‍රධාන පෙළේ වෙළෙඳසල්වලින් CIC Besto කුකුල් මස් නිෂ්පාදන සාධාරණ මිලකට ගත හැකිය.

CIC Feeds සමූහ ව්‍යාපාරයේ අනුබද්ධ ආයතනයක් වූ CIC Poultry Farms සමාගම 2007දී කුකුළු මස් නිෂ්පාදනය ඇරඹූ අතර වර්තමානයේදී 5%ක වෙළෙඳපොළ ප්‍රතිශතයකට හිමිකම් කියමින් දිනකට කුකුළන් 25,000ක පමණ නිෂ්පාදන ධාරිතාවක් පවත්වා ගෙන යයි. උසස් ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් ඉහළ CIC Besto කුකුල් මස් සඳහා ISO 22000, HACCP තත්ත්ව සහතිකද ලැබී ඇති අතර එහි ඇති ඉහළ රසය පාරිභෝගිකයන් දැනටමත් හඳුනා ගෙන ඇත. CIC Poultry Farms සතු කුලියාපිටියේ හා බඩල්ගම ගොවිපොළවල බ්‍රොයිලර් කුකුළන් ඇති කරන අතර මස් නිෂ්පාදනය බඩල්ගම අති නවීන නිෂ්පාදනාගාරයේදී කෙරේ. අන්තර්ජාතික ආහාර නිෂ්පාදන ප්‍රමිතීන් ඉතා ඉහළින් අනුගමනය කරන CIC Poultry Farms අවම මිනිස් මැදිහත්කමකින් සහ නවීන ස්වංක්‍රීය යන්ත්‍ර භාවිත කරමින් නිෂ්පාදන කරනු ලබයි. “මෑතකදී ගෘහනියන්ගේ පහසුව තකා කොටස් කළ ෆැමිලි පැක්” 400ට හා 700ට පැකට්ටුවක් හඳුන්වා දුන්නා. ඊට අමතරව සම්පූර්ණ කොටස් 12කට කපා සම රහිත හා සහිත කුකුළු මස් වශයෙන් CIC Besto Pre Cut නව ඇසුරුම් දෙකක් හඳුන්වා දුන්නා. වඩාත් සෞඛ්‍යාරක්ෂිතව ඇසුරුම් කළ වැකුම් පැක් නිෂ්පාදන ලෙස මේවා මිල දී ගත හැකියි. බ්‍රොයිලර් කුකුළු මස්වලට හෝමෝන හා ප්‍රතිජීවක ඖෂ එක් කරන්නේ නැහැ. එය ප්‍රායෝගිකව කළ නොහැකියි. හෝමෝන කුකුළු මස්වලටත් වඩා බෙහෙවින් මිල අධිකයි. ඉතා උසස් ප්‍රමිතියකින් යුතු කුකුළු මස් වෙළෙඳපොළට නිකුත් කිරීම අපගේ ඒකායන උත්සාහයයි”. CIC Poultry Farms ප්‍රධාන විධායක නිලධාරී අජිත් වීරසිංහ මහතා පැවසීය.

දොඩංගොඩ අභිනවයෙන් ඉදිවූ ‘රිසෝල්ව් ගාඩින්’

රජයේ සෞභාග්‍යයේ දැක්මට අනුව සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා පුළුල් වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වන අතර එහිදී හෝටල් ක්ෂේත්‍රයෙහි සංවර්ධනය ප්‍රධාන ස්ථානයක් ගනී.

කොවිඩ් 19 වසංගතය හමුවේ යම් පසුබෑමකට ලක් වුව ද සංචාරක කර්මාන්තය නැවත නගාසිටුවීමට පියවර රාශියක් ද ගෙන තිබේ. නවීන පහසුකම්වලින් යුත් හෝටල් විශාල ප්‍රමාණයක් විවෘත වෙමින් මෙන්ම ඉදිවෙමින් ද පවතින පසුබිමක් තුළ ඒ හා සමගාමීව දොඩංගොඩ, තුඩුගල, ඇල්ල පාරේ ස්වාභාවික පරිසරයක ඉදි වූ RESOLVE GARDEN හෝටලය පසුගිය දිනෙක විවෘත විය.

දෙස් විදෙස් සංචාරකයන් අතර ප්‍රචලිත සුප්‍රසිද්ධ තුඩුගල ඇල්ලට කිලෝමීටර තුනහමාරක් මෙපිට ඉදි වූ මෙම හෝටලයෙහි හිමිකරු වූයේ වෘත්තියෙන් අමෙරිකන් වෙළෙඳ නාවික ප්‍රධාන ඉංජිනේරුවරයකු වන කේ. ජී. පී. කුමාර මහතායි.

හෙතෙම මේ පිළිබඳව දිනමිණට මෙලෙස අදහස් දැක්විය:

“කුඩා කාලයේ ඉඳන්ම මගේ තිබූ බලාපොරොත්තුවක් වුණේ හෝටලයක් ඉදිකිරීමයි. අක්කර දෙකක ස්වභාවික පරිසරයක මේ හෝටලය ඉදිකිරීමට පුළුවන් වුණා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා රජය ගෙනයන වැඩපිළිවෙළට ශ්‍රී ලාංකිකයකු වශයෙන් දායකත්වයක් දීමට හැකිවීම ගැන මා ආඩම්බර වෙනවා. නවීන පහසුකම්වලින් යුක්තව ඇති මගේ හෝටලයෙන් දෙස් විදෙස් සංචාරකයින්ට විනෝද වෙලා නිදහසේ කෑම ටිකක් කාලයන්න පුළුවන්. කළුතර දිස්ත්‍රික්කය තුළ සංචාරය කළ හැකි ස්ථාන රාශියක් තියෙනව. ඉන් තුඩුගල ඇල්ලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්.

මේ කටයුතු සාර්ථක කර ගැනීමට මගේ බිරිය එච්. එන්. කේ. ගුණවර්ධන මහත්මියගෙන් ලැබෙන සහයෝගය ඉතා විශාලයි”.

එන්. විජේරත්න - නාගොඩ විශේෂ

2021 මාර්තු 12 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

පොල් ගස් ඇද බඳිනු ලැබේ

ඔබගේ නිවසට හෝ වෙනත් ස්ථානයකට නැමී බරවී ඇති පොල්ගස් ශක්තිමත් වානේ කම්බි යොදා ඇද බඳිනු ලැබේ.

071-9998083, 076-9167558

නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 176/1-B, මහවත්ත පාර, පැලැන්වත්ත, පන්තිපිටිය පදිංචි දෙමටගොඩ කංකානමලාගේ අමරසිංහ වන මම මින් ඉදිරියට දෙමටගොඩ කංකානමලාගේ සුනිල් අමරසිංහ ලෙස හාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, පොදු මහජනතාවටත්, මෙයින් දැනුම් දෙමි.

දෙමටගොඩ කංකානමලාගේ සුනිල් අමරසිංහ



21 වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

ඉදුසජණා

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

අබලි භාණ්ඩ විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අබලි භාණ්ඩ රැසක් අලෙවි කිරීම සඳහා 2021-03-30 දින ප.ව. 02.00 දක්වා ටෙන්ඩර්පත් කැඳවීමට කටයුතු යොදා ඇත.

2021 මාර්තු මස 15 දින සිට මාර්තු මස 29 දින දක්වා පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා භාණ්ඩ පරීක්ෂාවට ඉඩදෙනු ලැබේ. අදාළ ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන රු. 500.00 ක මුදලක් ආයතනයේ මුදල් අයකැමි වෙත ගෙවා රිසිට්පත සාමාන්‍ය පාලන අංශය වෙත ඉදිරිපත් කළ යුතුවේ.

මෙම ටෙන්ඩර් කැඳවීමේ දී ඉදිරිපත් කරන ලද මිල ගණන් 2021 මාර්තු මස 30 දින ප.ව. 2.00 ට විවෘත කරනු ලබන අතර, 2021 අප්‍රේල් මස 05 වන දින ප.ව. 02.00 ට පෙර තෝරාගත් ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ ටෙන්ඩර් වටිනාකමෙන් 25% ක් ගෙවා භාණ්ඩ වෙන්කර ගත යුතු අතර, ඉදිරි දින 03 තුළ භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම ගෙවා අදාළ භාණ්ඩ නිසි පරිදි ආයතන භූමියෙන් ඉවත් කරගෙන යාමට කටයුතු යොදාගත යුතු බව මෙයින් නිවේදනය කරමි.

ටෙන්ඩර් කරනු ලබන අබලි භාණ්ඩ පහතින් දැක්වේ.

වානේ අල්මාරි / ලිපිගොනු කබඩ් / පරිගණක මේස / පුටු / අබලි ලී භාණ්ඩ / මේස / ටෝනර් / රූපවාහිනී යන්ත්‍ර / ශීතකරණ / පරිගණක යන්ත්‍ර / ඡායා පිටපත් යන්ත්‍ර / යකඩ කැබලි / ටයර් / ලී ජනේල / විද්‍යුත් උපකරණ සහ වෙනත් ඉවතලන ද්‍රව්‍ය

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07.

2021-03-12

මහනුවර මහා නගර සභාව

ප්‍රසම්පාදන දැන්වීමයි

මහනුවර මහා නගර සභාවට අයත් වාහන 860 ක් පමණ ගාල් කිරීමට ඉඩ ඇති දිනකට වාහන 4000 ක් පමණ සංසරණය වන මහනුවර නගර මධ්‍යයේ ස්ථාපිත සිව් මහල් රථ ගාලේ පවිත්‍රතා කටයුතු හා සනීපාරක්ෂක සේවාව සපයා ගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවා සපයන්නන්ගෙන් මුදු, තබන ලද ලංසුපත් 2021-04-01 වෙනි දින පෙ.ව. 10.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

සුදුසුකම් :

(අ) පවිත්‍රතා කටයුතු හා සනීපාරක්ෂක සේවා සැපයීම සම්බන්ධව ව්‍යාපාර නාම ආඥා පනත යටතේ හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි ආයතනයක් විය යුතු අතර, එය 2021-04-01 දිනට වසර තුනක කාලයක් සම්පූර්ණ විය යුතුය.

(ආ) පවිත්‍රතා කටයුතු හා සනීපාරක්ෂක සේවා සැපයීම පිළිබඳව වසර 03 ක අඛණ්ඩ සතුටුදායක කාලයක් සපුරා තිබිය යුතු අතර, ඒ බව ලියවිලි මගින් තහවුරු කළ යුතුය.

අංක	ලංසු යොමු අංකය	FD/S/CC
01	ලංසු ලේඛනයේ මිල	රු. 1080/- ක (සියලු බදු ඇතුළත්) ❖ මහනුවර මහා නගර සභාවේ සරප් වෙත ගෙවා ලංසු ලියවිලි ලබාගත හැක. නැතිනම්, ❖ මුදල් ඇණවුමක් නම් "නාගරික කොමසාරිස් මහනුවර" නමින් ගෙවා 2021-03-26 ❖ දක්වා පමණක් එවිය යුතුය.
02	ලංසු ලේඛන තිකුත් කිරීමට ආරම්භ කරන දිනය	2021-03-12 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.45 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි
03	ලංසු ලේඛන තිකුත් කරන අවසාන දිනය සහ වේලාව	2021-03-31 ප.ව. 2.45 දක්වා
04	ලංසු ලියවිලි භාර ගන්නා අවසාන දිනය, වේලාව	2021-04-01 දින පෙ.ව. 10.00 හෝ ඊට පෙර.
05	ලංසු ලියවිලි තිකුත් කරන ස්ථානයේ ලිපිනය	නාගරික ගණකාධිකාරී (සැපයුම්) මහනුවර මහා නගර සභාව මහනුවර.
06	සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි භාර ගන්නා ස්ථානය	ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් 2021-04-01 වෙනි දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ප්‍රධාන නාගරික ගණකාධිකාරී භාරයේ තබා ඇති ලංසු බහාලුමට දැමිය යුතුය.
07	ලංසු විවෘත කරන දිනය, වේලාව සහ ස්ථානය	2021-04-01 දින පෙ.ව. 10.00 ට මහනුවර නගර සභා ශාලාවේදී.
08	ලංසු සුරක්ෂණය සහ එහි වලංගු කාලය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. 25,000.00 ක ඇපකරයක් "නාගරික කොමසාරිස්, මහනුවර" නමින් ලබාගත් සුරක්ෂණය සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළයුතු අතර, විවෘත කළ දින සිට එය මාස 03 ක වලංගු කාලයක් විය යුතුය.

මිල ගණන් පිළිබඳ අවසන් තීරණ ගැනීම මහනුවර මහා නගර සභාව සතුවේ. වැඩි විස්තර ගණකාධිකාරී (සැපයුම්) ගේ දුරකථන අංක 081-2232071 හෝ 070-3738117 හා ගණකාධිකාරී (ආදායම්) ගේ 071-8254464 මගින් ලබාගත හැක.

අමිල නවරත්න,
මහනුවර නාගරික කොමසාරිස්,

2021-03-10 දින,
මහා නගර සභාව, මහනුවර.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දක්වා ඇති අයිතමයන් සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	ටෙන්ඩරයේ නම	ලංසු සුරක්ෂණය (රු.)	ලිපිලේඛන ගාස්තුව (VAT ඇතුළුව)	අවසාන දිනය හා වේලාව
CES/FP/06/PT/6164(EL)	Hybrid Multi Core Cable for Alimak Elevators STS Cranes at JCT	45,000.00	1,000.00	20.04.2021 10.00 පැය
CES/FP/04/PT/6172(MP)	02 Nos. Boom Hoist Wire Rope (32.00MM x 910 Length) for ZPMC 50T STS Crane at JCT	56,000.00	1,000.00	20.04.2021 10.00 පැය
CES/FP/04/PT/6181(EL)	Electrical Spares for RAM Spreaders of JCT STS Cranes	40,000.00	1,000.00	22.04.2021 10.00 පැය
CMS/LP/21/PT/04/001	"H" Irons & "I" Beams	200,000.00	3,500.00	01.04.2021 13.30 පැය
CMS/LP/21/PT/17/001	Marine Quality Paints & Thinner	115,000.00	3,500.00	01.04.2021 13.30 පැය
CMS/LP/19/PT/17/059	2500 MTRS. Cloth Drill for Year 2020	25,000.00	1,000.00	01.04.2021 13.30 පැය

02. **රු. මිලියන 5** ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයට සම්බන්ධ වන සියලුම පාර්ශ්වයන්, කොන්ත්‍රාත් කාලසීමාව පුරාම එකී පනත හා සමග බැඳී කටයුතු කිරීම අවශ්‍ය වේ. ඒජන්තවරයකු / උප-ඒජන්තවරයෙකු, නියෝජිතවරයකු වෙනුවෙන් හෝ ඒජන්තවරයකු / උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම් කළ අයකු ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන ඕනෑම ලංසුකරුවකු පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි විය යුතු අතර, යථාපරිදි සම්පූර්ණ කළ ලියාපදිංචි සහතිකය තම ලංසු ලිපිලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

03. ලංසුකරුවන් ඉහත දී ඇති භාණ්ඩවලට සමාන භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක අඩුතරමින් පසුගිය වසර තුනක (3) නියැලී සිටිය අය විය යුතුවේ.

04. අභිලාෂී ලංසුකරුවන්ට පහත සඳහන් ලිපිනයේදී කාර්යාලයීය වේලාවන් තුළ ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

05. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා වගුවේ 4 වන තීරුවේ දක්වා ඇති ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, 2021 මාර්තු 15 දින සිට ලංසු භාරගැනීමේ අවසාන දිනට පෙර දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, අභිලාෂී ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

06. ලංසු භාරගැනීමේ අවසාන දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලංසු පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගන්නා අවසාන වේලාවේදී පහත ලිපිනයේදී, එම අවස්ථාවට පෞද්ගලිකව පැමිණ සිටීමට බලාපොරොත්තුවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ. සියලුම ලංසු සමග ඉහත සඳහන් කළ වටිනාකමට ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),
සැපයුම් අංශය,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01.

දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482832, 2482409, 2482652, 2482638, 2483024
ෆැක්ස් අංක : 2381652, 2470443

ලංසු කැඳවීමේ ආරාධනාවයි

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත (07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම් / දිසාපති නිල මැදුර සඳහා උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ

ප්‍රසම්පාදනය - 2021 වර්ෂය

කොන්ත්‍රාත් අංකය : POL/FRM/F7/01

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව

01. පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත (07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම් / දිසාපති නිල මැදුර වෙනුවෙන් පහත පරිදි උද්‍යාන හා සනීපාරක්ෂක සේවා ලබා ගැනීමට යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තැබූ මිල ගණන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය	ප්‍රසම්පාදනයේ නම	ලංසු සුරක්ෂණයේ වටිනාකම	සේවා සැපයිය යුතු ආයතන	සේවය ලබා ගන්නා කාල සීමාව	අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය සහ ලංසු විවෘත කිරීම
POL/ FRM/F7/01	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත (07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම් / දිසාපති නිල මැදුර සඳහා උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ ප්‍රසම්පාදනය.	රු. 10,000.00	1. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය	තව ගොඩනැගිල්ල විවෘත කරන තෙක්	2021 අප්‍රේල් 01 දින ප. ව. 2.00
			2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තමන්කඩුව දිඹුලාගල වැලිකන්ද ලංකාපුර මැදිරිගිරිය හිඟුරක්ගොඩ ඇලහැර	වර්ෂයක කාලයක් සඳහා	
			3. චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව	වර්ෂයක කාලයක් සඳහා	
			4. දිස්ත්‍රික් ලේකම් / දිසාපති නිල මැදුර	වර්ෂයක කාලයක් සඳහා	

02. උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී මගින් (027-2222061) වැඩි විස්තර ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේදී 2021 මාර්තු 12 දින සිට 2021 මාර්තු 31 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ අවශ්‍ය සුදුසුකම් සහ ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

03. ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 1,500.00 ක මුදලක්, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් අංශය වෙත මුදලින් පමණක් ගෙවීමෙන් ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් ලබාගත හැක.

04. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පහත සඳහන් ලිපිනයට 2021 අප්‍රේල් 01 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාර දීම සිදු කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ ලංසු විවෘත කිරීම සිදු කරන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව.
දුර : 027-2222061
2021.03.12

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

වනජීවී රැකවරණ, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ලංසු ආරාධනයයි

01. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් 2021වර්ෂය තුළ පහත දැක්වෙන දිස්ත්‍රික්ක වල විදුලි වැට මාර්ග ශුද්ධ කිරීම සහ විදුලි වැට ඉදිකිරීම (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විදුලි වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය අයිතම සපයනු ලැබේ.)සඳහා පූර්ව සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

දිස්ත්‍රික්කය හා ඊට ඇතුළත් කිලෝමීටර් ප්‍රමාණය	ප්‍රසම්පාදන අංකය	විදුලි වැටේ නම සහ දිග ප්‍රමාණය	ICTAD ආයතනයේ ලියාපදිංචිය (දිස්ත්‍රික්කයටම ඉදිරිපත් කරන්නේ නම්)	ආපසු නොගෙවන ලංසු අයදුම් පත්‍ර ගාස්තුව (රු.)	ලංසු සුරක්ෂණ වටිනාකම (රු.)
වව්නියාව- කි.මී.53.5	WL/02/20/R-03-2021(Lot I – Lot III)		C7 හෝ ඉහළ මාර්ග	3,000/-	
	WL/02/20/R-03-2021-Lot-I	ඕළුමඩුව කි.මී.25.0			57,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-03-2021-Lot-II	නැදුන්කර්ති දකුණ කි.මී.10.0			23,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-03-2021-Lot-III	කුළුවිසුඩාන් 1 සහ 2 කි.මී.18.5			42,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
ත්‍රිකුණාමලය කි.මී.67	WL/02/20/R-04-2021 (Lot-I – Lot-VIII)		C7 හෝ ඉහළ මාර්ග	3,000/-	
	WL/02/20/R-04-2021-Lot-I	ඇපාගම - කෝණාබැදි වැව කි.මී.4.5			8,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-II	කඹුරුපිටිය නැගෙනහිර - කි.මී.4			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-III	ජයනගර් පොඩ්ඩකට්ටු කි.මී.5			9,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-IV	තිරියාය පන්සල වටා - කි.මී.2.5			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-V	පුල්මුඩේ ගම්මානය - කි.මී.22.0			40,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-VI	පෙරියකුලම් - කි.මී.4.5			8,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-VII	මහින්ද පුර සුමේධංකර පුර - කි.මී.22.0			40,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-04-2021-Lot-VIII	ශාන්තිපුර - කි.මී.2.5			4,500.00 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
කුරුණෑගල කි.මී.32	WL/02/20/R-05-2021 (Lot-I – Lot-II)		C7 හෝ ඉහළ මාර්ග	2,000.00	
	WL/02/20/R-05-2021-Lot-I	ඉගිනිමිටිය තබ්බෝව - කි.මී.16			41,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-05-2021 -Lot-II	මී ඔය පයිරික්කුලම කි.මී. 16			41,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
මුලතිව් කි.මී.49	WL/02/20/R-06-2021 (Lot-I – Lot-III)		C7 හෝ ඉහළ මාර්ග	2,500.00	
	WL/02/20/R-06-2021 -Lot-I	එඩුක්කට්ටු තොට්ටිආඩි අදියර 1 සහ 2 - කි.මී.22			47,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-06-2021-Lot-II	මේලිවනම් ගමවටා - කි.මී.5			11,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-06-2021 - Lot-III	ඉරනමඩු මුරුකන්ඩි - කි.මී.22			47,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
පොලොන්නරුව කි.මී.25.5	WL/02/20/R-07-2021 (Lot-I – Lot-II)		C8 හෝ ඉහළ මාර්ග	1,500.00	
	WL/02/20/R-07-2021-Lot-I	කිතුල් උතුව කි.මී.17.5			40,000/- 2021.07.07දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-07-2021 -Lot-II	සිංහගම දිගුව කි.මී.8			18,000/- 2021.07.07දින දක්වා වලංගු විය යුතුය
මොණරාගල කි.මී.135	WL/02/20/R-08-2021 (Lot-I – Lot-VIII)		C6 හෝ ඉහළ මාර්ග	6,000.00	
	WL/02/20/R-08-2021-Lot-I	හැවැන්පිටිය වෙහෙරගල කි.මී.35			82,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021-Lot-II	වම් ඉවුර කොඩිගහ වැව -කි.මී.13.5			31,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021-Lot-III	කොඩිගහවැව කරවිලේ කි.මී.28			66,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021 -Lot-IV	කුමාරගම -කි.මී.9.7			23,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021 -Lot-V	කුකුල්කටුව බෝධි වැව දිගුව -කි.මී.3			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021-Lot-VI	මිගස්ආර අයිස්පිල්ල කි.මී.24.8			58,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021 -Lot-VII	මුල්ලේගම දුම්පදුරාව - කි.මී.18			42,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-08-2021-Lot-VIII	ගල්බොක්ක අයිස්පිල්ල කබරගල -කි.මී.3			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
මහනුවර සහ බදුල්ල කි.මී.57.5	WL/02/20/R-09-2021 (Lot-I – Lot-VI)		C7 හෝ ඉහළ මාර්ග	3,000.00	
	WL/02/20/R-09-2021 -Lot-I	වික්ටෝරියා වැගල -කි.මී.11			25,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-09-2021 -Lot-II	හසලක ඔය මහියංගන පාලම දිගුව -කි.මී.2			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-09-2021 -Lot-III	කඳන්හේන තවදිල්ලි වාඩිය -කි.මී.11			25,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-09-2021 -Lot-IV	අරළු පිටිය දෙහිගම (මාදුරුඔය පුවක්පැලේ) -කි.මී.13.5			31,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-09-2021 -Lot-V	වල්මිතලාව අයිස්පිල්ල අදියර 3 -කි.මී.10			23,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-09-2021 -Lot-VI	වල්මිතලාව අයිස්පිල්ල අදියර 4 -කි.මී.10			23,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය

දිස්ත්‍රික්කය හා ඊට ඇතුළත් කිලෝමීටර් ප්‍රමාණය	ප්‍රසම්පාදන අංකය	විදුලි වැටේ නම සහ දිග ප්‍රමාණය	ICTAD ආයතනයේ ලියාපදිංචිය (දිස්ත්‍රික්කයටම ඉදිරිපත් කරන්නේ නම්)	ආපසු නොගෙවන ලංසු අයදුම් පත්‍ර ගාස්තුව (රු.)	ලංසු සුරක්ෂණ වටිනාකම (රු.)
රත්නපුර කි.මී.42.5	WL/02/20/R-10-2021 (Lot-I – Lot-IV)		C7 හෝ ඉහළ මාර්ග	2,500.00	
	WL/02/20/R-10-2021 -Lot-I	මැදබැද්ද ඉළුක්පැලැස්ස -කි.මී.8			20,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-10-2021 -Lot-II	මුල්ගමපාර සමනල පාර වේල්ල - කි.මී.13			32,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-10-2021 -Lot-III	රජවක මුල්ගම පාර - කි.මී.10			25,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-10-2021 -Lot-IV	වේලිඔය මැදබැද්ද - කි.මී.11.5			28,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
මඩකලපුව කි.මී.108.5	WL/02/20/R-11-2021 (Lot-I – Lot-IX)		C6 හෝ ඉහළ මාර්ග	5,000.00	
	WL/02/20/R-11-2021 -Lot-I	මංගලගම කි.මී.10			22,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-II	මාරප්පලම් වෙප්පවට්ටුවාන් - කි.මී.6			13,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-III	තොනිතමඩු -කි.මී.3			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-IV	පුනානි නැගෙනහිර සිංහපුර -කි.මී.5			11,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-V	උත්තුච්චේනි -කි.මී.4			9,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-VI	මුල්ලිවට්ටුවාන් - කි.මී.11			24,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-VII	පුනානි බටහිර එකෙක්කට්ටු -කි.මී.3			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-VIII	වඩමුනේ LB -කි.මී.3			7,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-IX	පුනානි බටහිර මයිලවට්ටුවාන් -කි.මී.4			9,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-X	පෙරියවලි ඊච්ච අඩි -කි.මී.2			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XI	පෙරියවලි 6 කණුව - කි.මී.1			2,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XII	පෙරියවලි මඩුපිට්ටිතෝට්ටන් - කි.මී.1			2,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XIII	කෝරවලි(වට්ටුවාන්) කි.මී.1			2,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XIV	උත්තච්චි මධුරාවට්ටි - කි.මී.1			2,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XV	කෝරාවලි - කි.මී.7			15,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XVI	කුඩුම්බිමලේ ශාන්තිමලේ - කි.මී.2			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XVII	කුඩුම්බිගල පෙරියමියන්ගල් - කි.මී.2			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XVIII	පුලන්කාඩු පොන්ඩුකඩ්චේනි - කි.මී.9			20,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XIX	පුනානි බටහිර සලබච්චේනි - කි.මී.2			4,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XX	කෝරාවලි වෙල්ලමච්චේනි - කි.මී.4			9,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XXI	අක්කරාත - කි.මී.5			11,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XXII	මිනිමිනිත්තවේලි - කි.මී.2.5			5,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XXIII	මදුරන්කේනිකුලම් කිරිමච්චි - කි.මී.10.5			23,500/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය
	WL/02/20/R-11-2021 -Lot-XXIV	මයියන්කල් වාහනේරි - කි.මී.9.5			21,000/- 2021.07.21දින දක්වා වලංගු විය යුතුය

02. එක් ලංසුකරුවකුට දිස්ත්‍රික්ක සියල්ලටම හෝ එක් දිස්ත්‍රික්කයක් ඇතුළත ඇති ලොට් එකකට හෝ සියල්ලටම ලංසු ඉදිරිපත් කළ හැකි නමුදු ප්‍රදානයේදී එක් ලංසුකරුවකුට ප්‍රදානය කරනුයේ එක් දිස්ත්‍රික්කයක් හෝ කි.මී.100කට ආසන්න සීමාවකට යටත් වන පරිදි වේ.

03. යම්කිසි ලංසුකරුවකු ලොට් එකකට හෝ කිහිපයකට ලංසු ඉදිරිපත් කරන්නේ නම් ICTAD හි මාර්ග සඳහා ලියාපදිංචි ශ්‍රේණිය අනුව C9 සඳහා කි.මී.15ක් ද,C8 සඳහා කි.මී.37.5ක් ද,C7 සඳහා කි.මී.75ක් ද, C6 සඳහා ඉහත 02 ජේදයේ වන පරිදි උපරිමයකට යටත්ව ලංසු ඉදිරිපත් කළ හැක.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි 2021.03.17 සිට 2021.04.06 දින දක්වා රජයේ වැඩකරන කාර්යාල දිනයන්හිදී පෙ.ව.9.00 සිට ප.ව. 2.30 දක්වා බත්තරමුල්ල, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේදී නොමිලේ පරීක්ෂා කළ හැක.

05. ලංසු ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කර ඇති අතර පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා 2021.04.06 දින වන තෙක් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නමින්, කරන ලද ලිඛිත ඉල්ලීම හා ICTAD ලියාපදිංචි පොතෙහි මුල්පිටපත, ආපසු නොගෙවන ලද තැන්පත් මුදල දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් පසු ලබාගත හැක.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් අදළ ව්‍යාපෘති පරිශ්‍රය පරීක්ෂා කර බලා ලංසු ඉදිරිපත් කිරීම කළ යුතුය.

07. ඉහත සඳහන් ලංසු සුරක්ෂණය බැංකුවක් මගින් ඉදිරිපත් කරන්නේ නම් දක්වා ඇති වටිනාකම දක්වා ඇති දින තෙක් වලංගු වන සේ රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මගින් ඉදිරිපත් කළ යුතුය. එය මුදලින් ගෙවන්නේ නම් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පතේ පිටපතක් ඇමිණිය යුතුය. ලංසු ලියවිලි සමග ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ඇස්තමේන්තු මුදල මිලියන 5ට වඩා වැඩිවන සෑම ලංසුවක් සඳහාම 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී PCA 03 සහතිකය ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කර තිබිය යුතුය.

09. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි මුල්පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් ලියුම් කවරවල බහා මුදු, තබා නැවත එක් කවරයක බහා මුදු, තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය සඳහන් කර 2021.04.07 ප.ව.2.30 ට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියට බහාලිය හැකි අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම එදිනම (2021.04.07) ප.ව. 2.30 ට සිදු කරනු ලබන අතර, ඒ සඳහා ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

10. ලංසුපත් පිළිබඳ වැඩිමනත් විස්තර 0112-871537 දුරකථනය මගින් දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂ(මුදල්) ඇමතීමෙන් ලබාගත හැක. ලංසුපත් පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතු වන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන්හි සඳහන් වන හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයන්ට අදළ කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබා දීමේ බලය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

11. ලංසුපත් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වැය වන කිසිදු පිරිවැයක් සඳහා සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ,
අංක 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගම් නම : **සෙන්ට් මේරිස් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ලියාපදිංචි ලිපිනය : **පලායිකුලි, අඩම්පන්, මන්නාරම.**

ලියාපදිංචි අංකය : **පී.වී. 00235428**

සංස්ථාගත කළ දිනය : **2021-02-24**

ලේකම්

නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම

ඊසී වේ ෆුඩ් කැබින් (පිවිටි) එල්ටීඩී

ලියාපදිංචි අංකය : පීවී 00235836

ලියාපදිංචි දිනය : 02.03.2021

ලියාපදිංචි කාර්යාලය : 212, ඔලිම්පස් නිවාස, මිලේනියම් සිටි, අතුරුගිරිය.

අධ්‍යක්ෂක

විශේෂ ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීමයි

බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, 17 වන පටුමග, අංක 95/1බී දරන ස්ථානයේ පදිංචි **නයනා නිරංජලා ඊෂ්වර** (ජා.හැ.අංක 696512680V හිමි) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අධිකාරී ජයසුන්දර මුදියන්සේලාගේ සිරිසෝම මහතා විසින් ලියා සහතික කරන ලද අංක 3132 සහ වර්ෂ 2013 ක් වූ ජූලි මස 17 වන දින දරන දෙල්කඳ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 4743 යටතේ 124 වන කාණ්ඩයේ 63 වන පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් පත්තිපිටිය, රුක්මල්ගම, විදුලි මාවත, අංක 60/10 දරන ස්ථානයේ පදිංචි **හසිත කෞෂල්‍ය උක්වත්තගේ** (ජා. හැ.අංක 863234093V හිමි) යන අයට දෙන ලද ඇටෝර්නි බලය වර්ෂ 2021 ක් වූ මාර්තු මස 12 වන දින අවලංගු කර නිශ්ප්‍රභ කර බල රහිත කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. වර්ෂ 2021 ක් වූ මාර්තු මස 12 වන දිනෙන් පසුව ඉහත කී ඇටෝර්නි බලය යටතේ එකී **හසිත කෞෂල්‍ය උක්වත්තගේ** යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මම වග නොකියන බව ද දැනුම් දෙමි.

නයනා නිරංජලා ඊෂ්වර **වර්ෂ 2021 ක් වූ මාර්තු මස 12 වන දිනදිය.**

ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් - PB 222
කොටස් සහතික පත්‍රය නැති වීම

පහත සඳහන් කොටස් සහතික පත්‍රය නැතිවී ඇති බව වාර්තා වී ඇත.

කොටස් හිමියාගේ නම	කොටස් සහතිකයේ අංකය	කොටස් ගණන
වන් ඒසියා ඉන්වෙස්ට්මන්ට්ස් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	001000	4,440,000,000

මෙම දැන්වීම ප්‍රකාශයට පත්කරන ලද දින සිට දින 21 ක් ඇතුළත කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කරනු නොලබන්නේ වී නම් ඉහත සඳහන් කොටස් හිමියා හට එම කොටස් සහතිකයේ අනු පිටපතක් (Duplicate Share Certificate) නිකුත් කරනු ලබන අතර, එහි මුල් කොටස් සහතික පත්‍රය අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,
අංක 59, ග්‍රෙගරි පාර, කොළඹ 07.
2021 මාර්තු මස 09

විශේෂ ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීමයි

ඕස්ට්‍රේලියාව, වී.අයි. සී. 3171, ස්ප්‍රින්ක්වේල්, කොලොන්සායි පාර, අංක 2/4 දරන ස්ථානයේ පදිංචි **නයනා නිරංජලා ඊෂ්වර** (විදේශ ගමන් බලපත්‍ර අංක N 2423092 හිමි) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මයෝම් රණවක මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 103 සහ වර්ෂ 2016 ක්වූ පෙබරවාරි මස 12 වන දින දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 3794 යටතේ 162 වන කාණ්ඩයේ 32 වන පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, 17 වන පටුමග, අංක 95/1බී, දරන ස්ථානයේ පදිංචි **හසිත කෞෂල්‍ය උක්වත්තගේ** (ජා.හැ.අංක. 863234093 V හිමි) යන අයට දෙන ලද ඇටෝර්නි බලය වර්ෂ 2021 ක්වූ මාර්තු මස 12 වන දින අවලංගු කර නිශ්ප්‍රභ කර බල රහිත කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. වර්ෂ 2021 ක්වූ මාර්තු මස 12 වන දිනෙන් පසුව ඉහත කී ඇටෝර්නි බලය යටතේ එකී හසිත කෞෂල්‍ය උක්වත්තගේ යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මම වග නොකියන බව ද දැනුම් දෙමි.

නයනා නිරංජලා ඊෂ්වර **වර්ෂ 2021 ක්වූ මාර්තු මස 12 වන දින දිය.**

ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
මහ කොළඹ ජලය සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3
EIB සහ ADB ණය මගින් අරමුදල් සැපයේ

කොළඹ මහා නගර සභාව සඳහා කිරුළ - නාරාහේන්පිට මළාපවහන පද්ධතිය සංවර්ධනය කිරීම

ICB කොන්ත්‍රාත් අංක : GCWWMIIP-P2/EIB/KN

01. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන අරභයා යුරෝපා ආයෝජන බැංකුව වෙතින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය අරමුදලේ කොටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ යෝග්‍ය ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

02. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මින් ඉදිරියට "සේව්‍යයා" යනුවෙන් හැඳින්වෙන අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව, විෂය ක්ෂේත්‍රය පහත සැකෙවින් විස්තර කොට ඇති පරිදි කොටස් දෙකක් ලෙස සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් දැන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

විදුලි, යාන්ත්‍රික, SCADA යනාදිය ඇතුළු පොම්පාගාර දෙකක් ඉදිකිරීම සමග, කි.මී. 5.4 ක විවෘත කැපුම සහ කි.මී. 5.4 ක අගල් රහිත, ආසන්න වශයෙන් කි.මී. 10.8 ක ගුරුත්ව මලාපවහන ජාල පද්ධතිය අතුරා ඉදිකිරීම, මි.මී. 315 බාහිර තව්වේ කි.මී. 1.6 ක HDPE බලය යෙදූ ප්‍රධාන වාහක නළය ඇතිරීම හා ඉදිකිරීම.

03. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය තනි අදියර කවර දෙක ක්‍රියා පටිපාටියට අනුකූලව මෙහෙයවනු ලබන අතර, සෑම රටකම සෑම ලංසුකරුවන්ටම විවෘතය.

04. "කොළඹ - 7, ආනන්ද කුමාරස්වාමි මාවත, නො. 86, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේද" අභිලාෂී ලංසුකරුවන්ට ලංසුකරණ ලිපිලේඛන ලබා ගැනීමට පෙර කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලීමටත්, වෙනත් වැඩිමනත් විස්තර ලබා ගැනීමටත් පිළිවත. දුරකථනය (94)(11) 2665331, 5736015 හෝ 2665325, විද්‍යුත් තැපැල - pdgcwmp@sltnet.lk

05. ඉහත ලිපිනයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලංරු. 100,000 ක් හෝ ඇ.ඩොලර් 500 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හෝ මහජන බැංකුවේ, නගර ශාලා ශාඛාවේ අංක 167-1001-8-9026033 දරන ගිණුමෙහි ලංසුවේ නම සඳහන් කර තැන්පත් කිරීමෙන් අනතුරුව ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. මුදල් ප්‍රේෂණය සනාථ කෙරෙන ෆැක්ස් පිටපතක් සමග ඉල්ලුම් කළවිට, ලංසුකරු විසින් තම රටේ ප්‍රවාහනය කලින් ඇණවුම් කර ඇත්නම් ලංසුකරණ ලිපිලේඛන කුරියර් සේවාව මගින් එවනු ලැබේ. එවන් අවස්ථාවකදී ගෙනැවිත් භාරදීම පිළිබඳව සේව්‍යයා වගකීමක් දරනු නොලැබේ.

06. ඉහත 4 වන ඡේදයේ දී ඇති ලිපිනයේදී 2021 මාර්තු 25 දින පෙ.ව. 9.00 ට ආරම්භව ස්ථානීය පරීක්ෂාවක් පැවැත්වෙනු ඇත. පූර්ව - ලංසු රැස්වීම එදිනම ප.ව. 2.30 ට, එම ස්ථානයේදී පැවැත්වෙනු ඇත. එම අවස්ථා දෙකටම සහභාගි වන ලෙස ලංසුකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

07. සියලුම තාක්ෂණික ලංසු සමග ලංසුකරණ ලිපිලේඛනයේ (2 වන කොටස - ලංසු දත්ත පත්‍රිකාව) විස්තර කොට දක්වා ඇති මුදලට ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

08 ලංසු දින 203 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, ලංසු සුරක්ෂණය ලංසු භාර ගැනීමේ අවසාන දිනයේ සිට දින 231 ක කාලයකට වලංගු විය යුතුය.

09. ලංසු ලිපිලේඛනවල සඳහන් විස්තර හා ආකෘතිය අනුව සකස් කරගත් ලංසු, "ශ්‍රී ලංකාව, කොළඹ - 2, යුනියන් පෙදෙස, නො. 330, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (අවධානය / ප්‍රධාන ගණකාධිකාරී) සභාපති" නමට යොමු කොට 2021 අප්‍රේල් 27 දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් "ටෙන්ඩර් පෙට්ටියේ" බහාලිය යුතුය.

10. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. තාක්ෂණික ලංසු, ඉහත සඳහන් ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට කැමැති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී විවෘත කෙරේ.

11. ලංසුකරුවන් විසින් ලංසු පිළියෙල කිරීම. පූර්ව - ලංසු රැස්වීමට සහභාගිවීම හා ලංසු භාරදීම සම්බන්ධයෙන් දරනු ලබන යම් පිරිවැය හෝ වියදම් සඳහා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය.

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

ලංසු සඳහා ආරාධනයයි (IFB)
ත්‍රිකුණාමලය නගර සභාව

01. ත්‍රිකුණාමලය නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුමේ සභාපති විසින් පහත සඳහන් අයිතම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තබන ලද ලංසු දැන් භාර ගනු ලැබේ.
   - ❖ ඇම්පියර් 250 ස්වයංක්‍රීය සංක්‍රමණ ස්විච් සහිත 2 KVA 250 විදුලි ජනක යන්ත්‍ර සැපයීම හා සවිකිරීම
   - ❖ 48000 BTU (බ්‍රිතාන්‍ය තාප ඒකක) සිවිලිම මත තංවනු ලබන (Ceiling mounted) වායු සමීකරණ යන්ත්‍ර හයක් (06) සැපයීම හා සවිකිරීම
   - ❖ අශ්වබල (HP) 5 ඩීසල් එන්ජිම සහිත බිම් පඳුරු කපන යන්ත්‍රයක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසධුලේඛනගත නොවී සිටිය යුතු වන අතර, අංක 04/2016 හා 2016 මාර්තු 16 වන දින දතම දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි මෙම ලංසු කැඳවීම (IFB) පහත වගුවේ සඳහන් පරිදි අවශ්‍ය CIDA හි වලංගු ලියාපදිංචිය සහිත ලංසුකරුවන් හට සීමාවනු ඇත.

04. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපිලේඛනවල 3 වන ව්‍යාප්තිය / කොටස් දක්වා ඇති සුදුසුකම් අවශ්‍යතාවලට අනුකූලව වනු ඇත.

05. අභිලාෂ ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු පහත 6 වන ඡේදයේ සඳහන් ලිපිනයන් වෙතින් විමසා ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන එම ලිපිනයේදීම ඕනෑම වැඩ කරන දිනයකදී පැය 09.00 සිට පැය 16.00 දක්වා අතරතුර පරීක්ෂාකර බැලිය හැකිය.

06. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරනලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, පහත දැක්වෙන ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා පහත වගුවේ සඳහන් අදාළ වටිනාකමට වන අදාළ ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන්ද, අනතුරුව 2021.03.15 වන දින සිට 2021.04.05 වන දින දක්වා පැය 09.00 සිට පැය 15.00 දක්වා රාජකාරී දිනවලදී ත්‍රිකුණාමලය, ඩොක් යාඩ් (තාටාක අංගනය) පාරේ අංක 400 හි ත්‍රිකුණාමලය නගර සභාව වෙතින් මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින්ම වනු ඇත.

(දුරකථන : 026-2222275, 026-2222274, ෆැක්ස් : 026-2220552)

07. අනු පිටපතකින් යුක්තව සකස් කරන ලද ලංසු (මුල් පිටපත හා අනු පිටපත) වශයෙන් පිටපත් 2 කින් යුක්තව, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය පැහැදිලිව සටහන් කර, 2021.04.06 වන දින පැය 11.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ ත්‍රිකුණාමලය ඩොක්යාඩ් (තටාංක අංගනය) පාරේ, අංක 400 හි ත්‍රිකුණාමලය නගර සභාවේ, සභාපති වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු එකී ලංසු භාරගත්තා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලබේ.

08. සියලුම ලංසු සමග වගුවේ දක්වා ඇති තොරතුරු ප්‍රකාරව වන ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.

ලංසු අංකය	කර්මාන්තයේ විස්තරය	ඇස්තමේන්තු ගත පිරිවැය (රුපියල්)	නිමා කළ යුතු කාල සීමාව	ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රුපියල්)	අවශ්‍ය ශ්‍රේණිය	අවශ්‍ය ලංසු සුරක්ෂණ ඇපකරය	
						ලංසු ඇපකරයේ වටිනාකම	වලංගු කාල සීමාව
BD/UC/Tri-Generator/ 2021/01	ඇම්පියර් 250 ස්වයංක්‍රීය සංක්‍රමණ ස්විච් සමග 250 KVA විදුලි ජනක යන්ත්‍රයක් සැපයීම හා සවිකිරීම	5,000,000.00	මාස 03	රුපියල් 3,000.00	EM 3 හෝ ඉහළ	50,000.00	2021/07/15 වන දින දක්වා
BD/UC/Tri/ AC/2021/02	48000 BTU Ceiling mounted වායු සමීකරණ යන්ත්‍ර 06 සැපයීම හා විකිණීම	3,000,000.00	මාස 03	රුපියල් 2,000.00	EM 3 හෝ ඉහළ	30,000.00	2021/07/15 වන දින දක්වා
BD/UC/Tri/ cutter/ 2021/03	බිම් පඳුරු කපන යන්ත්‍රයක් (Ground bush cutter) (අශ්වබල (HP) 05 ඩීසල් එන්ජිම සහිත සැපයීමේ ප්‍රසම්පාදනය	400,000.00	මාස 03	රුපියල් 500.00	-	5,000.00	2021/07/15 වන දින දක්වා

පූර්ව ලංසු රැස්වීමක් ත්‍රිකුණාමලය ඩොක්යාඩ් (තටාක අංගනය) පාරේ, ත්‍රිකුණාමලය නගර සභාවේදී 2021.03.31 වන දින පෙ.ව. 11.00 ට පැවැත්වීමට නියමිතව ඇත.

N. රාජනායගම්,
සභාපති,
ත්‍රිකුණාමලය නගර සභාව, ත්‍රිකුණාමලය.

CDU/TS/2021/03&04

ශ්‍රී ලංකා රේගුව

රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීම

රාජසන්තක කරන ලද වාහන, රත් / රිදී ආභරණ, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ වෙනත් විවිධ අයිතමයන් විකිණීමේ ටෙන්ඩරයක් **2021.03.18 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශයේ ශ්‍රවණාගාරයේදී** පැවැත්වේ.

එම භාණ්ඩ සහ එහි විස්තර ඇතුළත් පත්‍රිකා ආපසු නොගෙවන, රුපියල් 25/= ක මුදලක් ගෙවා **ශ්‍රී ලංකා රේගුවේ තෙවන මහලේ මධ්‍යම අපහරණ අංශයෙන් 2021 මාර්තු මස 15, 16, 17 යන දිනයන් හිදී පෙ.ව. 10.00 සිට ප.ව. 3.30 දක්වා** ලබාගත හැකිය.

තවද, එම භාණ්ඩ ලැයිස්තුව ශ්‍රී ලංකා රේගු නිල වෙබ් අඩවිය www.customs.gov.lk මගින් **2021 මාර්තු මස 12** දින සිට ප්‍රදර්ශනය කරනු ඇත.

වැඩි විස්තර සඳහා දුරකථන අංක :
011-2430795/ 011-2143434 දිගුව 7300

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගුව,
අංක 40, කෙලින් වීදිය,
කොළඹ 11.

කාසල් වීදියේ කාන්තා රෝහල - කොළඹ 08

2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා ඉවතලන ද්‍රව්‍ය මිලදී ගනු ලබන්නන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් සහ සේවාවන් සැපයීම පිණිස සැපයුම්කරුවන්, නිෂ්පාදකයින් ලියාපදිංචි සමුපකාර සමිති ඇතුලු රජයේ ආයතන සහ පිළිගත් වාණිජ්‍ය ආයතන සහ පුද්ගලයන්ගෙන් මෙම රෝහල යටතේ ලියාපදිංචි වීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) ද්‍රව්‍ය සැපයීම

01. සියලුම වර්ගවල ලිපිද්‍රව්‍ය (පරිගණක ලිපිද්‍රව්‍ය ඇතුලුව)
02. කාර්යාලයීය උපකරණ (ෆොටෝ කොපි යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර)
03. කාර්යාලයීය ගෘහ භාණ්ඩ හා ලී බඩු උපකරණ (ලී, වානේ, ප්ලාස්ටික්)
04. කොහු මෙට්ට සහ රබර් මිශ්‍ර කොහු මෙට්ට
05. ඉදල්, කොසු, මොප්, ටොයිලට් බුරුසු ආදිය
06. සියලුම වර්ගවල සබන් හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය
07. සියලුම වර්ගවල රෙදි වර්ග, තීර රෙදි, මැකින්ටෝස් සහ ආශ්‍රිත නිෂ්පාදන
08. මෙතිලේටඩ් ස්පිරිට්
09. පාවහන් හා ශල්‍යාගාර පාවහන්
10. රසායනාගාර සඳහා රසායනික ද්‍රව්‍ය
11. රසායනාගාර උපකරණ හා වෛද්‍ය උපකරණ
12. සියලුම ඖෂධ වර්ග
13. ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය නොවන ද්‍රව්‍ය
14. කසළ බහාලන පොලිතීන් බෑග් හා පොලිතීන් වර්ග
15. විදුලි උපකරණ (වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ, විදුලි පංකා, පොලිෂර්)
16. සියලුම වර්ගවල ජල නළ උපාංග, සතිපාරක්ෂක උපකරණ හා හාර්ඩ්වෙයාර් අයිතම
17. ටයර් සහ ටියුබ්, වාහන බැටරි
18. රෝහල් උපකරණ සැපයීම (බෙහෙත් ට්‍රොලි, ඇඳන්, ආහාර ට්‍රොලි, සුපර්මාකට් ට්‍රොලි ආදිය)

(ආ) සැපයිය යුතු සේවාවන්

01. කුෂන් කිරීම (වාහන, කුෂන් පුටු) / වේවැල්
02. රබර් මුද්‍රා, ප්ලාස්ටික් නාම පුවරු සෑදීම
03. ශල්‍යාගාර, රසායනාගාර සහ සියලුම රෝහල් උපකරණ අලුත්වැඩියා කිරීම
04. විදුලි මෝටර්, ට්‍රාන්ස්පෝමර් නැවත ඔතවා ගැනීම හා විදුලි පංකා ආදිය අලුත්වැඩියාව, විදුලි කේතල්, විදුලි බොයිලේරු ආදී ඉලෙක්ට්‍රික් භාණ්ඩ අලුත්වැඩියාව
05. දුරකථන සේවාවන් ඉදිකිරීම, ආරක්ෂිත කැමරා , සේවා හා නඩත්තු කටයුතු
06. මෘත ශරීරාගාරයේ වායුසමීකරණ සහ මෘත ශරීර තැන්පත් කරන ලාච්චු
07. ගෑස් උපකරණ අලුත්වැඩියාවන් (ගෑස් බර්නර්, ගෑස් ලිප් ආදිය)
08. ලිපි ද්‍රව්‍ය මුද්‍රණය
09. පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම
10. ආයතනික හැඳුනුම්පත් සකස් කිරීම
11. වාහන අලුත්වැඩියාව හා සේවා කර ගැනීම
12. හිමිකම් නොපෑ මළ සිරුරු හා අජීවී කොටස් ඉවත් කිරීම
13. රසායනික අපද්‍රව්‍ය හා ඝණ අපද්‍රව්‍ය එකතු කර රැගෙන ගොස් විනාශ කිරීම
14. ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියාවන්

ඇ) අලෙවි කිරීම

මෙම රෝහලේ ඉවත් කළ කාඩ්බෝඩ්, පුවත්පත්, පොල්කටු, හිස් සේලයින් බෝතල්. ප්ලාස්ටික් කෑන්, හිස් වීදුරු බෝතල්, එක්ස්රේ වතුර හා කඩදාසි

උපදෙස් හා කොන්දේසි :

01. ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් අයිතමයක් සඳහා ආපසු නොගෙවන රු.1000/-ක් මුදලින් කාසල් වීදිය රෝහලේ සරප් වෙත ගෙවිය යුතු වන අතර, ලබා ගත්තා රිසිට් පතේ (පොදු 172) මුල් පිටපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. (මුදල් ඇනවුම් හා චෙක්පත් භාරගනු නොලැබේ) සැපයුම්කරුවන්ට අවශ්‍ය නම් අයිතමයන් කිහිපයකට ලියාපදිංචි විය හැකි අතර, එම එක් එක් අයිතමයක් වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවිය යුතුවේ. ඉල්ලුම්පත් කිහිපයක් එවන්නේ නම් සියලු අයදුම්පත් එක් කවරයක බහා එවිය හැකිය.
02. සියලුම අයදුම්පත් දී ඇති ආකෘතියට අනුව සකසා "අධ්‍යක්ෂ, කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ 08" යන ලිපිනයට 2021- 03-25 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
03. භාණ්ඩ හා සේවාවන් අවම වශයෙන් මසක කාලයක ණය පදනම මත සැපයීමට එකඟ විය යුතු අතර, භාණ්ඩ ප්‍රවාහනය කරදීමද අදාළ ආයතනය විසින් ඉටු කළ යුතුය.
04. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021" යනුවෙන් සඳහන් කරන්න.
05. කිසිම හේතුවක් නොදන්වා අයදුම්පත් භාර ගැනීමේ / ප්‍රතික්ෂේප කිරීමේ බලය කොළඹ 08 කාසල් වීදියේ කාන්තා රෝහලේ අධ්‍යක්ෂ සතුව ඇති බව සලකන්න.

අධ්‍යක්ෂ,
කාසල් වීදියේ කාන්තා රෝහල,
කොළඹ 08.

කාසල් වීදියේ කාන්තා රෝහල - කොළඹ 08

සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා ඉවතලන ද්‍රව්‍ය මිළදී ගනු ලබන්නන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය - 2021

01 ව්‍යාපාරිකයාගේ නම සහ ලිපිනය : .....
02. ලියාපදිංචි වීමට කැමති සැපයුම් හෝ සේවා අංකය : .....
03. අයදුම්කරුගේ නම හා ලිපිනය : .....
04. ව්‍යාපාරික ලියාපදිංචි අංකය සහ ලිපිනය : .....
(ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අමුණන්න)

රුහුණ විශ්වවිද්‍යාලය

තාක්ෂණ පීඨය, කරගොඩ - උයන්ගොඩ, කඹුරුපිටිය

ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කුලී පදනම මත බස් රථයක් ලබා ගැනීම

කඹුරුපිටිය, කරගොඩ – උයන්ගොඩ පිහිටි රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ දෛනික ප්‍රවාහන අවශ්‍යතාවය සඳහා මාතර සිට ගොඩගම – පාලටුව අධිවේගී පිවිසුම හරහා කඹුරුපිටිය කරගොඩ – උයන්ගොඩ පිහිටි තාක්ෂණ පීඨය දක්වා ගමන් කිරීම සඳහා ආසන 32 ක බස් රථයක් කුලී පදනම මත සැපයීමට හැකි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බස් රථය නිෂ්පාදිත වර්ෂයේ සිට වසර 06 ක් ඉකුත් නොවිය යුතුය.

අදාළ අයදුම්පත ආපසු නොගෙවන රු. 500.00 ක මුදලක් මහජන බැංකුවේ තාක්ෂණ පීඨ ගිණුම් අංක 133100140070650 ට ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් සහකාර ලේඛකාධිකාරී, තාක්ෂණ පීඨය වෙතින් කාර්යාලීය දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා 2021.04.01 දින දක්වා ලබාගත හැකිය. වැඩි විස්තර සඳහා සහකාර ලේඛකාධිකාරී / තාක්ෂණ පීඨය (041-2294754) අමතන්න.

අයදුම්පත සමග වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය, අදාළ වර්ෂයේ ආදායම් බලපත්‍රය, පූර්ණ රක්ෂන සහතිකය සහ අදාළ රියදුරු මහතාගේ රියදුරු බලපත්‍රය හා රිය සහයකගේ අදාළ ලිපි ලේඛනයන්හි සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත පිටපත් දෙකකින් යුතුව 2021.04.05 දින ප.ව. 2.00 ට හෝ ඊට ප්‍රථම **"සහකාර ලේඛකාධිකාරී, තාක්ෂණ පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, කරගොඩ – උයන්ගොඩ, කඹුරුපිටිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ගෙනවිත් භාරදෙන්නේ නම්, ඔබගේ ටෙන්ඩර්පත නියමිත දින නියමිත වේලාවට පෙර රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර් ලියවිලි බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ප්‍රවාහන පහසුකම් සඳහා කුලී පදනම මත බස් රථයක් සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

2021.04.05 වන දින ප.ව. 2.00 ට ටෙන්ඩර්පත් විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

ලබාදෙන ලද ආකෘතියට අනුකූල නොවන ලෙස පුරවන ලද සියලු ටෙන්ඩර්පත්, අපැහැදිලි, අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් කිසිදු හේතුවක් නොදන්වා විශ්වවිද්‍යාලය මගින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, රුහුණ විශ්වවිද්‍යාලයීය ටෙන්ඩර් මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේඛකාධිකාරී,
රුහුණ විශ්වවිද්‍යාලය.

ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
මහ කොළඹ ජලය සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3
EIB සහ ADB ණය මගින් අරමුදල් සැපයේ

කොළඹ මහා නගර සභාවේ දකුණු ජලපෝෂක ප්‍රදේශයේ පවත්නා මළාපවහන මාර්ග පුනරුත්ථාපනය

ICB කොන්ත්‍රාත් අංක : GCWWMIIP-P2/EIB/SR

01. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩසටහන අරභයා යුරෝපා ආයෝජන බැංකුව වෙතින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය අරමුදලේ කෙටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ යෝග්‍ය ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

02. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මින් ඉදිරියට "සේව්‍යයා" යනුවෙන් හැඳින්වෙන අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව, විෂය ක්ෂේත්‍රය පහත සැකෙවින් විස්තර කොට ඇති පරිදි කොටස් දෙකක් ලෙස සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වෙතින් දැන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

අගල් රහිත (කි.මී. 4.5) සහ විවෘත කැපුම (කි.මී. 2.1) ක්‍රම යොදා ගනිමින් මලාපවහන කානු විශාලත්වය ඉහළ නැංවීමෙන් පුනරුත්ථාපනය කිරීම, සම්පූර්ණ දිග ප්‍රමාණය, මිමි 300 VC විෂ්කම්භය සිට මිමි 600 VC විෂ්කම්භය සහ මිමි 1000 RC විෂ්කම්භය සිට මිමි 1400 RC විෂ්කම්භය තුළ කි.මී. 6.6 ක් වේ. පවත්නා මලාපවහන කානු සහ පවත්නා මලාපවහන කානු නව මලාපවහන / මාරුකිරීමේ නිවාස සම්බන්ධතාවයන්ට සම්බන්ධ කිරීම පිළිබඳ CCTV පරීක්ෂණයන්ද ඊට ඇතුළත් වේ.

03. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය තනි අදියර කවර දෙක ක්‍රියා පටිපාටියට අනුකූලව මෙහෙයවනු ලබන අතර, සෑම රටකම සෑම ලංසුකරුවන්ටම විවෘතය.

04. **"කොළඹ – 7, ආනන්ද කුමාරස්වාමි මාවත, නො. 86, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේදී"** අභිලාෂී ලංසුකරුවන්ට ලංසුකරණ ලිපිලේඛන ලබා ගැනීමට පෙර කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලීමටත්, වෙනත් වැඩිමනත් විස්තර ලබා ගැනීමටත් පිළිවන. දුරකථනය (94)(11) 2665331, 5736015 හෝ 2665325, විද්‍යුත් තැපැල – pdgcwmp@sltnet.lk

05. ඉහත ලිපිනයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලංරු. 100,000 ක් හෝ ඇ.ඩොලර් 500 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හෝ මහජන බැංකුවේ, නගර ශාලා ශාඛාවේ අංක 167-1001-8-9026033 දරන ගිණුමෙහි ලංසුවේ නම සඳහන් කර තැන්පත් කිරීමෙන් අනතුරුව ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. මුදල් ප්‍රේෂණය සනාථ කෙරෙන ෆැක්ස් පිටපතක් සමග ඉල්ලුම් කළවිට, ලංසුකරු විසින් තම රටේ ප්‍රවාහනය කලින් ඇණවුම් කර ඇත්නම් ලංසුකරණ ලිපිලේඛන කුරියර් සේවාව මගින් එවනු ලැබේ. එවන් අවස්ථාවකදී ගෙනැවිත් භාරදීම පිළිබඳව සේව්‍යයා වගකීමක් දරනු නොලැබේ.

06. ඉහත 4 වන ඡේදයේ දී ඇති ලිපිනයේදී 2021 මාර්තු 25 දින පෙ.ව. 9.00 ට ආරම්භව ස්ථානීය පරීක්ෂාවක් පැවැත්වෙනු ඇත. පූර්ව – ලංසු රැස්වීම එදිනම ප.ව. 2.30 ට, එම ස්ථානයේදී පැවැත්වෙනු ඇත. එම අවස්ථා දෙකටම සහභාගි වන ලෙස ලංසුකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

07. සියලුම තාක්ෂණික ලංසු සමග ලංසුකරණ ලිපිලේඛනයේ (2 වන කොටස – ලංසු දත්ත පත්‍රිකාව) විස්තර කොට දක්වා ඇති මුදලට ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

08 ලංසු දින 203 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, ලංසු සුරක්ෂණය ලංසු භාර ගැනීමේ අවසාන දිනයේ සිට දින 231 ක කාලයකට වලංගු විය යුතුය.

09. ලංසු ලිපිලේඛනවල සඳහන් විස්තර හා ආකෘතිය අනුව සකස් කරගත් ලංසු, **"ශ්‍රී ලංකාව, කොළඹ – 2, යුනියන් පෙදෙස, නො. 330, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (අවධානය / ප්‍රධාන ගණකාධිකාරී) සභාපති"** නමට යොමු කොට 2021 අප්‍රේල් 27 දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු. නැතහොත් **"ටෙන්ඩර් පෙට්ටියේ"** බහාලිය යුතුය.

10. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. තාක්ෂණික ලංසු, ඉහත සඳහන් ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට කැමැති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී විවෘත කෙරේ.

11. ලංසුකරුවන් විසින් ලංසු පිළියෙල කිරීම පූර්ව – ලංසු රැස්වීමට සහභාගිවීම හා ලංසු භාරදීම සම්බන්ධයෙන් දරනු ලබන යම් පිරිවැය හෝ වියදම් සඳහා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය.

මහජන නිවේදනය

හේලීස් සමූහයේ සමාගම් - කොටස් සහතික පත්‍ර

පහත ලැයිස්තුගත සමාගම්වල කොටස්වල උප කොට්ඨාශ කිරීම අවසන් කර ඇත. එවැනි උප කොට්ඨාශ ක්‍රියාත්මක වන දිනයන් පහත වගුවේ (B) තීරුවේ දක්වා ඇත. එකී කොටස්වල උප කොට්ඨාශයේ ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම විසින් නිකුත් කර ඇති දැනට පවතින සියලුම කොටස් සහතික පත්‍ර (C) තීරුවේ දක්වා ඇති දිනට අවලංගු කරනු ලැබේ. කොටස්වල උප කොට්ඨාශයෙන් ව්‍යුත්පන්න වන කොටස් වැඩි වීමෙන් පසු නව කොටස් සහතික පත්‍ර නිකුත් නොකෙරේ. කොටස් සහතික පත්‍ර ඇති කොටස් හිමියන්, කොටස් බ්‍රෝකර්වරුන් මගින් CDS ගිණුම් විවෘත කර, එම ගිණුම් අංක සමාගම් ලේකම්වරු, හේලීස් ගෘෂ් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින අතර සමාගම් ලේකම්වරු එම කොටස් හිමියන්ගේ කොටස් සෘජුවම එම ගිණුම්වල තැන්පත් කිරීමට කටයුතු කරනු ඇත. (ලේකම්වරු - විද්‍යුත් තැපෑල: info.sec@hayleys.com)

සමාගමේ නම (A)	කොටස්වල උප කොටස් බලපැවැත්වෙන දිනය (B)	දැනට පවතින සියලුම කොටස් සහතික අවලංගු වන දිනය (C)
ඇලුමෙක්ස් පීඑල්සී	2021 මාර්තු 03 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 04 දින
ද කිංග්ස්බරි පීඑල්සී	2021 මාර්තු 03 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 04 දින
සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී	2021 මාර්තු 04 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 05 දින
සිංගර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) පීඑල්සී	2021 මාර්තු 04 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 05 දින
රෙග්නිස් (ලංකා) පීඑල්සී	2021 මාර්තු 04 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 05 දින
යුනිසිස්ට් ඉංජිනියරින් පීඑල්සී	2021 මාර්තු 04 දින කොටස් හුවමාරුවෙන් පසු	2021 මාර්තු 05 දින

අදාළ මණ්ඩලයන් හි අණ පරිදි
හේලීස් ගෘෂ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු
2021 පෙබරවාරි 12 දින

ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත

ලංසු සඳහා ආරාධනයයි (IFB)

පල්ලෙකැලේ හරිත වෙළඳපල සඳහා වෙළඳ කුටියක් සහ විවේක පියසක් නිර්මාණය සහ ඉදිකිරීම (REDA)

හඳුනාගැනීමේ අංකය : CPC/CS/11/REDA/01/2021

සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල රු. 5,000,000.00

1. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්කරන ලද නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ, ප්‍රසම්පාදන කමිටු සභාපති විසින්, ඉහත කර්තව්‍යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. කුණ්ඩසාලේ, පල්ලෙකැලේ, ගොඩනැගිලි සංකීර්ණයේ, මධ්‍යම පළාත් සභාවේ, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් 2021 අප්‍රේල් 01 වනද, 15.00 වන පැය දක්වා, රු. 2,500.00 ක ආපසු නොගෙවන ටෙන්ඩර ගාස්තුවක් ගෙවීම මගින් ලබාගත හැකි පෝරමවල ලංසු ඉදිරිපත් කළ යුතුය.
3. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පහත සුදුසුකම් නිර්ණායක සමග අනුකූල විය යුතුය.
අවශ්‍ය කරන ලියාපදිංචිය – CIDA (ICTAD)

ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු	විශේෂවේදීතාව
CIDA C8 සහ C7	ගොඩනැගිලි

C8 සහ C7 කොන්ත්‍රාත්කරුවකු

හෝ

- C8 සහ C7 කොන්ත්‍රාත්කරු(වන්) අතර හවුල් ව්‍යාපාරය.
- නිර්මාණ කාර්ය මණ්ඩලය ලංසුකරුවන්ගේම හෝ සේවා සැපයීම සඳහා එකඟතාවයකට පැමිණ ඇති වෙනම සමාගමක් විය හැක.

3. (a) ඉහත ඉදිකිරීම සඳහා ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) පටිපාටිය යටතේ යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය සඳහා සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව රු. මි. 05 ට අඩු නිසා, ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016(iii) හි නියමකර ඇති පරිදි අදාළ වේ.
4. මේ පිළිබඳව වැඩිදුර විස්තර සහ ලංසු ලේඛන, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, මධ්‍යම පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ (දු.ක. 081-2233725) වෙතින් 09.00 වන පැයත් 16.00 වන පැයත් අතර ලබාගත හැක.
5. ලංසු ලේඛන, මුදල් ගෙවීමකින් තොරව, 'නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, මධ්‍යම පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ' යන ලිපිනයෙන් 09.00 වන පැයත් 16.00 වන පැයත් අතර පරීක්ෂාකර බැලිය හැක.
6. ලංසු, 2021 ජූලි 06 වනද දක්වා වලංගු විය යුතුය. (දින 91)
7. සෑම ලංසුවක්ම 2021 අගෝස්තු 03 දක්වා වලංගු, රු. 100,000.00 ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත වාණිජ බැංකුවක් මගින් ලබාගත් ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.
8. මුදු, තැබූ ලංසු, 'නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), මධ්‍යම පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ' යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය.
9. ඉදිකිරීම් (නිර්මාණ සහ ගොඩනැගීම්) කාලසීමාව දින 60 කි.
10. ලංසු, 2021 අප්‍රේල් මස 06 වන දින 11.30 වන පැයට විවෘත කෙරේ.
11. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටී.
12. පෙර ලංසු රැස්වීම 2021 මාර්තු 29 වන දින 10.00 වන පැයට 'නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, මධ්‍යම පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ' යන ලිපිනයේදී පැවැත්වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,
මධ්‍යම පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,
පල්ලෙකැලේ,
කුණ්ඩසාලේ.

2021-03-09

ඇටර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හොරණ, ශ්‍රී සීලරතන මාවත, නො. 95 හි පදිංචිව සිට දැනට 09, EXELL DRIVE DANDENONG NORTH, 3578, VIC, MELBOURN, AUSTRALIA දරන ස්ථානයේ පදිංචි **හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ** යන අය විසින් ඕස්ට්‍රේලියාවේදී ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය Special Power of Attorney dated 12th January, 2015 attested by Wimalasiri Jayakody, 26 Thomas Mitchell Drive, Endeavour Hills, Vic 3802, registered in the Register Written Authorities in Volume / Folio 155/45 day Book entry No. 554 dated 28th January, 2015 මෙතැන් පටන් අවලංගු හා බලරහිත ශූන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේම දැනගැනීම පිණිස දන්වන අතර, එකී බලපත්‍රය යටතේ මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් අංක 68, ශ්‍රී සීලරතන මාවත, හොරණ හි පදිංචි **හල්පන්දෙනිය හේවගේ ගාමිණී කීර්ති කුමාර ආනන්දවංශ** (ජා. හැ. අංකය, 620570656V) යන අයට දී ඇත්තා වූ 2015.01.12 වන දින ඇටෝර්නි බලය මෙතැන් පටන් මින් අවලංගු කරන්නෙමි. එබැවින් අද දින පටන් එකී ඇටෝර්නි බලකරු විසින් කරන කිසිදු කටයුත්තකට **හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ** වන මා මින්මතු වග නොකියන බව මෙයින් සියලු දෙනාටම දැනුම් දෙමි.

හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ

පඩි පාලක සභා ආඥා පනත

පඩි පාලක සභා තීරණ වලින් ආවරණය වන කම්කරුවන්ට 2021 පෙබරවාරි මාසයට ගෙවිය යුතු වේතන පහත දැක්වේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

2021 මාර්තු මස 09 වන දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොකෝවා, කරඳමුංගු සහ ගම්මිරිස් වැවීමේ හා සෑදීමේ කර්මාන්තය	කම්කරුවෙකුට දිනකට රු. 905.41

මීට අමතරව 2005 අංක 36 දරන අයවැය සහන දීමනා පනත හා 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත අනුව ගෙවිය යුතු දීමනාව සෑම සේවායෝජකයකු විසින්ම අදාළ සේවකයින්ට ගෙවිය යුතුය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)

(පිරිපහදු අංශය)

ටෙන්ඩර් දැන්වීමයි

උපයෝගිතා ක්ෂේත්‍රයේ බිම කොන්ක්‍රීට් කිරීම සඳහා ටෙන්ඩර් - අදියර 1

REF-PD/WORKS/03/2021

ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාවේ (CPC)හි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) විසින් කැලණිය, සපුගස්කන්ද, තෙල් පිරිපහදුව හි, උපයෝගිතා ක්ෂේත්‍රයේ Utility Area) හි, බිම කොන්ක්‍රීට් කිරීමේ කාර්යය අදියර 1 සඳහා මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

ලංසුකරුවන් විසින්, ලංසු ලිපිලේඛන ලබාගන්නා අවස්ථාවේදී, ඉල්ලීමේ ලිපිය ද සමග පූර්ව – යෝග්‍යතා නිර්නය සඳහා වන පහත දැක්වෙන ලියකියවිලිද ඉදිරිපත් කළ යුතුය.

1. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA)හි, 8 වන ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණි සඳහා වලංගු ලියාපදිංචි සහතිකය.
2. පසුගිය වසර පහ (05) තුළ සමාන අන්දමේ හා ස්වභාවයේ කාර්ය කර්මාන්ත ඉටුකළ බවට වන ලේඛනගත සාක්ෂි ඒ බව සනාථ කිරීම සඳහා අනුග්‍රාහක භවතුන් වෙතින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

ලංසු ලිපිලේඛන ලබාගන්නා අවස්ථාවේදී පිරිපහදුවේ. මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත, ආපසු ගෙවනු නොලබන රු. 1,000/- ක (එක් දහසක) ටෙන්ඩර් ගාස්තුවක් ගෙවිය යුතුය.

ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය හා වේලාව 2021-03-30 වන දින පැය 15.00 (ප.ව. 03.00) දක්වා වන අතර, මුදු, තබන ලද ලංසු භාර ගන්නා අවසාන දිනයට හා වේලාව සහ ලංසු විවෘත කරනු ලබන දිනය හා වේලාව 2021-04-07 වන දින පැය 14.30 (ප.ව. 2.30) වනු ඇත.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC),
ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව (CPC),
පිරිපහදු අංශය,
සපුගස්කන්ද, කැලණිය.

දුරකථන : + 94 11 2400684 / 2400427 / 2400431
ෆැක්ස් : + 94 112400684 / 2400431 / 2400436

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
App Store Google play Windows Store
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

ලංසු සඳහා ආරාධනයයි (IFB)

අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු අධ්‍යාපන ආයතන සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් අංක : ED/07/101/04/CF/2021/G-11

01. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ගුරු අධ්‍යාපන ආයතන සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසු ලේඛනයේ අඩංගු වේ. අපේක්ෂිත, ගෙනැවිත් භාරදීමේ කාල සීමාව පිළිගැනීමේ ලිපිය ලැබුණු දින සිට සති 8-10 අතර කාලයක් වේ. සෑම ලංසුවක්ම පහත වගුවේ සඳහන් පරිදි ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.

අයිතම පිළිබඳ විස්තරය	ලංසු සුරක්ෂණය රු.
ලොට් **A** - ශිෂ්‍ය පුටු සහ මේස, දේශක පුටු සහ මේස, කෑම මේස සහ පුටු	රු. 120,000.00
ලොට් **B** - කාර්යාල පුටු සහ මේස, පරිගණක මේස සහ පුටු, විධායක පුටු සහ මේස	රු. 115,000.00
ලොට් **C** - පන්තිකාමර පුටු	රු. 45,000.00

02. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය අනුව සිදු කෙරේ (NCB)

03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට මේ පිළිබඳව වැඩිදුර විස්තර, **"ප්‍රසම්පාදන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, 5 වන මහල, "ඉසුරුපාය", බත්තරමුල්ල"** (දු. ක. 011-2785573) වෙතින් ලබාගත හැකි අතර, ලංසු ලේඛන මුදල් ගෙවීමකින් තොරව 2021 මාර්තු 31 වන දින දක්වා රාජකාරී දිනවල පෙ.ව. 9.00 - ප.ව. 3.00 ත් අතර පරීක්ෂාකර බැලිය හැක.

04. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන්, රු. 5,000/- ක ආපසු නොගෙවන ගාස්තුවක් (එක් ලේඛනයකට) ගෙවා ලබාගත හැක. (ගෙවීමේ ක්‍රමය මුදල් මගිනි)

05. ලංසු, 2021 අප්‍රේල් 01 වන දින, පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර **"ප්‍රසම්පාදන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, 5 වන මහල, "ඉසුරුපාය", බත්තරමුල්ල"** යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකර ආපසු එවනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ පසු ඉහත සඳහන් ලිපිනය වෙත එදිනට පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කෙරෙනු ලැබේ.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය", බත්තරමුල්ල.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

ලංසු කැඳවීම

වයඹ පළාත තුළ පාලම් ඉදිකිරීමට යෝජිත ස්ථානයන්හි ස්ථානීය මිහි විදුම් පරීක්ෂණ සිදුකිරීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් අධ්‍යක්ෂගේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කොන්ත්‍රාත්තුව සඳහා පාලම් ඉදිකිරීමට යෝජිත ස්ථානයන්හි ස්ථානීය මිහි විදුම් පරීක්ෂණ සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගේ මුදු, තබන ලද ලංසු ආරාධනා කෙරේ.

කොන්ත්‍රාත් අංකය	ව්‍යාපෘතියේ නම	මිහි විදුම් ගණන	ඉංජිනේරු ඇස්තමේන්තුව (සම්භාව්‍යතාවය සහ VAT රහිත) රු. (මිලියන)	ලංසු ආරක්ෂණය (රු.)	කොන්ත්‍රාත් කාලය (මාස)
RDA/SMF/BI/GOSL/PD/NWP/2021-14	වයඹ පළාත තුළ පාලම් ඉදිකිරීමට යෝජිත ස්ථානයන්හි ස්ථානීය මිහි විදුම් පරීක්ෂණ මගින් භූ ගර්භයේ ස්ථරායනයේ, මව් පාෂාණයට ඇති ගැඹුර, එහි ශක්ති හා පාංශු ස්ථරවල ශක්ති පරාමිතිය තීර්ණය කිරීම.	75	14.36	236,200.00	03

2. ලංසු කැඳවීමේ ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.
3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය (වයඹ), මාර්ග සංවර්ධන අධිකාරිය, පුත්තලම් පාර, කුරුණෑගල වෙතින් වැඩි තොරතුරු ලබාගත හැක. **දුරකථන අංකය** 037-2056534
4. 2021.03.19 **දින පෙ.ව** 10.00 ට මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (වයඹ) කාර්යාලයේදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වේ.
5. ලංසුකරු මෙම සේවාවෙහි ස්වභාවයට සමාන ව්‍යාපෘතියන්හි අවම වශයෙන් **වසර 03 ක** පළපුරුද්දක් තිබිය යුතු අතර, ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
6. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වේ.
7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021.03.12 **දින සිට** 2021.03.25 **දින දක්වා** 09.00 **පැයේ සිට** 15.00 **පැය** දක්වා කාලය තුළ ආපසු නොගෙවනු ලබන **රු. 2,500.00 ක** (වැට් බදු සහිත) ගාස්තුවක් සහිත ලිඛිත අයදුම්පතක් සමග සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය පළාත් භාර අධ්‍යක්ෂ (වයඹ) මාර්ග සංවර්ධන අධිකාරිය, කුරුණෑගල වෙත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් ලබාගත හැකිය.
8. සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරෙහි අදාළ කොන්ත්‍රාත්තුව සඳහන් කර 2021.03.26 **දින** 14.00 **පැයට** හෝ ඊට පෙර සභාපති, වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුවේ. ප්‍රමාද වන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කිරීම, ටෙන්ඩර්පත් භාරදෙන වේලාව අවසන් වීමත් සමග සිදු කරනු ලැබේ.
9. 2021.05.25 දින දක්වා ලංසුව වලංගුවේ.
10. ටෙන්ඩර්පත් සමග ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් සුරක්ෂිත කිරීමේ සහතිකය 2021.06.22 දින දක්වා වලංගු විය යුතුය.

සභාපති, වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව,
පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
කුරුණෑගල.

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021/ 2022 වර්ෂය සඳහා දකුණු කොළඹ ශික්ෂණ රෝහල කළුබෝවිල දෙහිවල

2021/ 2022 වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් හා සේවාවන් සැපයීම පිණිස නිෂ්පාදකයින්, නියෝජිතයින්, ලියාපදිංචි සමුපකාර සමිති, සංස්ථා ඇතුළු රජයේ ආයතන, ග්‍රාමෝදය මණ්ඩල සහ පිළිගත් වාණිජ ආයතන හා පුද්ගලයින් මෙම රෝහල යටතේ ලියාපදිංචි කිරීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

(ආ) ද්‍රව්‍ය සැපයීම

(01-i) ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ උදා - පැන්සල්, මකන, ටිපෙක්ස් ආදිය
(01-ii) කාර්යාලීය උපකරණ උදා - අංකන යන්ත්‍ර, කැල්කියුලේටර්, පන්චර් යනාදී වශයෙන්
(02) ලී බඩු, ගෘහ භාණ්ඩ හා වානේ ගෘහ භාණ්ඩ
(03) ෆයිබර් ග්ලාස් හා ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ
(04) කොහු මෙට්ට, රබර් මිශ්‍රිත කොහු මෙට්ට හා පුළුන් කොට්ට
(05) සබන් වර්ග, සෝදන කුඩු, පිරිසිදු කිරීමේ දියර
(06) පැදුරු, වැසිකිළි බුරුසු හා සියළුම වර්ගයේ රෙදි මුසුන් තිර බුරුසු
(07) සියළුම වර්ගවල රෙදි වර්ග, (මැකින්ටෝෂ්, රෙක්සීන්, කොට්ට උර, ඕවර් රෝල්, සර්ජන් ගවුම්, පිජාමා කිට් (ශල්‍යාගාර සඳහා), ජී.එස් ටවල්, බෙඩ් ෂීට්, ඩ්‍රෝ ෂීට්, තිර රෙදි, කොටු රෙදි, මදුරු දැල්, මුහුණ පිසින තුවා.
(08) ඇලුමිනියම් සාස්පාන්, ජෝගු, කේතල ආදි ඇලුමිනියම් භාණ්ඩ/සුදු යකඩ භාණ්ඩ
(09) මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය පිඟන් භාණ්ඩ , වීදුරු භාණ්ඩ, ප්ලාස්ටික් භාණ්ඩ.
(10) රේසර්, බ්ලේඩ්, ගිනි පෙට්ටි, ඉටි පන්දම්, හිස් යෝගට් කෝප්ප.
(11) එල් පී ගෑස්
(12) වෛද්‍ය උපකරණ (අදාළ උපකරණ වර්ගය සම්බන්ධ දේශීය නියෝජිත බව තහවුරු කළ යුතුය.)
(13) වෛද්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය (අදාළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වර්ගය සම්බන්ධ දේශීය නියෝජිත බව තහවුරු කළ යුතුය.)
(14) රසායනාගාර උපකරණ (අදාළ උපකරණ වර්ගය සම්බන්ධ දේශීය නියෝජිත බව තහවුරු කළ යුතුය.)
(15) රසායනාගාර ද්‍රව්‍ය අදාළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වර්ගය සම්බන්ධ දේශීය නියෝජිත බව තහවුරු කළ යුතුය.)
(16) පොලිතීන් බෑග් හා පොලිතීන් වර්ග
(17) වායු සමීකරණ යන්ත්‍ර සැපයීම.
(18) විදුලි නඩත්තු උපකරණ - ටියුබ් ලයිට්, CFL බල්බ්, LED බල්බ්, වෙනත් හීටර්, ස්විච් වර්ග, කන්ටැක්ටර්, ටයිමර්, MCB/MCCB/RCCB/LED කොටස්, හීටර් බල්බ් අමතර කොටස්, බල්බ්, හීටර් ආදිය.
(19) විදුලි උපකරණ - ශීතකරණ, අධිශීතකරණ, විදුලි පංකා, පොලිෂර්, විදුලි උඳුන්, බ්ලෙන්ඩර්, කැසට් රේඩියෝ, විදුලි කේතල, රෙදි සෝදන යන්ත්‍ර, බොයිලේරු ආදිය.
(20) මෝටර් රථ අමතර කොටස් හා උපාංග (ටයර් , ටියුබ් හා බැටරි, වෙනත් දෑ)
(21) හාඩ්වෙයාර් උපකරණ (යතුරු තහඩු, සරන්තේරු, සොයිබ ඇණ වර්ග හා ට්‍රොලි රෝද හා සියළුම යකඩ තහඩු වර්ග)
(22) සියළුම වර්ගවල ජලනළ උපාංග හා සනීපාරක්ෂක උපකරණ
(23) පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා ඒ සම්බන්ධ උපාංග. (ටෝනර්, කාඩ්රිජ්, රිබන් සැපයීම සම්බන්ධයෙන් අයදුම්පතෙහි නිවැරදිව සටහන් කරන්න.)
(24) පරිගණක මෘදුකාංග (නිර්මාණය කිරීම හා සැපයීම).
(25) සියළුම දෘව වර්ග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන.
(26) ඖෂධ බහාලන කවර, සී ටී ස්කෑන් වාර්තා බහාලන කවර, එක්ස්රේ වාර්තා බහාලන කවර මුද්‍රණය කර සැපයීම හා වාහන අවසර බලපත් මුද්‍රණය කිරීම.
(27) වීදුරු වර්ග (මේස, දෙරවල් සහ ජනෙල් සඳහා හා මුහුණ බලන කණ්ණාඩි)
(28) පාවහන් (ශල්‍යාගාර පාවහන්)
(29) සපත්තු සෑදීම සඳහා අමු ද්‍රව්‍ය - (සම් අලවන ගම්, ලයිනින් ලෙදර්, කිඩ් ලෙදර්, ලෙදර් සී ජී, ලෙදර් සී සී, ඉනිසෝල් ලෙදර්, රබර්, සපත්තු ලේස්, කැන්වස් රෙදි, කුෂන් රබර් ෂීට්, පේපර් බෝඩ්, ෂයිනින් බෝඩ්, ටියුබර් රිවට්, සපත්තු බකල්, රෙක්සින් රෙදි.)
(30) තීන්ත වර්ග, තීන්ත බුරුසු ආදි නිෂ්පාදන
(31) සූර්යය බලශක්ති පද්ධති සපයා සවි කිරීම
(32) ගිනි නිවීමේ උපකරණ, ගිනි අනතුරු ඇඟවීමේ සංඥ උපකරණ ද්‍රව්‍ය හා උපකරණ පද්ධති සවි කිරීම
(33) ගබඩා රාක්ක සපයා සවි කිරීම සහ සේවා කිරීම, ගඩඩා කළමනාකරණ ද්‍රව්‍ය හා උපකරණ සැපයීම
(34) ජීව වායු ගෑස් පද්ධති සකසා සැපයීම.
(35) අකුණු සන්නායක සැපයීම.
(36) ආරක්ෂිත කැමරා සපයා සවි කිරීම.

(ආ) සැපයිය යුතු සේවාවන්

(37) පුටු විවීම, තීන්ත ගෑම, වාර්නිෂ් කිරීම, රෙක්සීන් හා ෆෝම්කා ගැසීම.
(38) වායු සමීකරණ, ශීතකරණ, අධිශීතකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.
(39) රබර් මුද්‍ර, සෑදීම - ප්ලාස්ටික් නාම පුවරු සැකසීම
(40) යතුරු ලියන, එකතු කිරීමේ යන්ත්‍ර හා රෝතියෝ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම
(41) ශල්‍යාගාර, රසායනාගාර හා සියළුම රෝහල් උපකරණ අළුත්වැඩියාව
(42) විදුලි මෝටර්, ට්‍රාන්ස්ෆෝමර් හා විදුලි පංකා ආදිය නැවත ඔතවා ගැනීම හා අළුත්වැඩියාව
(43) රූපවාහිනී, වීඩියෝ යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කටයුතු කිරීම
(44) වාහන සේවාවන් හා අළුත්වැඩියා කටයුතු - පහත සඳහන් කරුණු පිළිබඳව අයදුම්පතෙහි නිවැරදිව සටහන් කරන්න
(44 - i) වාහන වායු සමීකරණය
(44 - ii) අමතර කොටස්
(44 - iii) වාහනවල විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම
(44- iv) සීට් කුෂන් කිරීම හා සීට් කවර දැමීම
(45) වතුර පොම්ප අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
(46) විවිධ වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීම
(47) ගෑස්/ඔක්සිජන් උපකරණ අළුත්වැඩියාව
(48) පරිගණක යන්ත්‍ර/ මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියාව.(Projectors, Scanners etc....)
(49) නිල හැඳුනුම්පත් සකස් කිරීම.
(50) අයිතිවාසිකම් නොමැති මළ සිරුරු වැළලීමේ කොන්ත්‍රාත්තුව
(51) ගිනි නිවීමේ උපකරණ හා පද්ධති සේවා කිරීම
(52) වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ සහ විකිරණ පරීක්ෂණ සිදුකර ගැනීම
(53) ආරක්ෂිත කැමරා පද්ධති සේවා හා නඩත්තු/ අළුත්වැඩියා කිරීම
(54) අභ්‍යන්තර දුරකථන පද්ධති සේවා හා නඩත්තු/අළුත්වැඩියා කිරීම

(ඇ) (55) ගැනුම්කරුවන්

ඉවතලන කඩදාසි , කාඩ්බෝඩ්, හිස් ඉන්ජෙක්ෂන් කුප්පි, ප්ලාස්ටික් කන්ටේනර්, ඊතල් හයිඩ්‍රජන් බෝතල්, සයිඩෙක්ස්, ප්ලාස්ටික් කෑන් (5L) හිස් සේලයින් බෝතල්, එක්ස්රේ සේයා පටල, හිස් වතුර බෝතල්, පත්තර, වෙනත් ප්ලාස්ටික් වර්ග, බෝතල්, යකඩ තහඩු ආදිය, ගොඩනැගිලි වලින් ගලවා ඉවත් කරන ලද ද්‍රව්‍ය (ලී වර්ග, යකඩ ආදිය) සහ රෝහලේ ඉවත් කරන කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි හා වෙනත් රෙදි වර්ග, සපත්තු ආදිය (පරිසරයට හානි නොවන ලෙස ඉවත් කරවා ගැනීම සඳහා පරිසර බලපත්‍රයක් සහිත විය යුතුය) ගැනුම්කරුවන් ලියාපදිංචිය කරනු ලැබේ.

කොන්දේසි

(01) සැපයුම්කරුවන්ට අවශ්‍ය නම් එක් අයිතමයකට වැඩි සංඛ්‍යාවකට ලියාපදිංචි විය හැක. ඒ සඳහා ගෙවීම් කිරීම සඳහා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා ඔබ වැට් බදු ගෙවීම සඳහා ලියා පදිංචි වී ඇති ආයතනයක් නම් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් වැට් බදු නිෂ්කාශන සහතිකයේ පිටපතක් (2021/ 2022 වර්ෂය සඳහා) ඉදිරිපත් කළ යුතුය.
(02) අනතුරුව මෙම රෝහලේ වෙබ් අඩවිය වන http://www.csth.health.gov.lk/sup/ ට පිවිස ඔබ ලියාපදිංචි වීමට අදාළ එක් එක් අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කර එම අයදුම්පත් බාගත කර මුද්‍රණය කළ පිටපත් හා ඉහත අංක01 හි ඉල්ලා ඇති විස්තර අමුණා එම අයදුම්පත සමග අයිතමයන් සඳහා වෙන වෙනම රු. 500.00 බැගින් මෙම රෝහලේ සරප් අංශය වෙත ගෙවීමෙන් ලබාගන්නා පොදු 172 රිසිට්පතෙහි අංකයද ඇතුළත් කර 2021.03.31 දින ප.ව. 2.00 දක්වා ලියාපදිංචිය විය හැක.
(03) **http://www.csth.health.gov.lk/sup/ වෙබ් අඩවියට පිවිස සැපයීම් හා සේවාවන් සඳහා වෙන වෙනම අයදුම්පත සම්පූර්ණ කර එහි මුද්‍රිත පිටපත ට එක් එක් අයිතමයන් සඳහා වෙන වෙනම මුදල් ගෙවා ලබාගත් රිසිට්පත් අංක ඇතුළත් කර අයදුම්පත් අප ආයතනය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඔබ ආයතනය මෙම රෝහලේ ලියාපදිංචි ආයතනයක් වශයෙන් සැලකේ.**
(04) සැපයුම් හා සේවාවන් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයෙන් මිල ගණන් කැඳවීමට ප්‍රමුඛත්වය දෙනු ලැබුවද ලියාපදිංචි නොවූ අනිකුත් පිළිගත් සැපයුම්කරුවන්ගෙන් (දේශීය සැපයුම්කරුවන්, නිෂ්පාදකයන්න, දුරකථන නාමාවලිය වැනි (Yellow Pages) මිල ගණන් කැඳවීමේ අයිතිය මෙම ආයතනය සතුය.
ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක කටයුතු සඳහා පක්ෂයේ මධ්‍යම පුවත්පත ලෙස "ජනතා විමුක්ති"ද, කම්කරුවන් සඳහා "රතු ලංකා"ද, ශිෂ්‍යයින් සඳහා "රතු බලය"ද, ළමයි සඳහා "රතු කැකුළු"ද සහ දේශප්‍රේමී නමින්ද පුවත්පත් පළ කරන ලදී. නමුත් මේ වන විට එම පුවත්පත් ජනතාව අතර බෙදා හැරීමේ කටයුතු රහසිගතව ක්‍රියාත්මක කළ ද එහි එතරම් සාර්ථකත්වයක් දැකගත නොහැකි විය. විශේෂයෙන් ඉන්දීය ආක්‍රමණයට එරෙහිවත් ජේ.ආර්. ජයවර්ධනගේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ද්‍රෝහී පාලනයට එරෙහිව දැවැන්ත ජනතා විරෝධයක් හා ජනබලයක් නිර්මාණය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කළේය. ඒ අනුව එය උද්ඝෝෂණ, බහුජන, රහසිගත ප්‍රචාරණ මෙන්ම සන්නද්ධ ක්ෂේත්‍රය තුළද ක්‍රියාත්මක විය. පක්ෂයේ හා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් තීව්‍ර වෙද්දී ආණ්ඩුව විසින් තම ප්‍රතිප්‍රහාර ක්‍රියාවලියද උත්සන්න කළේය. මේ අතර පක්ෂයට එරෙහිව විවිධ කුමන්ත්‍රණ බොරු ප්‍රචාර ආදිය යොදා ගනිමින් ජනතාව නොමඟ යැවීමට කටයුතු කිරීමත් පක්ෂයට එරෙහිව රාජ්‍ය මර්දනය මුදා හැරීමත් එකවිට සිදුවිය. පක්ෂයට සම්බන්ධ රහසිගත මුද්‍රණාල සතුරු ග්‍රහණයට පත්වෙමින් තිබූ අතර ජනතාව වෙත පක්ෂයේ මතවාදය සන්නිවේදනය කිරීමේ මාර්ග ඇහිරෙමින් තිබුණි.

මෙම තත්ත්වය තුළ පක්ෂය විසින් ගුවන්විදුලි විකාශනයක් ආරම්භ කිරීමේ පර්යේෂණ කටයුතු සිදුකරන ලදී. ගුවන් විදුලි සම්ප්‍රේෂණ යන්ත්‍රය දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයට සකස් කිරීමේ මූලික වැඩකටයුතු සිදුකරනු ලැබුවේ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ශිෂ්‍යයෙකි. නමුත් පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ශිෂ්‍යයින් කිහිප දෙනෙකු මෙය භාරව සිටි අතර පසුව එච්.බී. හේරත්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක අංශය බාරව ගුවන්විදුලි සම්ප්‍රේෂණ කටයුතු සිදුවූ අතර අවිස්සාවේල්ල සිට හෝමාගම මහරගම දක්වා ප්‍රදේශයන්හි ගුවන් විදුලිය විසුරුවා හැරීමේ කටයුතු සිදුවිය. ඒ අනුව සම්ප්‍රේෂණයන් ස්ථානගත කිරීම සඳහා පොළව මට්ටමින් ඉහළ ස්ථාන තෝරා ගන්නා ලදී. ඒ අනුව කඳු මුදුනක පිහිටි අතුරුගිරිය ප්‍රදේශයේ නිවසක්ද, කොස්ගම සාලාව හමුදා කඳවුර අසල නිවසක් ද හා අවිස්සාවේල්ල කඳු මුදුනක පිහිටි නිවසක පොල් ගස් උඩද වශයෙන් සම්ප්‍රේෂණ යන්ත්‍ර සවිකර ස්ථාන තුනකදී මුලින් ක්‍රියාත්මක විය. පසුකාලීනව කඩවත තෙමහල් ගොඩනැගිල්ලක ඉහළ මාලයේ ද බොරලැස්ගමුව ප්‍රදේශයේ උස් බිමක පිහිටි නිවසකද රත්මලාන මට්ටක්කුලිය නිවාස කිහිපයක ඇතුළුව රටපුරා විවිධ ස්ථාන කිහිපයකදී සම්ප්‍රේෂණ කටයුතු සිදුකරන ලදී.

'රණහඬ' විකාශනය සිදුවූයේ එක් සම්ප්‍රේෂණ ස්ථානයකිනි ගුවන් සැතපුම් දෙකකට විකාශන කලාපය සීමා විය.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක අංශය විසින් අසවල් දින "රණහඬ" විසුරුවාහරින බවට පෝස්ටර් අලවනු ලබමින් මහජන දැනුවත් කිරීමක් සිදුකරනු ලැබේ. රණහඬ ගුවන් විදුලිය විකාශනය වන අවස්ථාවේදී පක්ෂය විසින් සැකසූ කැසට් පටයක් වාදනය කරවීමට සලස්වමින් විකාශනයේ ආරම්භය සිදු වෙයි. පසු කාලය වන විට දිස්ත්‍රික්ක කිහිපයකම හොඳින් ශ්‍රවණය කළ හැකි පරිදි සම්ප්‍රේෂණ යන්ත්‍ර ප්‍රමාණය වැඩි කරන ලදි. 'රණහඬ' ගුවන්විදුලියේ වැඩසටහන් ජනප්‍රිය වූ අතර දෛනික ප්‍රවෘත්ති, විප්ලවීය ගී, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ ප්‍රවෘත්ති, කැරලිකරුවන්ගේ සම්මුඛ සාකච්ඡා, විමුක්තිකාමීන් පිළිබඳ විස්තර හා පක්ෂ නායක රෝහණ විජේවීර ජනතාව අමතන පටිගත කරන ලද කතා වැනි වැඩසටහන් එමගින් විකාශනය විය.

කෙසේ වෙතත් 1987 ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව රට තුළ ඇවිළෙමින් තිබූ ජයවර්ධන විරෝධය 1988 වන විට වඩා උත්සන්න තත්වයට පත්විය. ආණ්ඩුව විසින් ජනතාව වෙත මුදාහරිමින් තිබූ මර්දනය උත්සන්න වීමත් ඒ සමග ආණ්ඩු විරෝධය හා ජයවර්ධන විරෝධය උත්සන්න වීමත් සාධාරණ මැතිවරණ පවත්වා ගැනීමේ වුවමනාවත් ජාතිය ගලවා ගැනීමේ පෙරමුණක් වෙනුවෙන් කරන සාකච්ඡාවල බලපෑමත් සහිතව රටේ විවිධ සංවිධාන ආණ්ඩුවට කරන බලපෑම වැඩි වෙමින් තිබිණි. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරණ මාධ්‍යයන් ඔස්සේ දක්වන කරුණු දැක්වීම් හා ඒවන විට මතුව තිබූ තත්ත්වය අනුව 1988 ඔක්තෝබර් මස මුලදී මල්වතු හා අස්ගිරි නාහිමිවරුන් ප්‍රකාශයක් නිකුත් කරමින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේ පාර්ලිමේන්තුව විසුරුවා හැර මැතිවරණ දෙකම භාරකාර ආණ්ඩුවක් යටතේ පවත්වන ලෙසය. ඊට අමතරව ප්‍රබල වෘත්තීය සමිති හා සංවිධාන විස්සක් ද මේ බලපෑම ආණ්ඩුවට සිදු කළේය. මෙලෙස පුළුල් ජනතා විරෝධයන් සඳහා ජනතාව සවිඥාන කිරීම උදෙසාවන කරුණු දැනුම්වත් කිරීම සඳහා 'රණහඬ' ගුවන්විදුලිය බොහෝ උපකාර විය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණට හිතවත් වූද නොවූද සියලු පාර්ශ්වයන් රණහඬ ගුවන්විදුලිය ශ්‍රවණය කළ බව සඳහන් කළ යුතුය.

ජනතා විමුක්ති පෙරමුණේ ගුවන් විදුලිය රණහඬ අධිබලැති ගුවන්විදුලි සම්ප්‍රේෂණ ඔස්සේ විකාශනය වීමෙන් පසුව ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශනයන් විශේෂයෙන් බස්නාහිර පළාතේ ප්‍රදේශ කිහිපයකින් අපැහැදිලි තත්ත්වයට පත්විය. මෙයට හේතුව අධිබලැති සම්ප්‍රේෂණ මගින් සිදුකරනු ලබන බාධා කිරීම් බව රාජ්‍ය ආරක්ෂක අංශ විසින් සොයා ගන්නා ලදි. මේ අනුව දිවයිනේ ස්ථාන කිහිපයකින් රණහඬ ප්‍රධාන විකාශනාගාර, අධිබලැති ට්‍රාන්ස්මීටර් මෙන්ම සම්ප්‍රේෂණ කටයුතු සිදුකරන උපකරණ අත්අඩංගුවට ගනු ලැබිණි.

කෙසේ වුවද ජනතා විමුක්ති පෙරමුණ 1985 සිට 1989 දක්වා ප්‍රධාන නගරයන්හි සිට ඈත ගම්දනව් දක්වා විවිධ නිර්මාණශීලි සන්නිවේදන ක්‍රමවේදයන් භාවිතයට ගනිමින් ජනයා සවිඥාන කරන ලදි. මෙය ශ්‍රී ලංකාවට නැවුම් අත්දැකීමක් සහිත අපූර්ව සන්නිවේද ජාලයක් විය. මේ අනුව රජය මගින් 1983 ජූලි මස සිට ජනතා විමුක්ති පෙරමුණ නිල වශයෙන් තහනම් කළ ද ජනතා විමුක්ති පෙරමුණේ හඬ තහනම් කිරීමට රජයට නොහැකි වූබව සඳහන් කළ යුතුය.

හීෂණ සමයේ දසුනක්

◣ **එම්. තාරික්**

රජ ගෙදරට පැමිණි උඩුනුවර ගැමියා

රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ හදිසි අභාවයෙන් පසුව 1993 වසරේ මැයි මස හත් වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තුන්වන විධායක ජනාධිපතිවරයා බවට පත්වූයේ, උපශාන්ත සන්සුන් සරල ගැමියෙකි. ඔහු චාම් සරල ගැමියෙකු වුවද, චතුර ලෙස ඉංග්‍රීසි බස හසුරුවන රාජ්‍ය තාන්ත්‍රික දැනුමෙන් හා ඥානයෙන් පිරිපුන් පුද්ගලයෙකි. ජනාධිපති බවට පත්වීමට පෙර ඔහු කැබිනට් ඇමති තනතුරු රැසක් දරමින් දේශපාලන අත්දැකීම් රාශියකින් සන්නද්ධව සිටි අතර සිව් වසරකට ආසන්න කාලයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අගමැති තනතුර ද හොබවමින් දේශපාලන හා රාජ්‍ය පරිපාලන අත්දැකීම් වඩාත් ඔපමට්ටම් කරගෙන සිටියේය. තනතුරු පසුපස හඹා නොගිය ඔහු පසුපස තනතුරු හඹා ආවේය. සිංහල රාජාවලියෙන් පසු කන්ද උඩරට්න් රාජ්‍ය නායකයකු නැවත බිහි විය. තම මිතුරන්ට "ඩීබී" වූ එතුමා මහජනතාවට "විජේතුංග මහත්තයා" විය.

මුදියන්සේ විජේතුංග හා පළිඟුමැණිකේ විජේතුංග යන මව්පියන්ට දාව 1916 පෙබරවාරි මස 15 වන දින ඓතිහාසික මහනුවර උඩුනුවර ප්‍රදේශයේ පොල්ගහඅංග නම් ග්‍රාමයේදී ඩිංගිරි බණ්ඩා විජේතුංග දරුවා උපත ලැබීය. එකල තිබූ වාතාවරණයට අනුව පන්සලේ නායක හිමියන්ගෙන් හා ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා පසුව ගම්පොල ශාන්ත ඇන්ඩෘ විද්‍යාලයට ඇතුළත්ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීය. ශිෂ්‍යත්වයක් හිමි වීමෙන් පසුව මහනුවර ත්‍රිත්ව විද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපනය ලැබූ අතර ඒවන විට ඒ යුගයේ දුෂ්කර ප්‍රදේශයක ජීවත්වන ශිෂ්‍යයකුට ලැබිය හැකි ඉහළම අධ්‍යාපනය ඩී.බී. විජේතුංගයන් ලබා සිටියහ. අධ්‍යාපනය නිම කිරීමෙන් පසු මුලින්ම පොලිස් නිලධාරියකු ලෙසත්, පසුව සමුපකාර පරීක්ෂකයකු ලෙසත් රාජ්‍ය සේවයේ නියැළුණු එතුමන් ඒ තුළින් ලැබූ විනය ගරුත්වය සහ ප්‍රජා සමූපකාරික දැනුම තම පාලන තන්ත්‍රය සඳහා උපයෝගි කර ගත්තේය. රැකියාවෙහි නිරතව සිටියදී 1947 වසරේ වත්තේගම මන්ත්‍රීවරයෙකු ලෙස පාර්ලිමේන්තුවට තේරී පත්වූ උඩරට කීර්තිමත් දේශපාලනඥයකු වූ ඒ. රත්නායක මහතාගේ පෞද්ගලික ලේකම් තනතුර ඩී.බී. විජේතුංග තරුණයාට හිමි විය.

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.ඇස්. සේනානායක මහතාගේ රජයේ ආහාර හා සමුපකාර ඇමැති ධුරයට පත් වූ ඒ. රත්නායක මහතාගේ පෞද්ගලික ලේකම්වරයා වශයෙන් ඩී.බී. විජේතුංග මහතා කටයුතු කරන සමයේ ප්‍රථම වරට දේශපාලන කටයුතුවලට ද සම්බන්ධ විය. ඒ අනුව එක්සත් ජාතික පක්ෂයේ සංවිධාන කටයුතු වලදී දුම්බර ජනතාවගේ ජීවන ප්‍රශ්න, යටිතල පහසුකම් දියුණු කිරීම ආදි කටයුතු පිළිබඳ මනා දැනුමක් ලැබීමටත්, කොළඹ අමාත්‍ය කාර්යාලයේදී ඇමැතිවරයාට සහාය වීමටත් ඔහුට පැවරී තිබූ රාජකාරිය විය.

උඩුනුවර මැණික්හින්නේ වලල ග්‍රාමයේ මුතුකුඩ වලව්වේ නිලමේතුමාගේ දෙටු දියණිය වූ විමලා කුමාරිහාමි මෙනවිය සමග 1954 වසරේදී යුගදිවියට එළඹි ඩී.බී. විජේතුංග මහතා රටටත්, දැයටත්, පොදු ජනතාවටත්, සේවය කිරීමේ අරමුණින් දේශපාලනයට ප්‍රවේශ විය. ඒ අනුව 1965 වසරේ මහා මැතිවරණයේදී උඩුනුවර එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයා ලෙස ඩී.බී. විජේතුංග මහතාව ජනතා ඡන්දයෙන් තෝරා ගනු ලැබුවේ ඔහු තුළ ජනතාව කෙරෙහි පැවති කරුණාව දයාව ඇහුන්කන් දීම මෙන්ම සමාජ සේවය යන යහගුණ පමණක්ම නොව මානුෂීය ගති ස්වභාවයද හේතුකොට ගෙනය. පාර්ලිමේන්තුවට තේරී පත්වූ ඩී.බී. විජේතුංගයන් 1978 වසරේදී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන්ගේ රජයේ විදුලිබල හා බලශක්ති මෙන්ම මහාමාර්ග අමාත්‍ය ධුරයත්, අනතුරුව කෘෂිකර්ම හා පර්යේෂණ අමාත්‍ය ධුරයත් හොබවන ලදී. 1988 වසරේදී එතුමන් වයඹ පළාත් ආණ්ඩුකාර ධුරයට පත්වූ අතර 1989 ජනවාරි මස එවකට ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ ඉල්ලීම පරිදි 1989 පෙබරවාරි මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් විය. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයෙන් තරග වැදී එම පක්ෂ අපේක්ෂක ලැයිස්තුවේ ප්‍රමුඛයා වශයෙන් මනාප ඡන්ද ලබා නැවතත් මැතිසබයට පැමිණියේය. ඉක්බිති ඒ මහතා රණසිංහ ප්‍රේමදාස රජයේ මුදල් ඇමැති ධුරයට පත් විය. ඊට අමතරව රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය ඇමැති වශයෙන්ද, කම්කරු හා වෘත්තීය පුහුණු ඇමති වශයෙන් ද පත්විය. මේ අනුව ප්‍රේමදාස මහතා විජේතුංග මහතාට තවත් පදවි තනතුරු ලබා දුන්නේ ඔහු කෙරෙහි විශ්වාස කළ නිසාය. ඔහු ලෝකය පුරා පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණ වලට ගොස් පිළිගත් සාර්ථක කතා ද පැවැත්වූයේය. ඔහු මේ සාකච්ඡාවන් වලට ගියේ ඉතාමත් දක්ෂ නිලධාරින් සමගය. ඒ සාකච්ඡා ආරම්භයේදී ඔහු කෙටි කතාවක් පවත්වා ඉතිරි කොටස පවත්වාගෙනයෑමට ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා නිලධාරින්ට බාර දුන්නේය. එය ඉතාමත් සාර්ථක බව කාගේත් මතය විය. දශක ගණනාවක සිට විවිධ තනතුරු දරමින් පරිණතභාවයට පත් මෙම නිහතමානී දේශපාලනඥයා වර්ෂ 1989 මාර්තු 06 වන දින ශ්‍රී ලංකාවේ 10 වන අග්‍රාමාත්‍ය ධුරයට පත්විය. මෙම තනතුර ජ්‍යෙෂ්ඨත්වය සලකා ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා විසින් පිරිනමන ලදී.

1993 මැයි 01 වැනිදා එවකට ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාස මහතා දිවංගත වීමෙන් පසු වැඩබලන ජනාධිපති ලෙස පත්වූ ඩී.බී. විජේතුංගයන් දින කිහිපයකට පසුව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ ඒකමතික තීරණය අනුව තුන්වැනි විධායක ජනාධිපතිවරයා බවට පත්විය. විධායක ජනාධිපති ධුරයට පත්වූ පසු එතුමා පොදු ජනතාව හමුවේ විප්ලවීය ක්‍රියාවලියක් සිදු කළේය. මහනුවර ජනාධිපති මන්දිරයේදී ඕනෑම කෙනෙකුට එතුමා හමුවිය හැකි බව නිවේදනය කිරීමෙන් පසු ජනාධිපති මන්දිරය වෙත දිගු පෝලිම් නිර්මාණය විය. පෙරවරු නමයේ සිට ඇඳිරි වැටෙනතුරු වෙහෙස නොබලා ඔහු ජනතාව හමුවුනේය. ඔවුන්ගේ දුක් කරදර කම්කටොලු වලට සාවධානව සවන් දුන්නේය. සමහර ප්‍රශ්නවලට ක්ෂණික විසඳුම් ලැබුණේය. මේ සඳහාම සැකසුණු ලේකම්වරු කිහිපදෙනෙකුගෙන් සමන්විත කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ජනාධිපතිවරයාගේ නියෝග ක්ෂණිකව පිළිපැදීමට සැදී පැහැදී සිටියහ.

උතුරු නැගෙනහිර පවතින්නේ ජනවාර්ගික අර්බුදයක් නොව ත්‍රස්තවාදයක් යැයි අභීතව ප්‍රකාශ කළ එතුමා ජාති හිතෛෂී බවින් හා දේශප්‍රේමී භාවයෙන් නිර්භීතව ගත් තීරණ නිසා සාර්ථක ලෙස යුද මෙහෙයුම් කර නැගෙනහිර ප්‍රදේශය එල්.ටී.ටී.ඊ ත්‍රස්ත ග්‍රහණයෙන් මුදා ගැනීමේ මහඟු කාර්යය මැනවින් ඉටුකළේය. නිර්ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ ඩී.බී. විජේතුංග මහතා, 1993 පළාත් පාලන මැතිවරණය, 1994 මාර්තු දකුණු පළාත් සභා මැතිවරණය හා 1994 ජනාධිපතිවරණය දූෂණයෙන් හා හීෂණයෙන් තොරව පැවැත්වූ බවට විචාරක මතයයි. ඩී.බී. විජේතුංග මහතා තමන් සතු විධායක බලතල ක්‍රියාත්මක කළ එකම අවස්ථාව ලෙස හැඳින්විය හැක්කේ 1995 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ මහ මැතිවරණය ඊට වසරකට කලින් එනම් 1994 දී පැවැත්වීමට තීරණය කිරීම පමණි.

රූපවාහිනිය ආරම්භ කිරීම, ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය රට තුළ ව්‍යාප්ත කිරීම, දිවයිනේ සෑම ප්‍රදේශයකටම විදුලි බලය ලබා දීම, ලෝකයේ සෑම රටකටම ක්ෂණිකව කතා කළ හැකි අන්දමට විදුලි සංදේශ දුරකතන සේවාව ආරම්භ කිරීම, විහාරස්ථාන සඳහා විදුලි පහන් ලබා දීම, කුඹුරු පනත සංශෝධනය කර ගොවීන්ට සහන ලබා දීම, වාරිමාර්ග ක්‍රම නවීකරණය කිරීම හා රාජ්‍ය සේවක වැටුප් සියයට 30 කින් වැඩි කිරීම යන මහඟු කාර්යයන් විජේතුංග මහතා ඉටු කළ ජාතික සේවාවන් ලෙස නම් කළ හැක. තවද එතුමා සහ ජනමාධ්‍යවේදීන් අතර සමීප ඇසුරක් නොතිබුණත් ඔවුන්ට නිදහස් ලෙස අදහස් පළ කිරීමේ අවස්ථාව ලබා දුන්නේය. ලාංකේය ජනතාවට අද්විතීය නායකයකු විය. 1994 දී ජනාධිපති ධුරයෙන් හා දේශපාලන වේදිකාවෙන් ගෞරවනීය ලෙස විශ්‍රාමගත් එතුමාගේ නිහතමානීත්වයට කදිම උදාහරණයක් වන්නේ වයෝවෘද්ධව රෝගාතුර වූ විටදී අවශ්‍ය වෛද්‍ය පහසුකම් මහනුවර මහ රෝහලෙන් ලබා ගැනීමට තරම් ඔහු සරල මිනිසෙකු විය.

ජාතික ඇඳුම, සිංහල භාෂාව, බෞද්ධාගමට මූලිකත්වය ලබා දුන් එතුමා සරල නිහතමානී පුද්ගලයකු විය. එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය උදෙසා විශාල දායකත්වයක් දැක්වූ එතුමා එම පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදි. විශ්‍රාම සුවයෙන් සිටියදීත් ජන මෙහෙවරෙහි යෙදුණු ඩී.බී. විජේතුංග මහතා ස්වල්ප කාලයක් රෝගාතුරව සිට 2008 සැප්තැම්බර් මස 21 වන දින දැයෙන් සමුගත්තේය.

ඩී.බී. විජේතුංගයන් පිළිබඳව පක්ෂ විපක්ෂ පොදු ජනතාව තුළ අදටත් ඇත්තේ දැඩි ගෞරවයක් හා පිළිගැනීමකි. එය උත්තරීතර දේශපාලනඥයකු සඳහා පිදෙන වටිනාම ජනතා උපහාරය බව සඳහන් කිරීම නිවැරදිය.

◣ **කේ. පත්මනාදන්**

ප්‍රබලයන්ගේ විරෝධය මැද පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාවේදීම මන්ත්‍රී පඩි වැඩි වුණ හැටි

වර්තමානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප්, දීමනා සම්බන්ධයෙන් විවිධ කතාබහ සමාජයේ අසන්නට ලැබේ. සාමාන්‍ය ජනතාවගේ චෝදනාව වන්නේ ලැබෙන වැටුපට සාධාරණ සේවයක් ඔවුන්ගෙන් ඉටුවෙනවා ද යන්නයි. මේ කතාබහ අදක ඊයෙක නොව පළමු රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ ද දක්නට ලැබිණි. මේ 1931 පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී මන්ත්‍රී වැටුප් වැඩි කිරීම පෙළ ගැස්වුණු ආකාරයයි.

1931දී ලංකාවට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වාදෙනු ලැබිණි. එහිදී ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව වයස අවුරුදු 21 ට වැඩි සැමට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමිවිය. මේ සමඟ ලංකාව ඉතිහාසයට එක් වූයේ ආසියානු මහද්වීපයේ ප්‍රථමයෙන් සර්වජන ඡන්ද බලය හිමි වූ රට ලෙස ය. එමෙන්ම ආසියානු හා ඕස්ට්‍රේලියානු මහද්වීප දෙකට අයත් රටවල් අතරින් ලංකාවට පෙර සර්ව ජන ඡන්ද බලය හිමිව තිබුණේ නවසීලන්තයට පමණි. පළමුවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීවරු තේරීමේ මැතිවරණය 1931 ජූනි 13 දින ආරම්භ වී ජූනි 20 වැනි දිනෙන් අවසන් විය. මේ සම්බන්ධයෙන් 1931 ජූනි 15 දින දිනමිණ පුවත්පත මුල්පිටුවේ "සෙනසුරාදා පැවැත්වූ තරග පිළිබඳ ප්‍රවෘත්ති හා ප්‍රතිඵල" යන සිරස්තලයෙන් වාර්තා කර තිබිණි.

"රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තේරීම සම්බන්ධයෙන් පසුගිය සෙනසුරාදා ලක්වැසි ජනයා අතර පැවැති උද්‍යෝගය ඉතා මහති. මෙවැනි ආණ්ඩුවක් මින් පෙර කවදාවත් නොතිබුණේය. මෙදින ඡන්දදායක කොට්ඨාස දහසයකම බලවත් තරග පැවැත්තාහ. කොළඹ නගරයේම කොට්ඨාස තුනකි. ලංකාවට සර්වජන ඡන්ද බලය අත්වූ මේ වතාවෙ කොළඹ නගරයේ මෙන්ම අන්‍ය පළාත්වල ද ඡන්දදායක ස්ත්‍රී පුරුෂයන් විසින් මහත් සැලකිල්ලක් දක්වන ලද්දේය. තරග ඉතා බල සම්පන්න වූවත් කිසිම කලබලයක් නැතුව සියලු වැඩ ශාන්තවම කෙරුණේය."

කෙසේ වෙතත්, එතෙක් පැවැති ජාතීන් අනුව මන්ත්‍රීවරු තේරීමේ ක්‍රමය අහෝසි කිරීමට ඩොනමෝර් කොමිසම තීරණය කිරීම නිසා ඊට විරෝධය පෑමක් ලෙස ලංකාවේ දෙමළ පිරිස් මැතිවරණය වර්ජනය කළහ. මේ හේතුවෙන් යාපනය, කන්කසන්තුරේ, කයිට්ස් හා පේදුරුතුඩුව ආසන සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් නොවීය. ඡන්ද විමසීමෙන් මන්ත්‍රීවරු 50' සර්වජන ඡන්දයෙන් තෝරා පත් කෙරිණි. එහිදී සිංහල මන්ත්‍රීන් 38ක්, ලාංකික ද්‍රවිඩ මන්ත්‍රීන් 3ක්, ඉන්දියානු ද්‍රවිඩ 2ක්, යුරෝපීය 2ක් සහ මුස්ලිම් 1ක් වශයෙන් තෝරා ගැනිණි. මෙලෙස ඡන්ද කොට්ඨාස සඳහා මන්ත්‍රීවරු 46ක් තේරී පත් විය. තවත් 09 දෙනෙක් නිතරගයෙන් තේරී පත් විය සර්. ඩී. බී. ජයතිලක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, ඩී. එස්. සේනානායක, පැරි සුන්දරම්, ඩී. එච්. කොතලාවල, ජී. සී. රඹුක්පොත, ඒ. එෆ්. මොලමුරේ, ජේ. එම්. මීදෙනිය අධිකාරම්, ජේ. සී. රත්වත්ත යන මහත්වරුන් නිතරගයෙන් පත් වූහ.

මෙලෙස පැවැති පළමු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමු සැසිවාරය එම වසරේ ජූලි 07 වැනිදා ආරම්භ විය. මන්ත්‍රීවරු 57 ක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට අසුන් ගත් අතර එහි සභාපතිවරයා ලෙස තේරී පත් වූයේ ඩී.බී. ජයතිලක මහතාය. කථානායක ධුරයට පත්වූයේ ප්‍රැන්සිස් මොලමුරේ මහතා ය. මෙහිදී කතානායක ධුරයට පැවැති තරගයේදී මොලමුරේ මහතාට ඡන්ද 35ක් ද ඒ සඳහා ඉදිරිපත් වූ ස්නයිදර් මහතාට ඡන්ද 18ක් ද හිමිවිය.



මෙලෙස ඇරඹි ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාව ඉන් කෙටි කලක් යත්ම මැති ඇමැතිවරුන්ගේ වැටුප් සහ දීමනා සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කෙරිණි. ජූලි 28 ඉදිරිපත් වූ එම යෝජනාව ඉදිරිපත් වූයේ සභාපතිවරයා වූ සර්. ඩී. බී. ජයතිලක මහතා ගෙනි. මේ වනවිට රට දරුණු ආර්ථික පරිහානියක් කරා යොමුවෙමින් තිබිණි. එවැනි තත්ත්වයක මසකට රැස්වීම් 8කට සහ කාරක සභා විවාදවලට ද සහභාගි වීමට සිදුව පවතින බව සභාපතිවරයා ප්‍රකාශ කළේය. එහිදී මන්ත්‍රීවරයකුට ආදායම් වර්ෂයකට රුපියල් 400.00ක් ගෙවීම සුදුසු බව හෙතෙම යෝජනා කළේය. පසුව එය වැඩි කිරීමට ද යෝජනා කෙරුණි. ඒ සමගම කථානායකට සහ ඇමැතිවරුන්ට රුපියල් 1000.00ක් ද, උප සභාපතිවරයාට රුපියල් 750.00ද යෝජනා කෙරිණි. අයහපත්ව පැවැති ආර්ථිකය යහපත්වූ විට එම දීමනා වැඩි කළ යුතු බවද ජයතිලක මහතා යෝජනා කළේය. ඩී.එස්. සේනානායක මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි. ඒ හැරුණුවිට මන්ත්‍රීවරුන්ට නිදහස් දුම්රිය ප්‍රවේශ පත්‍ර හා තැපැල් හා විදුලි සංදේශ සේවා වැනි වරප්‍රසාද ලැබෙමින් තිබිණි.

සභානායක සර් ඩී. බී. ජයතිලක මහතා ඉදිරිපත් කළ ඉහත යෝජනාවට අතුරු යෝජනාවක් ඉදිරිපත් කළ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මන්ත්‍රීවරයකුට දැනට ගෙවීමට යෝජනා කරන රුපියල් 400 මුදල රු. 300 දක්වා අඩු කරන ලෙසත් ආර්ථිකය යහපත් වූ පසු ගෙවීමට යෝජිත මුදල රු. 500 සිට රු. 400 දක්වා අඩු කරන ලෙසත් යෝජනා කර සිටියේය. එසේම ඇමැතිවරුන් හා කථානායකවරයාගේ වැටුප රුපියල් 1000/- බැගින් ද උප කථානායක හා කාරක සභා උප සභාපතිට රුපියල් 750 බැගින්ද ගෙවන ලෙස යෝජනා කර සිටියේය. රජයේ සේවකයන්ගේ වැටුප යළි වැඩි කරනතුරු මන්ත්‍රීවරුන්ගේ වැටුප් වැඩි නොකළ යුතු යැයි බණ්ඩාරනායක මහතා කීවේය. විශේෂයෙන්ම ගම්බද සිටින ජනයා ආහාරපාන හිඟවී, ජීවත්වීමට හැකියාවක් නොමැතිව පැතිර යමින් පවතින මැලේරියා රෝගයෙන් පීඩාවට පත්වන සිටින අයුරු තමන් දුටු බව ද මෙහිදී පැහැදිලි කර තිබිණි. මෙලෙස බණ්ඩාරනායක මහතා ඉදිරිපත් කළ යෝජනාව ජෝන් කොතලාවල මහතා විසින් ස්ථිර කරන ලදි.

වේයන්ගොඩ ආසනය නියෝජනය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට එක්ව සිටි බණ්ඩාරනායක මහතා මෙම විවාදයේදී මෙසේ අදහස් දක්වා තිබිණි.

" ... මේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට මා පැමිණි පළමු දවසේ එනම් රාජ්‍ය මන්ත්‍රණ සභාව විවෘත කරන දවසේ මම මුහුදට මුහුණලා පිහිටි ප්‍රියංකර අගාරයක තේ පානය කරමින් සිටියෙමි. මෙය කොපමණ ප්‍රතාපවත් ගොඩනැඟිල්ලක් දැයි මගේ මිත්‍රයා විමසුවේය. ද්‍රව්‍යයෝපකරණ කොතරම් වැදගත්ද? ආසන කොපමණ සැප පහසුද? මහා සාගරයේ ගුමු ගුමුව කොපමණ සිත්ගන්නා සුලුද? මේවා ගම්බද පළාත් හා සසඳා බැලීමේදී මට මතක් වූයේ ජයග්‍රාහක ස්කිපියෝගේ වචනයයි. අපගේ ගම්බද පළාත්වල වෙසෙන ජනතාව දහස් ගණනින් මෙහි පැමිණ ඔවුන්ගේ අත්වලින්ම මේ ගොඩනැඟිලි අප මත බිඳ හෙළන දිනයක් එළඹෙතැයි මට සිතුණේය. මගේ මිත්‍රයාගේ කනට මිහිරි වූ සාගරයේ ගුමු ගුමුව මට ඇසෙන්නේ අසරණ දරුවන් වෙනුවෙන් වැලපෙන කාන්තාවන්ගේ සුසුම් ලෙසිනි. එය බොළඳ අදහසකැයි ද මට සිතේ. එසේ වුවත් ඒ දිළිඳු අයගේ තත්ත්වය අමතක නොවනු පිණිස අප විසින්ම කිසියම් පරිත්‍යාගයක යෙදිය යුතු වන්නේය."

මෙහිදී තවත් අතුරු යෝජනාවක් ඉදිරිපත් කෙරිණි. හලාවත මන්ත්‍රී ජී. සී. එස්. කොරයා විසින් ඉදිරිපත් කළ අතර එයින්. කියැවුණේ කොළඹ ජීවත් වන මන්ත්‍රීවරයකුට මසකට රුපියල් 200ක් ද, කොළඹින් සැතපුම් පනහක් ඇතුළත ජීවත් වන මන්ත්‍රීවරයකුට රුපියල් 300ක් ද, ඊටත් දුර බැහැර මන්ත්‍රීවරයකුට රුපියල් 400ක් ද බැගින් ගෙවිය යුතු බවය. බිබිල මන්ත්‍රී ජී. සී. රඹුක්පොත විසින් ස්ථිර කරන ලද එම යෝජනාවද ප්‍රතික්ෂේප විය.

කෙසේ වෙතත් ඉහත අතුරු යෝජනා දෙකම ප්‍රතික්ෂේප විය. මන්ත්‍රී වැටුප් අඩු කළ යුතු යැයි බණ්ඩාරනායක මහතා ගෙනා යෝජනාවට එච්. ඩබ්. අමරසූරිය, ඩී. ඩී. ඇතුලත්මුදලි, ජී. සී. එස්. කොරයා, සුසන්තා ද ෆොන්සේකා, එච්. ඇල්. ද මැල්, ඩබ්. ඒ. ද. සිල්වා, ජී. රොබට් ද සොයිසා, එච්. ආර්. ප්‍රීමන්, ජෝන් කොතලාවල, ඒ රත්නායක, ඩබ්. ටී. බී. කරල්ලියද්ද යන මන්ත්‍රීවරු පමණක් ඡන්දය ලබා දුන්හ.

රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ බණ්ඩාරනායක මහතා වඩා ප්‍රගතිශීලී කටයුතු රැසකට දායක වී තිබිණි. විශේෂයෙන්ම ලංකාවට පූර්ණ නිදහස ලැබීමට නම් රාජ්‍ය නිලධාරීන් තිදෙනා සභාවෙන් පිටමං කළයුතු බවත්, ඔවුන්ගේ ධුර අහෝසි කලයුතු බවටත් යෝජනා කරන ලදි. එමෙන්ම බණ්ඩාරනායක මහතාගේ මැදිහත් වීමෙන් ඉදිරිපත් කෙරුණු විශ්වාසභංගය ද මෙහිදී සුවිශේෂය. 1933 ජූනි 14 දින ඇමැති මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙම විශ්වාස භංග යෝජනාවෙන් කියැවුණේ රාජ්‍ය මන්ත්‍රණ සභා කථානායක වැටුප රුපියල දක්වා අඩුකළ යුතු බවය.

රාජ්‍ය මන්ත්‍රණ සභා යුගය අවසන් වී, 1947 වසරේ මහා මැතිවරණයෙන් පසුව මන්ත්‍රීවරුන්ට ලැබුණු රුපියල් 400ක වැටුප රුපියල් 600ක් දක්වා වැඩි විය. ඊට අමතරව රාජකාරි කටයුතු සඳහා ලිපිකරුවකු තබාගැනීමට රුපියල් 75ක දීමනාවක්, වාහන බලපත්‍රයක්, පෙට්‍රල් සඳහා මසකට රුපියල් 50ක කූපනයක්, මන්ත්‍රීවරුන්ට සිය මෝටර් රථය දුම්රියෙන් කොළඹට ගෙන ඒම සහ ආපසු ගෙන යාම සඳහා දීමනාවක්, මන්ත්‍රීවරයාට පළමු පන්තියේ දුම්රිය ගමන් බලපත්‍රයක් හා සේවකයාට තුන්වන පන්තියේ දුම්රිය ගමන් බලපත්‍රයක් හිමිවිය. එමෙන්ම මන්ත්‍රීවරයෙකුට සිය මැතිවරණ බල ප්‍රදේශය තුළ දී දුරකථන, තැපැල්, සහ විදුලි පණිවුඩ වැනි සේවා නොමිලේ දීම සිදුවූ අතර, මන්ත්‍රීවරයෙකුට රුපියල් 2කට ආහාර වේලක් ද හිමිවිය. පසුව එම ගෙවීම් ද අවස්ථා කිහිපයකදීම වෙනස් වූ අතර වර්තමානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ මාසික වැටුප පමණක් රුපියල් 54,285කි.

මලික් චමින්ද ධර්මවර්ධන

මිල මුදල් වෙනුවට මිනිසුන් හම්බ කළ ඇල්පිටියේ නිල් මන්ත්‍රී

නිදහසින් පසුව ඇති වූ දේශපාලන ව්‍යාපාර අතර ගැමි ජනතාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වූ ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරය වූයේ මහජන එක්සත් පෙරමුණ ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලන ව්‍යාපාරයයි.

1956 මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවක් පත් කර ගැනීමට සඟ,වෙද,ගුරු,ගොවි,කම්කරු යන පංච මහා බලවේගය සමඟ අත්වැල් බැඳගත් ඒ ප්‍රධාන දේශපාලන බලවේගය වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

අපේ රටේ රෙද්ද, බැනියම අඳින මිනිසුන්ගේ දුවා දරුවන්ටත් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමේ දොරටු විවෘත වූයේ ඒ පනස් හයේ සමාජ පෙරළිය සමඟිනි. ඒ දේශපාලන උද්දාමයේ ප්‍රධාන කොටස්කරුවන් අතර ගුරුවරුන්ට හිමිවූයේ ඉහළ පිළිගැනීමකි.

ඒ සංස්කෘතික විප්ලවයේ ජයග්‍රහණය සමඟ විශේෂයෙන් දකුණේ ගැමි ජනයාගේ හදවත් තුළ නැවුම් බලාපොරොත්තු රැසක් රෝපණය විය. කුඹුරු පනත මගින් ගොවි ජනයාගේ ආත්ම විශ්වාසය වැඩිදියුණු කළේය. දේශීය කර්මාන්ත ශාලා රැසක් රජයේ අනුග්‍රහයෙන් බිහිවීමෙන් කම්කරු ජනයා ද වහල් මානසිකත්වයෙන් මිදී පොදු ජයග්‍රහණ රැසක හිමිකරුවන් බවට පත් කළේය. මෙවැනි පසුබිමක් යටතේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ සාතනයෙන් පසු පැමිණි 1960 මහා මැතිවරණය ඉතා උණුසුම් ස්වරූපයක් ගත්තේය.

එහිදී ගාලු දිස්ත්‍රික්කයට අලුත් මන්ත්‍රී ආසනයක් ද නිර්මාණය විය. වෝල්ටර් තල්ගොඩපිටිය කොමිෂන් වාර්තාවට අනුව බද්දේගම, බළපිටිය ආසනවලින් වෙන් වූ මේ ආසනය බෙන්තර ඇල්පිටියයි. මේ අලුත් මන්ත්‍රී ආසනයෙන් අලුත් මන්ත්‍රීවරයකු තෝරා පත්කර ගැනීමට බෙන්තර, ඇල්පිටිය ජනතාවට අවස්ථාව උදා විය. එහිදී ජනතා ආකර්ෂණය දිනාගත් ගැමි ජනයාගේ හදවත හඳුනාගත් චාම්, සරල දිවි පෙවෙතක් ගත කළ උපාධිධාරි ගුරුවරයෙකු තෝරා පත්කර ගැනීමට තරම් බෙන්තර, ඇල්පිටිය ජනතාව බුද්ධිමත් විය. ඒ අලුත් මන්ත්‍රී ආසනයේ අලුත් මන්ත්‍රීවරයා වූයේ හපුතන්ත්‍රි ගමගේ ඇල්බට් කාරියවසම් නම් වූ මානව හිතවාදී දේශපාලනඥයාය.

1921 මැයි මස 8 වැනි දින තල්ගස්වල නියාගමදී උපත ලද ඇල්බට් කාරියවසම් 9 දෙනකුගෙන් යුත් පවුලේ බාලම දරුවා විය. එකල නියාගම පල්ලි ඉස්කෝලය නමින් හැඳින්වූ පසුව නියාගම විජිත මහා විද්‍යාලය, එතුමා අධ්‍යාපනය ලැබූ පාසලයි.

ගුරුවරයකු ලෙස සිය ජීවන ගමන ආරම්භ කළ ඇල්බට් කාරියවසම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමාධාරියකු හා පසුව උපාධිධරයකු ද විය. එතුමාගේ සමකාලීනයන් අතර පසුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ මහාචාර්ය ධුරය හෙබවූ මැන්දිස් රෝහණ ධීරයන් ද වේ.

පේරාදෙණිය සරසවියෙන් සිය අධ්‍යාපනය හමාර කළ ඇල්බට් කාරියවසම් මහතා දඹදෙණිය ගුරු අභ්‍යාස විදුහලේ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කළේය. විශේෂයෙන් ඇල්බට් කාරියවසම් මහතාගේ දේශපාලන ජීවිතයට නව අරුතක් එක්කළ දේශපාලන සගයන් අතර හිටපු නියෝජ්‍ය ඇමැතිවරයකු වූ මතුගම දයා ටී පැස්කුවෙල්, හිටපු නියෝජ්‍ය කථානායකවරයකු වූ ඩී. ඒ. රාජපක්ෂ යන ප්‍රගතිශීලී දේශපාලන චරිත බෙහෙවින් ඉවහල් විය.

දඹදෙණිය ගුරු අභ්‍යාස විදුහලේ කථිකාචාර්ය ධුරයට සමුදුන්නේ ක්‍රියාකාරී දේශපාලනයට පැමිණීමේ බලවත් ආශාවෙනි. පසුව සිය ගම් ප්‍රදේශය ආසන්නයේ වූ ඇල්පිටිය ආනන්ද මධ්‍ය මහා විදුහලේ ගුරුවරයකු වශයෙන් කටයුතු කළේය.

ඇල්පිටිය ආනන්ද විදුහලේ සේවය කරන අවදියේ සිය ප්‍රගතිශීලී දේශපාලනයට අවැසි මංපෙත් විවර වූයේ ජනතාවගේ ළෙන්ගතු මිතුරකු වශයෙනි. ඇල්පිටිය ආනන්ද විදුහලේ කීර්තිමත් ගුරුවරයකු වශයෙන් ද ශිෂ්‍ය ප්‍රජාවගේ හදවත් දිනාගත්තේය. ඒ ලැබූ කීර්තිය ප්‍රගතිශීලී දේශපාලන කඳවුරේ ක්ෂේමභූමිය බවට පත් විය. දිනෙන් දින බෙන්තර ඇල්පිටිය ජනතාවගේ සමීපතම දේශපාලනඥයා බවට පත්වීමට ඇල්බට් කාරියවසම් මහතාට වැඩි කල් ගත නොවීය. 1960 මාර්තු පැවැත්වූ මහා මැතිවරණයේදී බෙන්තර, ඇල්පිටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වූයේ බද්දේගම හෙන්රි අබේවික්‍රම මහතාය.

ඇල්බට් කාරියවසම්

එක්සත් ජාතික පක්ෂයෙන් ආර්. ජී. සමරනායක මහතා ද ඉදිරිපත් විය. 1960 අලුතින්ම බිහිවූ බෙන්තර ඇල්පිටිය ආසනයට හාපුරා කියා ඉදිරිපත් වූ ඇල්බට් කාරියවසම් මහතා කරත්ත රෝදය ලකුණින් තරග කළේ මහජන එක්සත් පෙරමුණෙනි. 1960 මාර්තු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයේ ආර්. ජී. සමරනායක මහතා ජයගත්තේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ හෙන්රි අබේවික්‍රම පසුකොට මහජන එක්සත් පෙරමුණෙන් ඉදිරිපත් වූ ඇල්බට් කාරියවසම් මහතා දෙවැනි ස්ථානය ගැනීම ද මෙම මැතිවරණයේ සිදු වූ සුවිශේෂ සිදුවීමකි. 1960 දෙවැනි මැතිවරණය පවත්වනු ලැබුවේ ජූනි මාසයේදීය. ඒ මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආරාධනාවෙන් බෙන්තර ඇල්පිටියට ඉදිරිපත් කළේ ඇල්බට් කාරියවසම් මහතාය. 1960 ජූනි මහා මැතිවරණයෙන් විශිෂ්ට ජයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා වූ ඇල්බට් කාරියවසම් මහතා හිමිකර ගත්තේය.

කතරගම කිරිවෙහෙර අබියසදී සිරිමා මැතිනි, ඩී.ඒ. රාජපක්ෂ සමඟ ඇල්බට් කාරියවසම්

අලුත් ආසනයක් වූ බෙන්තර ඇල්පිටිය ආසනයේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් දිවුරුම් දුන්නේ එම ආසනයෙන් පත් වූ පළමුවැනි මන්ත්‍රීවරයා වශයෙනි. නවක මන්ත්‍රීවරයකු වශයෙන් කාරියවසම් මහතා ජනතා ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙමින් තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නවලට විසඳුම් දුන්නේය. මේ වන විටත් යෞවනයකු වූ ඇල්බට් කාරියවසම් මහතා 1962 වසරේදී උපාධිධාරි ගුරුවරියක වූ බදුරලිය පැළැඳේ හේමා කාරියවසම් මහත්මිය සමඟ විවාහ විය. මේ විවාහයේ ඇති විශේෂත්වය වන්නේ එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිල නිවෙස වූ කොළඹ ශ්‍රාවස්ති මන්දිරයේදී මේ විවාහ උත්සවය පැවැත්වීමයි. 1965 මහ මැතිවරණයට ඇල්බට් කාරියවසම් මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ද එක්සත් ජාතික පක්ෂයෙන් ආර්. ජී. සමරනායක මහතා ද තරග කළේය. එහිදී එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ ආර්. ජී. සමරනායක මහතා ජයගත්තේය. එහෙත් ඇල්බට් කාරියවසම් මහතා දැමූ ඡන්ද පෙත්සමකින් ආර්. ජී. සමරනායක මහතාගේ මන්ත්‍රී ධුරය පමණක් නොව වසර ගණනාවකට ප්‍රජා අයිතිය ද අහෝසි වී ගියේය. නැවත 1966 පැවැති අතුරු මැතිවරණය ද උණුසුම් දේශපාලන වටාපිටාවක් නිර්මාණය කළේය. 'බ' යන අකුරින් පටන්ගන්නා ආසන තුනකම අතුරු මැතිවරණ 3ක් පැවැත්වීමට සිදුවීම මෙහි ඇති විශේෂත්වයයි. ඒ අනුව බෙන්තර ඇල්පිටිය, බණ්ඩාරවෙල, බලන්ගොඩ යන ආසන තුනේම අතුරු මැතිවරණය පැවැත්වීමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට සිදුවිය. බණ්ඩාරවෙල ආසනයේ මන්ත්‍රීවරයා වූ ජේ. ජී. ගුණසේකර මහතාගේ ඉල්ලා අස්වීම සහ බලන්ගොඩ ආසනයේ මන්ත්‍රීවරයා වූ ක්ලිෆර්ඩ් රත්වත්තේ (හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සොහොයුරා) ඡන්ද පෙත්සමකින් සිය අසුන අහිමිවීම නිසා බලංගොඩට ද අතුරු මැතිවරණයක් පැවැත්වීමට සිදුවිය. එවර බලංගොඩ ආසනයට ශ්‍රීලනිපයෙන් තරග කළේ (සිරිමාවෝ මැතිනියගේ සහෝදරියක වූ) මල්ලිකා රත්වත්තේ මහත්මියයි. මෙම ආසන තුනේම අතුරු මැතිවරණ පැවැත්වූයේ 1966 ඔක්තෝබර් 24 වැනිදාය. බෙන්තර, ඇල්පිටියට එවර එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වූයේ ආර්. ජී. සමරනායක මහතාගේ සොයුරු ව්‍යාපාරික කොලින් සමරනායක මහතාය. 1966 ඔක්තෝබර් 24 වැනිදා පැවැති අතුරු මැතිවරණයේ බෙන්තර, ඇල්පිටිය ආසනයේ ඡන්ද ප්‍රතිඵල මෙසේය.

ඇල්බට් කාරියවසම් මහතා 24,132 කොලින් සමරනායක මහතා 22,455 වැඩි ඡන්ද 1677 කින් ඇල්බට් කාරියවසම් මහතා ජයගත්තේය. බලංගොඩින් මල්ලිකා රත්වත්තේ ද, බණ්ඩාරවෙලින් ආර්. ඇම්. අප්පුහාමි ද ජයගත්තේය. මේ අපේක්ෂකයන් තිදෙනාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වීම බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයට දැල්වූ රතු එළියකි. මේ ජයග්‍රහණය ගැන 'ඇත්ත' පුවත්පත සිය ප්‍රධාන ශීර්ෂපාඨයෙන් දක්වා තිබුණේ ඉතාම හාස්‍යය මතුකරන ශීර්ෂපාඨයකි. එය නම් "ඩබ්ලිට තුනම නැතිවෙයි" යනුවෙනි. මේ අයුරින් ඉතාම තීරණාත්මක අතුරු මැතිවරණයකින් ජය ගැනීමට ඇල්බට් කාරියවසම් මහතා සමත්වීම ගැන ප්‍රගතිශීලීන්ගේ පැසසුමට ලක්වී ඇත.

1970 මහා මැතිවරණයෙන් ද ඉතා පහසු ජයක් හිමිකර ගැනීමට ඇල්බට් කාරියවසම් මහතාට හැකි විය. 1970 සමගි පෙරමුණු ආණ්ඩුවේ වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමැතිවරයා වශයෙන් ඒ මහතා කටයුතු කළේය.

බෙන්තර කේන්ද්‍රකොටගෙන ඇති වූ සංචාරක ව්‍යාපාරයේ පෙරගමන්කරුවා ඇල්බට් කාරියවසම් මහතාය. බෙන්තර සංචාරක හෝටල් ආරම්භ කිරීම සිදුවූයේ ඒ මහතා මහජන මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කළ වකවානුවේදීය. විශේෂයෙන් බෙන්තර රජයේ රෝහල, තැපැල් කන්තෝරුව ඒ මහතාගේ යුගයේ සිදු කළ පොදුජන සේවාවන්ය. තව ද කෘෂි සේවා මධ්‍යස්ථාන මුළු ආසනය පුරා ඇති කිරීමට පියවර ගත්තේය. ඇල්පිටියට දැඩි අවශ්‍යතාවයක්ව පැවැති අධිකරණ පද්ධතියක් ආරම්භ කළේ ද කාරියවසම් මහතාය. බෙන්තර ඇල්පිටිය ආසනය පුරා පාසල් 78ක් ආරම්භ කිරීමට ඔහු පියවර ගත්තේය.

නියාගම රජයේ රෝහල, නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මුලින්ම ආරම්භ කළේය. විදුහල්වලට ක්‍රීඩාංගණ රැසක් ආරම්භ කිරීමට පියවර ගත්තේය. ඇල්පිටිය ආනන්ද විදුහල, පෝද්දිවෙල මහා විද්‍යාලය, කහඳුව මහා විද්‍යාලය, බෙන්තර ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය ආදි ක්‍රීඩාංගණ ආරම්භ කොට ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වැඩිදියුණු කිරීමට ක්‍රියා කළේය. දුෂ්කර ප්‍රදේශවල පාලම් බෝක්කු පමණක් නොව ලංගම බස් රථ ද ධාවනය සඳහා යෙදවීමට පියවර ගත්තේය.

බඹරවාන, මත්තක, ගොඩමුණ, කහඳුව, පිණිකහන, උතුරුපිට්ගල, පැලවත්ත, නෙළුව ආදී ප්‍රදේශ දක්වා ගමනාගමනය සඳහා ලංගම බස්රථ යෙදවීමට පියවර ගන්නා ලදී. වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමැතිවරයා වශයෙන් ඇල්පිටිය, කැටපලේ පටපණු සේද කර්මාන්තය හෙවත් මල්බෙරි වගාව ආරම්භ කොට විශාල පිරිසකට රැකියා දීමට කටයුතු කළේය.

පේෂ කර්මාන්තය හෙවත් රෙදි විවීමේ පාසල් මුළු ආසනය පුරා ඇතිකොට දේශීය රෙදිපිළි නිෂ්පාදනය දිරිමත් කළේය. සතොස ඇල්පිටිය, පිට්ගල, නියාගම බෙන්තර ආදි නගරවලත් සමුපාකාර ප්‍රාදේශික රැසක් මුළු ආසනය පුරා ආරම්භ කිරීමට එතුමා ක්‍රියා කළේය. ශ්‍රී ලංකා කජු සංස්ථාව ආරම්භ කළේ එතුමා වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමැතිවරයා වශයෙන් සිටියදීය. 1977 මහා මැතිවරණයෙන් ඇල්බට් කාරියවසම් මහතා පරාජයට පත්වුව ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනයේ මියනතුරාම කටයුතු කළේය.

අපේ රටේ ජීවත් වූ ඉතාම දුර්ලභ දේශපාලනඥයන් අතර ඇල්බට් කාරියවසම් මහතා ද අගය කළ යුතු දේශපාලන චරිතයකි. දේශපාලනයෙන් මිල මුදල් නොව මිනිසුන් හම්බ කළ දේශපාලනඥයෙකි. සිය දේපළ පවා අහිමි කර ගනිමින් දේශපාලනය කළ කාරියවසම් මහතා මන්ත්‍රී විශ්‍රාම වැටුපකටවත් හිමිකම් නොකියූ මහජන සේවකයෙකි. අදටත් ඇල්බට් කාරියවසම් මහතා සිදු කළ දේශපාලනය ගැන දන්නා බොහෝ දෙනා එතුමාගේ ගුණ සිහිපත් කරන්නේ එවැනි දේශපාලනඥයන් දුර්ලභ නිසාය.

මහින්ද ආරියවංශ

ශ්‍රීලනිපයට මොකද වුණේ?

"මිනිසා උපතින්ම දේශපාලන සත්ත්වයෙකි" යි කියුවේ ග්‍රීක මහා දාර්ශනික ඇරිස්ටෝටල්ය. මිනිසාගේ දේශපාලනික හැසිරීම ඔහු නිශ්චය කළේ ක්‍රි.පූ 384 දීය. මිනිසා නමැති කාසියේ එක පැත්තක බලය ද අනෙක් පැත්තේ දේශපාලනය ද පවතී. ඒ නිසා ම බලය වූ කලී මිනිසා ඒ පසුපස හඹා යන්නට පොලඹවන්නකි. බලය යනු ධනය මෙන් ම දෑස් අඳ කරන බෙහෙතක් ය. දේශපාලන පක්ෂ ක්‍රමයේ ඇරඹුමත් සමඟ ම අභ්‍යන්තර බල අරගලය යන්න ද ආරම්භ වේ.

එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ආදී සෑම පක්ෂයක් ම මෙම පොදු ගැටලුවට කලින් කල මුහුණ දෙන අයුරුත් නැවතුමක් නොමැති බල අරගලයක පක්ෂ වශයෙන් ක්‍රියාකාරී වන අයුරුත් දකිමු. මෙරට මුල් බැසගත් ප්‍රධාන පක්ෂ දෙකක් ලෙස පසුගිය මැතිවරණය දක්වාම එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය ආධිපත්‍යය රට තුළ පවත්වාගෙන යනු අපි දුටිමු. නමුත් මේ සියල්ල සුනු විසුනු කරමින් පොදුජන පෙරමුණ සහ සමඟි ජන බලවේගය ගොඩනැඟුණි. එයින් අපට පැහැදිලි එක් කරුණක් වනුයේ ජනතාව සාම්ප්‍රදායික 'පක්ෂය' නමැති සංකල්පයට වඩා ප්‍රායෝගික දේශපාලනයට නැඹුරුවීමේ ප්‍රවණතාවක් පවතින බව ය. කෙසේවෙතත් අප මෙහි දී මාතෘකා වන්නේ බලය හෝ මිනිසා පිළිබඳ කතා කරන්නට නොවේ. එහි තෙවැන්න වූ දේශපාලනය පිළිබඳව ය. එහි ද යථෝක්ත මුල් බැසගත් ප්‍රධාන පක්ෂ දෙකෙන් එකක් පිළිබඳව ය. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිබඳවය.

මෙරට මුල් ම දේශපාලන පක්ෂය වන්නේ 1947 දී පිහිටුවනු ලැබූ එක්සත් ජාතික පක්ෂය යි. එහි ආරම්භය සඳහා ද ස්වකීය දායකත්වය සැපයූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා වූයේ සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක මහතාය. ඔහු මෙරට මුල් බැසගත් දේශපාලන පක්ෂයක නිර්මාතෘවරයා සේම මෙරට දේශපාලනය තුළ අනුප්‍රාප්තිකයන් බිහිකළ පවුලක දැවැන්තයකු ලෙස සමස්ත ආසියාවේම ප්‍රකටය. එක්සත් ජාතික පක්ෂය සමඟ මතුවන අභ්‍යන්තර බල අරගල සහ වෙනත් අර්බුද හේතුවෙන් බණ්ඩාරනායක මහතා ඉන් ඉවත් වී 1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි කර ගනී. එවක රජය 1951-52 අය වැය යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහු එජාපය අතැර ගියේය. අභ්‍යන්තර බල අරගලය සේම මහජන සංවර්ධනයේ පරමාර්ථ අසාර්ථක වීම සහ ඒ තුළ ඉඩ ප්‍රස්ථා නිර්මාණය නොවීම ප්‍රධාන හේතුව විය.

1951 සැප්තැම්බර් 02වැනි දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කිරීමේ රැස්වීමේදී පක්ෂය හා එහි අරමුණ පැහැදිලි කළ බණ්ඩාරනායක මහතා, අභිනව පක්ෂය හා එහි ප්‍රතිපත්ති පිළිබඳව පැවසුවේ මෙසේ ය. "අපේ පක්ෂය සමාජවාදී ප්‍රජාතාන්ත්‍රීය පක්ෂයක් බව පළමු කොටම සඳහන් කළ යුතුයි. සියල්ලන්ටම සාධාරණ වන අතර, දුගීව සිටින බහුතර මහජනයාට අපගේ රටේ ජාතික ධනයෙන් දියහැකි උපරිම තත්වය සැලසීම අපේ පරමාර්ථය වන හෙයින් එය සමාජවාදී වන්නේය. අප පක්ෂය පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක ඒකාධිපති බලය නොඉවසන නියම මහජන පක්ෂයක් වන හෙයින්, එය ප්‍රජාතාන්ත්‍රීය වන්නේය. " ශ්‍රීලනිපයේ වත්මන් දැක්ම, පරමාර්ථ මෙන් ම ප්‍රතිපත්ති ද මීට තරමක් එහාට ගොස් ඇතැයි යන චෝදනාවෙන් මිදීම පහසු කටයුත්තක් නොවන බව ද පෙනේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තම දෙවන සංවත්සරයේ දී එහි නායක බණ්ඩාරනායක මහතා ප්‍රකාශකොට සිටියේ බුද්ධාගමට හා සිංහල භාෂාවට මේ රටේ විශේෂ ස්ථානයක් තිබිය යුතු බවයි. කෙසේ වෙතත් සර් ජෝන් කොතලාවල අග්‍රාමාත්‍යවරයා 1954 ඔක්තෝබර් මාසයේ යාපනයේ කළ සංචාරයක දී තමා බලයේ සිටිනතුරු සිංහල හා දෙමළ භාෂා දෙකටම සම තැන ලබාදෙන බවට සහතික විය. අගමැතිවරයාගේ යාපන කථාව සමග සිංහල භාෂාව පිළිබඳ අලුත් ආන්දෝලනයක් රටපුරා ඇතිවිය. මේ අතර, 1955 සැප්තැම්බර් 24 දින බණ්ඩාරනායක මහතාගේ නායකත්වය සහිත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලංකා සම සමාජ පක්ෂය සමග නිතරඟ ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. 1955 ඔක්තෝබර් 19 වන දින ඇන්.ඇම්. පෙරේරා මහතා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා ලෙස පිළිගැනීමට හැකි ලෙස රාජ සභා ආඥාව සංශෝධනය කළ යුතු බවට යෝජනා කළ විට සිංහල භාෂාව ලංකාවේ රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගැනීමට හැකි ලෙස සංශෝධනයක් බණ්ඩාරනායක මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

එසේම 1955 දෙසැම්බර් 17 දින සිංහල බස ලංකාවේ රාජ්‍ය භාෂාව වශයෙන් පත්විය යුතු බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය දෙවන සමුළුවේදී සම්මත කර ගන්නා ලදී. එසේම සිංහල භාෂාව පමණක් ලංකාවේ රාජ්‍ය භාෂාව විය යුතුය යන හඬින් කොළඹ නගර සභාවේ පැවැති මහ සභාවට එක්සත් භික්ෂු පෙරමුණ ඉදිරිපත් කළ "දස පනත" බණ්ඩාරනායක මහතා විසින් පිළිගත් අතර, තම ඉදිරි ආණ්ඩුවක් මගින් එය ඉටු කරන බවද ප්‍රකාශ කර සිටියේය. මේ අනුව භාෂා ප්‍රශ්නය ඉදිරියට ඒමත් සමග 1956 පමණ වන විට සිංහල භාෂාව ලංකාවේ රාජ්‍ය භාෂාව විය යුතුය යන මතය වර්ධනය වෙමින් පැවතිණි. මේ අතර, 1956 පෙබරවාරි 21 වන දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් යුතුව "මහජන එක්සත් පෙරමුණ" පිහිටුවනු ලැබූ අතර, පාර්ලිමේන්තුව 1956 පෙබරවාරි 18 දින විසුරුවා හරින ලදුව 1956 මාර්තු 06 වන දින නව මහ මැතිවරණය සඳහා නාම යෝජනා භාරගන්නා ලදී. ඉහත සියලු කරුණු කාරණා සමඟ සැසඳීමේ දී එවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ස්වකීය බලය තහවුරු කර ගැනීම සඳහා ක්‍රමයෙන් ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙළවල් වෙනස් කරන බව ය. බහුතර සිංහලයන්ගේ ඡන්ද බලයෙන් බලයට පත්වීම ඔවුන්ගේ සැඟවුණු අරමුණ වූ බැව් විචාරක මතය යි.

බණ්ඩාරනායක මහතාගේ මරණයෙන් අනතුරු ව පක්ෂ නායකත්වයට පත් වන සිරිමා බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සැබෑ මාවත පෙන්නුවා ය. ඇය සමඟ සමඟි පෙරමුණ නිර්මාණය කරන්නට එවක පිටියට බැස්සේ ආචාර්ය එන්.එම්.පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ ආදී වමේ නායකයෝ ය. එවක ලොව තුළ සමාජවාදයේ දැවැන්ත ජයග්‍රහණ හඹා යන යුගයක් විය. ශ්‍රී ලංකාවේ ද බලවත් ව සිටි වාමාංශික නායකයෝ මැතිනියට සහාය දැක්වීම තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙළ නිවැරදි දිශාවකට ගමන් කරනු පෙනුණි.

බොහෝ දෙනා කතා කරන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මාවත එතැන තිබුණි. සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුව මෙරට දේශපාලන, ආර්ථික සහ සමාජ සංස්කෘතිකමය වශයෙන් වැදගත් තීන්දු තීරණ රාශියක් ගනු ලැබූ බැවු අපි දනිමු. ඒ වනවිට පිටරටින් මෙරටට ගෙන්වන, මෙරට නිපදවිය හැකි සියලු දේ පිටරටින් ගෙන්වීම නැවැත්වීමට අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලදී. එමෙන් ම එම භාණ්ඩ මෙරට අමුද්‍රව්‍ය භාවිත කරමින් නිපදවීමට අවශ්‍යවන කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. රබර් වගාව භාවිත කරමින් මෙරටට අවශ්‍ය ටයර් නිෂ්පාදනය කිරීමට ටයර් කර්මාන්ත ශාලාවක් සෝවියට් සමූහ ආණ්ඩුව සමඟින් ඇරඹීමට කටයුතු කරන ලදී. වානේ කර්මාන්ත ශාලාව, ලෝහ භාණ්ඩ කර්මාන්ත ශාලාව, කපු සංස්ථාව, පූගොඩ, වේයන්ගොඩ, මත්තේගොඩ, තුල්හිරිය ඇතුළු මහා පරිමාණ රෙදිපිළි කර්මාන්ත ශාලා හා රට පුරා බලවේග පෙහෙ කර්මාන්ත ශාලා පිහිටුවීමට එකල හැකි විය. මෙරට දේශීය අත්යන්ත්‍ර කර්මාන්තය දියුණු කිරීමට පක්ෂය ගත් දේශපාලන තීන්දු සහ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිය අපේම ආර්ථිකයක් ගොඩනගා ගැනීම කෙරෙහි යොමු කිරීමක් විය. වී, තිරිඟු, මිරිස්, ධාන්‍ය නිපදවීමට අවශ්‍ය සියලුම සහනාධාර ලබාදීමට පියවර ගැනීම ප්‍රායෝගිකව එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අනුබල සැපයීමක් විය. උතුරේ, දකුණේ සියලුදෙනාට එමගින් ආර්ථික ප්‍රතිලාභ ගැනීමට හැකි වි. එහි විකෘතිතා නොපැවතුණේ නොවේ. මිනිසුන්ට බත් කෑමට, පාන් කෑමට වෙන ම දින වෙන් කිරීම එවැනි විකෘතිතා බැව් ද සඳහන් කළ යුතුය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ක්‍රමයෙන් දියාරු වන අයුරු ද ඔටුන්න හිමි කුමරා ලෙස හැඳින් වූ අනුර බණ්ඩාරනායක මහතා සිදු කරන අභ්‍යන්තර බල අරගලය ප්‍රතිවාදී පක්ෂ සඳහා අනුබලයක් ලබා දුන්නේය. බල අරගලය හමුවේ ජයග්‍රහණය කරන චන්ද්‍රිකා මැතිනිය මෙරට පළමු ජනපතිනිය බවට පත්වන්නේ ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකාවක් ලෙස ය. ඇය එහි සභාපතිනිය බවට ද පත් වන්නේ ය. මහින්ද රාජපක්ෂ මහතා ඉන් අනතුරුව ශ්‍රීලනිප සභාපති තනතුර මෙන්ම ජනාධිපතිවරයා ද වන්නේය. පොදුජන පෙරමුණු ආණ්ඩුව සහ වත්මන් ජනාධිපතිවරයා පත්වීමට පෙර ශ්‍රීලනිප සභාපතිවරයා සහ ජනාධිපතිවරයා වූයේ මෛත්‍රිපාල සිරිසේන මහතාය. පක්ෂය මෙන් ම රට ද ශ්‍රීලනිපය බලාපොරොත්තු වන මැද මාවතකට ගැනීමට ඔහුට අවශ්‍යතාව තිබුණු බැව් ද විචාරකයෝ පවසති. කෙසේ වෙතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දියාරුවේ උපරිමයට හේතු වූයේ ද එක්සත් ජාතික පක්ෂය සමඟ සහාග ආණ්ඩුවක් කිරීමට ගොසිනි. ඒ තුළ වර්තමානය වනවිට එක්සත් ජාතික පක්ෂය මෙන් ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද පැහැදිලිව දියාරු විය.

දේශපාලන පක්ෂ බිහිවන්නේම බලය ලබා ගැනීමේ අරමුණ මූලික කරගෙනය. ඉන් ඕදෙන්නට කිසිදු දේශපාලන පක්ෂයකට නොහැකිය. එවන් වාතාවරණයක් තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලය ලබා ගැනීමට මෙන් ම ලැබූ බලයෙන් රට වෙනුවෙන් යමක් කරන්නට උත්සාහ කළ අවස්ථා ද ඉතිහාසයේ දුලබ නොවේ. කෙසේ වෙතත් පක්ෂ හතු පිපෙන්නා සේ බිහිවන වාතාවරණයක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිය මුදුන් මුල් පරෙස්සම් කර ගනිමින් ඉදිරියට යනු පෙනේ. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය නොහොත් මැද මාවත නිසි පරිදි අවබෝධ කරගතහොත් සහ එය නිසි පරිදි ජනතාවට අවබෝධ කරලීමට හැකිවන තාක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැජඹෙනු ඇත.

ගයාන් පීරිස්

එජාපය පරාජයට තල්ලු කළ ගොවි හමුදාව

එක්සත් ජාතික පක්ෂය 1956 මහ මැතිවරණයෙන් බලාපොරොත්තු නොවූ ආකාරයෙන් අන්ත පරාජයට පත්වීමෙන් පසු පක්ෂ නායකයෝ සහ උපදේශකවරු සිරිකොත පක්ෂ මූලස්ථානයේදී අප්‍රේල් මාසයේ අවසාන සතියේදී රැස් වූහ.

එකල පක්ෂ මූලස්ථානය පිහිටා තිබුණේ කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 532 දරන ස්ථානයේය. සොල්දර සහිත ගොඩනැගිල්ලේ පහත මාලයේ විවාහ මංගල උත්සව සඳහා කුලියට දීමට වෙන්කර තිබුණි. එකල අද මෙන් ප්‍රජා ශාලා නැත. උත්සව ශාලා නැත. ඒ කුලී මුදල් පක්ෂ අරමුදලට බැර කෙරිණි.

පක්ෂයේ සභාපති හිටපු අගමැති සර් ජෝන් කොතලාවල පැමිණ නොසිටියේය. ඩඩ්ලි සේනානායක අසනීපයෙනි. උප සභාපතිවරයකු වූ ජේ. ආර්. ජයවර්ධනගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව පැවැත්විණි. ප්‍රධාන ලේකම් සර් උක්වත්තගේ ජයසුන්දර සකස් කළ න්‍යාය පත්‍රය අනුව වැඩසටහන ආරම්භ විය. උපදේශක මණ්ඩලය නියෝජනය කරමින් එස්මන්ඩ් වික්‍රමසිංහ ප්‍රධාන පිරිසක් ද සහභාගි වූහ.

පැය කීපයක උණුසුම් සාකච්ඡාවෙන් පසු පක්ෂ ක්‍රියාකාරීහු පහත සඳහන් යෝජනාවලට පිවිසියහ.

1. ඉතා ඉක්මනින් පක්ෂයේ සම්මේලනයක් පැවැත්වීම.

2. වෘත්තීය සමිති ජාලයක් ආරම්භ කිරීම.

3. පක්ෂ යාන්ත්‍රණයට නව ජීවයක් දෙමින් තරුණ තරුණියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ඡන්ද කොට්ඨාස මට්ටමෙන් ආරම්භ කිරීම.

එම යෝජනාව ඉදිරිපත් කළේ එජාප තරුණ සමිති සම්මේලනයේ ලේකම් ජිනදාස නියතපාල විසිනි. පක්ෂයේ නිල පුවත්පතෙහි කර්තෘ වූයේ ද ජිනදාස නියතපාලය. 1959 ඔක්තෝබර් 30 - 31 දෙදින කැලණියේදී පක්ෂ සම්මේලනය පැවැත්විණි. ජාතික සේවක සංගමය සහ ලංකා ජාතික වතු කම්කරු සංගමය පිහිටුවීමට අදාළ යෝජනා සභා සම්මත විය. ජාතික සේවක සමිතියේ සභාපති වශයෙන් ජේ. ආර්. ජයවර්ධනත්, වතු කම්කරු සමිති බලමණ්ඩලයේ සභාපති වශයෙන් ගාමිණී දිසානායකත් පත්කර ගත්හ.

මේ ජංජාලයන් අතරදී පාර්ලිමේන්තුව විසුරුවන ලද අතර 1960 මාර්තු මහ මැතිවරණයට දින නියම විය. මැතිවරණ ප්‍රතිඵල අනුව එ. ජා. පක්ෂයේ රජයක් ගොඩ නැඟුණි. පාලන කාලය දින 33කට සීමා විය. 1960 ජූලි මහ මැතිවරණයෙන් එජාප රජය පරාජය වී නිතරඟ ගිවිසුමක් ඔස්සේ ශ්‍රී. ල. නි. ප. ආණ්ඩුවක් ගොඩ නැඟුණි. මේ කාලපරාසය තුළ යළිත් ගැටවර තරුණ තරුණියන්ට දේශපාලන පුහුණුවක් දීමේ අවශ්‍යතාවය යළිත් පණ ගැන්විණි. දහඅටේ ඡන්දය ක්‍රියාත්මක වීමේ පසුබිමක් ද ගොඩනැඟී තිබුණි.

පුහුණු භටයින් පුහුණු කිරීම මැයෙන් වූ වැඩසටහන වහාම ක්‍රියාත්මක කළ යුතු බව පක්ෂයේ ඉහළ මට්ටමෙන් යෝජනා විය. මේ අතර 1960 මාර්තු මහ මැතිවරණයට සමාජවාදී මහජන පෙරමුණේ නායකයා වශයෙන් ඉදිරිපත් වූ අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල ජයගත් නමුත් ජූලි මැතිවරණයෙන් තියුණු සටනකින් පසුව ඡන්ද 96කින් පරාජය වීම විශේෂ සිද්ධියක් විය. ඔහු 1947 පටන්ම විවිධ පක්ෂ ඔස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කළේය. පරාජයෙන් පසු ඊරියගොල්ල එජාපයට වඩාත් සමීප විය. පුහුණු භටයින් පුහුණු කිරීමේ සම්මන්ත්‍රණ මාලා වැඩසටහන නායකත්වයත්, උපදේශකත්වයත් පැවරුණේ ඊරියගොල්ල වෙතටය. ඔහු ඒ අපහසු කාර්යය කැමැත්තෙන් භාර ගත්තේය.

1956 ගොඩනැඟූ මහජන එක්සත් පෙරමුණේ නායකයෙකු වූ ඊරියගොල්ලට ජ්‍යෙෂ්ඨ ඇමැති ධුරයක් නොලැබුණි. ඔහු අධ්‍යාපන ඇමැති ධුරය බලාපොරොත්තුවෙන් සිටියේය. නමුත් ඔහුට හිමි වූයේ ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ධුරයයි. ජ්‍යෙෂ්ඨ ඇමැති වූයේ උත්තර මන්ත්‍රණ සභා මන්ත්‍රී ඒ. පී. ජයසූරියයි. ටික කලකින්ම ඊරියගොල්ල ම. එ. පෙ. ඇමැති මඬුල්ලෙන් සමුගත්තේ පෙරමුණු නායකයින් කර්කශ උපහාසයෙන් විවේචනය කරමිනි. අදාළ සම්මන්ත්‍රණ මාලාවේ පළමුවන පියවර වශයෙන් එජාපයට ඉතා ශක්තිමත් ජන පදනමක් සහිත ඡන්ද කොට්ඨාසවලත් සාම්ප්‍රදායික වමේ බළකොටු සහිත ආසනවලත් සම්මන්ත්‍රණ මාලාව දෙවැනි තුන්වැනි පියවරේදී ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කර තිබුණි.

එජාප රැළියක්

නියතපාල

ඊරියගොල්ල

පළමුවන සම්මන්ත්‍රණ මාලාවට හොරණ ඡන්ද කොට්ඨාසය ඇතුළත් විය. රත්නසිරි වික්‍රමනායක මහතා 1960 මාර්තු මැතිවරණය ම. එ. පෙ. නියෝජනය කරමින් හිටපු මුදල් ඇමැති ඇම්. ඩී. එච්. ජයවර්ධන අන්ත පරාජයට පත් කළේය. 1960 ජූලි මැතිවරණයට ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත්ව ජයග්‍රහණය කළ නමුත් ලබාගත් ඡන්ද ප්‍රතිශතයේ අඩුවීමක් දක්නට ලැබුණි. කුඹුක පත්තුව ගම්කාර්ය සභාවේ හිටපු සභාපති ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චිට ජන පදනමක් ගොඩනැගෙන වගට ලකුණු මතු වී තිබුණි.

පුහුණු භට නායක නායිකාවන් පුහුණු කිරීමේ දින තුනක සම්මන්ත්‍රණය 1962 වසරේ මාර්තු මාසයේදී පැවැත්වුණේ හොරණ ඡන්ද කොට්ඨාසයේ උඩුවේ ජයසිංහ වලව්වේය. ඉඩම් හිමි වැවිලිකරුවන් වූ වනිගතුංග පරපුරේ ජයසිංහ හිටපු මුදල් අමාත්‍ය ඇම්. ඩී. එච්. ජයවර්ධනගේ සමීපතම හිතවතෙකු විය. හොරණ ඡන්ද කොට්ඨාසයට අයත් ප්‍රධාන වසම් පනහෙන් එක් වසමකින් ගැහැනු පිරිමි දහදෙනෙකු බැගින් 500ක් තෝරා ගැනිණි.

එවකට සියරට පුවත්පතේ විශේෂ ලියුම්කරුවකු වූ ලියුම්කරු ද ඒ පනහට ඇතුළත් විය. එවකට සියරට නියෝජ්‍ය කර්තෘ වූ ජිනදාස වීරකෝන් (ආචාර්ය ජිනදාස වීරකෝන් දැනටත් ලේඛන කලාවේ යෙදී සිටී) තොරතුරු වාර්තාකරණය සඳහා සහභාගි විය. අද මෙන් එකල මාධ්‍යවේදීන් නැත.

ඊරියගෝල්ල සම්මන්ත්‍රණය ආරම්භ කරමින් විශේෂ දෙසුමක් පැවැත්විය. ඊරියගොල්ලගේ අදහසක් නිසා සමසමාජ පක්ෂයෙන් ඉවත්ව සිටි ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදී චන්ද්‍රරත්න මානවසිංහගේ සාරගර්භ දේශනයෙන් අපි මවිතයට පත් වීමු. බොහෝ දැනුවත් වීමු. මානවසිංහයන් ලියූ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රගතිය පිටු පොත සම්මන්ත්‍රණවලදී විශේෂයෙන් ප්‍රචාරය කෙරිණි. එකල පොතේ මිල රුපියල් දෙකකි.

ලංකාදීප පුවත්පතෙහි නියෝජ්‍ය කර්තෘ අම්බලන්ගොඩ ඩී. එච්. අභයසිංහ විශේෂ දේශනයක් පැවැත්විය. පක්ෂ නායක ඩඩ්ලි සේනානායක සම්මන්ත්‍රණයට සහභාගි වූයේ තුන්වන දිනයේදීය. එවකට දකුණු කොළඹ බහු මන්ත්‍රී ජේ. ආර්. ජයවර්ධන, මැදකොළඹ හිටපු මන්ත්‍රී ආර්. ප්‍රේමදාස (ජූලි මැතිවරණයේදී පරාජය විය), හෝමාගම මන්ත්‍රී ගාමිණී ජයසූරිය, හිටපු මුදල් ඇමැති ඇම්. ඩී. එච්. ජයවර්ධන (හැටේ ජූලි මැතිවරණයෙන් ද කොට්ටාවෙන් පරාජය වී සිටි), යාපහුව මන්ත්‍රී යූ. බී. වන්නිනායක, සමස්ත ලංකා තරුණ සම්මේලනයේ ලේකම් ජිනදාස නියතපාල (කෝට්ටේ හිටපු මන්ත්‍රී) විවිධ මාතෘකා ඔස්සේ සම්මන්ත්‍රණය ඇමතූහ. හොරණ ගෝනාපොල පදිංචි වී සිටි ප්‍රේමදාස ජයතුංග ඉන්දු-ලංකා ප්‍රශ්නය ගැන විශේෂ දේශනයක් පැවැත්විය. සම්මන්ත්‍රණයේ දෙවැනි දින රාත්‍රියේ ප්‍රවීණ සංගීතවේදී සරණගුප්ත අමරසිංහයන් සංගීත ප්‍රසංගයක් පැවැත්විය.

මුළු සම්මන්ත්‍රණ මාලාවේම බර පැන පහසුකම් හොරණ ප්‍රදේශයේ ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි ඇතුළු එජාප ප්‍රබලයින්ගෙනි. කළුතර දිස්ත්‍රික්කයේ සියලු එජාප සංවිධායකවරු සංවිධාන ශක්තිය ලබා දුන්හ. 1963 දී පමණ කොළඹ නිදහස් චතුරශ්‍රයේදී විශේෂ උත්සවයක් පවත්වා පුහුණු භට නායක නායිකාවන්ට විශේෂ මැඩලයක්/ පදක්කමක් ප්‍රදානය කෙරිණි. ඒ මැඩලය රවුම් ආකෘතියකින් නිමකර තිබුණි.

අපේ ආණ්ඩුවක් ආවාට පසු මේ මැඩලයට බොහෝ ගරු සත්කාර ලැබෙනවා. මේ මැඩලය අගමැතිතුමන්ගේ සිට ඕනෑම රාජ්‍ය ආයතනයකට යන්නට හැකි විශේෂ හැඳුනුම්පතක්. (ඒ කාලයේ රාජ්‍ය හැඳුනුම්පත් නොතිබුණි) ඊරියගොල්ල විස්තර කළේය. අපි දැතින්ම අත්පොළසන් දුනිමු. 1965 මාර්තු 22 වැනි දින මැතිවරණය පැවැත්විණි. හොරණ අසුනට යළිත් රත්නසිරි වික්‍රමනායක පත් විය. එජාප ප්‍රධාන පක්ෂ හතකින් හත් හවුලෙන් රජයක් පිහිටුවිය. අගමැති ඩඩ්ලි සේනානායක රජයේ රාජ්‍ය ඇමැති වශයෙන් ජේ. ආර්. ජයවර්ධන පත් විය.

හොරණ එජාප ප්‍රධාන සංවිධායක ධුරයට අයි. හෙට්ටිආරච්චි පත් විය. මහියංගණය මන්ත්‍රී කැප්ටන් සී. පී. ජේ. සෙනෙවිරත්නට ඉඩම් වාරිමාර්ග හා විදුලිබල අමාත්‍ය ධුරය පැවරුණි. ඔහු යටතේ ගොවි හමුදාවක් ස්ථාපිත විය. සම්මන්ත්‍රණයට එක්වූ පුහුණු භට නායක නායිකාවන්ට එම අමාත්‍යාංශයට අනුයුක්ත වන්න යැයි රජයෙන් උපදෙස් ලැබුණි. උතුරුමැද පළාතේ කෘෂිකර්ම සංවර්ධනවලට පුහුණු භට නායක නායිකාවන් බඳවා ගැනීම පළමු අදියර විය. වගාව නොව රැකියාවක් බලාපොරොත්තු වූ විශේෂයෙන් යෞවනයෝ මුල් අවස්ථාවේම අකැමැත්ත පළ කළහ. සැලසුමකින් තොරව ආරම්භ කළ ගොවි හමුදාවෙන් ඉතා ඉක්මනින් ගැටවරයෝ ඉවත් වූහ. පක්ෂයේ ගමේ එජාප හිතවතුන්ට රැකියා පහසුකම් උදාවූයේ පුහුණු භට නායක නායිකාවන්ගේ ඇස්වලට වැලි නොව මිරිස් කුඩු ගැසීමෙනි.

මෙම ගොවි හමුදාව විශේෂයෙන් විපක්ෂයේ සමච්චලයට ලක්වූයේ බව කිව යුතු නොවේ. එජාප බටගොයි හමුදාව වශයෙන් ඇත්ත පුවත්පත නම් කළේය. උණ බට හමුදාව වශයෙන් ලංකා සමසමාජ පක්ෂයේ නිල පුවත්පත හැඳින්විය. සැලසුමකින් තොරව සකස් කළ ගොවි හමුදාව ඉතා ඉක්මනින් නන්නත්තාර විය. 1970 මහ මැතිවරණයේදී පුහුණු භට නායක නායිකාවන්ගෙන් බහුතරයක්ම එජාපයට විරුද්ධව පෙරමුණ ගත්හ. තවත් කොටසක් 1971 අරගලයට එක්වී ජීවිතයෙන් වන්දි ගෙවූහ.

බන්ධුල ආර්. ගුලවත්ත

දේශවංශය
සංස්කරණය - උදිත ගුණවර්ධන
මෙම සියලු ලිපි සංවාදයට විවෘත බව සලකන්න.
දේශපාලනය හා සම්බන්ධ ඔබේ ලිපි අපට එවන්න.
'දේශවංශය', දිනමිණ, අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
deshawanshaya@lakehouse.lk